SL-UNLIMITED
The Spirit of Sri Lankan Community
www.sinhalaelibrary.com
Uploaded By Crzzzy

# ගිම්හාන ගීතිකා

# 1

'ටිකක් හෙමින් යමන් බං... ඔහොම ගියොත් වෙළඳ කලාපෙට යන්න ඉස්සර වෙලා මෝචරියට ගියැකි....'

මෝටර් සයිකලයේ පිටුපස අසුනේ වාඩි වී සිටි සංජීව කෑ ගැසීය. " එතකොට ඉතින් හෙට පත්තරේ තියෙන්නෙ නැතෑ ප්‍රවීන පුවත්පත් කලාවේදී ළහිරු ගිම්හාන සමරදිවාකර සහ කැමරා ශිල්පී සංජීව පෙරේරා අභාවප්‍රාප්ත වෙයි කියල....."

ගිම්හාන මෝටර් සයිකලයේ වේගය මඳක් අඩු කරමින් සිනාසුණේය.

"උඹේ නමට විතරයි ප්‍රවීන කෑල්ල... මම නිකම්ම නිකම් කැමරා ශිල්පියා......"

"ඉතිං ඇත්තනෙ බං...."

හිරු උදා වී හෝරා දෙකක්වත් ඉක්ම ගොස් නොතිබුණි ද පාර පුරා වූයේ වාහන තදබදයකි. කැළණි පාලම මත රිය පෙළක්ම නවත්වා තිබිණි. ගිම්හාන ඒ රිය පෙළට පිටුපසින් මෝටර් සයිකලය නැවැත්වූයේ නොරිස්සුම් සහගත හැඟීමෙන් යුතුවය.

SL-UNLIMITED The Spirit of Sri Lankans
www.sinhalaelibrary.com Uploaded By Crazy

"මෙතන පැයක් විතර ලගින්න වෙයිද දන්නෙ නෑ...." සංජීව පැවසුවේ නොඉවසිල්ලෙනි. "කෙල්ලො ඔක්කොම ගාමන්ට්ස්වලට ගිහිල්ල ඉදිව් අපි යනකොට...."

"උඹත් එක්ක යනකොට නම් එහෙම තමයි වෙන්නෙ..... ඇයි ඉතින් පොඩ්ඩක් ස්පීඩ් කරල ගිය ගමන් මැරෙන්න හදනවනෙ....."

ගිම්හාන පැවසුවේ උපහාසයෙනි. තවමත් උදෑසන වුවද පරිසරය පුරා වූයේ උණුසුමකි. ගිම්හාන ජර්කිනය ලිහිල් කොට පපුවට පිඹ ගත්තේ ය.

"හරිම රස්නෙයි බං....

"උඹේ නමත් ගිම්හාන. ඒකට මොකද මේ පොඩි රස්නෙකට ඔරොත්තු දෙන්න බෑ...." සංජීව සරදම් කළේය.

'එංගලන්තෙ ඉපදුන උඹලට කොහොමටත් ලංකාව අල්ලන්නෙ නෑ බං..."

"අපි පරිසරයට අනුව හැඩ ගැහෙන්න ඕන...."

"එහෙම නම් ඉතින් රස්නෙ ඉවසන්නත් පුරුදු වෙයන්..."

රිය පෙළ සෙමෙන් ඉදිරියට ඇදෙන්නට විය. ගිම්හාන මුවින් නොබැණ මෝටර් සයිකලය පණ ගන්වාගෙන ඒ ඉබි ගමනට එක් විය. එංගලන්තයේදී වේගයෙන් රිය පදවන්නට හුරුව සිටි ගිම්හානට මේ ගමන පයින් යන ගමනක් හා සමාන විය.

"ඔතනින් හරවපන්...." පැලියගොඩ හන්දියේදී සංජීව කෑ ගසා කීවේය.

"සොරි මචං... මම වෙන කල්පනාවක හිටියෙ..." ගිම්හාන මීගමු පාරට සයිකලය හරවා ගත්තේය.

"මටත් ඒක තේරුණා. උඹ ඉන්නෙ ලංකාවෙ නෙමෙයි එංගලන්තෙ කියල..."

එංගලන්තයේ සිටියදී ගිම්හාන වෙළඳ කලාපය ගැන ද එහි දහදිය වගුරන සන්නාලි ලියන් ගැන ද බොහෝ තොරතුරු අසා තිබිණි. එහි ගොස් ඔවුන්ගේ විස්තර සියැසින්ම දැක බලා ගැනීමට ඔහුගේ සිත තුළ ඇති වූයේ අධික ආශාවකි. වෙළඳ කලාපයේ නේවාසිකාගාර ගැන ලිපියක් සකසන ලෙස කර්තෘතුමා කී විට ගිම්හාන ඒ අවස්ථාව කැමැත්තෙන්ම බාර ගත්තේ එහෙයිනි. ගිම්හාන සමඟ ඕනෑම ගමනකට එක් වෙන්නේ සංජීවය. පුවත්පත් කාර්යාලයේ සේවයට පැමිණි ද සිටම ඔහුගේ හොඳම මිතුරා වූයේත් සංජීවය. එංගලන්ත සමාජයට හුරු පුරුදු වී සිටි ගිම්හානට මෙහි පරිසරයට හැඩ ගැසෙන්නට සංජීවගෙන් ලැබුණේ මෙතෙකැයි කිව නොහැකි පිටුවහලකි.

"ඒක නෙමෙයි ගිම්හාන ඇවරිවත්ත පාරෙ අපේ ඒජන්ට් ඉන්නවනෙ.... එතන බයික් එක දාල අපි පයින් යමු....." ගුවන් තොටුපල පාරට මෝටර් සයිකලය හැරවෙද්දී සංජීව යෝජනා කළේය.

"උඹ මිනිහව අඳුනනවද...?"

"අපොයි මොකද නැත්තෙ...? මිනිහගෙන් ඕන සපෝර්ට් එකක් ගත්තැකි...."

තනි තනිව හෝ රංචු වශයෙන් හෝ ඇඟළුම් කම්හල් භූමියට ඇදෙන යුවතියන් දෙස ගිම්හාන බලා සිටියේ මවිතයෙනි. මෙතරම් යුවතියන් රැසක් එක්තැන් වූ වෙනත් කිසිදු පෙදෙසක් ලංකාවේ නැතැයි ඔහුට සිතිණි. ඇවරිවත්ත පාරට හැරුණු පසුව ගිම්හාන මෝටර් සයිකලයේ වේගය හොඳටම අඩු කළේය.

"මොකද ඒ සැරේ....? සංජීව කුතුහලයෙන් විමසුවේ වේගයෙන් රිය පැදවීම ගිම්හානගේ විනෝදාංශය බව ඔහු දැන සිටි හෙයිනි.

"මෙහෙම යනකොට කෙල්ලො කතා කරන දේවලිනුත් මගෙ ආටිකල් එකට කරුණු හොයා ගතැකි...."

"ඔව්... කෙල්ලන්ට හොරෙන් හොඳ පින්තූර ටිකකුත් ගතැකි.... සමහර උන් කැමති නෑ පින්තූර ගන්නවට....."

"හුගාක් පත්තරවලින් කරල තියෙන්නෙ වෙළඳ කලාපෙ කෙල්ලන්ගෙ ප්‍රතිරූපය එහෙම පිටින්ම විනාශ කරන එකනෙ..... ඉතින් උන් කැමති වෙයි ද පින්තූර ගන්නවට.....? ගිම්හාන පැවසුවේ චෝදනාත්මක හඬිනි.

"රෝස කරන්නෙ හුළං බැහැල වගේ...." යුවතියන් රංචුවක් අසලින් යද්දී කටකාර යුවතියකගේ හඬක් ඇසිණි. ගිම්හාන එදෙස බලද්දී සියලු දෙනාම එක්වරම හඬ නගා සිනාසෙන්නට වූහ. ගිම්හාන ද යන්තමින් සිනාසුණේය.

"අනේ පව්... තල්ලු කරල දෙන්නද...? පෙර කී යුවතිය නැවත ද ඇසුවාය.

"මාර සවුත්කුට්ටෙන මචං.... ඕක ටිකක් ස්පීඩ් කරපන්...." සංජීව කොඳුරා කීවේය.

එහෙත් ගිම්හානට ඔහු කී දෙය ඇසුණු බවක්වත් නොපෙනිණි. ඔහු නැවත ද වරක් ඕනෑකමින් යුවතියන් දෙස බැලීය. එක්තරා සොඳුරු යුවතියකගේ රුව ඔහු නෙත ගැටුණේ ඒ දෙවන බැල්මේදීය. ඔහුගේ සිත විදුලි සැරයක් වැදුණු කලෙක මෙන් තිගැස්සිණි. ඇය කෙරෙන් දෙනෙත් ඉවතට ගන්නට ඔහුට සිතුණේ නැත. ළමැදට හෙලාගෙන සිටි ගොතන ලද දිගු කොණ්ඩයෙන් ඇගේ තියුණු දෙනෙතේත්, පිරුණු දෙකපොල් සහිත මුහුණේත් කුමක්දෝ හුරු පුරුදු බවක් ඇතැයි ඔහුට සිතිණි. ඔහු නැවතත් පියවි ලොවට පිවිසියේ යුවතියන් නැගූ සිනාව නිසාය.

"මොකද ගිම්හාන උඹ හීන දකිනවද....?" සංජීව තරහින් විමසීය. යුවතියන්ගේ සිනාවට ඉලක්ක වීමට සිදුවීම ඔහුගේ කෝපයට හේතු විය.

"කලාපෙ කෙල්ලො මෝටර් බයික්වලට රැවටුණේ චින්නු කොණ්ඩෙ බැඳපු කාලෙ...... නැද්ද ගීති...?" කටකාර යුවතිය අර

සොඳුරු යුවතියගෙන් විමසුවාය. නැවත ද සිනා හඬ පාර පුරා දෝංකාර දුන්නේය. ඒ යෞවනයට පමණක් උරුම වූ දඟකාර අහිංසක බවය. එම නිසා සංජීවට මෙන් ගිම්හානට තරහක් දැනුණේ නැත.

ඔහු බයිසිකලයේ වේගය වැඩි කළේ යුවතිය දෙස බලාගත්වනමය. ඉදිරියෙන් පැමිණි බයිසිකල්කරුවා ඔහුට පෙනුණේ නැත.

"ඔන්න....." සංජීව තෑ ගැසීය. කලබල වූ ගිම්හාන සයිකලය වම්පසට හැරවීය. යුවතියන්ගේ බියමුසු කටහඬවල් ඔහුට ඇසුණේ සිහිනයෙන් මෙනි.

පසෙකට ඇළවී ගෙන ගිය මෝටර් සයිකලය පාලනය කර ගැනීමට ගිම්හාන ගත් උත්සාහය අසාර්ථක විය. සංජීවත් ගිම්හානත් දෙදෙනාම කාණුවට විසිකර දමමින් මෝටර් සයිකලය පෙරළී ගියේය. එය ඇවරිවත්ත පාර අතිශයින් ජනාකීර්ණව තිබූ මොහොතක් විය. ඇසිපිය සලන නිමේෂයකදී ඔවුන් දෙදෙනා සිටියේ මිනිස් වළල්ලක් මැදය. ගිම්හානට ඇතිවූයේ කිව නොහැකි තරමේ ලැජ්ජාවකි. බිම වැදීමෙන් වම් අතේ වැලමිටට වේදනා දුන්න ද ඔහු වහා නැගිට ගත්තේ එම නිසාය. ආරක්ෂක හිස් වැසුම තිබූ නිසා බිම වැදුණි ද හිස තුවාල වී තිබුණේ නැත. ඔහු හිස්වැස්ම අතට ගෙන හිසකෙස් සකස් කර ගත්තේය. සංජීව නැගිට්ටේ ගිම්හාන දෙස අමනාපයෙන් බලමිනි. ඔහු පළමුවෙන්ම කැමරාව පරීක්ෂා කොට බැලීය.

"ඇති යන්තම් කැමරාවට මොකුත් වෙලා නෑ....." ඔහු තමාටම කියා ගත්තේය.

"ගනින් පින්තූරයක්..... මෙච්චර කෙල්ලො ගොඩක් අපි වට කරගෙන ඉන්නකොට නාට ද ආඩම්බර.....?" ගිම්හාන වේදනාව යටපත් කරගෙන සිනාසුණේය.

"උඹ මගෙන් මොකුත් අහගන්නෙ නැතුව හිටපන්...." සංජීව රවා බැලීය.

ගිම්හාන ඔවුන් වට කරගෙන සිටි තරුණ පිරිස දෙස නොබලාම මෝටර් සයිකලය නැගිටුවන්නට වෑයම් කළේය. සැබැවින්ම ඒ පිරිසේ වැඩිපුරම වූයේ යුවතියන්ය. නැවත වරක් අර තරු දෙනෙත දකීමේ ආශාවක් ඔහුගේ සිත තුළ පොර කෑවේය. එහෙත් පිරිස අතරින් පිට වූ ඇනුම්පද නිසා ඔහු හිස එසවූයේ අකැමැත්තෙනි.

"ඔයාට තුවාලද අයියෙ....?"

දයාබර කට හඬක් ගිම්හානගේ සවන්පත් අසලින්ම නැගිණි. ඔහු හිස ඔසවා බැලීය. අනුකම්පා සහගත සිනාවක් මුවගට නගාගෙන ඔහු දෙස බලා සිටියේ අර තරු දෙනෙතේ හිමිකාරියයි. ගිම්හානගේ ළය පුරා සතුටක් මෝදු වෙමින් ආවේය.

"අපෝ නංගි ඔය වගේ අයට අනුකම්පා කරන්න එපා...... ඔයාලට ආදරේට එන අය නෙමෙයි ඔය...." පිරිසේ සිටියෙක් කෑ ගැසීය. අනෙක් අය කොක් හඬලා සිනාසුණහ.

"මූන් හිතාගෙන ඉන්නෙ අපි රස්තියාදු කාරයො කියලා..... බලපන් උඹ කෙල්ලො දිහා බලන්න ගිහින් වුණ වැඩේ......" සංජීව දෙස් කීවේය.

"ගීතිකා....... උඹ අද වැඩට යන්නෙ නැද්ද.....?"

ඔවුන්ට පෙරදින් සරදම් කළ කටකාර යුවතිය ඉදිරියට ආවාය. තරු දෙනෙත හිමිකාරියගේ නම ගීතිකා බව ගිම්හාන දැන ගත්තේය. ඔහු ඇය දෙස බැලුවේ සිනාසීගෙනය.

"වැළමිට නම් ටිකක් රිදෙනවා....." ගිම්හාන ජර්කිනයේ අත උඩට නැමුවේය. වැළමිටෙන් ලේ ගලන බව ඔහු දුටුවේ එවිටය.

"ආ.... නේ..... ලේ එනව නේද අයියෙ.....?" යුවතිය විමසුවේ බියපත් හඬිනි. මෙතෙක් අමනාප මූහුණක් පෑ සංජීව ද ළං වී තුවාලය දෙස බැලීය.

"ගිම්හාන..... සැහෙන්න තුවාල වෙලා මචං.... යමං කොහෙට හරි බෙහෙත් ටිකක් දාගෙන ඉන්න......" එවර සංජීව පැවසුවේ

කලබලයෙහි. මේ වන විට ඔවුන් වටකර ගෙන සිටි පිරිස විසිර යමින් සිටියහ. එතැන ඉතිරි වී සිටියේ ගීතිකාත් ඇය හා යෙහෙළියන් පිරිසත් පමණි. ගීතිකා ඕනෑකමින් ඔහු දෙස බැලුවාය.

"අයියගෙ නම හොඳට අහල පුරුදුයි මට......" ඇය පැවසුවේ මඳ සිනාවකින් යුතුවය.

"අහල පුරුදු නැත්තෙ මොකද.....?"

ගිම්හාන කියන්නෙ අවුරුද්දෙම එක කාලයක්නෙ....." යුවතියක් සිනාසුණාය.

"ඔයාල පත්තරෙන් නේද...?"

ගීතිකා හදිසියේ යමක් මතක් වූ කලෙක මෙන් සංජීවත් ගිම්හානත් දෙස මාරුවෙන් මාරුවට බැලුවාය.

"ඔයා කොහොමද දැන ගත්තෙ...." සංජීව පළමු වතාවට යුවතියන් සමඟ කතා කළේය.

"ඔය කැමරාව හින්දා....."

යුවතියන් ගිම්හාන සමඟ දෙඩමළු වෙද්දී සංජීව ඔවුන්ට නොදැනෙන්නට කැමරාව ක්‍රියාත්මක කළේය.

"අයියා ගිය සතියෙ පත්තරේට ලියල තිබුණු ආර්ටිකල් එක මං කියෙව්වා...... ඒක කියනවකොට මටත් හිතුණා ගිහින් එංගලන්තෙ පදිංචි වෙන්න....." ගීතිකා පැවසුවාය.

ඒ ලිපිය කුමක්දැයි ගිම්හාන මදක් කල්පනා කළේය. ඔහු එංගලන්තයේ ජන ජීවිතය අළලා ලිපි කිහිපයක්ම ලියා තිබිණි. ගිම්හාන සිතා සිටියේ එවැනි ලිපි කියවන්නේ සරසවි සිසුන් වැනි උසස් බුද්ධි මට්ටමක් ඇති අය පමණක් බවය. වෙළඳ කලාපයේ සේවය කරන්නේ වැඩි ඉගෙනුමක් නැති අය බව ද ඔහු අසා තිබිණි. විශේෂත්වය ඇත්තේ ගීතිකාගේ රූවෙහි පමණක් නොවේයයි ඔහුට සිතුණේ එනිසාය.

"ඇයි අයියා කල්පනා කරන්නෙ.....?" ගීතිකා විමසුවාය.

"මම ඇත්තම කියන්නම්කො නංගි.... මට පුදුම හිතුණා ඔයා ඒ ආර්ටිකල් එක කියෙව්වයි කිව්වම." ගිම්හාන ඔහුගේ අදහස විවෘතවම කියා පෑවේය.

"ඒ කියන්නෙ අනිත් හැමෝමත් වගේ පත්තරේ වැඩ කරන අයත් හිතාගෙන ඉන්නෙ අපි මැට්ටො කියල එහෙමද....."

ගිම්හානට එම පැනයට දිය යුතු පිළිතුරක් ගැන සිතා ගැනීමට නොහැකි විය. ඔහු ඈත මෑත බැලීය. කිත්සිරි කූල් ස්පොට්හි ඉදිරිපස සිට ගත් තරුණයෙක් ඔවුන් දෙස ඕනෑ කමින් බලා සිටියේය. ඔහුගේ දෙනෙතෙහි වූයේ නොපහන් බැල්මකි. ගීතිකා ගැන හෝ මේ කාණ්ඩයේ වෙනත් යුවතියක ගැන ඔහු උනන්දු වෙනවා ඇතැයි ගිම්හානට සිතිණි.

සංජීවගේ කැමරාවේ ගීතිකාගේ රුව කිහිප වරක්ම සටහන් වෙනවා ගිම්හාන දුටුවේය. සංජීව එලෙස ඡායාරූප ගන්නේ සැබැවින් ම රූමත් යුවතියන් ගේ පමණි. එහෙත් සිය රුව කැමරාවට හසු වෙන වග ගීතිකා දැන සිටියේ නැත.

www.sinhalalibrary.com
Uploaded By Crazzy

## 2

දෙපස ගැවසුණු කොහොඹ වැනි ගස් වලින් සෙවන සැදුණු කැනඩා මිත්‍ර මාවත අතිශයින්ම පාළු විය. හෝරාවකට දෙකකට පෙර දහස් ගණනක් යුවතියන් ගැවසුණේ මේ මාවතේම දැයි ගිම්හානට සිතා ගැනීමට පවා නොහැකි විය.

"මාර පාළුවක්නෙ මචං තියෙන්නේ...... මේ උදේ ආව පාර ද කියලත් සැකයි මට නම්....."

ගිම්හාන මෝටර් බයිසිකලය පැදවූ සංජීවට පැවසීය. බයිසිකලය පෙරළීමෙන් ගිම්හානට වූයේ සුළු තුවාලයකි. එහෙත් එය බෙහෙවින් වේදනා දුන්නේය. සංජීව බයිසිකලය පදවන්නට ගත්තේ එහෙයිනි.

"උඹට නම් පාර විතරක් නෙමෙයි අර කෙල්ල දැක්කට පස්සෙ උතුර දකුණත් අමතක වුණා කියලා තේරුණා මට...." සංජීව සරදම් කළේය.

සැණින් අර තරු දෙනෙත ගිම්හානගේ නෙත් අබියස ඇඳී මැකී ගියේය. "ඔයාට තුවාලද අයියෙ....? ඒ ගීතවත් කටහඬ සවන් අසළ නින්නාද වුණේය. සංජීවගේ මිතුරු පොලිස් පරීක්ෂකවරයා එතැන ජීප්රිය නතර නොකළේ නම් තවත් ටිකක් ඇය සමඟ දෙඩමළුවීමට ඉඩ

SL-UNLIMITED Spirit of Sri Lankans www.sinhalaelibrary.com Scanned by Crzzy

තිබ්ණැයි ඔහුට සිතිණි. ජීප් රිය ඔවුන් අසළ නැවතුණු වහාම යුවතියන් පිරිස විසිර ගියහ. ගිම්හාන පිටුපා යන ඔවුන් දෙස මොහොතක් බලා සිටියේය. ඇය තුමක්දෝ බරක් සිය සිත තුළ ශේෂ කොට ගිය බවක් ඔහුට දැනිණි.

"ගිම්හාන.... මේ මගෙ හොඳම යාළුවෙක් ප්‍රදීප්.... ප්‍රදීප් මේ අපේ පත්තරේ සබ් එඩිටර් කෙනෙක් ළහිරු ගිම්හාන සමරදිවාකර...."

සංජීව එකිනෙකා හඳුන්වා දෙද්දී ගිම්හාන සිනාවක් දෙතොලතර රඳවා ගන්නට වෑයම් කළේය.

"නම නම් හොඳට අහල පුරුදුයි.....

ප්‍රදීප් සිනාසෙමින් ගිම්හානට අත දිගු කළේය. ගිම්හානගේ වැළමිටින් ඒ වන විටත් ලේ වහනය වෙමින් තිබිණි.

"කොහොමද බයික් එක පෙරලුණේ.....?"

"ඉස්සරහින් ආව බයිසිකල් කාරයෙක් බේරන්න ගිහින් කාණුවට වැටුණා....." ගිම්හාන පැවසුවේ සංජීව දෙස ද හොරැහින් බලමිනි. සංජීව යමක් කියන්නට සූදානම් වී නැවතත් එය ගිල ගත්තේය.

"වැළමිට හොඳටම තුවාල වෙලා වගේ නේද....? ප්‍රදීප් ගිම්හාන ගේ අත දෙස ඕනෑ කමින් බැලීය.

"පොඩි තුවාලයක්...." ගිම්හාන සාක්කුවෙන් ගත් ලේන්සුව තුවාලය මත තබා තද කර ගත්තේය.

"ඔව් ඉතින් පත්තරකාරයින්ට තුවාල වෙනවා කියන එක අමුතු දෙයක් නෙමෙයිනෙ නේද සංජීව....?" ප්‍රදීප් ඇසක් වසා ඉඟි කළේය.

"පොලිසියෙන් ගුටි කාලම තමයි අපි ජීවට පුරුදු වුණේ....." සංජීව සරදම් හඬින් පැවසුවේ ප්‍රදීප් මෙන්ම ගිම්හාන ද සිනා ගන්වමිනි. ප්‍රදීප් සිය හිස් වැස්ම සකස් කර ගනිමින් සංජීවගේ උරහිස මත අතක් තැබුවේය.

"මචං හුග කාලෙකින් අපි කට්ටිය සෙට් වුණෙත් නැනෙ...... ලබන ඉරිද තිවාඩු ද උඹලට......?"

"උඹලගෙ රාජකාරිය වාගෙ තමයි අපේ රාජකාරියත්. අපිට ඕන වෙලාවට නිවාඩු නෑ....." සංජීව සිනාසුණේය.

"ලබන ඉරිද හවස පුළුවන් නම් වරෙන් ගෙවල් පැත්තෙ....."

"එහෙනම් බෝතල් දෙක තුනක් එහෙම ගෙනත් තියපන්කො.... මම මේ හදිසි රාජකාරියකට යන ගමන් උඹව දැකල නැවතුණේ. මං යනවා.... ගිම්හාන සී.යූ. ලේටර්......"

පුළුල් සිනාවක් පෑ ප්‍රදීප් සාඩම්බර ගමනින් ගොස් ජීප් රියට නැංගේය.

"ඌ මගෙත්තෙක්ක එක ක්ලාස් එකේ හිටියෙ කේරි කොලේජ් එකේදී.... යාපනේ වැඩ කළේ.... මේ ළඟදි තමයි මෙහාට මාරු කෙරුවෙ......" සංජීව ප්‍රදීප් ගැන විස්තර කළේය.

එහෙත් ගිම්හාන එයට ඕනෑකමින් සවන් දුන්නේ නැත.

ඔහු බයිසිකලයේ ඇඳ වී තිබූ පැති කණ්ණාඩිය සකස් කළේය.

"හිටපන්... හිටපන්.... මම පදින්නම්..... උඹ තවත් පැරයක් කෙල්ලෙක් දිහා බලන්න ගිහින් අඩව්වක් ඇල්ලුවොත් එහෙම මමත් අමාරුවේ....." සංජීව බයිසිකලයට නැඟුණේය. ගිම්හාන ඔහුව වළක්වන්නට වෑයම් කළේ නැත.

"උඹ හිතුව ද මං දකින දකින කෙල්ලන්ට බැල්ම දාන එකෙක් කියලා....." ගිම්හාන විමසුවේ ආරක්‍ෂක හිස් වැස්ම පැළඳ ගනිමිනි. අත ඔසවද්දී ඔහුට වේදනාවක් දැනිණි.

"අම්මේ....." ගිම්හානට කෙඳිරි ගෑවිණි. සංජීව වහා පිටුපස බැලීය.

"ඇයි මචං...."

"තුවාලෙ පුංචි වුණාට රිදෙනව හරියට....."

"යමං එහෙනම් ඉස්සර වෙලා බේත් ටිකක් දාගෙන ඉඳිමු. මීගමු පාරෙ තියෙනවා මං අඳුනන ඩිස්පෙන්සරියක්....."

"උඹත් නාඳුනන තැනක් නෑ....."

www.sinhalalibrary.com
Uploaded By Crzzz!

"එහෙම තමයි බං.... පත්තරකාරයො, කැමරාකාරයො වුණාම හැම තැනම කන්ටැක්ට්ස් තියෙන්න ඕන....."

"එහෙනම් මම නියම පත්තර කාරයෙක් මට ලෝකෙ රටවල් ගණනාවකම කන්ටැක්ට්ස් තියෙනවනෙ...." ගිම්හාන සිනාසුණේය.

සංජීව ඇවරිවත්ත හන්දියෙන් කැනඩා මිත්‍රු මාවතට බයිසිකලය හැරවීය.

කිහිප වරක්ම මේ පෙදෙසට පැමිණ ඇති බැවින් සංජීවට මේ වේලාවට පාරේ ඇති පාළු බව ද සවසටත් උදයටත් දිස් වෙන කඩිසර බවද ආගන්තුක දෙයක් නොවීය. එහෙත් පළමු වතාවට නිදහස් වෙළඳ කලාපයට පැමිණි ගිම්හානට හැම දෙයකම අමුත්තක් පෙනිණි.

"මොකද ඒ සැරේ උඹ කල්පනා කරන්නෙ....? අර කෙල්ල ගැනද.....? සංජීව පැති කණ්ණාඩියෙන් ගිම්හාන දෙස බැලීය.

"සුන්දර දේවල් ගැන විතරක්ම හිත හිතා ඉන්න තියෙනව නම් මොන තරම් දෙයක්ද බං......?" ගිම්හාන පැවසුවේ දිගු සුසුමක් ද හෙළමිනි.

ඉතා පහතින් පියාසර කළ ගුවන් යානයක හඬ පරිසරය දෙදරවීය. එය කටුනායක ගුවන් තොටුපලින් ඉහළ නගින යානයක් හෝ එයට පහත් කරන යානයක් විය යුතුයයි ගිම්හානට සිතිණි. ගුවන් යානයත් සමඟම ඔහුගේ සිතුවිලි ද ඈතට පාවෙන්නට විය.

ලන්ඩන් නුවර හීත්රෝ ගුවන් තොටුපලින් පිටත් වූ ගුවන් යානයකින් ලංකාවට ආ දිනයේ මතකය තුළ ගිම්හානගේ සිත නැවතිණ. මවගේත් පියාගේත් නැගණියගේත් මුහුණුවල වූ දුක්බර බව ඔහුට තවමත් මතකය. එහෙත් ඔහුගේ බිරිඳ පියුමිගේ මුහුණේ වූයේ දුකකට වඩා අමනාපයකි. ඔහු ලංකාවට එනවාට ඇය කොහෙත්ම කැමති වූයේ නැත.

"ලංකාවෙ පත්තරකාරයෙක් වෙන එක මෝඩකමක්...." පියුමි ඔහු අධෛර්යයට පත් කරන අදහසින් සැම විටම පැවසුවාය.

එහෙත් ඇගේ එවන් සරදම් බස්වලින් ඔහුගේ සිත සැලුණේ නැත.

"ඒ කියන්නෙ ඔයා ලංකාවට එන්නෙ නෑ මගෙත් එක්ක...?" ගිම්හාන විමසීය.

"නෑ මම ආවෙ ආයෙ ලංකාවට යන්න හිතාගෙන නෙමෙයි.." ඇය අවධාරණයෙන් කීවාය. ඇයට බල කිරීමට යාමෙන් රිදෙන්නේ තමාගේම සිත බැව් දුන සිටියෙන් ගිම්හාන නිහඬ වූයේ ය. එහෙත් ඔහු ලංකාවට පැමිණීමේ තීරණය එලෙසින් ම ක්‍රියාත්මක කළේ ය.

SL-UNLIMITED
The Spirit of Sri Lankans Community
www.sinhalaelibrary.com
Uploaded By Crzzzy

# 3

විදුලි පංකාව වේගයෙන් භ්‍රමණය වෙමින් තිබිණි. ගිම්හාන අතේ වූ සඟරාවේ පිටු කිහිපයක් පෙරළීගෙන ගියේය. සඟරාව අතේ තිබුණත් අකුරකුදු නොකියවූ බව ඔහුට වැටහුණේ එවිටය. ඔහු සඟරාව පපුව මත තබාගෙන දකුණත හිස යටින් තබා ගත්තේය. වමතේ වැළමිට තවමත් වේදනා දෙමින් තිබිණි. ඔහු අත යන්තමින් හරවා වැළමිට දෙස බැලීය. වෙළුම් පටියට උඩින් සිහින් ලේ පැල්ලමක් මතු වී තිබිණි.

"හොඳ වෙලාවට වමත තුවාල වුණේ...." ඔහු තමාටම කියා ගත්තේය.

"ඔයාට තුවාලද අයියෙ....?"

ගීතිකාගේ ගීතවත් ස්වරය සවන් අසළම නැගෙන්නාක් මෙන් ඔහුට දැනිණි. ඔහුගේ දෙතොලෙහි මන්දස්මිතයක් ඇඳිණි.

"ඇත්තටම ඒ කෙල්ල නම් හරි ලස්සනයි මචං......" තුවාල වූ අතට බෙහෙත් දමා ගැනීමට යද්දී සංජීව කී අයුරු ඔහුට සිහිපත් විය.

"උඹල ඉතින් ලස්සන බලන්නෙ කැමරාව ඇතුළෙන් විතරනෙ...... ඒකනෙ මට බැන්නෙ කෙල්ලො දිහා බලන්න ගිහින් බයික් එක පෙරළ ගත්ත කියල....."

"ඒක ඇත්තනෙ ඉතින්....." සංජීව සිනාසුණේය.

"උඹ ඕක ගිහින් ඔෆිස් එකේ කියන්න එහෙම එපා...... මට කනක් ඇහිල ඉන්න නැති වෙයි....." ගිම්හාන අනතුරු ඇඟවීය.

"මම කියන්න දෙයක් නෑ.... තුවාලෙ දැකපු ගමන් හොඳ නාඩ් එකක් වැදෙයි...."

ලිපියට අවශ්‍ය කරුණු සොයා ගත් ගිම්හාන කාර්යාලයට නොගොස් කෙළින්ම පැමිණියේ නවාතැනටය. ඔහුගේ නවාතැන පිහිටියේ නුගේගොඩ මෙල්ඩර් පෙදෙසේය. එය විසල් ගෙවත්තක් මැද පිහිටි මැදුරක වූ සුඛෝපභෝගී ඇනෙක්සියකි. නිදන කාමර දෙකක් සාලයක් හා කුස්සියකින් සමන්විත වූ මේ ඇනෙක්සිය තනිව ජීවත්වන තමාට විශාල වැඩියයි ඔහුට කෙදිනකවත් සිතුණේ නැත. එහෙත් වෙළඳ කලාපයේ යුවතියන් ජීවත් වූ නේවාසිකාගාර දෙස බලද්දී ඔහුට තමා ගැනම කළකිරීමක් දැනිණි.

"එක්කෙනෙකුට හැරෙන්නවත් ඉඩ නැති මේ බෝඩිම්වල හත් අට දෙනා ඉන්නවා කිව්වමත් මට පුදුමයි මචං...." ඔහු කියද්දී සංජීව උපහාසයෙන් මෙන් සිනාසුණේය.

"දැන් උඹට තේරෙනවා නේද උඹල සැප විඳිනවා වැඩියි කියල...."

ගීතිකා ද කොහේ හෝ එවැනි කුඩා කාමරයක සිර වී සිටින්නියක විය යුතු යයි ඔහුට සිතිණි. ඔහු ඇය සමග සිටි යෙහෙළියන්ගේ දඟකාර හැසිරීම සිහිපත් කළේය.

"මේ කෙල්ලො හිනා වෙන්නෙ මොන තරම් ප්‍රශ්න හිත ඇතුළෙ හිර කරගෙන වෙන්න ඇද්ද....? ඔහු සිතුවේ අනුකම්පාවෙනි. ඒ සමගම ඔහුට පුවත්පතට ලිවිය යුතු ලිපිය පටන් ගන්නට කදිම අදහසක් සිතට නැගිණි. ඔහු ඇඳෙන් නැගී සිටියේය.

මේසය මතවූ පියුමිගේ ඡේයාරුව ඔහු සමඟ සිනාසෙන්නාක් මෙන් විය. ඔහු ඇගේ කෙළිලොල් මුහුණ දෙස මොහොතක් බලා සිටියේය. පියුම් කැළඹුණු සයුරක් නම් ගීතිකා නිසසල විලක් යයි ඔහුට සිතිණි..

"මොකක්ද මට මේ වෙලා තියෙන්නෙ...? හීනෙන් වාගෙ එකම එක මොහොතකට දකපු කෙල්ලක් ගැන මං මෙච්චර හිතන්නේ මොනවටද.....?"

ඔහු තමාටම දෙස් පවරා ගත්තේය. එහෙත් එකම එක නිමේෂයකට දුටු අයෙකු නොව සදාකාලිකව සිතේ රැඳී උන් අයෙකු මෙන් ගීතිකා පිළිබඳව ඔහුට සිතිණි.

"පියුමි......." ඔහු සේයාරුවේ මුහුණ මත ඇඟිලි දුවවමින් මිමිණිය.

ඇය සිය බිරිඳ වුව ද අදහස් අතින් ඔවුන් දෙදෙනා මොන තරම් දුරස් දැයි ගිම්හාන සිහිපත් කළේය.

පියුමි ද කැටුව ලංකාවට පැමිණ කොහේ හෝ ගම්බද පෙදෙසක ගෙයක් මිලදී ගෙන ජීවත් වෙන්නට ඔහු සිහින මැව්ය. එහෙත් පියුමි එයට මඳ අනුබලයක් වත් නුදුන්නාය.

"මට බෑ ලංකාවට යන්න..... මම එහෙන් ආවෙ ආයෙ යන්න හිතාගෙන නෙවෙයි,...." ඔහු ලංකාවට ඒම ගැන කියන හැම විටකම ඇය මුරණ්ඩු ලෙස තෙපළාය.

"ඒ වුණාට මම කැමතියි ලංකාවට...."

"කැමතිනම් ඔයා යන්න....."

ඇය සැහැල්ලු ලෙස කියද්දී ඔහු ඇය දෙස රවා බැලීය.

"ඔයා කාටද ඔය කතා කරන්නෙ.....?"

ඔහු කෝපයට පත් වූ බව වටහාගත් පියුමි සුරතල් ලෙස ඔහුගේ ඇඟේ දැවටුණාය. කොට කලිසමකින් හා අත් හැති ටී ෂර්ටයකින් සැරසුණු ඇයගෙන් දිස් වූයේ දඟකාරී බවකි. අලුත්ම මෝස්තරයට කැපූ කෙටි කොණ්ඩය නළලත වැටී තිබුණේ ඒ දඟකාරී බව වඩාත් ඉස්මතු කරවමිනි. තවදුරටත් සිත තුළ කෝපය රඳවා ගැනීමට ඔහුට නොහැකි විය.. ඔහු ඇගේ බඳ වටා දෑත යැව්වේය.

"මං ලංකාවට ගියොත් ඔයාට පුළුවන් ද තනියම මෙහෙ ඉන්න.....?"

"ලන්ඩන්වල මොකක්ද තියෙන තනිය.....?" ඇය ඔලොක්කුවට මෙන් සිනාසුණාය.

"ඔව්... ඔයාට නම් තනියක් නෑ තමයි..... ෆ්ලැට් එකේ ඉන්න ඔක්කොම කොල්ලො එන්නෙ නැතෑ තනි රකින්න......" ඇය අත හළ ඔහු කාමරය දෙසට ගියේ අමනාපයෙනි.

"ඔන්න, ඔන්න ඉරිසියා හිතුණා....." පියුමි පිටුපසින් දිව ගොස් ඔහුගේ ගෙල බදා ගත්තාය. "ඔයා ලංකාවට ගිහින් තපස් රකිව් කියල විශ්වාස කරන්නද මට කියන්නෙ. මම දන්නවනෙ කොල්ලගෙ හැටි...."

"ඒක හින්ද තමයි මං කියන්නෙ ඔයාටත් මගෙත් එක්ක එන්න කියල....." ඔහු එවර පැවසුවේ දැඩි හඬකිනි. ඔහුගේ ගෙල මත රැඳී තිබූ දෑත මුදා ගත් පියුමි වෙහෙස වූ නියායෙන් ගොස් අසුනකට බර වුණාය.

"මට බෑ ගිම්හාන......" ඇය පැවසුවේ ස්ථිර හඬිනි. "මට බල කරන්න එපා...."

"ඒ කියන්නෙ ඔයා මට ආදරේ කරන්නෙ බොරුවට......?"

ඔහු ආපසු හැරී ඈ දෙස බැලීය.

"ඇයි ඔයා එහෙම කියන්නෙ......?"

"මට ආදරේ නම් ඔයා කොහොමද ඔය විදියට කතා කරන්නෙ......? ඔයා කොහොමද ඔයාව දල මට යන්න කියන්නෙ......?"

"ඔයාට ආදරේ කියල ඔයා කරන මං අකමැති හැම දෙයක්ම අනුමත කරන්න කියල ද කියන්නෙ.....?" ඇය උස් හඬින් විමසුවාය. ඇගේ කම්මුලට ගැසීමට සිත තුළ ඇති වූ ආවේගය පාලනය කර ගත් ගිම්හාන කාමරයට වැදී දොර වසා ගත්තේය.

එදා සිටම පියුමිත් ගිම්හානත් අතර වූයේ යහපත් වාතාවරණයක් නොවේ. ඔහු ලංකාවට එන්නට ඉක්මන් වූයේ ද එනිසාමය. පියුමි මේ මොහොතේ කුමක් කරනු ඇද්දැයි ඔහු සිතුවේය.

හදිසියේම නාද වූ ටෙලිෆෝනය ඔහුගේ අවධානය වෙනතකට යොමුකරලීය. පියුමිගේ සේයාරුවෙන් දෙනෙත මුදාගෙන ඔහු ටෙලිෆෝනය වෙතට ගියේ සුසුමක් ද හෙළමිනි.

• • • •

ගිම්හානගේ පෑන වේගයෙන් කඩදාසිය මත දිව යන්නට විය. පෙරදා ලිපිය ලිවීමට ඇරඹුව ද හදිසියේම පියුමිගෙන් ලැබුණු දුරකථන ඇමතුම නිසා එය සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය. උදෑසනට කාර්යාලය මී මැසි ගුලක් සේ කඩිසරය. තත්පරයක් පාසා හැඬවෙන දුරකථනය නිසා කාර්යාලයේ මොහොතක නිහඬ බවක්වත් නොවිය. මෙවන් වාතාවරණයක සිට ලිවීම පහසු නැත. එහෙත් ප්‍රධාන කතුතුමාගෙන් බැණුම් අසන්නට වෙතැයි බියෙන් ඔහු අත ඉක්මන් කළේය.

"ඒයි, මචං ගිම්හාන....."

සංජීවගේ උස් කටහඬ කාර්යාලයේ ඝෝෂාව තුළින් නැගී ආවේය. ගිම්හාන හිස ඔසවා බැලීය. කැමරා බෑගය ද කරේ එල්ලා ගත් සංජීව ගිම්හානගේ මේසය අසළට ආවේ සිනාසෙමිනි. ඔහු බෑගය මේසය මත තබා මේසයේ කෙළවරක වාඩි ගත්තේය. ගිම්හාන පෑන රැඳි අත හිස කෙස් අතරින් යවමින් සංජීව දෙස කුතුහලයෙන් බැලීය.

"මොකද උඹ අද රජගෙදර පරෙවියා වාගෙ......? අර හොල්මනවත් මීට වුණාද මගදී......?"

ගිම්හාන අදහස් කළේ නිශාන්තිය. සංජීව දෙබැම හකුළුවා ගත්තේය.

"ඔව් ඉතින් අපිට ඉන්නේ හොල්මන්..... උඹලට වාගේ සුර කුමරියො නැනෙ අපිට....."

"උඹට ඇත්ත කිව්වම මොකද ඔච්චර කේන්ති එන්නෙ.....?" ගිම්හාන පෑන වසා තබා සුව පහසු ලෙස පුටුවට හේත්තු විය.

"නෑ කේන්ති ආවෙ නෑ...... මොකද අපේ එඩිටර් හැම වෙලාවෙම කියනවනෙ මීනියක් මරල හරි ඇත්ත කියන්න කියල....." සංජීව ඇසක් වසා ඉඟි කළේය.

"කරුමෙට තවම අපි අතින් මිනියක් මැරුණෙ නෑ.... නැත්තම් බලන්න තිබුණා ඇත්ත කීවම වෙන වැඩේ...... ඒක නෙමෙයි...... මොකද උඹ මේ ලොකු ජොලියකින්......?"

www.sinhalalibrary.com

"උඹ දන්නවද.....? මම අර ෆිල්ම් රෝල ප්‍රොසෙස් කළානෙ...." සංජීව පැවසුවේ ඉතා විශාල කාර්යයක් ඉටු කළ අයෙකුගේ හඬිනි. ගිම්හාන අත්පුඩි ගසා සිනාසුණේය.

"ගිම්හානගෙ ජීවිතේට වසන්තයක් උදා වෙලා වගේ මිහ සද්දෙට හිනා වෙන්නෙ......" අසල මේසයේ සිටි සරිතා හැරී බැලුවාය.

"උඹලට අපි හිනා වුණත් වැරදියි.... හිනා නොවී හිටියත් වැරදියි....." සංජීව පැවසීය.

"මම කිව්වෙ ගිම්හානට..... ඔයාට නෙමෙයි......" සරිතා මුහුණ අඳුරු කර ගනිමින් පැවසුවාය. ගිම්හානට තවත් හිනා ගියේය.

"මොකද උඹ හිනා වෙන්නෙ......?" සංජීව ගිම්හාන දෙස බැලුවේ නොරිස්සුම් සහගත බැල්මකිනි.

"හිනා යන්නෙ නැද්ද.....? හරියට මහ ලොකු වැඩක් කළා වගේ ෆිල්ම් රෝලක් ප්‍රොසෙස් කළා කියනකොට.....? උඹ හිතුවද ඕක පත්තරේ දන්න තරම් නිවුස් එකක් කියල......?"

"යකෝ..... මං කිව්වෙ අර කටුනායකදි ගත්ත පින්තූර ටික......"

"ආ ඔහොම කියපන්කො....." ගිම්හාන පුටුවේ ඉදිරියටත් පසුපසටත් පැද්දුණේය. "කොහොමටත් අද පින්තූර ටික ඕන.... මම දැන් මේ ආර්ටිකල් එක ලිය ලියා ඉන්නෙ....."

"අර කෙල්ල ගැනත් ලිව්වද.....?"

සංජීව සරදම් සිනාවක් මුවට නංවා ගනිමින් ගිම්හාන ලියමින් සිටි කොළය දෙසට එබී බැලුවේය. ගීතිකා ගැන සිහිපත් කරද්දී ගිම්හානගේ මුහුණේ සිනාව වියැකී ගියේය. පුටුවේ පැද්දීම ද ඉබේම නතර විය. ඔහු සුරතින් නළල පිරිමදිමින් දිගු සුසුමක් හෙළීය.

"කවුරු හරි ඔහෙ කෙල්ලක් සෙට් වෙලා ඇති...... දැන් කෝල් එකක්වත් දෙන්නෙ නැත්තෙ මට......" පෙර දින දුරකථනයෙන් ඇමතූ පියුමිගේ වදන් ඔහුට සිහිපත් විය. සැබැවින්ම ලංකාවට පැමිණි ද සිට මේ වන තෙක්ම ඔහුගේ සිතේ කිසිඳු යුවතියක ගැන හැඟීමක් ඇති

වූයේ නැත. යන්තමින් හෝ පහන් හැඟීමක් ඇති වූයේ ගීතිකා ගැන පමණකි. එය ද සිහිනෙක් ගෑ සුවඳක් මෙන් මායාවකි. එහෙත් එදිනම පියුමි එවන් චෝදනාවක් කළේ ඔහුගේ සිත හැඳිනගෙන ද?

"එහෙම සෙට් වුණොත් ඔයා මොනව කරන්නද?" ඔහු අභියෝගයකට මෙන් පියුමිගෙන් විමසීය.

"අනේ මම මොනව කරන්නද? මයි කන්ග්‍රැජුලේෂන්ස් කියල අයින් වෙනව මිසක්....."

"ඔව් එහෙම කරන්න ඔයා නම් ආස ඇති තමා......" ඔහු පැවසුවේ තරහිනි.

"උඹට නම් හොඳ නෑ ගිම්හාන හැදිල තියෙන ලෙඩේ......" සංජීව ගිම්හානගේ උරහිසට පහරක් ගැසීය. ගිම්හාන තිගැස්සිණි. ඔහු සිනාවක් මවා ගන්නට උත්සාහ කරමින් සංජීව දෙස බැලීය.

"අර කෙල්ලව මතක් කරපු ගමන් උඹ හීන ලෝකෙකට යනවා.... මොනවා වුණත් නියම කෙල්ල මචං......" සංජීව පැවසුවේ සරිතා දෙසද නෙත් කොන් බැල්මක් හෙළමිනි.

"මමද ?" සරිතා ගවුම් කොළරය ඔසවා ගනිමින් ඔවුන් දෙස බැලුවාය.

"අපොයි ඔව්... තමුසෙ හොඳයි අහස ගොරවන වෙලාවට මිදුලට තල්ලු කරන්න....."

සංජීව මහ හයියෙන් සිනාසුණේය. සරිතා අසල තිබූ කඩදාසියක් ගුලි කොට ඔහුට දමා ගැසුවාය.

"ඇත්තමයි මචං.... විහිළුවක් නෙමේ මේ කරන්නෙ........ කෙල්ලට හොරෙන් වුනත් ගත්ත පින්තූර ටික නියමයි....... මං හිතාගෙන ඉන්නෙ එකකින් කවර් පේජ් එකක් කරන්න..."

"කෙල්ල ගෙන් ගුටි කන්න වෙයි ද දන්නෙ නෑ..." ගිම්හාන සිනාසුණේය.

"පිස්සුද මචං.. උන්ට කවදා ඔය වගේ චාන්ස් එකක් ලැබිලද..? පැනලා කැමති වෙයි.." සංජීව පැවසුවේ දැඩි විශ්වාසයකිනි.

• • • •

www.sinhalalibrary.com

# 4

SL-UNLIMITED
www.sinhalaelibrary.com
Uploaded By Crzzzy

සුන්දර වූත් චමත්කාර ජනක වූත් නැවුම් සිතුවිලි කැලතක් ගීතිකාගේ සිත තුළ සැරිසරමින් තිබිණි. ඒ සිතුවිලි වලින් ඇය ලැබුවේ අපමණ ආස්වාදයකි. බෝඩිම කාමරය තුළ කිසිවෙකු නොවීය. සේනානි නාන්නට ගොස් සිටියාය. ප්‍රියන්තිත් නිර්මලාත් තවම පැමිණ සිටියේ නැත. ගීතිකා කොට්ටයක් ද උකුල මත තබාගෙන බුරු ඇඳේ වාඩි වී බිත්තියට හේත්තු වුණාය.

මෙවන් සැහැල්ලු බවක් ඇගේ සිතට දැනුණේ කාලයකට පසුවය. ඒ සැහැල්ලු බවට හේතු වූයේ කුමක්දැයි ඇය යළි යළිත් සිතා බැලුවාය. ළහිරු ගිම්හාන සමරදිවාකරගේ රුව ඇගේ සිත කොනක ඇඳිණි. එහෙත් ඔහු සිහිනෙන් දුටු රුවක් හා සමානය. හමු වී වචන කිහිපයක් කතා කළ සැණින් ඔවුහු ඈත් වූහ. හමුවීමත් වෙන්වීමත් අතර වූයේ නිමේෂයක කාලයක් පමණකි. සැබැවින්ම ජීවිතය නිම වී තිබෙන්නේ මේ හමුවීම් සහ වෙන්වීම්වලින් පමණක් යයි ඇයට සිතිණි. ඇය දිගු සුසුමක් හෙළුවාය. සිතට දැනෙමින් තිබූ සැහැල්ලු බව අතුරුදන් විය.

ඉබේටම මෙන් ගීතිකාගේ අත යැවුණේ මේසය මත වූ අත් බෑගය වෙතය. ඇය අත් බෑගය විවර කොට දිනපොත අතට ගත්තාය. එහි මුල්ම පිටුවේ අලවා තිබුණේ නිලන්තගේ උඩුකය ජේයාරුවකි.

ඔහු සිනාසෙමින් ගීතිකා දෙස බලා සිටියේය. එහෙත් ඒ සිනාව තව දුරටත් තමා සතු නොවන බව ගීතිකා දැන සිටියා ය. නොදැනුවත්වම ඇසට ඉනු කඳුළු කම්මුල දිගේ ගලාගොස් සේසාරුව මත පතිත විය. ඇය සේසා රුවට හානියක් නොවන ලෙස ඒ කඳුළ පිස දැමුවාය. තුන් වසරක පෙම් කතාව නිම වූයේ ඇයට මේ සේසාරුවත් මතකයත් පමණක් තිළිණ කරමිනි.

"ඔන්න මං නොකිව්වා කියන්න එපා ගීති..... ඔය රස්සාවට ගියොත් එහෙම ආයෙ ඔයාගෙයි මගෙයි කිසිම සම්බන්ධයක් නෑ...." ඔහුගේ අවවාදාත්මක තර්ජනය තවමත් ඇගේ සවන් පත්ලේ රැඳී ඇතුවාක් මෙනි.

වෙල්යාය කෙළවර ගල්තලාව මතට වී දෙඩමළු වූ ඒ නිසල සැඳෑව ඔවුන්ගේ අවසන් හමු වීම වේයැයි ගීතිකා සිහිනයකින් හෝ සිතුවේ නැත. බැස යන හිරුගේ රන්වන් රැස් දහර තැවරුණු ඔහුගේ මුහුණ දෙස ඇය ආයාචනාත්මක බැල්මක් හෙලුවාය.

නිමේෂයකට ඔවුන්ගේ සිව් නෙත් පැටලිණි. වෙල්යාය සිපගෙන ආ සුළඟ ගල්තලාවට ඉහළින් වූ කුඹුක් ගසෙහි අතුපතර සොලවාලිය. ගිලිහී වැටුණු කුඹුක් කොළයක් ඇගේ දිගුවන් වරලසෙහි රැඳිණි. නිලන්ත සීරුවට ඒ කුඹුක් කොළය අතට ගත්තේය.

"මං කියන දේ පොඩ්ඩක් අහන්න ගීති....." ඔහු එවර කතා කළේ මුදු ස්වරයෙනි.

"මොකක්ද නිලන්ත ඔයා මට කරන්න කියන්නෙ.....?" ඇය හිස ඔසවා ඔහුගේ මුහුණ දෙස බැලුවාය. ඔහු අත වූ බට නලාව පසෙකින් තබා ඇගේ දෑතින් අල්ලා ගත්තේය.

"ඔයාට කැම්පස් යන්න මදි වුණේ ලකුණු හතරක් පහක් විතරනෙ.... ඔයා ආපහු එග්සෑම් කරන්න... ඊට පස්සෙ හොඳ රස්සාවක් හොයා ගන්න බැරියැ....."

"හොඳ රස්සාවක් ලැබෙනව නම් මේ ඉගෙන ගත්ත තරම මදැයි නිලන්ත... ඇප්ලිකේෂන් රාත්තල් ගණනක් දැම්මට පස්සෙයි මේ රස්සාව හරි ලැබුණෙ. ඉතින් ඇයි ඔයා මට යන්න එපා කියන්නෙ...."

ඇය බැගෑපත් ව විමසුවා ය.

ගීතිකාට කටුනායක වෙළඳ කලාපයේ රැකියාව ලැබුණේ කලක් එකම පන්තියේ ඉගෙනුම ලැබූ සේනානිගේ මාර්ගයෙනි. සේනානි මුල් වරට සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමෙන් අනතුරුව කලාපයේ රැකියාවකට ගියාය. එහෙත් ඇයත් ගීතිකාත් අතර වූ මිතුදම නොනැසී පැවතිණි. රැකියා ප්‍රශ්නය ගැන ගීතිකා සේනානිට ලියා යැව්වේ නිකමටය.

"අපේ ෆැක්ටරියට නම් නුපුහුණු සේවිකාවො ගන්නවා. ඒත් ඔච්චර හොඳට ඉගෙන ගත්ත ඔයාට මේ වගේ රස්සාවක් ගැලපෙන්නෙ නැහැ....." සේනානි ලියා එවා තිබිණි.

එහෙත් ඒ වන විට ගීතිකාට අවශ්‍ය වී තිබුණේ කුමක් හෝ රැකියාවකි. නංගිලා දෙදෙනාත් මල්ලිලා දෙදෙනාත් ඇයත් ජීවත් කරවීමට කුලී වැඩ කරමින් මවත් පියාත් දරන උත්සාහය දෙස ඇය බලා සිටියේ අපමණ වේදනාවෙනි. ගීතිකා සේනානි විසින්ම එවන ලද ඉල්ලුම් පත්‍රයක් පුරවා යැව්වේ නිලන්තටවත් නොකියාමය.

රැකියාව ලද දින ගීතිකා පස්වනක් ප්‍රීතියෙන් ඉපිලී ගියාය. එහෙත් එය ඇසූ විගස නිලන්ත කෝපයට පත් විය.

"මං එපා කියන්නෙ වෙන හේතුවක් නිසා නොවෙයි.... බලන්න ඔය වෙළඳ කලාපෙ කෙල්ලො ගැන මිනිස්සු කියන කතා.... ඔයාටත් ඒ විදිහෙ කතා හැදෙනව දකින්න මම කැමති නෑ...." නිලන්ත පැවසුවේ ඔහුගේ දෑතෙහි රැඳී තිබූ ඇගේ දෑත මුදා හරිමිනි. ඇය ඒ දෑත ඔහුගේ දණහිස් මත තබාගෙන ඔහු දෙස බැලුවාය.

"මාව තේරුම් ගන්න නිලන්ත...." ඇය කීවේ බැගෑපත් හඬිනි.

"මං දන්නවා ඔයා කියන්න යන්නෙ මොකක්ද කියලා.... දුප්පත්කම හැමදාම තියෙන එකක් නෙමෙයි ගීති... ඒ හින්ද මං කියන දේ අහලා ඔයා ආපහු එග්සෑම් කරන්න......"

"අම්මයි, තාත්තයි විඳින දුක දිහාව බල බලා තවත් ඒ අයට බරක් වෙන්න මට බෑ නිලන්ත..... එහෙම කරන්න කියලා මට බල කරන්නත් එපා...... අනිත් එක තමන් හොඳනම් ඕන තැනක ඉන්න පුළුවන්..." ඇය

දැඩි හඬකින් පැවසුවාය. ඇය කිසිම දිනයක නිලන්ත ඉදිරියේ එවන් ස්වරයකින් කතා කොට නැත. නිලන්ත පුදුමයෙන් මෙන් ඇය දෙස බලා සිටියේ එහෙයිනි.

"රස්සාව ලැබුණු ගමන්ම ඔහොම නම් රස්සාවට ගියාට පස්සෙ ඔයා කොච්චර වෙනස් වෙයි ද කියල මට හිතා ගත්තැකි..... ඔයාට ඕන දෙයක් කරගන්න අද ඉඳන් නිදහස තියෙනවා. ගීති ....." නිලන්ත ඔහුගේ දණහිස් මත වූ ගීතිකාගේ දෑත් ඉවත් කොට නැගී සිටියේය. ඔහු නැගී සිටි දයා විරහිත ස්වභාවය ඇගේ දෑසට කඳුළු ගෙනාවේය. එහෙත් ඇය සිත දැඩි කර ගත්තාය. ඔහු බට නළාව ද රැගෙන වෙල් නියර දිගේ ඈතට පියමන් කළේ වරක්වත් ඇය දෙස නොබලාමය. සැන්දෑ අඳුර කුරු ගාමින් දසතින්ම ඇදී එමින් තිබිණි. ඒ ගීනි අඳුර යටින් ඔහු නොපෙනී යන තුරු බලා සිටි ගීතිකා ඉකිබිඳ වැලපුණාය.

"මොකද බං මේ.....?" සේනානිගේ කටහඬ සවන් අසළින්ම නැගී ආවේ ය. ගීතිකා තිගැස්සී හිස එසෙව්වාය. සේනානි කෙටි කොණ්ඩයේ වතුර ගැසුවේ ගීතිකාගේ මුහුණට වීසි වෙන පරිදිය. එහෙත් ගීතිකා සිටි තැනින් මඳක් වත් නොසෙල්වුණාය.

• • • •

පියුමි සමග දුරකථනයෙන් කළ කතාබහෙන් පසුව ගිම්හානගේ සිතට සියුම් කළකිරීමක් බඳු හැඟීමක් දැනෙමින් තිබිණි. විනාඩි කිහිපයක්ම ඇය හා කතා කළ ද ඔහු නොමැතිව පාළුවක් දැනෙන බව හෝ ඔහුට ඉක්මනින් ආපසු එන ලෙස හෝ ඒ කතාවේ කිසිදු තැනක ඇය සඳහන් නොකළාය.

ඔහු පුටු ඇන්දට හේත්තු වී පුරතින් නළල පිරිමැද ගත්තේය. විදුලි පංකාවෙන් හමන සුළඟ මේසය මත වූ කොළ ඒ මේ අත විසුරුවා දැමීය. එහෙත් කොළ ටික එකට ගොනු කොට ඒ මත බරක් තැබීමට පවා ගිම්හානට සිතුණේ නැත. නිතර නිතර හිසකෙස් අතරින් අතැඟිලි

යවා පිරිමැදීම ගිම්හානගේ පුරුද්දක් විය. එම නිසාම ඔහුගේ හිසකෙස් අවුල් වී නළලතට වැටී තිබිණි. උදෑසන අවදි වූ විගසම ඔහුගේ හිසකෙස් එහා මෙහා කොට නළලත සිපගැනීම පියුමි සිරිතක් වශයෙන් කළාය. ඒ සිරිත කඩ වූයේ ඔහුත් ඇයත් අතර ගැටුම් ඇති වෙන්නට පටන් ගත් කලය. පියුමිගේ දෙතොල් පහස තවමත් නළලතේ තැවරී ඇති සෙයක් ගිම්හානට දැනිනි.

ලන්ඩන් නගරයේ තට්ටු නිවාස සංකීර්ණයක වූ සිය නිවෙස සිහිපත් වෙද්දී සිහින් දුකක් වැනි හැඟීමක් ගිම්හාන ගේ සිත තුළට පිවිසිණි.

සුව පහසු යුගල ඇඳේ දඟකාරී ඉරියව්වකින් වැතිරී රිසිවරය කණේ තබාගත් පියුමිගේ රුව ඔහුට මැවී පෙනිණි. ගිම්හාන ඇඳේ වැතිර සිටියදී දුරකථන ඇමතුමක් ලැබුණ හොත් ඇය එයට පිළිතුරු දුන්නේ ඔහුගේ ළය මත හිස තබාගෙනය. දැන් පියුමි යුගල ඇඳ බෙදා ගන්නේ කවුරුන් සමග දැයි ඔහු සිතුවේය. ඒ සිතුවිල්ල පවා ඔහුගේ සිත කළඹාලන්නට සමත් විය. එරික්, සුසිත්, ශෙහාල්, ආදී පියුමිගේ සමීපතම මිතුරන්ගේ රූ ඔහුගේ මනසේ ඇඳිණි. ශ්‍රී ලාංකික මෙන්ම විජාතික මිතුරන් ද ඇය එකසේ සමීපව ඇසුරු කළාය.

"උඹ නම් සමහර විට එහේ ගිහින් තපස් රකීවි..... ඒත් පියුමි නම් එහෙම කරන එකක් නෑ...."

කාඩිෆ් පෙදෙසේ පිහිටි ඔහුගේ මව්පියන්ගේ නිවසේ පැවැති සමු ගැනීමේ සාදයකදී මිතුරකු කී වදන් ගිම්හාන අකමැත්තෙන් වුව ද යළිත් සිහිපත් කළේය. ඔහුගේ සිත වඩාත් සසල විය. සැබැවින්ම ඔහු සමග ලංකාවට ඒමට ඇය අකමැති වූයේ නිදහසේ කටයුතු කිරීමට අවශ්‍ය නිසාදැයි ඔහු සිතුවේය.

"කෝල් එක ආව වෙලාවේ ඉඳන්ම ගිම්හාන කල්පනා කරනවා.... ඇයි මොකක් හරි අප්සෙට් එකක් ද......?" සරිතා ගිම්හානගේ මේසයට දෙවැලම්ට තබා ඔහු දෙසට නැඹුරු වූවාය. ඔහුට රෝසමල් සුවඳක් දැනිණි. ඒ සරිතා තවරා තිබූ යම් විලවුනක සුවඳය. පියුමි ගල්වන මිල අධික විලවුනක සුවඳ ඔහුට සිහිපත් විය.

"ඇත්තටම මොකද ගිම්හාන.....?"

"මොකුත් නෑ....." ඔහු මඳ සිනාවක් මුවග තවරා ගනිමින් සරිතා දෙස බැලීය.

"සරිතා...... ළං වෙලා හිටියට වැඩක් නෑ...... මිනිහ බැඳල....." ධනුක කෑ ගැසීය.

"බැඳපු මිනිස්සු ළඟටම යන්නෙ මේ තනිකඩ අපි දිහා බැලුවම නරකද......?"

කාර්යාලය පුරා සිනා හඬ පැතිරී ගියේය. සරිතා ඉඟ ගස්සාගෙන මේසය වෙතට ගියාය. ගිම්හානගේ සිතට මෙතෙක් දැනෙමින් තිබූ කැළඹිලි සහගත බව ක්‍රමයෙන් අඩු වීගෙන ගියේය. සැබැවින්ම කාර්යාලයේ ගෙවෙන කාලය මොන තරම් සැහැල්ලු බවකින් යුතුදැයි ඔහු සිතුවේය.

"රෑං පෙන්න කැරකෙනවා.... හාෆ් සීට් ඉගිලෙනවා...... ඉගිලෙනවා...... ඉගිලෙනවා...... ඉගිලෙනවා......" ගිම්හානගේ කොළ සුළඟේ පාවෙනු දුටු මහේෂ් ගායනා කළේය.

"මොකද මචං.... ඉගිලි ඉගිලි එක තැන කැරකෙන්නේ....." ගිම්හාන විමසීය.

"ඒ තැටියේ දෝෂයක්....."

"ඔව් ඔයාගේ පරණ තැටියේ කොහොමටත් දෝෂ තමයි...." සරිතා පැවසුවේ මහේෂ්ගේ හිස දෙස බලමිනි. මහේෂ් පිටුපසින් තට්ටය පෑදීගෙන එන සිය හිස පිරිමැද ගත්තේ සියල්ලන්ගේම සිනාහඬ මැදය. එවිටම සංජීව කාර්යාලයට ඇතුළු විය. සිය මේසය වෙතට නොගොස් කාර්යාලය සිසාරා බැල්මක් හෙලූ ඔහු ද සිනාසෙන්නට පටන් ගත්තේය.

"මේ මොකද හිටිය ගමන් උඹට හැදුණු පිස්සුව......?" ධනුක කෑ ගසා විමසීය.

"උඹල ඔක්කොම හිනා වෙද්දි මට විතරක් බකං නිලාගෙන ඉන්න පුළුවනෑ.... ඉතින් මාත් ඔහෙ හිනා වුණා...." සංජීවගේ සැහැල්ලු කටහඬ සිනාව වැඩි කළේය.

"උඹට ලස්සන දෙයක් පෙන්නන්න මොනවද උඹ මට දෙන්නෙ....?" සිනා හඬ යන්නමින් සංසිඳී යද්දී ගිම්හාන අසලට පැමිණි සංජීව විමසීය.

"මට පෙන්නන්න තරම් ලස්සන දෙයක් කොහෙද උඹ ළඟ තියෙන්නෙ.....?" ගිම්හාන සරදම් හඬින් සිනාසුනේය.

"ඒ වුණාට මේක දැක්කම උඹ එහෙම කියන එකක් නෑ....." සංජීව බෑගයෙන් පිටතට ගත් පිංතූර කවරයක් ගිම්හානගේ මේසය මතට හැලීය.

ගිම්හාන එතරම් උනන්දුවකින් තොරව එදෙස බැලීය.

ඒ සමගම ඔහුගේ දෙනෙත් විස්මයෙන් විවර වීණි.

"ඍ........." ඔහුට කියවුනේ ඉබේටමය. ගීතිකාගේ මුහුණේ විවිධ ඉරියව් ඒ ජේයාරු වල රැඳී තිබිණි. සැබැවින්ම ඇගේ පියවි රුවට වඩා වැඩි සුන්දර බවක් ඒවායේ දිස් විය.

"ඒකි හරි ෆොටෝ ජෙනික් නේද.....?"

ගිම්හාන නැවත නැවතත් ජේයාරු දෙස නෙත් හෙළීය.

"උන්ගෙ ලස්සන නෙමෙයි අපේ දක්ෂකම...." ආඩම්බර හඬකින් කියමින් සංජීව කමිස කොලරය ඔසවා ගත්තේය.

"අපොයි ඔව්.... එහෙමවත් කියපන්කො......" ගිම්හාන සිනාසුණේ ය.

• • • •

"ගීතිකා .... ගීතිකා...."සේනානි දඩි නොඉවසිල්ලකින් මෙන් කෑ ගසමින් කාමරයට ඇතුළු වූවාය. ගීතිකා අතේ වූ පොත පසෙක තබා නැගී සිටියාය. සේනානිගේ කටහඬෙහි වූ නොඉවසිලිමත් බව ඇයගේ සිතට බියක් බඳු හැඟීමක් ඇති කළේය. සේනානිගේ මුහුණ දහදියෙන් තෙත්ව හිසකෙස් අවුල්ව තිබිණි.

"මොකද උඹ බය වෙලා වාගෙ.... හොල්මනක්වත් දැක්ක ද මගදී....?" ගීතිකා සේනානි දෙස කුතුහලයෙන් බැලුවාය. එවර සේනානිගේ මුහුණේ සිනාවක් විසිරිණි. ඇය අත් බෑගය පසෙකට වීසි කොට දමා ගීතිකාගේ ගෙල වටා දෑත යැව්වාය.

"ඕ.ටී. කරන්න යනව කියල ගිහින් තියෙන්නෙ වෙන කොහේ හරි මට පේන්නෙ..... නැත්තම් මොකද මෙච්චර විසේ.....?" ගීතිකා සේනානිගේ දෑත ඉවත් කරන්නට උත්සාහ කළාය.

"අද ඉරිදනෙ..... රංග එන්න ඇති ෂුවර් එකටම....."

"ඉරිදු දවසකවත් එච්චර ජොලියෙ ඉන්න වාසනාව තියෙනවද බං අපිට.....?" සේනානි ගීතිකාගේ ගෙල මුදා හැර ඇඳ මත වාඩි ගත්තාය.

"හේ.... යි ගීතිකා..... උඹ නිකමටවත් අපිට කිව්වෙ නෑ නේද......?" ප්‍රියන්තිත් නිර්මාලත් දෙදෙනාම කාමරයට කඩා වැදුණෙ එක්වරමය. ගීතිකාට කිසිම දෙයක අගමුල වටහා ගත නොහැකි විය. ඔවුන් තිදෙනාම කුමක් හෝ රහසක් සඟවාගෙන සිටිතැයි ඇයට සිතිණි.

"මොකද උඹලට අද වෙලා තියෙන්නෙ.....?" ඇය දෙබැම හකුළුවාගෙන ඔවුන් දෙස බැලුවාය.

"නිකම්ම කියන්න බෑ ඔය වගේ සුබාරංචියක්...... ඉස්සර වෙලා කියක් හරි ඉල්ල ගන්න ඕන....."

"කියන දෙයක් කියපල්ලකො මෙතන පිස්සු නටන්නෙ නැතුව....." ගීතිකා නොඉවසිල්ලෙන් දෑත ගැසුවාය.

නිර්මලා අත් බෑගයට අත දමා හතරට නැමූ පුවත්පතක් එළියට ගත්තාය. ගීතිකා ඇය දෙස බලා සිටියේ නොපහන් දෑසිනි. ඔවුන් තිදෙනාම එක් වී කුමක් හෝ රැවටිල්ලක් කරන්නට උත්සාහ කරන බවට හැඟීමක් ඇගේ සිතේ ඇති විණි. ඇය ඔවුනට පිටුපා මේසය අසලට ගියාය. ඒ කුඩා කාමරයේ ඉඩ තිබුණේ ඔවුන් සිව් දෙනාට යන්නමින් එහා මෙහා හැරෙන්නට පමණි. සේනානි විහිළුවට කියන්නේ කාමරය මැද සිටගෙන බිත්ති හතරම ඇල්ලිය හැකි බවය.

"මේ තියෙන්නෙ.... බලපන්...." නිර්මලා ගීතිකා පිටුපසින් සිටගෙන ඇගේ කර දෙපසින් දෑත දමා පුවත්පත මුහුණට ළං කළාය. ගීතිකා එදෙස බැලුවේ නිර්මලාගෙන් මිදෙන්නට නොහැකි නිසා මිස උනන්දුවකින් නොවේ. එහෙත් පුවත්පත දුටු සැණින් ඇගේ දෑස් විකසිත විණි. ඇය වහා පුවත්පත උදුරා ගත්තාය. යෙහෙළියන්ගේ

සිනා හඬ කාමරය පුරා දෝංකාර දුන්නේය. එහෙත් ගීතිකාට ඒ සිනාහඬ නෑසිණි. ඇය විකසිත කරගත් දෙනෙතින් යුතුව පුවත්පත් කවරය සැරසූ ඇගේම සේයාරුව දෙස බලා සිටියාය. ඇයට පියවි සිහිය ලැබුණේ සේනානි පුවත්පත උදුරා ගත් පසුවය. ගීතිකා අචේතනිකව මෙන් ඇඳමත වාඩි ගත්තාය. යෙහෙළියෝ තිදෙන ඇය වටකොට වාඩි වූහ.

"දෙවියනේ...." ගීතිකා පහත් හඬින් කොඳුළාය. "මේක කොහොමද වුණේ.....? මගේ ෆොටෝ එකක් කොහොමද පත්තරේකට ගියෙ..." ගීතිකාගේ මුහුණේ ඇතිවූ ගැමලු සහගත බියපත් පෙනුම දුටු යෙහෙළියන්ගේ මුහුණුවලින් ද සිනාව පලා ගියේය.

ඔවුන් බලාපොරොත්තු වූ සතුටු සහගත පෙනුම ගීතිකාගේ මුහුණට ගව් ගණනකින්වත් ළං නොවීය. ඇය කල්පනා කළේ ඇගේ සේයාරුවක් පුවත්පතකට ලැබුණේ කෙසේද යන්නය.

"ඇයි ඉතින් මේක දක්කම ඔයා අප්සෙට් ගියෙ ගීති....?" සේනානි ගීතිකාගේ උරහිස මත අත තැබුවාය. "බලන්නකො මේ පින්තූරෙ මොන තරම් ලස්සන ද....?"

සේනානි ගීතිකාගේ දෑස් ඉදිරියෙන් පුවත්පත දිග හැරියාය. එය උදුරා පොළොවේ ගසන්නට සිත තුළ නැගුණු ආවේගය ගීතිකා පාලනය කර ගත්තේ දැඩි අපහසුවෙනි. මුහුණ අඩක් පසෙකට හරවා ගත් නෙත් කොන් බැල්මක් සහිත ඒ පින්තූරය සැබැවින්ම සුන්දරය. එහෙත් හෙට දිනය ගැන සිහි වෙද්දී ගීතිකාගේ සිරුර කිළිපොලා ගියේය. හෙට කම්හල තුළ ඇය පිළිබඳව දහසකුත් එකක් කටකතා පැතිරෙනු නියතය. මේ පින්තූරය ඇගේ අනුදැනුම ඇතිව පළවූ එකක් පමණක් නොව එයට තවත් විවිධ අර්ථ කථන ද කම්හල තුළින්ම සැපයෙනු නියතය. ඇයට කට කතාවක් පට බැඳීමට මාන බලන කිහිප දෙනෙකුම සිටින බව ගීතිකා පසක් කරගෙන සිටියාය. දැඩි ආත්ම අනුකම්පාවකින් ඇගේ සිත සසල විණි. ඇය හිටි හැටියේම දෝතින් මුහුණ වසාගෙන ඉකි බිඳ හඬන්නට පටන් ගත්තාය. යෙහෙළියන් තිදෙනාම කලබල වූහ.

"ගීති...... ගීති... ඇයි මේ....?"

"අපි හිනා වුනාට බං හෙට උදේ වැඩට ගියාම ගීතිට කතාක් ඇහිල ඉන්න නැති වෙයි... දන්නවනෙ අපෙ එවුන්ගෙ කටවල්..." සේනානි කීවේ කල්පනාකාරී ස්වරයෙනි. ඔවුන්ගේ මුහුණුවල වූ විනෝදකාමී පෙනුම සැණින් අතුරුදන් විය.

"උඹ හිතන්නෙ මේ පින්තූරෙ කොහොම පත්තරේට ගියා කියලද....?" මඳ වේලාවකට පසු ගීතිකා කඳුළු බර දෙනෙත යෙහෙළියන් වෙත යොමු කළාය.

"ආ..... මට මතක් වුණා... එදා මතකද අර ගිම්හාන සමරදිවාකර අපිත් එක්ක කතා කර කර හිටියා.....?" සේනානි හදිසියේ යමක් මතක් වූ කලෙක මෙන් හඬ නැඟුවාය. ගීතිකාගේ මනස තුළ ඒ මතකය විදුලි කොටාගෙන ගියේය.

"මම දැන් යනවා ඔය මිනිහව මූණ ගැහෙන්න....." ගීතිකා ඇඳෙන් නැඟී සිටියේ කෝපයෙන් දිලිසෙන මුහුණින් යුතුවය.

www.sinhalalibrary.com
Edited By Crazzy

# 5

සියය දෙනෙතට එල්ල වී තිබූ ගීතිකාගේ තරු දෙනෙත තුළ කිසියම් සසල වීමක් ඇතැයි ගිම්හානට එක් වරම තේරුම් ගියේය. එහෙත් වරක් පමණක් හදිසියේ හමු වූ මේ රූමත් යුවතිය නැවත හමුවීමේ සතුට ඔහුගේ සිත් පතුලේ රඟ දිණි. ඔහු සිනාවකින් මුව සරසාගෙන ඇය වාඩිවී සිටි සෙට්යේම අනිත් කෙළවරේ වාඩි ගත්තේය. ඇය බිම බලාගෙන අත වූ කුඩා මුදල් පසුම්බිය කොනහන්නට වූවාය.

"ගීතිකා..." ඔවුන් දෙදෙනා අතර ඇතිවූ නිහඬ බව දුර දිග යතැයි බියෙන් ගිම්හාන ඇය ඇමතීය. ඇගේ දෙනෙත සියුම් කඳුළු පටලයකින් වැසී යනු ඔහු දුටුවේ නැත.

"ගීතිකා ඇයි ඔයා මේ වෙලාවෙ....?" ගිම්හාන නැවතත් ඇය ඇමතීය.

සැබැවින්ම ඉරුදිනට ගිම්හාන කාර්යාලයට එන්නේ ඉතාමත් හදිසි වැඩක් තිබුණහොත් පමණකි. මෙය ද එවන් අසාමාන්‍ය ඉරු දිනක් විය. ගීතිකා ඔහු සොයාගෙන කාර්යාලයට පැමිණීම ඒ අසාමාන්‍ය බව තවත් වැඩි කළේය.

"කතා කරන්න ගීතිකා... ඔයාට මොකක් හරි කරදරයක් ද....? ඔහු ඇය දෙසට නැමුරු වී හැකිතාක් මෘදු ස්වරයෙන් විමසීය.

"අයියෙ...." ගීතිකා තැතනුවාය.

ඇය බෝඩිමෙන් එද්දී සිත තුළ වූ දැඩි ආත්ම ශක්තිය අතිශයින් හීන වී තිබිණි. සැබැවින්ම යෙහෙළියක හෝ කැටුව ආවා නම් මෙවැනි අසීරු තත්වයකට පත් නොවන බව ඇයට සිතිණි. මෙවැනි ගමනකට සුදුසුම තැනැත්තිය සේනානිය. ඇයට ඕනෑම කෙනෙකු සමඟ නොපැකිලව කතා කරන්නට හැකියාව තිබිණි. යෙහෙළියන් කිසිවකු මේ ගමනට එක් නොවූයේ ගීතිකා විහිළුවක් කරන්නේ යයි සිතාගෙනය.

"කියන්න ගීතිකා... ඔයාට මොකක් හරි උදව්වක් ඕන ද මගෙන්.....?" ඔහුගේ ස්වරය කාරුණික වූයේ වී නමුදු එයින් ගීතිකාගේ සිතට ඇතුළු වූයේ කෝපයකි.

මෙතෙක් වේලා නොතිබූ ශක්තියක් කොහේදෝ සිට දිව අවුත් සිත තුළට පිවිසියේය.

"කරපු උදව්ව හොඳටම ඇති... මම මේ ආවෙ ඒකට ස්තුති කරල යන්න...." ඇය කෝප දීප්ත දෙනෙතින් ඔහු දෙස බලා පැවසුවාය.

ගිම්හාන තිගැස්සී ගියේය. මේ නන්නාඳුනන යුවතියගෙන් එවන් චෝදනාවක් ඔහු කිසිසේත්ම බලාපොරොත්තු වූයේ නැත. මහේෂ් එතැනින් යන්නට ආවේ ගිම්හාන වික්ෂිප්තව ගීතිකා දෙස බලා සිටියදීය. ඔහු ඔවුන් දෙදෙනා දෙස විමසිල්ලෙන් බැලීය. ඔහුගේ බැල්ම වැඩිපුර වේලාවක් රැඳී තිබුණේ ගීතිකා වෙතය.

"ආ... මෙයා නේද මේ සැරේ කවර් පේජ් එකේ හිටියෙ....?" මහේෂ් සිනාසෙමින් විමසීය.

බලා සිටියදීම ගීතිකාගේ මුහුණ රත් පැහැ ගැන්විණි. ඇය ලේන්සුවේ කෙළවරක් විකාගෙන බිම බලා ගත්තාය. ඇගේ දෙනෙතින් කඳුළු කඩා හැලෙනු දුටු ගිම්හාන වහා කලබල විය. ඔහු මහේෂ් දෙස

බැලීය. මහේෂ් ඇසක් වසා ඉඟි කොට අමුතු සිනාවකින් මුව සරසාගෙන යන්නට ගියේය. ඔහු දැන් හොඳ කතාවක් නිර්මාණය කොට කාර්යාලය පුරා පතුරුවා හරිනු ඇත. ගිම්හාන නැඟී සිටියේය.

"එන්න..... " ඔහු ගීතිකා දෙසට අත පෑවේය. සැබැවින්ම ඔහු ඉතා සමීප කෙනෙකුට මෙන් ඇයට අත පෑවේ නිරායාසයෙනි. ගීතිකා ඔහුගේ අත දෙසත් මුහුණ දෙසත් මාරුවෙන් මාරුවට කඳුළු බර දෙනෙත යොමු කළාය.

"එන්න......." තව වරක් කියමින් ඔහු දොර දෙසට ගමන් කළේය. ඔහුගේ අණට පිටු පෑමට දිරියක් ගීතිකාට නොවීය. ඇය කඳුළු පිසදාගෙන ඔහු පිටුපසින් ඇදුණාය. ඔහු රිය ගාලේ වූ සිය මෝටර් සයිකලය වෙතට ගමන් කළේය. ඇගේ දෙනෙත මහත් විය. ඇය සිටිවනම නැවතුණාය. ගිම්හාන ඇය දෙස හැරී බැලීය.

"අයියෙ, මාව වරදවල හිතන්න එපා....... ඔයාව හොයාගෙන මෙහෙට ආව එක වැරදියි කියල මම දන්නවා. ඒත් මට නැවිත් බැරි වුණා...." ඇය මිමිණුවාය. ඇගේ දෑසේ වියළී යමින් පැවැති කඳුළු නැවතත් අලුත් විය.

"මට තේරෙනවා ඔයාට මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවා කියල..... අපිට ඒක මෙතන කතා කරන්න බෑනෙ ගීතිකා....." ඔහු හෙල්මටය පැළඳ ගනිමින් මෝටර් සයිකලයේ රඳවා තිබූ අමතර හෙල්මටය ඇයට දිගු කළේය.

"දාගන්න මේක....."

ඇය හෙල්මටය අතට නොගෙන ඔහු දෙස බලාගෙන සිටියාය. ඇගේ පපුව ගිඩි ගිඩි ගා ගැහෙමින් තිබුණි. තමා පැමිණියේ යුවතියකට තරම් නොවන ගමනකැයි ඇගේ සිත කියන්නට විය. මෙවන් ගමන් ගොස් ජීවිතය වරදවා ගත් යෙහෙළියන් කිහිප දෙනෙකුගේ රූ ඇගේ මනස හමුවේ මැවිණි. ඇයගේ සිත තේරුම් ගත්තාක් මෙන් ඔහු මඳ සිනාවක් පෑවේය.

"බයවෙන්න එපා ගීතිකා..... දාගන්න හෙල්මට් එක.... අපි දෙන්නා පොඩ්ඩක් නිවී හැනහිල්ලෙ කතා කරමුකො...."

ගිම්හානගේ එවදන් ද දෙනෙතෙහි වූ කාරුණික මුදු බැල්ම ද ගීතිකාගේ සිතට දිරියක් එක් කළේය. එහෙත් ඔහුගේ අතකින් හෙල්මටය ගනිද්දී ඇගේ අත සැලිණි. ඇය මින් පෙර කිසිදු දිනක මෝටර් සයිකලයක ගොස් නොතිබිණි.

හෙල්මටය පැළඳ ගත්ත ද එහි ගාංචුව දමන සැටි පවා ඇය දැනගෙන සිටියේ නැත. එය ඔහුට අඟවන්නට ගීතිකා මැළි වූවාය. එහෙත් ගිම්හානට ඇගේ නුහුරු බව දැනිණි. ඔහු ඇගේ හෙල්මටයේ ගාංචුව දමද්දී ඔහුගේ ඇඟිලි ඇගේ නිකට මත යන්තමින් ස්පර්ශ විය. ඇගේ සිරුර කිළි පොලා ගියේය.

"අනේ මට බයයි...." ගිම්හාන මෝටර් සයිකලය හරවා පාරට ගනිද්දී නිරායාසයෙන්ම ඇය ඔහුගේ උරහිස තදින් අල්ලා ගත්තාය.

"බය වෙන්න එපා.... මං ඔයාව වට්ටන්නෙ නෑ...." ගිම්හාන සිනාසුණේය.

"ඒ වුණාට ඔයත් එදා වැටුණනෙ...." ඇයට ඉබේටම කියැවිණි. එහෙත් ඒ සමඟම ඇයට ඇති වූයේ පසුතැවිල්ලකි. එවදන් සමඟම ඔවුන් දෙදෙනා අතර කිසියම් බැඳීමක් ඇතිවිණැයි ඇයට සිතිණි.

"මට දැන් හිතෙනවා එදා වැටුණ එක හොඳයි කියල...." ඇගේ සිතුවිලිවලට බාධා කරමින් ගිම්හාන හඬ නැඟීය.

ඔහු වේගයෙන් මෝටර් සයිකලය ධාවනය කළේය. ගීතිකා බියෙන් ඇලලී දැඩින්ම ඔහු අල්ලාගෙන සිටියාය. යන්නේ කොහේදැයි ඇය ඇසුවේ නැත. සැබැවින්ම කොළඹ නගරය ගැන ඇය කිසිවක්ම දැන සිටියේ නැත. ඇය පුවත් පත් කාර්යාලයට පැමිණියේ ද කීප දෙනෙකුගෙන් අසා දැනගත් තොරතුරු ඔස්සේය. එහෙත් පැමිණියේ කුමකටද යන්න පවා මේ මොහොතේ ඇයට අමතකව තිබිණි. නුගේගොඩ නගරයට පැමිණි බව ඇය දැන ගත්තේ වේගයෙන් ධාවනය වන මෝටර් සයිකලයට පසු වූ නාම පුවරු කිහිපයක් කියැවීමෙනි.

"කොහෙද මේ යන්නේ......?" අවසානයේදී ඇය විමසුවේ ගිම්හාන මෙල්ඩර් පෙදෙසට මෝටර් සයිකලය හරවද්දීය.

"යන්නෙ මගේ ගෙදරට...." ඔහු අලංකාර ගෙවත්තක් මැද්දේ වූ නිවසේ සිය ඇනෙක්සිය ඉදිරිපිට මෝටර් සයිකලය නතර කළේය.

ගීතිකා කුඩා පසුම්බිය දෙතොලතරට ළං කොට ගෙන ගිම්හාන දෙස බලාගෙන සිටියාය. ඇගේ හදවත වේගයෙන් ගැහෙමින් තිබිණි. ඔහු සාක්කුවෙන් ගත් යතුරකින් දොර විවර කළේය. ආපසු හැරී දිවීමට ගීතිකාට සිත් විණි. ඇය බියපත් මුවැත්තියක මෙන් අසරණ ඇසින් ගිම්හාන දෙස බැලුවාය. ගිම්හාන සිනාසුණේය.

"ඇයි බලාගෙන ඉන්නෙ..... එන්න ඇතුළට...." ගිම්හාන ඇරයුම් කළේය.

"අනේ මට බෑ...." ගීතිකා නැතිගත් හඬින් පැවසුවාය.

"ඇයි ඔයා බය ද......?" ගිම්හාන පහත් හඬින් පිළිවිසියේය.

ගීතිකා කතා නොකළාය. ඇය බියපත්ව සිටින බව ගිම්හානට වැටහිණි. ඕනෑම දෙයකට ඔට්ටු එංගලන්තයේ යුවතියන් මෙන් නොව මෙම යුවතියන් මොන තරම් අහිංසක දැයි ඔහු පහන් සිතින් සිතුවේය. ඇය සිය නිවසට රැගෙන ඒම අනුවණ ක්‍රියාවකැයි ඔහුට මුල් වරට සිතිණි.

"මාව වරදවල හිතන්න එපා ගීතිකා.... මං ඔයාව මගෙ ගෙදරට එක්ක ආවෙ තැන් තැන්වල කතා කරන එක අපි දෙන්නටම හොඳ නැති නිසා... ඒත් ඔයාට බය නම් අපි ආපහු යමු...." ගිම්හාන පැවසීය.

එවදන් ගීතිකාගේ සිතුවිලි වෙනස් කරලීමට සමත් විය. ඇය තවත් මොහොතක් කල්පනා කරමින් සිට හිස පැළඳගෙන සිටි හෙල්මටය ගලවා අතට ගත්තාය. ඇයට ගෙතුළට පිවිසීම පිණිස ගිම්හාන දොරකඩින් මෑත් විය. ගීතිකා ගල් ගැසුණාක් මෙන් සාලය මැද සිටගෙන වටපිට බලන්නට වූවාය. ගිම්හාන දොර වසා දැමීය. සිය හද ගැස්ම පිටතට ඇසෙන තරමටම වේගවත් වන්නට ඇතැයි ගීතිකාට සිතිණි. "වාඩි වෙන්න ගීතිකා......" ඇයට පැවසූ ඔහු සාලය මැදින් නොපෙනී ගියේය.

ඇය යන්ත්‍රානුසාරයෙන් මෙන් සුඛෝපභෝගී අසුනකට බර වූවාය. ගෙතුළ සිටින කිසිවෙකු කැඳවාගෙන ඒමට ඔහු යන්නට ඇතැයි ඇයට සිතිණි. එහෙත් ඇයට කිසිදු කට හඬක් ඇසුණේ නැත. ගෙතුළ වූයේ ඉවසන්නට නොහැකි තරමේ නිහඬතාවයකි. කේක් තැටියක් සහ ශීත කළ බීම වීදුරු දෙකක් සහිත බන්දේසියක් ද රැගෙන ගිම්හාන ආපසු ආවේය. ඔහු ඇය අසල වූ කුඩා ස්ටූලය මත බන්දේසිය තැබුවේ ආචාරශීලී ලෙසිනි.

"ගෙදර කවුරුවත් නැද්ද අයියා...?" ගීතිකා සිහින් හඬින් විමසුවාය. අවට වූ නිහැඬියාව තුළ ඒ සිහින් හඬ දෝංකාර දුන්නේය.

"ඇයි මං ඉන්නේ....?" ඔහු සැහැල්ලු හඬින් සිනාසුණේය.

"ඔයා ඇරෙන්න වෙන කවුරුත් නැද්ද......?"

"ඔයත් අර මිහිඳු හාමුදුරුවො දේවානම් පියතිස්ස රජ්ජුරුවන්ගෙන් ඇහුව ප්‍රශ්නමද මගෙන් අහන්න යන්නෙ....?"

ගිම්හාන සිනාසී කේක් තැටිය ඇයට පෑවේය. ඇය කේක් කැබැල්ලක් අතට ගත්තේ පැකිළෙමිනි. ඇගේ හැම ඉරියව්වක් තුළම අපූර්ව චමත්කාරයක් රැඳී ඇතැයි ගිම්හානට සිතිණි. ඇය ඉවතට හැරී කේක් කැබැල්ල සපද්දී ගිම්හාන ඇය දෙසම දෙනෙත් යොමු කරගෙන සිටියේය. නොකැළඹුණු විලක ඇති සන්සුන් බව ඔහු ඇගේ ඉරියව් තුළින් දිටීය. හදිසියේම ගීතිකා හිස හරවා බැලුවාය. ඔවුන් දෙදෙනාගේ සිව් නෙත් හමු විණි. ඇය ඒහාම ඉවත බලා ගත්තේ තැති ගැන්මෙන් යුතුවය. ඇගේ දෙකොපුල් වල ලා රත් පැහැයක් විසිර යනු ඔහුට පෙනිණි.

"ඔයා හරි බයෙන් ඉන්නෙ නේද ගීතිකා...." ගිම්හාන විමසීය.

"බය හිතෙන්නෙ නැද්ද කවුද කියල හරියටම නොදන්න පිරිමියෙකුගෙ ගෙදරකට ආවම....?" ගීතිකා තමාටම කියා ගන්නාක් මෙන් මිමිණුවාය.

"මට නම් බය වෙන්න එපා..... මොකද මම කවදවත් කෙල්ලෙකුගෙ හිත රිදෙන දෙයක් කරන්නෙ නෑ....." ගිම්හාන ඇයට බීම වීදුරුවක් පිරිනමමින් පැවසීය. බීම වීදුරුව දරා ගත් ඇගේ සුරත වෙව්ලනු ඔහු දිටීය.

"දැන් කියන්න ගීතිකා...... ඇයි ඔයා මාව හොයාගෙන ඔෆිස් එකට ආවෙ......?"

ඔහු ඉතිරි බීම වීදුරුව අතට රැගෙන අසුනේ සුව පහසුව හාන්සි විය. ගීතිකා දෑතින්ම වීදුරුව අල්ලා ගත්තාය. ඇගේ දෙනෙතට කඳුළු පිරී එනු ඔහුට පෙනිණි. කොයි අන්දමින් ඔහුට චෝදනා කළ යුතුදැයි ඇය සිතුවාය.

"ඔයා ඉස්සර වෙලා කිව්වා මං කරපු උදව්වට ස්තුති කරල යන්න ආවෙ කියලා...." ඔහු ඇයට කතාව අරඹන්නට පොටක් පාද දුන්නේය.

"ඇයි අයියා ඔයා මගේ ෆොටෝ එකක් පත්තරේ දැම්මෙ.....?"

ගීතිකා අත වූ බීම වීදුරුව බන්දේසිය මත තබා දෝතින්ම මුහුණ වසා ගත්තාය. ගිම්හාන දැඩි ලෙස මවිතයට පත් විය. පුවත්පතේ ඡායාරූපයක් පළකොට ගැනීම පිණිස දිනකට එන යුවතියන් සංඛ්‍යාව කොපමණක් දැයි සිහිපත් කර ගන්නට ඔහු උත්සාහ කළේය. ඒ බොහෝ දෙනෙකුගේ රූ කවරයේ සේයාරුවකට උචිත නැත. සේයාරුවක් පළවූ කල ඔවුන් මොන තරම් සතුටට පත්වන්නේදැයි ගිම්හාන කල්පනා කළේය. ඇතැම්හු තෑගි බෝග ද රැගෙන ඔවුන් බැහැ දකින්නට පැමිණෙති. එහෙත් මේ යුවතිය ඔහුට චෝදනා කරමින් ඉකිබිඳ හඬන්නීය.

"ඇයි ගීතිකා පත්තරේක මුල් පිටුවේ පින්තූරයක් ගියාම ඒක කොච්චර ආඩම්බරයක් ද.......?" ගිම්හාන ඇය අස්වසන්නට උත්සාහ කළේය. ඇය ඔහු දෙස හැරී බැලුවේවත් නැත.

"ඔයා දන්නවද පත්තරේක පින්තූරයක් දගන්න බැරිව කී දෙනෙක් දුක් වෙනවද කියලා... ඉතින් ඔයා කොච්චර සන්තෝස වෙන්න ඕනද.....?" "ඔයා ආඩම්බර වෙන්න එපායැ ඔච්චර ලස්සන රූපයක් තියෙන එක ගැන......"

"ලස්සන ආඩම්බරයක් වෙන්නත් පොහොසත් වෙලා ඉපදෙන්න ඕන අයියෙ... වෙලෙඳ කලාපෙ වැඩ කරන අපි වගේ දුප්පත් කෙල්ලන්ට ලස්සන කියන්නෙ විනාසෙට මුලක්....." ඇය පැවසුවේ අප්‍රමාණ කළකිරීමකිනි. ඔහු මවිතයෙන් මෙන් ඇය දෙස බලා සිටියේය.

"මට තේරෙන්නෙ නෑ ඔයා මොනවද මේ කියන්නෙ කියලා......"

"ඔව් අයියෙ ඔයාලට තේරෙන්නෙ නෑ තමයි.... ඒව තේරෙන්න එක දවසක් ගිහින් වෙළෙඳ කලාපෙ ඇවිදලා ඇවිත් පත්තරේට ආටිකල් එකක් ලිව්වට මදි...... පොඩ්ඩක් වෙළෙඳ කලාපෙ ගැවසෙන්නත් ඕන..."

ගීතිකා එවර පැවසුවේ සිත ඇතුළින් නැඟී එන කෝපයකින් යුතුවය. සිය අල්ප දැනුම ගැන ලැජ්ජා වෙන අයෙකු මෙන් ගිම්හාන මඳ සිනාවක් පෑවේය.

"මම එද ඒ වෙළෙඳ කලාපෙට ගියාමයි...." ඔහු පැවසුවේ ඒ මඳ සිනාවෙන්ම යුතුවය.

"මං අයියට දොස් කියනව නෙමෙයි. ඒත් අයියෙ සමහර පත්තර කාරයො තමයි වෙළෙඳ කලාපෙ කෙල්ලන්ගෙ ප්‍රතිරූපය විනාශ කෙරුවෙ..... මට මතකයි එක කාලයක් නිදහස් ප්‍රේම කලාපය කියල කිව්ව වෙළෙඳ කලාපෙට..... ඒත් ඇත්තටම නම් අපෙ කෙල්ලන්ට ප්‍රේම කරන්නවත් නිදහසක් නෑ අයියෙ....." ගීතිකා දෙනෙත බිමට නැඹුරු කරගත්තාය. ගිම්හාන කිවයුතු දෙයක් මතක් නොවුණ කලෙක මෙන් ඇය දෙස බලා සිටියේය.

"පත්තරේ පින්තූරයක් ගියාම ඔයාව වරදවල හිතාවි කියල ඔයා බයයි එහෙම ද...?"

"ඇත්තටම ඔව්... අයිය දන්නවද මම වෙළඳ කලාපෙ රස්සාවට එනව කියල මගෙ බෝයි ෆ්‍රෙන්ඩ් මගෙත් එක්ක තරහ වුණා. නැද්දයො මාව කොන් කළා.... දැන් එයාල හිතන්නෙ නෑ මං දන්නෙවත් නැතිවයි මගෙ පින්තූරෙ පත්තරේ ගියෙ කියලා.... එයාල මම හීනෙන්වත් නොහිතුව දේවල් කියාවි....." ගීතිකා දෝතින්ම මුහුණ වසාගෙන ඉකිබිඳිමින් හඬන්නට පටන් ගත්තාය.

"ගීතිකා අඬන්න එපා......" ගිම්හාන ඇය වාඩි වී සිටි පුටුවේ අත මත වාඩි වෙනු ඇයට දැනිණි. කුමක්දෝ නුහුරු හැඟීමකින් ඇගේ සිත සලිත විය.

"මෙහෙ බලන්න ගීතිකා....."

ඔහු ඇගේ අත් දෙක මුහුණින් ඉවත් කරන්නට උත්සාහ දැරීය. ඔහුගේ පහස දැනෙද්දී විදුලි සැරයක් වැදුණු කලෙක මෙන් ගීතිකා

තිගැස්සුණාය. ගිම්හාන යනු තව දුරටත් නන්නාඳුනන කෙනෙකු නොව අතිශය ළබැඳි තැනැත්තෙකු බව ඇගේ සිතට දැනී ගියේය. ඇය කඳුළු බර දෙනෙත ඔසවා ඔහුගේ මුහුණ දෙස බැලුවාය. එකිනෙකාගේ සුසුම දැනෙන තරමට ඔවුන් දෙදෙනාගේ මුහුණු සමීපව තිබිණ. ගිම්හාන එක් අතෙකින් ඇගේ අත අල්ලා ගත් වනම අනෙක් අතින් ඇගේ දෙනෙතෙහි රැඳුණු කඳුළු පිස දැමීය. ගීතිකාගේ දෙනෙතට නැවතත් කඳුළු පිරිණි. සැබැවින්ම වෙළෙඳ කලාපයට ආවාටම පසු මෙවැනි දයාබරත්වයක් අත් විඳින්නට ලැබුණේ පළමු වතාවටය.

"ලස්සන දෙයක ලස්සන ලෝකෙට පෙන්නන එක තමයි අපේ රස්සාව ගීතිකා.... අපි ඒක කරන්නෙ කාටවත් හානියක් කරන අදහසකින් නෙමෙයි....." ගිම්හාන පැවසුවේ ඇගේ හිස සෙමෙන් පිරිමදිමිනි. ඔහුගෙන් මිදී පලා යාමේ වුවමනාවකින් ඇගේ සිත නොඉවසිලිමත් විය. එහෙත් ඒ සඳහා දිරියක් ඇති කර ගැනීමට ඇයට නොහැකි වන තරමටම ඔහු දයාබර විය. එපමණටම මෘදු විය.

පැය ගණනාවක් ඇතුළත ඔවුන් දෙදෙනා මොන තරම් සමීප වූවා දැයි ගීතිකා කල්පනා කළාය. ඇයට ඔහු ඉදිරිපිට බියක් චකිතයක් දැනුණේ නැත. සිය ජීවිත කතාව ඇය බොහෝ පුහුණු කොට ඔහු හමුවේ දිග හැරියේ එහෙයිනි. ඇයට කාලය ගෙවෙනවා දැනුණේ නැත.

"දෙවියනේ හයටත් ළඟයි....." හිටි හැටියේම අත් ඔරලෝසුව දෙස නෙත් හෙළූ ගීතිකා දෙනෙත මහත් කොට ගත්තාය.

ඇය ගිම්හාන දෙස බැලුවේ ද ඒ විකසිත දෙනෙතින්ම යුතුවය.

"බය වෙන්න එපා මං ඔයාව ගිහින් ඇරලන්නම්..." ඔහු සිනාසී ඇගේ කම්මුලට තට්ටු කළේය.

එහෙත් ගීතිකා ගිම්හාන සමඟ ආවේ සීදූවට පමණකි. ඇගේ නවාතැන් පොළ පිහිටියේ සීදූවත් ලියනගේමුල්ලත් අතරය. ඔහු කැටුව නවාතැනට යාම අනවශ්‍ය ප්‍රශ්නයකට මුල පිරීමකැයි ඇයට සිතිණි.

"මට මේ ටික පයින් යනෑකි අයියෙ...," ඇය ලෙන්ගතුකම පුරවාගත් මඳ සිනාවකින් ඔහුට සංග්‍රහ කළාය.

"දැන් අටටත් කිට්ටුයි...... ඔයා කොහොමද තනියම පයින් යන්නෙ......?"

"මට පාර පුරුදුයි හොඳට....."

"ආයෙ කවදද අපි මීට් වෙන්නෙ....?" ගිම්හාන විමසුවේ රහසින් මෙනි.

"ඉක්මනටම......" ගීතිකා ද එබඳු ස්වරයෙන් පැවසුවාය. "ඔයා පරිස්සමින් යන්න.... වැඩිය හයියෙන් යන්න එපා...."

ඇය සෙනෙහසින් මිමිණුවාය.

නුහුරු නුපුරුදු මෝටර් සයිකල් ගමන නිසා ඇගේ දෙපා රිදුම් දෙමින් තිබිණි. එහෙත් ඇගේ සිත අමුතුම මිහිරි හැඟීම් රැසකින් අවදි වී තිබිණි. යෙහෙළියන් නවාතැන් කාමරයේ දොරකඩට වී මග බලා සිටිනු ඇයට පෙනිණි. ඔවුන් වෙනුවෙන් ද ඇගේ සිතේ වෙනදා නැති තරමේ සෙනෙහසක් ඇති විණි.

"අම්මෙ දූන් තමයි ඇඟට ලේ ටිකක් ඉනුවෙ...." සේනානි ඇය දකින්ම හඬ නැඟුවාය.

"උඹ කොහෙද ගියෙ.....?"

එහෙත් ඇය යෙහෙළියන්ගේ එකම පැනයකටවත් පිළිතුරු දුන්නේ නැත. ඒවාට පිළිතුරු දීමට ගියහොත් සිතේ පිරී රැඟ දෙන සතුට අඩු වේතැයි ඇයට බිය සිතිණි.

"පස්සෙ කියන්නම්කො....." යෙහෙළියන්ට පැවසූ ඇය ඉක්මනින්ම මුහුණ දෙවා ඇඳුම් මාරු කොට ගෙන ඇඳට වැටුණාය.

"ඇයි උඹ කන්නෙ නැද්ද....?" සේනානි ඇසුවාය.

"නෑ.... මට බඩගිනි නෑ....." කොට්ටයේ හිස ඔබා ගනිමින් ගීතිකා මිමිණුවාය. යෙහෙළියන් මොන මොනවාදේ පවසනු ඇසුණ ද ඇගේ සිත තිබුණේ බොහෝ ඈතකය.

"ජීවිතේ කියන්නෙ හරිම පුදුම දෙයක්...." ගීතිකා තමාටම කියා ගනිමින් අඳුරට සිනාසුනාය.

www.sinhalaelibrary.com

# 6

වියරුවෙන් මෙන් හඬා එන දළ රළ පෙළ ඔවුන්ගේ පා දෝවනය කරමින් නැවතත් මුහුදටම ඇදී ගියේය. දඟකාර මුහුදු සුළඟ ගීතිකාගේ හිස කෙස් සමඟත් ගවුම් සාය සමඟත් සෙල්ලම් කළේය. ඇය දැතින්ම ගවුම් සාය හික්මවා ලන්නට තැත් දරමින් ගිම්හාන දෙස බැලුවාය. ඔහු ඇගේ ලතාවකට සැලෙන දිගු කෙස් කළඹ දෙස බලාගෙන සිටියේ ආශාවෙනි. සැබැවින්ම එංගලන්තයේ දී ඔහුට හමු වූ කිසිම යුවතියක මෙබඳු දිගු කෙස් කළඹකට උරුමකම් කීවේ නැත.

ඔවුන් දෙදෙනා මුහුදු වෙරළ දිගේ තවත් පියවර කිහිපයක් ඉදිරියට යද්දී විශාල රළ ගෙඩියක් පෙරළී ආවේය. සිරුරේ සමබර භාවය රැකගත නුහුණු ගීතිකා එක්වරම ගිම්හාන දෙසට අත පෑවාය. ගිම්හාන ඇය තමා වෙතට ඇද ගත්තේය. ඔවුන් දෙදෙනාගේ සිරුරු අඩක්ම තෙමාලමින් රළ බිඳී ගියේය.

"ෂීඃ තෙමුණා හොඳටම....." ගීතිකා වහා ගිම්හාන වෙතින් මෑත් වී ගවුම සාය දෙස බැලුවාය. එය තෙමී ඇඟටම ඇලී තිබිණි. ඔහු සිනාසුණේ ය. ඇය ඔහු දෙස හෙලුවේ අමනාපය මුසු බැල්මකි. ඒ බැල්ම ඔහුගේ සිත විනිවිද ගියේය.

"ඔයාට නම් හිනා... දැන් මම කොහොමද බෝඩිමට යන්නෙ....?"

"අපෝ... ඔක වෙලෙයි ළමයො... එන්න අපි අර ගල උඩින් වාඩි වෙමු....." ගිම්හාන ඇයට අත පෑවේය. එහෙත් ඇය ඒ අත පිළිගත්තේ නැත. ඔහුට පියුම් මදිකමක් බඳු හැඟීමක් දැනිණි.

"මං කලින්ම කිව්වනෙ ඔයාට අද මුහුද සැරයි මෙහෙන් වාඩි වෙලා ඉඳිමු කියලා...." ඇය ගවුම් සාය දැතින් ගසා දමා ගල් තලාව මත වාඩි වූවාය.

"ඇයි අද මුහුද සැර...,?" ගිම්හාන ඇයට අඩි කිහිපයක් මෙහායින් හිඳ ගත්තේය.

"අද විතරක් නෙමෙයි වාරකන් කාලෙට කවදත් මුහුද සැරයි......" ගීතිකා පැවසුවේ ගිම්හාන නොදත් දෙයකි. සැබැවින්ම එංගලන්තයේදී සිංහල ඉගෙන ගත්ත ද ඇතැම් යෙදුම් හා ඒවා භාවිතා කරන අන්දම ඔහු ඉගෙන ගත්තේ ලංකාවට පැමිණියාට පසුවය. පුවත්පත් කාර්යාලයේ සේවය සඳහා පැමිණි මුල් දිනවල ඔහු සිංහල කතා කළේ දැඩි අසීරුවෙනි. දනුවූ ඇතැම් විට ඔහුගේ මිතුරෝ ඔහු සිංහල කතා කළ ආකාරය අනුකරණය කරමින් විනෝද වෙති.

"මොනවද අයියෙ කල්පනා කරන්නෙ...,?" ගීතිකා ඔහු දෙස බැලුවාය.

"මට අයියා කියන්න එපා ගීතිකා..... මට මගේ නම කියන්න ගිම්හාන කියන්න....." ගිම්හාන නොරිස්සුමෙන් මෙන් පැවසීය.

"ඇයි ඒ...?" ගීතිකා ලතාවකට හිස ඇළ කොට ඔහු දෙස බැලුවාය. ඒ අහිංසක මුහුණ දෙස කල්ප කාලාන්තරයක් බලා සිටින්නට හැකියැයි ගිම්හානට සිතිණි.

"ඔයා අයියා කියනකොට මට හිතෙන්නෙ මං නංගිත් එක්ක ඇවිදින්න ඇවිත් කියලා.... එතකොට මට ඔයත් එකක් කතා කරන්න කිසිම දෙයක් මතක් වෙන්නෙ නෑ...."

"ඒ වුණාට අයියෙ....."

"ඔය ආයෙත් කියනවා...."

"සොරි... සොරි...." ඇය දඟකාර හඬින් සිනාසුණාය. ඒ සිනා හඬ රළ බිඳෙන සෝෂාව තුළ සැඟවී ගියේය.

"ඉතින් අපි දෙන්නා අයියයි නංගියි වගේනෙ ගිම්හාන......" ඇය ඒළඟට පැවසුවේ ගිම්හාන යන්න බරට උච්චාරණය කරමිනි. එවදන් ඊයම් බරු මෙන් ඔහුගේ සිත පතුලටම කිඳා බැස්සේය. සැබැවින්ම ගීතිකා සමඟ මිතුරු දමකට වැඩි යමක් පැවැත්විය හැකිදැයි ඔහු කල්පනා කළේය. ඔහුගේ සිත තුළ ඇය වෙනුවෙන් ඇත්තේ සහෝදර බැඳීමක් නොවන බව නම් ඔහුට සහතිකය. ඔහු දිගු සුසුමක් හෙළා නැගී සිටියේය. ගීතිකා කලබලයෙන් ඔහු දෙස බැලුවාය.

"අපි යමු ගීතිකා....." ඔහු සිහින් හඬින් නෙපළේය. ගීතිකාගේ ඇසේ ඇඳුණේ කුතුහලයකි. ඔහු තුළ කුමක් හෝ වෙනසක් ඇතිවූ බව ඇයට දැනිණි. ඒ වෙනස සිය වදන් නිසා ඇති වූවක් යයි ඇයට සිතිණි. ඇගේ වත දුක්බර විය. ගිම්හාන ඇය දෙස හැරී බැලීය. ඒ වතෙහි වූ දුක්බර බව හැඳින ගත් ඔහුගේ සිතට දැනුණේ පසුතැවිල්ලකි. ඔහු නැවතත් ඇය අබියසින් වාඩි ගත්තේය.

"ඔයාට තරහ ගියා ද...?" ගීතිකා සෙමින් විමසුවාය.

"නෑ...." ගිම්හාන කෙටියෙන් පිළිතුරු දෙමින් ඈත ක්ෂිතිජය දෙස බැලීය. ක්ෂිතිජයට ළංවී ඈදී යන නෞකාවක කුඹ ගස ඔහුගේ ඇසට හසු විණි. ඔහු අරමුණකින් තොරව එදෙස බලා සිටියේය.

ගීතිකා ඔහු සොයාගෙන කාර්යාලයට පැමිණි දින සිටම ගිම්හානගේ සිතුවිලි අතර සැරිසැරුවේ ඇයමය. නැවත වරක් ඇය දකීමේ ආශාව ඔහුගේ සිත තුළ ඇති වෙමින් තිබිණි. ඇගෙන් ලිපියක් ලැබුණේ ඒ ආශාව නොඉවසිල්ලක් තරමටම දැඩිවී තිබූ මොහොතකය. ඔහු එද හැසිරුණු මහත්මා විලාශය ගැන ඇය ස්තුති කොට තිබිණි. ලිපිය ලද වහාම ඔහු ඇයට පිළිතුරු ලිපියක් ලිව්වේය. මේ ඉරිදා දිනයේ මීගමු නගරයේදී ඔවුන් දෙදෙනා හමු වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

ගිම්හාන මීගමුව දුම්රිය ස්ථානය ඉදිරිපිට සිටගෙන ඇය එන තුරු බලා සිටියේය. පියකරු නිල් පැහැති රැළි ගවුමකින් සැරසුණු ගීතිකා ඔහු අබියසට ආවේ මුව පොපියා හිනැහෙමිනි. ගිම්හානගේ සිතේ සුවහසක් මල් පිබිදිණි.

"ඉතින්.....?" ඔහු සිනාසුණේය.

"නතින්......" ඇය සිනාසුණාය.

ඔවුන් දෙදෙනා එක්වන්ව සිනාසෙමින් මොහොතක් උනුනුන් දෙස බලා සිටියහ. ගිම්හාන ගේ බැල්ම දරා ගත නුහුණු ගීතිකා පළමුව බිම බලා ගත්තාය.

"ඇයි අයියා අද බයික් එකේ නෙමෙයි ද ආවෙ....?" මොහොතකට පසු ඇය විමසුවාය.

"නෑ..... මං හැමදම යන්නෙ එන්නෙ බයික් එකේනෙ..... ඉතින් අද වෙනසකටත් එක්ක ට්‍රේන් එකේ ආවා.... ඒක නෙමෙයි ගීතිකා අපි බීච් එකට යමු ද...?"

ගිම්හාන යෝජනා කළේ එතරම් කැමැත්තකින් නොවේ. ඇය හා නිදහසේ කතා කරන්නට සුදුසුම තැන සිය නිවස බව ඔහුගේ හැඟීම විය. එහෙත් ඔහු මුහුදු වෙරළ තෝරා ගත්තේ නිවසට යාමට දුර වැඩි නිසාය.

"ගිම්හාන......" ගීතිකා සිහින් හඬින් ඔහු අමතමින් ඔහුගේ බාහුව මත අත තැබුවාය. ඔහු ක්ෂිතිජයට යොමු වී තිබූ සිය දෑස මුදාගෙන ඇය දෙස බැලීය.එහෙත් එකම මොහොතක් පමණක් ඔහු දෙස බලා සිටි ඇය විලියෙන් මෙන් ඉවත බලා ගත්තාය.

කෙමෙන් කෙමෙන් අව් රස්නය දැඩි වෙමින් පැවතිණි. එහෙත් ගිම්හානටවත් ගීතිකාටවත් ඒ බවක් දැනුණේ නැත. ලවණ මිශ්‍රිත මුහුදු සුළඟ ඔවුන් වටකොට ගෙන හමා ගියේය. ගීතිකාගේ හිසකෙස් අවුල් වී මුහුණ වටා විසිරී තිබිණි. එය ඇගේ පියකරු බව වැඩිකරලූ බව ගිම්හානට සිතිණි.

"ගීති...." ඔහු සිහින් සරින් ඇය ඇමතීය. ඔහු සිය නමින් අඩක් කියූ පළමු වතාව එය බැවින් ඇය තිගැස්සුණාය.

"ඇයි ඔයා බය වුණේ එක පාරටම.....?"

"නෑ මොනවට බය වෙන්න ද....?" ඇය ගල්තලාව මත වූ කුඩා සිප්පි කටුවක් ඇහිඳගෙන එහි දුර දිගේ ඇඟිල්ල දිවෙව්වාය.

"එහෙනම් ඔයා මොකද ඔච්චර කල්පනා කරන්නෙ....?"

"මමයැ මෙච්චර වෙලා කල්පනා කර කර හිටියෙ. ඔයානෙ...."

ඇය අත තිබූ සිප්පි කටුව ඔහු දෙසට විසි කළාය. එය ඔහුගේ කමිසයේ සාක්කුවට වැටිණි.

"කොහොමද මගෙ ඒම් එක....." ඇය ආඩම්බරයෙන් සිනාසුණාය.

"ඔයාව මතක් වෙන්න මම මේ සිප්පි කටුව තියා ගන්නවා...." ඔහු සෙනෙහසින් ඇය දෙස බැලුවේය. ඇය අඩවන් දෑසින් ඔහු දෙස බලා සිටියාය. ඇය ළං කොට ගෙන ඒ අඩවන් දෑස සිප ගැනීමේ ආශාවක් ඔහු තුළ ඇති විය. එහෙත් ඇය නොසන්සුන් වනු ඇතැයි බියෙන් ඔහු සිය හැඟීම් පාලනය කර ගත්තේය.

"ඒ කියන්නෙ ඔයාට ආයෙ මාව මතක් වෙන්නෙ ඔය සිප්පි කටුව දැක්කොත් විතරයි....."

"පිස්සු කෙල්ල....."

ඔහු ඇගේ කම්මුලක් සෙමින් කෙනිත්තුවේය. වගකීම් සහිත පුවත්පත් කලාවේදියෙකු වූ තමා මෙතරම් බොළඳ වූයේ කෙසේදැයි ඔහුට සිතිණි. සැබැවින්ම ආදරය හමුවේ බොළඳ නොවන කෙනෙක් ඇද්ද....?"

"මං දෙයක් අහන්න ඔයා තරහ වෙන්නෙ නැද්ද ගිම්හාන.....?" ගීතිකා හිස ඇලකොට ඔහු දෙස බැලුවාය.

"ඕන දෙයක් අහන්න...."

"ඔයා හුගාක් සන්තෝසෙන් මෙතෙන්ට ආවෙ..... ඒත් ඊට පස්සෙ අප්සෙට් වුණා. ඇයි ඒ....? මගෙන් වරදක් වුණාද...?" ඇය විමසුවේ අතිශය තැන්පත් හඬකිනි. ඇය දෙස මොහොතක් බලා සිටි ඔහු දිගු සුසුමක් හෙළීය.

"නැහැ ගීති....."

සියල්ල ඇයට පැවසිය යුතුයයි එක්වරම ඔහුට සිතිණි. අනෙක් අතට කියන්නට ඇත්තේ කුමක්දැයි ඔහු කල්පනා කළේය. ඇයට පියුමි පිළිබඳව කිව යුතුය. එහෙත් ඇය කුමන අන්දමකින් ඒ ගැන සිතනු ඇද්දැයි ඔහුට සිතාගත නොහැකි විය.

"ඔයා ආයෙත් කල්පනා කරනවා......"

"නෑ..... මම කල්පනා කළේ නැහැ. අර බලන්න අර ඈත නැවක් පේනවා. ඒක දැන් හුඟ වෙලාවක ඉඳල ඕතනමයි....."

මාතෘකාව වෙනස් කරනු රිසියෙන් ඔහු පවසද්දී ඇය සිනාසුණාය.

"හුඟ වෙලාවක ඉඳල නෙමෙයි හුඟ කාලෙක ඉඳල ඔය නැව ඕතන තියෙන්නෙ. ඒක කැඩිච්ච නැවක්..."

ඔහුට ඒ ඔස්සේ සිතන්නට බොහෝ දේවල් තිබිණි. එහෙත් ඔහු සිතුවිලි සයුරේ අතරමං වීමට පෙර ගීතිකා ඔහුගේ අවධානය ඇය වෙත යොමු කර ගත්තාය.

"ඒක නෙමෙයි. කවුද ඔයාට ගිම්හාන කියල නම දැම්මෙ.....?" ගීතිකා විමසුවේ සුරතල් ලෙස සිනාසෙමිනි. ගිලිහී යමින් තිබූ ප්‍රබෝධමත් බව නැවතත් ඔහුගේ සිතට පිවිසියේය.

"අපේ අම්මයි තාත්තයි මිසක් වෙන කවුද....?" ඔහු සිනාසුණේය.

"ඉතින් ඒ වගේ නමක් දැම්මෙ ඇයි.....? ගිම්හාන කියන්නේ ඍතුවක නමක්නෙ......"

"මම ඉපදිලා තියෙන්නෙ ගිම්හාන කාලෙ දවසක උදේ වරුවෙ... ඉතින් ඒක නමයි ළහිරු ගිම්හාන කියල දල තියෙන්නෙ...." ගිම්හාන නොදැනුවත්වම ඔහු පිළිබඳ තොරතුරු ඇය හමුවේ දිග හැරෙමින් තිබිණි.

"මොනව වුණත් ලස්සන නම......" ගීතිකා සිනාසුණාය.

"ඇයි නම විතරක්... මම ලස්සන නැද්ද...?" ඔහු ඇගේ මුහුණට සිය සුසුම් වැදෙන තරමටම සමීප වූයේය. ගීතිකාගේ මුහුණ රත් පැහැ ගැන්විණි.

"ලස්සනයි... ටිකක් විතර....."

"ටිකක් ලස්සන තිබුණම හොඳටම ඇති.... ඕනවට වැඩිය ලස්සන වුණාමත් හරි කරදරේ....."

"ඒ මොකද.....?"

"ඇයි එතකොට කෙල්ලො එනවනෙ පස්සෙන්......" ඔහු සිනාසුණේය.

"දැන් ඔයා යනව කෙල්ලො පස්සෙ එහෙමද.....?"

"ඔයාව හොයාගෙන ආවට මම කෙල්ලො පස්සෙන් යන කෙනෙක් නෙමෙයි ගීති...." ඔහු තරමක තද හඬින් පැවසීය.

"අනේ තරහ වෙන්න එපා අයියෙ...." ගීතිකා බැගෑපත් ලෙස පැවසුවාය. "ඒ වගේ පහත් විදියට ඔයා ගැන හිතුව නම් මම මේ වගේ ගමනක් එන්නෙ නෑ...."

"ඒ කියන්නෙ ඔයාගෙ හිතේ මං ගැන තියෙන්නෙ උසස් හැඟීමක්...."

"පත්තර කාරයෙක් කියන්නෙ ඇත්තටම උසස් කෙනෙක් කියල තමයි මම හිතන්නෙ. එයාලා මොන තරම් ලොකු සමාජ සේවයක් ද කරන්නෙ....?"

"හැමෝම අපි ගැන ඔය විදියට හිතන්නෙ නෑ ගීති... වැඩි දෙනෙක් කරන්නෙ අපිට බනින එක...."

"හරියට අපිට වගේ.... එද අයියා පත්තරේට ලිව්ව ආර්ටිකල් එක මම කියෙව්වා.... මම දන්න කාලෙක වෙළඳ කලාපෙ කෙල්ලො ගැන හොඳක් කියල තිබුණේ ඔයාලගෙ පත්තරේ විතරයි...."

"අන්න දූන් තහනම් වචනෙ කිව්වා දෙසැරයක්ම...."

"තහනම් වචනෙ.....?" ගීතිකා දෙබැම හකුළුවා ඔහු දෙස බැලුවාය.

"මං කිව්වනෙ මට අයියා කියන්න එපා ගිම්හාන කියන්න කියල....."

"මං ආස නෑ ගිම්හාන කියන නමට.... වසන්ත වගේ නමක්වත් තිබුණනම්......"

"ගිම්හාන කාලෙ මොන තරම් ලස්සන ද කියල දන්නවනම් ඔයා ඔහොම කතා කරන්නෙ නෑ...."

"ඔයා කොහොමද කියන්නෙ ගිම්හාන කාලෙ ලස්සනයි කියල...."

"උපන්දා ඉඳල එංගලන්තෙ හිටපු මම කාලෙ වෙනස ගැන හොඳටම දන්නවා ගීති...."

www.sinhalelibrary.com
Uploaded By Crizzzy

ඔහු සාමාන්‍ය ස්වරයෙන් පැවසුවත් අදහාගත නොහැකි යමක් කියවුණ කලෙක මෙන් ගීතිකා දෙනෙත් විවර කර ගත්තාය. ගිම්හාන ඇය දෙස විමසිල්ලෙන් බැලීය.

"ගීති ඇයි.....?"

"අපි යමු ගිම්හාන......" ඇය එක්වරම නැගී සිටියාය.

"ඇයි ගීති...... හදිසියේම මොකක්ද ඔයාට වුණේ...?" ඇයත් සමග මුහුදු වෙරළින් නික්ම එද්දි ඔහු විමසීය.

"මගෙ ඔළුව රිදෙන්න ගත්තා....."

ඇය නළලට අත තබාගෙන පැවසුවේ ඔහුගේ මුහුණ මග හරිමිනි. ඇගේ දෙනෙතෙහි කඳුළු පිරී දිළිසෙමින් තිබෙනු ඔහු දිටීය. සැබැවින්ම ඇයට ඇත්තේ හිසරදයක් නොව හිතේ අමාරුවක් බව ඔහුට වහා වැටහිණි. එහෙත් එයට හේතුවක් සිතා ගැනීමට ඔහුට නොහැකි විණි.

"අපි මොනව හරි බීල යමු....." මීගමු නගරයට පැමිණි විට ගිම්හාන යෝජනා කළේය. "එතකොට ඔය හිසේ කැක්කුමත් ටිකක් අඩු වෙයි...."

"දැන් ට්‍රේන් එකක් තියෙනවා..... අපි ඒකෙ යමු ගිම්හාන......" ඇය බැගෑපත් සරින් යෝජනා කළාය. මොහොතක් නිහඬව ඇය දෙස බලා සිටි ඔහු එම යෝජනාවට එකඟ විය.

"ඔයාටත් පුළුවන් ද මං යන ට්‍රේන් එකේ යන්න.....?" ගිම්හාන විමසුවේ ටිකට් කවුන්ටරය අසලට යමිනි.

"ඔව්..... සීදුව පහු කරලනෙ ට්‍රේන් එක යන්නෙ...." ගීතිකා සිනාසෙන්නට තැත් දැරුවාය. එයින් වූයේ ඇගේ මුහුණේ වූ ශෝකී පෙනුම වඩාත් ඉස්මතු වීමය.

ඔවුන් දෙදෙනා සිටි දුම්රිය මැදිරියේ සිටියේ දෙතුන් දෙනෙකු පමණි. එබැවින් කිසිවෙකුගේ අවධානය ඔවුන් වෙතට යොමු වී තිබුණේ නැත. ගිම්හාන ගීතිකාගේ නිකටින් අල්ලා ඇගේ මුහුණ තමා දෙසට හරවා ගත්තේය. ගීතිකා දැඩි ලෙස සසල වූ බව ඔහුට ඇගේ



www.sinhalalibrary.com

මුහුණෙන් පෙනිණි. දෙනෙත්වල පිරී තිබූ කඳුළු කම්මුල් දිගේ ගලනු ඔහු බලා සිටියේ හැඟීම් විරහිත දෙනෙතෙනි. ඇයට හඬන්නට හේතුවක් තිබෙන්නට නොහැකියයි සිතූ බැවින් ඔහුගේ සිත ඇගේ කඳුළුවලින් සසල වූයේ නැත.

"මං ඔයාගෙ හිත රිදෙන කිසිම දෙයක් කිව්වෙ කළේ නෑ..... ඇයි ඔයා අඬන්නෙ.....?"

ඔහු තරමක දැඩි හඬකින් විමසීය.

සැබැවින්ම යුවතියක හමුවේ බැගෑපත් වීමේ පුරුද්දක් ඔහුට තිබුණේ නැත.

"මට ඒක කියන්න බෑ ගිම්හාන....." ඇය කඳුළු පිරි දෙනෙත් ඉවතට හරවා ගනිමින් මිමිණුවාය.

"කියන්න බැරි දෙයක් නම් මම ඔයාට බල කරන්නෙත් නෑ.... ඒත් මං ආස නෑ අපි දෙන්න මීට් වෙන හැමදාම ඔයා අඬනවට... එදත් ඔයා ඇඬුවා... අදත් අඬනවා..... අපි මීට් වෙන එක ඔයාට කරදරයක් ද.....?"

"නෑ දෙවියනේ නෑ....." ඇය ගිම්හානගේ උරහිසෙහි හිස රඳවා ගත්තාය. ඔහුගේ සිත මෘදු විය. ඔහු ඇගේ නළලත රැඳුණු කෙස් රොදක් සෙමින් පසුපසට කළේය.

"ගීති....." ඔහු දයාබර හඬින් ඇය ඇමතීය.

ඇගේ ගතින් නිකුත් වූ කිසියම් විලවුනක මුදු සුවඳ ඔහුගේ නාස් පුඩු තුළට පිවිසියේය. ඇය ළං කොට ගෙන ඒ සුවඳ සිත් සේ විඳගන්නට ඔහුට සිතිණි. සැබැවින්ම පියුමිගෙන් ඈත් වූ ද පටන්ම ඔහු යුවතියකගේ පහස පැතුවේම නැත. එහෙත් ඔහු සිතැඟි අනුව ක්‍රියා කළේ නැත. ඔහු කළේ ඇයට දැනෙන නොදැනෙන තරමට හිස පිරිමැදීම පමණකි. සීදූව දුම්රිය ස්ථානයේ දුම්රිය නවත්වන තුරුම ඔවුන් දෙදෙනා අතර කිසිදු කතා බහක් ඇති වූයේ නැත.

"ආ..... තේ..... සීදූවටත් ඇවිත්....." ගිම්හානගේ උරහිසේ රඳවාගෙන සිටි හිස මෑත් කළ ගීතිකා කලබලයෙන් පැවසුවාය. කුඩා අත් ලේන්සුවෙන් මුහුණ පිසදාගත් ඇය ලෙන්ගතුකමත් බැගෑපත් බවත්

www.sinhalalibrary.com

පුරවා ගත් ඇසින් මොහොතක් ඔහු දෙස බලා සිටියාය. ගිම්හාන මලක් සිප ගන්නා තරම් මුදුව ඇගේ නළලත සිප ගත්තේය. ගීතිකා එක්වරම තිගැස්සුණාය.

"බනින්න ගීති...." සසල දෙනෙතින් බලා සිටි ඇයට ගිම්හාන කීවේ දයාබරවය. ගීතිකා දෙනෙතේ කඳුළු පුරවාගෙන නැගී සිටියාය.

"අඬන්නෙ නැතිව යන්න....." ගිම්හාන මිමිණීය. දුම්රියෙන් බට ගීතිකා වේදිකාව දිගේ ඔහු ඉඳ සිටි අසුන අසල වූ ජනේලය වෙතට ආවාය.

"ගිම්හාන ඔයා තරහ ද මගෙත් එක්ක...." ඇය ඇසෙන නෑසෙන තරම් පහත් හඬින් පිළිවිසියාය.

"නෑ.... ඒත් මං ආසයි හිටි ගමන් ඔයා වෙනස් වුණ හේතුව දැනගන්න.

"මම ලියල එවන්නම්කො....." ඇය බිම බලාගෙන කොඳුළාය. දුම්රිය ඉදිරියට ඇදෙන්නට විය.

"බායි....." ඔහු දුක්බර මඳහසින් යුතුව සුරත සැලීය. ඇය දුම්රිය වේදිකාවේ සිටගත්වනම බලා හිඳිනු ඔහුට පෙනිණි. ඇය නොපෙනී ගිය වහාම ඔහුට දැනුණේ කියා නිමකළ නොහැකි තරමේ පාළුවකි.

ඔහුගේ සිත බෙහෙවින් චංචල වී තිබිණි. ඔහු සිය නවාතැනට එනතුරුම කල්පනා කළේ ඇය පිළිබඳවය. ඇයට යම් වැරැද්දක් සිදුවන අන්දමේ වදනක්වත් සිය මුවින් පිට නොවූ බව ඔහුට විශ්වාසය. එහෙත් ඇය හිටි ගමන්ම වෙනස් වූයේ මන්දැයි ඔහු කල්පනා කළේය.

ආශාවෙන් ඇරඹූ දිනය සිත් වේදනාවක් පමණක් ශේෂ කොට නිමා වී යනු ඇතැයි ගිම්හාන නිකමටවත් සිතුවේ නැත. ඔහුට කෑමට පවා ප්‍රියක් නොවීය. ඔහු තේ කෝප්පයක් ද සාදාගෙන සාලයට පැමිණියේය. කිසිදක නොවූ තරමේ හුදෙකලා බවක් නවාතැන පුරාම පැතිරී ඇතියි ඔහුට දැනිණි. තේ කෝප්පයක් සාදා දී එය පානය කරන තුරු රසබර

යමක් දෙඩමින් අසළක සිටින කෙනෙකු නැති වීමේ පාළුව ඔහුට දැනෙන්නට විය. මේ සියල්ල මෙසේ සිදුවූයේ ගීතිකාගේ හදිසි වෙනස් වීම නිසා බව ගිම්හානට සිතිණි.

දුරකථනය නාද වනු ඇසිණි.

ගිම්හාන උගුරක්වත් තොල නොගෑ තේ කෝප්පය ද අතැතිව නැගී සිටියේ දිගු සුසුමක් ද හෙළමිනි.

SL-UNLIMITED
The Spirit of Sri Lankan Community
www.sinhalaelibrary.com
Uploaded By Crzzzy

# 7

රාත්‍රිය නිහඬ විය. නිහඬ තරමටම එය ගුප්ත ද විය. ගීතිකා සුවසේ නිදන යෙහෙළියන් දෙස බැලුවාය. සැබැවින්ම තමාට ඔවුන් මෙන් සැහැල්ලුවෙන් නිදා ගැනීමට නොහැකි මන්දැයි ඇය සන්තාපයෙන් යුතුව සිතුවාය. ඇය ඇඳ හරහට දෙපා දමා බිත්තියට හේත්තු වී හිස් දෑසින් අඳුර දෙස බලා සිටියාය. එහෙත් අඳුර විනිවිද ගෙන ඇයට දිස්වූයේ ගිම්හානගේ කඩවසම් සිරුරය. ඒ ගැඹුරු බැල්මය. සිය නළල මත රැඳුණු ඔහුගේ දෙතොල් පහස තවමත් ඇයට දැනෙමින් තිබිණි. නළල හිරි වැටුණු සෙයක් මේ මොහොතේත් ඇයට දැනිණි.

ගිම්හානගෙන් වෙන් වී පැමිණි මොහොතේ සිටම ඇය පසුතැවිලි වූවාය. ඔහු අබියස මොහොතක් රැඳී නොසිට ඔහුගේ සිතත් රිදවා පලා ඒම ඇගේම සිත රිදවන්නක් විය. ඔහුගේ සිත මොන තරමක් පීඩාවට පත් වෙන්නට ඇද්දැයි ඇය සිතුවාය. ඔහු තමා වැනි වෙළෙඳ කලාපයේ සේවය කරන දිළිඳු යුවතියක අබියස බැගෑපත් විය යුතු පුද්ගලයෙකු නොවේ. එංගලන්තයේ හැදී වැඩුණු අයෙකු නම් ඔහු අතිශයින්ම ධනවත් තැනැත්තෙකු බව නොඅනුමානය. සැබැවින්ම ඇයගේ සිත දැඩි ලෙස සසල වූයේත් ඒ සත්‍යය නිසාම නොවන්නේ ද? ඇය දිගු සුසුමක් හෙළුවාය.

"අපි මීට් වෙන එක ඔයාට කරදරයක් නම් මම මීට පස්සෙ ඔයාව බලන්න එන්නෙ නෑ ගීති...."

ඔහුගේ දයාබර කටහඬ ඇය සිහිපත් කළාය. සැබැවින්ම ඔහු ඇය වෙත දක්වන්නේ කුමන අන්දමේ සෙනෙහසක්දැයි ඇයට සිතා ගැනීමටවත් නොහැකි විය.

"අනේ මන්ද මොනව වෙන්න එනවද කියල...." ඇය දෑතින් හිසකෙස් ඇද ගත්තාය.

"ගීති....." යාබද ඇඳේ නිදන සේනානිගේ හඬින් ගීතිකා තිගැස්සුණාය. පාර අයිනේ පහන් කණුවෙන් ගලා එන සුදුමැලි ආලෝකය කාමරයේ වූ අඳුර යන්තමින් පලවා හැර තිබිණි. සේනානි ඇඳේ වාඩිගෙන ඇය දෙස බලා සිටිනු ගීතිකා අඳුර තුළින් දුටුවාය. ඇය ඇඳෙන් බැස ගීතිකාගේ ඇඳට පැමිණි ඇය අබියසින්ම බිත්තියට හේත්තු වූනාය.

"මට ඇත්ත කියපන් ගීති....... මොකද උඹට අද වෙලා තියෙන්නෙ.....?" සේනානි ඇසුවේ ප්‍රියන්තිටත් නිර්මලාටත් නෑසෙන තරමේ පහත් හඬකිනි. ගීතිකා සුසුමක් හෙළා සේනානි දෙස බැලුවාය. එහෙත් ඔවුන්ට ඔවුනොවුන්ගේ මුහුණු පෙනුණේ යන්තමිනි.

"කතා කරපන්කො....." ඇය ගීතිකාගේ උරහිසින් අල්ලා සෙලවූවාය. ඇගේ අත ගීතිකාගේ කම්මුලක ස්පර්ශ විණි. කම්මුලක තැවරී තිබුණු කඳුළක සීතල ඇගේ සුරතට දැනිණි. සේනානි කලබල වූවාය.

"මේ රෑ මැද්දෙ ඇහැරගෙන උඹ අඬන්නෙ මොකටද කියපන් මට..... කොහෙද අද උඹ ගියෙ.....? නිලන්ත ආවද.....?" සේනානිගේ කටහඬ පහත් වුව ද රළු විය. එම ස්වරය ගීතිකාගේ සිතට කිසියම් බියක් දැනවිය.

"නෑ....." ගීතිකා සෙමින් කොඳුළාය.

"ගිය ඉරිදත් උඹ කොහේදෝ ගිහින් ආවා... අපිට කිව්වෙ අර පත්තර කාරයා මීට් වෙන්න යනව කියල..... අදත් උඹ කොහෙද ගියා..... එක කාමරේ එක බත්පත බෙදාගෙන කාල සහෝදරියො වාගෙ ඉන්න අපි තුන් දෙනාටත් උඹ හැමදේම හංගනව නේද ගීති.....?" සේනානිගේ කටහඬට කිසියම් දුක්බර බවක් එක් වී තිබිණි.

බෙහෙවින් විනෝදකාමී ඔය යෙහෙළිය මේ අන්දමින් කතා කිරීම ගීතිකාගේ සිතට පීඩාවක් විය. ඇය ගිම්හාන ගැන යෙහෙළියන්ට නොකීවේ සිතා මතාමය. පළමු දිනයේදී ඒ හමුවීමේ ඇති චමත්කාරජනක බව අඩු වෙතැයි බියෙන් ගීතිකා යෙහෙළියන් හමුවේ ගොළුවත පිරුවාය. මෙදින සිත පුරා අරක් ගත් දුක්බර සිතුවිලි පෙළ ගැස්වීමේදී හඬා වැටෙන්නට සිදු වෙතැයි ඇයට බිය සිතිණි. ඇය කිසිවක් ඔවුනට නොකීවේ එහෙයිනි.

"උඹලට හංගන්න තරම් දෙයක් නෑ කියල උඹ දන්නවනෙ සේනානි....." ගීතිකා බොහෝ වේලාවකට පසුව කටහඬ අවදි කළාය.

"එහෙනම් මොනවද උඹ අඬ අඬා කල්පනා කරන්නෙ....? අපෙන් උදව්වක් ඕනනම් කියපන්....."

"මං හිතන්නෙ නෑ කාටවත් මට උදවු කරන්න පුළුවන් වේවි කියල...." ගීතිකා කීයේ නැවත ද දිගු සුසුමක් හෙළමිනි.

"උඹ ඉතින් පණ්ඩිතයනෙ.... ඒත් මතක තියා ගනින් පණ්ඩිතයට ඒදණ්ඩෙ යන්න බෑ කියල......"

තරහින් කියූ සේනානි ඇඳෙන් බසින්නට උත්සාහ කළාය. එහෙත් ඒ බව ගීතිකාට ඉව වැටිණි. ඇය සේනානිගේ අත තරයේ අල්ලා ගත්තාය.

"මගෙත් එක්ක තරහ වෙන්න එපා බං.... බනින්නත් එපා මට..... මං අදත් ගියෙ ගිම්හානව මීට් වෙන්න......" ගීතිකා සෙමින් පැවසුවාය. ලා අඳුරේ වුව ද සේනානිගේ ඉරියව් වෙනස් වෙනු ඇයට දැකගත හැකි විය.

"ගිම්හාන....... අර පත්තරකාරයා.....?" නොදැනුවත්වම සේනානිගේ කටහඬ තරමක් උස් වී තිබිණි.

"කෑ ගහන්න එපා බං...." ගීතිකා අත්ලෙන් සේනානිගේ මුව වැසුවාය.

"ඇත්තටම උඹේ ඔළුව හොඳ නැද්ද ගීති...... අපිට බණ කිය කියා උඹ යනව කව්ද කියලවත් හරියට දන්නෙ නැති පිරිමි හොයන්න......" සේනානි කීවේ සැබැවින්ම තරහිනි.

www.sinhalalibrary.com

" පොඩ්ඩක් මං කියන දේ අහපන් සේනානි....." ගීතිකා බැගෑපත් සරින් පැවසුවාය. සැබැවින්ම ඇය කිසිදු දිනයෙක යෙහෙළියක හමුවේ මෙලෙස බැගෑපත් වී නොතිබිණි.

"හරි කියපන් ඉතින්....." යෙහෙළියගේ බැගෑපත් බව හමුවේ තරමක් මුදු වූ සිතැති සේනානි සන්සුන්ව පැවසුවාය. ගීතිකා කොතැනින් කතාව අරඹම්දැයි නොදන මොහොතක් නිහඬව සිටියාය.

සියල්ල සේනානිට පැවසීමෙන් පසුව ගීතිකාගේ සිත යම් තරමකින් සැහැල්ලුවට පත්විණි. සේනානි ඇයට හැකි අයුරින් ගීතිකාගේ බිඳුණු සිත සුවපත් කරන්නට වෑයම් කළාය.

"ඒ මනුස්සය හැඳුණෙ වැඩුණෙ එංගලන්තෙ කිව්ව ගමන් උඹ අප්සෙට් වුණා එහෙමද..? ගීතිකා සියල්ල පවසා අවසන් වනතුරු නිහඬව සිටි සේනානි විමසුවාය.

"ඔව්...." ගීතිකා පැවසුවේ අත වූ කොට්ටය තුරුළු කරගෙන ඒ මත නිකට හොවා ගනිමිනි.

"ඇයි ඒ.....?"

"ඇයි ඒ.....?" ඒ පැනයම උච්චාරණය කරමින් ගීතිකා සේනානි දෙස බැලුවාය. සේනානිගේ දෙනෙතේ තියුණු බව අඩ අඳුරේ වුව ද ඇගේ දෙනෙතට හසු විණි. සැබැවින්ම තමා නොසන්සුන් වූයේ නිකරුණේ යයි ප්‍රථම වරට ඇයට සිතිණි. ඇගේ සිත තුළට සියුම් ලැජ්ජාවක් බඳු හැඟීමක් ගලාගෙන ආයේය.

"මං දන්නෙ නෑ සේනානි මට මොනව වුණාද කියල...." ඇය සෙමින් මිමිණුවාය.

"ගිම්හාන කිවුවද ඔයාට ආදරේ කරනවා කියලා....?" සේනානි ඇසුවාය.

"නෑ....." ගීතිකා මුව විවර කළත් හඬ පිට නොවිය. ගිම්හානගේ දෙතොලේ පහසේ උණුසුම ඇගේ නළලතට නැවතත් දැනිණි.

වදන්වලින් කීවාට වඩා සිතට දැනෙන ලෙස ඔහු තමාට ආදරය ප්‍රකාශ කළේ යයි ඇයට සිතිණි. එහෙත් ඒ බව සේනානිට ඇඟවීමට ඇය පසුබට වූවාය.

"දැන් ඉතින් ඔය විකාර හිතෙන් අතෑරල දල නිදගනින් ගීති...... හෙට උදේ වැඩට යන්නත් එපායැ....." සේනානි ඇඳට ගියේ එසේ කියාගෙනය. ගීතිකා සුසුමක් හෙළා නැවතත් ඇඳේ වැතිරුණාය. එහෙත් ඇය වෙත නින්ද ළඟා වූයේ බොහෝ වේලාවකට පසුවය.

ඇය සේවය සඳහා ගියේ ද බොහෝ විඩාබර සිතින් යුතුවය. ඇය අතින් වැඩ කිහිපයක්ම අතපසු වී ගියේ ය.

"ගීතිකා මෙච්චර කල් නම් හොඳට වැඩ කළා.... පින්තූරේ පත්තරේ ගියාට පස්සෙ අනිත් අයගෙ ලෙඩෙ බෝ වුණාද.....?" අසාගෙන ආයතන පාලිකාව මැඹින් පේළි දෙක අතරින් ඉදිරියට ගියාය. ගීතිකාගේ දෙකොපුල් රතු විය. ඇගේ පින්තූරය පුවත්පතේ කවරයේ පළවූ දින සිටම ඇනුම්පද සරදම් බස් ආදියෙන් ඇයට අඩුවක් නොවීය. කාලයාගේ ඇවෑමෙන් ඒවා අවම වී යනු ඇතැයි ඇය සිතා සිටියාය. එහෙත් අංශ පාලිකාව ගීතිකා අතින් වරදක් සිදු වූ හැම විටෙකම නැවත නැවතත් මතක් කරලූයේ ඒ සිද්ධියමය.

"ගිම්හාන හින්ද තමයි මේ ඔක්කොම...." ඇය ඔහු පිළිබඳව තරහින් යුතුව සිතුවාය. ඔහුගේ දයාබරත්වයෙන් පිරි දෙනෙත ඇගේ දෙනෙත් හමුවේ ඇඳී ඇඳී මැකී ගියේය. ඇගේ සිත තුළ වූ කෝපය අතුරුදන් විය. ඒ වෙනුවට එතැන ලැඟුම් ගත්තේ වේදනාවකි.

"පිනි බින්දු වැටේ.... රෝස පෙති කඩා හැලේ..... ඉතින් අවසරයි මගේ පුංචි කුමරියේ....." ගීතිකා සිත තුළින් නැඟී එන ගීතයට සවන් දුන්නාය. පෙරද ගිම්හාන සිය නළලත සිපගෙන කොඳුරන්නට ඇත්තේ ද එලෙසයයි ඇයට සිතිණි. ඇගේ දෙනෙත්වලට කඳුළු පුරා ආවේය. එක් කඳුළු බින්දුවක් මසමින් සිටි රෙදි කැබැල්ල මත වැටිණි. මැසීම නතර කළ ගීතිකා දෝතින් මුහුණ වසා ගත්තාය.

"ගීතිකා...... මොකද ඔයාට...?" යාබද මැෂිමේ සිටි ප්‍රියන්ති විමසුවාය. එහෙත් ඇයට පිළිතුරු දීමට තබා හිස එසවීමටවත් ගීතිකාට සිතුණේ නැත.

"ගීතිකා...." එවර වම් පසින් නැගුණේ පාලිකාවගේ කට හඬය. ගීතිකා කඳුළු බර දෙනෙත් ඇය වෙත යොමු කළාය.

"මොකද සනීප නැද්ද....?" පාලිකාව විමසුවේ පෙරට වඩා මුදු ස්වරයකිනි.

"ඔව් මිස්... මගෙ හිස කකියනව ඉන්නවත් බැරි තරමට......" ගීතිකා කොඳුළාය. ඇගේ දෙනෙතින් කඳුළු කඩා හැලෙමින් තිබිණි. පාලිකාව මොහොතක් ඇය දෙස බලා සිටියාය. ගීතිකා කිසිදු විටෙක බොරුවට වැඩ අතපසු කරන තැනැත්තියක් නොවන බව ඇය දැන සිටියාය.

"පෙනඩෝල් දෙකක් බීලා රෙස්ට් රූම් එකේ ටිකක් ඉඳල එන්න බලන්න...." පාලිකාව යෝජනා කළාය.

"මිස් මම නිවාඩු දාල බෝඩිමට යන්න ද....?" ගීතිකා විමසුවේ බයාදු ස්වරයෙනි.

"ඔයා මේ මාසෙ නිවාඩු අරගෙන නෑ නේද.....?"

"නෑ මිස්....."

ගීතිකාට නිවාඩු සඳහා අනුමැතිය ලැබිණි. ඈත මැෂිමක සිටි ස්නේහානිගේ කුතුහල්බර දෙනෙත තමා වෙත යොමු වෙනු ගීතිකාට පෙනිණි. එහෙත් ඈ එම බැල්ම නුදුටු ලෙස කම්හලෙන් පිටතට ආවාය.

කම්හලෙන් පිට වූ වහාම තුමක්දෝ සහනදායී හැඟීමක් සිත තුළට පිවිසෙනු ඇයට දැනිණි. කුඩයෙන් හිස සෙවන කරගත් ඇය පාළු මාවත දිගේ ඇවිදගෙන ආවාය. උදෑසන නවයවත් වී නොතිබුණි ද ඒ වන විටත් පුවතියන් සුවහසක් ගැවසෙන මාවත හිස්ව තිබිණි.

දුම්රිය පොළට පැමිණෙන තුරුම ගීතිකා හිස එසවූයේවත් කල්පනාවෙන් මිදුණේවත් නැත. පාළු නවාතැන් කාමරයේ තනි වී නැවතත් සිත රිදවා ගන්නට වෙතැයි ඇයට සිතිණි. නවාතැනට හොගොස් යන්නට වෙන තැනක් ද නොවිය. එක්වරම සිතට දුනුණු පෙලඹීම නිසා ගීතිකා කොළඹ කොටුවට ටිකට්ටුවක් ගත්තාය.

ගිම්හාන නොකඩවාම හඬ දෙන දුරකථනය වෙතට ගියේ අලස ගමනිනි. සැබැවින්ම ඒ මොහොතේ ඔහුට අවශ්‍යව තිබුණේ සංවාදයක් නොව හුදෙකලා වීමටය. පෙරදා ගීතිකා නිසා කැළඹුණු සිත ඒ වන විටත් සන්සුන්ව නොතිබිණි. කාර්යාලයට යාමට හැඳ පැළඳ ගත්ත ද ඔහු තුළ වූයේ දැඩි උදාසීන බවකි. මෙතරම් උදාසීන බවක් කෙදිනකවත් ඔහුගේ සිතට දැනී තිබුණේ නැත. ඔහු රිසීවරය අතට ගත්තේ ද නොකර බැරි කමටය.

"හෙලෝ...."

"හායි ගිම්හාන......" එහා කෙළවරින් ඇසුණේ පියුමිගේ උද්‍යෝගිමත් කටහඬය. ගිම්හාන සුසුමක් හෙළා රිසීවරය ද අතැතිව පුටුවකට බර දුන්නේය.

"හායි පියුමි...." ඔහු ප්‍රබෝධවත් බවක් පෙන්වන්නට උත්සාහ කළ ද සැබැවින්ම එය මලානික ස්වරයක් විය. "කොහොමද සැප සනීප....."

"මම නම් ජොලියෙ ඉන්නවා.... දැන් වින්ටර් සීසන් එක පටන් ගත්තා....."

පියුමි කියද්දී ඔහුගේ සිත අතීතයට දිව ගියේය. සුදු පැහැති හිම ගොඩවල් මැද්දේ කොළ හැලුණු ගස් තටු පොරවාගෙන බලා සිටිනු ඔහු මනැසින් දිටීය. හිසේ සිට දෙපා දක්වා හිම කබා ඇඳ ගත් හිමට ඔරොත්තු දෙන හිස් වැසුම් ලාගත් මිනිසුන් යුහු යුහුව එහා මෙහා යනයුරු ඔහුට සිහිපත් විණි.

"හෙලෝ..... හෙලෝ.... ගිම්හාන....." එහා කෙළවරින් පියුමිගේ නොඉවසුම් සහගත හඬ ඇසෙද්දී ගිම්හාන නැවතත් පියවි ලොවට පිවිසියේය.

"මොකද ඔයා කතා නැත්තෙ.....? කව්රු හරි ඉන්නව ද ඔයා ළඟ.....?"

"ඔව් ඉන්නවා...." ගිම්හාන පිළිතුරු දුන්නේ නොසැළකිල්ලෙනි.

"කව්ද ඒ......? ලස්සන කෙල්ලක් ද......?" පියුමි කිකිණි හඬින් සිනාසුණාය. ගීතිකාගේ රුව ගිම්හානගේ දෙනෙත් හමුවේ ඇඳී මැකී ගියේය.

"මගෙ හෙවනැල්ල....." ගිම්හාන එසේ කියද්දී පියුමි වඩාත් උස් හඬින් සිනාසුණාය.

"ඒක තෙමෙයි ගිම්හාන..... ඔයාට පාළු ඇති නේද මම නැතිව....." එවර පියුමි විමසුවේ වෙනස් කරගත් කට හඬකිනි. සිතට නැගී කෝපය සමහන් වන තුරු ගිම්හාන තත්පර කිහිපයක් නිහඬව සිටියේය.

"ඒක දැන් ද ඔයාට තේරුණේ.....?"

"තරහ ගන්න එපා කොල්ලො..... ඔයාට මම කිව්වනෙ මම ලංකාවෙන් එංගලන්තෙට ආවෙ ආපහු කවදාවත් ලංකාවෙ පය් පාගන්නෙ නෑ කියල හිතාගෙන......"

"ඔයා දන්නවා මට නොකියන පැත්තකුත් ඔයාගෙ ජීවිතේ තියෙනවා කියල...." නොමනාපය නිසාම ගිම්හානට කියැවිණි.

"ඔව්.....ඔයාට නොකිව්ව හුඟක් දේවල් තියෙනව තමයි ගිම්හාන.... ඒත් මං ඒව හංගන්නෙ නෑ.... කවද හරි දවසක ඔයාට කියන්නම්...." ඇගේ කටහඬේ දුක්බර බවක් තැවරී තිබෙනු ඔහුට දැනිණි. ඔහුගේ සිතට ද දුක්බර සිතුවිලි ඇතුළු වෙමින් තිබිණි.

"මං වෙනුවෙන්වත් ඔයාට බැරි ද පියුමි ඔය අදහස වෙනස් කරල ලංකාවට එන්න.....?"

"බෑ... බෑ.... මං නොඑන එක ස්ථිරයි...... ඒක ගැන ආයෙමත් කතා කළොත් අපි දෙන්නට රණ්ඩු වෙන්න වේවි...."

"හරි එහෙනම්....... හැතැප්ම දාස් ගණනක් දුර ඉඳගෙන අපි දෙන්න රණ්ඩු වෙන එකේ තේරුමක් නෑ. ඔයා අපේ ගෙදර ගියෙ නැද්ද.....?"

"ළඟදි ගියෙ නෑ....." ඇය පැවසුවේ කිසියම් පැකිළීමකින්යයි ඔහුට සිතිණි.

"ඇයි ඒ.....?"

"ඔයා නිවාඩුවකටවත් මෙහෙ එන්නෙ නැද්ද ගිම්හාන.....?" ඇය සිය ප්‍රශ්නය මග හරින්නට එසේ විමසන බව ඔහුට වහා වැටහිණි.

"ඔයා ඉස්සර වෙලා මං අහපු ප්‍රශ්නෙට උත්තර දීල ඉන්න...." ඔහු පැවසුවේ කෝපයෙනි. රණ්ඩු නොවී කතා කරමු යයි ඔහු පැවසූ බව ඒ වන විට ඔහුටම අමතක වී තිබිණි.

"මං කිව්වනෙ ඔයාට..... මං හැම දේම දවසක කියන්නම් කියල......"

ගිම්හානට එක්වරම කිසියම් සංගීත නාදයක් ඇසිණි. සැතපුම් අහස් ගණනක දුර සිටියත් ඔහුට ඒ නාදය නොවැරදී හඳුනා ගන්නට හැකියාව තිබිණි. ඒ ඔහුත් පියුමිත් වාසය කරන මහල් නිවසෙහි ඇති සංගීතමය විදුලි සීනුවය.

"කව්ද ඇවිල්ලා නේද....?" ගිම්හාන විමසීය.

"ඔව්..... මං කියන්නම ගිම්හාන..... බයි බායි......" පියුමි කලබලයෙන් රිසීවරය තැබුවාය. රිසීවරය තබන්නට අමතක වූවාක් මෙන් ගිම්හාන මොහොතක් එලෙසම සිටියේය. එතුලින් නැගෙන හිස් නාදය ඔහුට දනුණේ කිසිවෙක් සරදම් කරන්නාක් බඳුවය. ඔහු රිසීවරය ආපසු තැබුවේ සිත තුළ නැඟී එන පරාජිත හැඟීම් රැසක් සමඟිනි.

පියුමි එතරම් කලබල වූයේ මන්දැයි ඔහු කාර්යාලයට යන අතරතුරදීත් කල්පනා කළේය. ඇය කිසියම් තරුණයෙකු හා වාසය කරනු ඇතැයි සිතුවිල්ල ඔහුගේ සිත තුළට නැඟී ආවේ සිත ඇඩී සේ පාරවමිනි. සැබැවින්ම පියුමි අතිශය දඟකාරී යුවතියකි. ගීත සාතුව ලඟා වෙද්දී ගිම්හානට නම් නිරතුරුවම පියුමි සිහිපත් විය. ඒ ඔහුත් ඇයත් හමු වූයේ කාඩිෆ් හිල්හි හිම ක්‍රීඩා කරන්නට ගිය දිනයක වීම නිසාය. එහෙත් ඇය නිකමටවත් ඒ ගැන මතක් නොකිරීම ඔහුගේ සිතට ළං කළේ මනස්තාපයකි.

"එයාට දැන් ඒව මොකුත් මතක නැතුව ඇති.... මමත් නැති හින්ද දැන් එයාට ඕන ඕන විදියට නටිනව ඇති....." ඔහු අමනාපයෙන් යුතුව සිතුවේය.

කල්පනාවේ ගැලෙමින් මෝටර් සයිකලය පැදවූ ගිම්හාන අතින් නොදැනුවත්වම එහි වේගය වැඩි වී තිබිණි. ඉදිරිපසින් ආ ලොරියක නොගැටී ඔහු සයිකලය හසුරුවා ගත්තේ අමාරුවෙනි. ලොරි රියැදුරා ගිම්හානට බැණ වැදුනේය.

"පාර බදු අරගෙන වගේ මුත් පාර පුරාම යන්නෙ...."

පරාජය පිළිගත් ගිම්හාන මෝටර් සයිකලයේ වේගය අඩු කළේය. ඔහු කාර්යාලයට පැමිණෙන විට බොහෝ ප්‍රමාද වී තිබිණි.

"සර් හම්බ වෙන්න කව්ද නෝන කෙනෙක් ආවා...." ගේට්ටුව අබියස සිටි ආරක්ෂක නිලධාරියා පැවසීය.

"නෝන කෙනෙක්....? මාව හම්බ වෙන්න.....?" ගිම්හාන නළලත රැලි කළේය.

ඔහු ඇතුළට ගියේ උනන්දුවකින් තොරවය. පැමිණ ඇත්තේ පුවත්පතේ ලිපියක් පළ කරවා ගැනීමට වුවමනා කාන්තාවක් යයි ඔහු සිතීය. එහෙත් ගීතිකා දුටු සැනින් ඔහුගේ සිත කැළඹිණි.

සැබෑවත් මායාවත් අතර අතරමං වූ කලෙක මෙන් ඔහු ගීතිකා දෙස බලා සිටියේය. ගීතිකා අසුනෙන් නැගිට පියවරකින් දෙකකින් ඔහුට ළං වූවාය. ඇගේ දෙනෙතට කඳුළු පිරී තිබිණි. යටිතොල සෙමින් සැලෙනුද ඔහුට පෙනිණි. ඔහු හැඟීමක් පළ නොවෙන දෑසින් මොහොතක් බලා සිටියේය.

"ගිම්හාන...." ඇය සෙමින් කොඳුළාය. ඇගේ කටහඬ හැඬුම්බර විය. එද මෙන්ම ඇය හඬා වැටෙතැයි ඔහුට බිය සිතිණි.

"ගීති...... එන්න අපි අර ඉස්සරහ ස්නැක් බාර් එකට යමු....." ගිම්හාන ඇය කැඳවීය. ඉඟි බිඟි කරන මිතුරු මිතුරියන්ගේ නෙත් වලින් සැඟවී ඇය හා තනි වීමට ඔහුට ඇවැසි විය. ඇය සෙමින් පියවර තබා ඔහු හා එක් වුණාය.

"ඔයා වැඩට ගියෙ නැද්ද ගීති....?" ඇගේ උරහිසින් එල්ලුණු අත් බෑගය දෙස විමසිලිමත් බැල්මක් හෙළමින් ගිම්හාන විචාළේය. එහෙත් එයට දීමට සුදුසු පිළිතුරක් ඇගේ දිවගට පිවිසියේ නැත.

"ඔයා මොනවද බොන්න කැමති....?" අවන්හලේ කෙළවර මේසයක අසුන් ගත් ගිම්හාන විමසීය. ඇය මේසයේ ෆෝමිකා තහඩුව මත ඉරි ඇන්දූ විනා පිළිතුරක් නොදුන්නාය.

"සර් අද නෝන කෙනෙකුත් එක්කම....?" ගිම්හාන දැක පුරුදු සේවකයා මුව පුරා පැතිරුණු සිනාවකින් යුතුව ඔවුන් අබිමුව පෙනී සිටියේය.

"ඔව් හොඳයි නේද.....?" ගිම්හාන ගීතිකා දෙස හොරැහින් බලමින් සිනාසුණේය. ගීතිකාගේ දෙකොපුලෙහි ලා රත් පැහැයක් විසිර ගියේය.

"මේ මොනව අහනව ද සර්.....? හැමදම තනියම ඉන්න හොඳයැ... සර්ටම ගැලපෙන නෝනා......" සේවකයා පැවසුවේ ආචාරශීලී හඬිනි. ගීතිකාගේ මුහුණ වඩාත් බිමට නැඹුරු විය.

"පෝටෙලෝ දෙකක් ගේන්න පියදාස...." ගීතිකාගේ මුවින් වදනක් හෝ පිට නොවූ බැවින් ගිම්හාන සේවකයා ඇණවීය.

"ගිති කතා කරන්නකෝ...... ඇයි මාත් එක්ක තරහ වෙලා වගේ....."

සේවකයා නික්ම ගිය වහාම ගිම්හාන මේසය මත වූ ඇගේ අතැඟිලි තුවු සිය සුරතට මැදි කර ගත්තේය. මුළු ගතම ශීතලව ගිය සෙයක් ඇයට දැනිණි. ඔහුගෙන් අත මුදා ගැනීමට තරම් දිරියක් නොවූ ඇය අසරණ බැල්මකින් ඔහුගේ මුහුණ දෙස බැලුවාය.

"මට කතා කරන්න දෙයක් නෑ ගිම්හාන....." ඇය කොඳුළාය.

"ඇයි එහෙනම් ඔයා මාව බලන්න ආවෙ.....?"

"ඒක මටවත් හිතා ගන්න බෑ...." ඇය පැවසුවේ අවංකවමය. සැබැවින්ම දුම්රියේ එද්දි ද මේ යන ගමනේ තේරුම් කුමක්දැයි ඇය කිහිප වරක්ම තමන්ගෙන්ම විමසා ගත්තාය.

"අපිව බණ කියන උඹ කව්ද කියලවත් නොදන්න කොල්ලො මීට වෙන්න පත්තර කන්තෝරු ගානෙ යනවා......" පෙරදා සේනානි දෙස් පැවරූ අයුරු ඇයට කිහිප වරක්ම සිහිපත් විය.

ඇය හිස ඔසවා ගිම්හානගේ දෙනෙත් දෙස ඍජුව බැලුවාය. ඔවුන් දෙදෙනා එකිනෙකා වෙතින් දෙනෙත් ඉවතට ගන්නට නොහැකි විලසින් නිමේෂයක් එලෙසම සිටියහ. පළමු හමු වීමේදී සිය සිත සසල කළ ඒ තරු දෙනෙතේ කාන්තිය ගිම්හාන සිත් සේ විඳ ගත්තේය.

"සර් මෙන්න පෝටෙලෝ දෙක...." සේවකයාගේ කටහඬින් ඔවුන්ගේ දැහැන බිඳිණි. ගිම්හානගේ සිත තුළ සිහින් නොරිස්සුමක් ඇති විණි. ඇගේ දෙනෙතින් දෙනෙත මුදා ගත්ත ද ඔහු ඇගේ අතැඟිලි මුදා හැරියේ නැත. සේවකයා මුවට නැඟුණු සිනාව සඟවා ගැනීමට වෙර දරමින් ඉවතට ගියේය.

"බොන්න ගීති...." ඔහු එක් පෝවෙලෝ බෝතලයක් ඇය වෙතට ළං කළේය. එහෙත් ඇය එදෙස බැලුවේවත් නැත.

ගීතිකා දෙස බලා සිටියදී ගිම්හානට සිහිපත් වූයේ පියුමිය. පියුමි හා කළ දුරකථන සංවාදයෙන් අනතුරුව ඔහුගේ සිත දැඩි ලෙස කැළඹිණි. ඒ ඇය වෙනෙකකු හා සබඳකමක් පවත්වනු ඇතැයි සිත තුළ හැඟුණු සිතුවිල්ල නිසාය. එසේ නම් ඔහු මෙලෙස යුවතියකගේ අතැඟිලි අල්ලා ගෙන සිටිනු දුටුව හොත් පියුමිට කුමක් සිතෙනු ඇද්දැයි ඔහු කල්පනා කළේය. එහෙත් ගීතිකාගේ මුදු රතැඟිලි මුදා හැරීමට ඔහුට ලෝබ සිතිණි.

"ගීති......" ඔහු අපමණ දයාවෙන් කොඳුළේය. ඒ කටහඬ ඇගේ දෙනෙතට කඳුළු නැංවීමට තරම් හැඟුම්බර විය.

"ඇයි ඔයා අද වැඩට ගියේ නැත්තෙ.....?" ඔහු යළි වරක් විමසීය. ගීතිකා කඳුළුබර දෙනෙත විකසිත කොට ඔහු දෙස බැලුවාය.

"මං ගියා වැඩට....." ඇය නැවත ද දෙනෙත බිමට යොමු කර ගනිමින් පැවසුවාය.

"එහෙනම් මෙහෙ ආවෙ.....?"

"මං ආව එක ඔයාට කරදරයක් ද ගිම්හාන.....?"

"මමත් ඔයාගෙන් ඊයෙ ඕකම ඇහුවා......."

ගිම්හාන ඇගේ අතැඟිලි මුදහැර පෝවෙලෝ බෝතලය ළං කොට ගත්තේය. ඔහුත් ඇයත් අතර වූ සියලුම බැඳීම ගිලිහී ගියාක් වැනි හැඟීමක් ඇයට දැනිණි. ගිම්හානගේ අතැඟිලි සිය අතැඟිලි අතර රැඳී තිබූ තාක්කල් ඇයට ආරක්ෂාකාරී හැඟීමක් දැනෙමින් තිබිණි. සැබැවින්ම ඒ හැඟීමේ අරුත කිමෙක්දැයි ඇය කල්පනා කළාය.

ගිම්හාන යනු ඇයගේ ජීවිතයට සම්පූර්ණයෙන්ම පිටස්තරයෙකි. අහම්බෙන් හමු වී අහම්බෙන් මෙන් මෙතරම් ළං වුව ද ඔහුගෙන් පතන්නේ කුමක්දැයි ඇයට සිතා ගැනීමට පවා නොහැකි විය. නිලන්තගෙන් හිස් වූ අරාජික ඇගේ ලොවේ සෙනෙහසේ කිරුළ පැළඳවීමට ගිම්හාන තරම් සුදුස්සෙකු තවත් හමු නොවෙනු ඇත.

එහෙත් ඔවුන් දෙදෙනා අහස පොළොව මෙන් දුරස්තරය. ඔහු ඉපැදුණ ද සිට එංගලන්තයේ හැදී වැඩුණු උසස්යයි සම්මත සමාජ තලයේ පුද්ගලයෙකි. රට පිළිගත් රැකියාවක නියුතු කෙනෙකි. ඇය නිකම්ම නිකම් වෙළඳ කලාපේ කෙල්ලකි. ඔවුන් දෙදෙනා අතර පෑහීමක් ඇති වීම මිරිඟුවක් පමණකැයි ඇයට සිතිණි.

"ගීතිකා.... දැන් ඉතින් මගේ ඉවසීමේ සීමාව පැනලයි තියෙන්නෙ....." ගිම්හානගේ රළු හඬින් ගීතිකා දැහැනින් මිදුණාය. ඔහුගේ දෙනෙතේ මෙතෙක් නොවූ විරූ දැඩි බැල්මක් තිබෙනු දැක ඇගේ සිත නැති ගැනිණි. ඔහුගේ පෝටෙලෝ බෝතලය අවසන්ව තිබිණි. එහෙත් ඇගේ බෝතලය එලෙසම මේසය මත විය.

"බොන්න ඕක...." ඔහු ඒ ස්වරයෙන්ම අණ කළේය. ගුරුවරයෙකුගේ අණ පිළිපදින සිසුවියකගේ කීකරුකමින් යුතුව ගීතිකා පෝටෙලෝ බෝතලය ළං කර ගත්තාය.

"ගීතිකා මං කැමති නෑ කෙල්ලෙකුගෙ හිතක් රිද්දවන්න..... ඒ වගේම මම කැමති නෑ කෙල්ලක් මගේ හිත රිද්දනවටත්...."

"මං ඔයාගෙ හිත රිදෙව්වෙ නෑ අයියෙ....." ගීතිකා බියමුසු හඬින් පැවසුවාය. ඔහුට ගිම්හාන යනුවෙන් ඇමතූ බව ඒ වන විට ඇයට අමතක වී තිබිණි. ඔහු ද මේ වන තුරුම ඇය ඇමතුවේ "ගීති" වශයෙනි. එහෙත් කෝපයට පත්වීම නිසා ඔහුට ද ඒ ඇමතුම සිහිපත් නොවන්නට ඇතැයි ඇයට සිතිණි.

"මං කිව්වනෙ මට අයියා කියන්න එපා කියල....."

"සොරි....." ඇය ඔහු දෙස බලාගත්වනම පෝටෙලෝ බෝතලයෙන් උගුරු කිහිපයක් බිව්වාය.

සැබැවින්ම යුවතියකගේ ජීවිතය මොන තරම් ගුප්ත සහගතදැයි ගිම්හාන කල්පනා කළේය. ඔහුට නොකියූ බොහෝ දේවල් තිබෙන බව පියුමි පැවසුවාය. ගීතිකා ද යමක් සිත තුළ තෙරපාගෙන පීඩා විඳින බව ඔහු සක්සුදක් සේ පැහැදිලිව දිටිය. එක් අතකට වසර දෙක තුනක් එක්ව ගතකළ පියුමි ද තමාගෙන් වසන් කළ දේ ඇති කොට ගීතිකා තමා අබියස සිතැඟි හෙළි නොකිරීම අරුමයක්දැයි ඔහු සිතීය.

"හේ.... යි ගිම්හාන......" හදිසියේ ඇසුණු හඬකින් ඔවුහු දෙදෙනාම ගැස්සුණහ.

සිනාසෙමින් පැමිණි සංජීව ඔවුන් අබියස වාඩි ගත්තේ අනාරාධිතවය. ගීතිකාගේ දෙනෙත ලැජ්ජාවෙන් බිමට යොමු විය. සංජීව සරදම් දෑසින් ඔවුන් දෙදෙනා දෙස මාරුවෙන් මාරුවට බැලීය.

"මොකද උඹට වෙලා තියෙන්නෙ.....?" ගිම්හාන විමසීය.

"පියදස මටත් පෝටෙලෝ එකක් ගේන්න....." සේවකයාට අණ කළ සංජීව අසුනේ හරි බරි ගැසුණේය.

"මටත් උඹෙන් අහන්න තියෙන්නෙ ඒකම තමයි.... බලපන් උඹ ඊයෙ මට කිව්වා අටට එන්න කියල මොකක්දෝ මල දෙනෙක ෆොටෝස් ගන්න යන්න තියෙනවා කියලා..... මම එපොයින්ට්මන්ට්ස් දෙක තුනකුත් කැන්සල් කරගෙන උඹ එනකම් බලාගෙන හිටියා.... උඹ මෙහෙ පෙම් පිළිසඳරේ......" සංජීව දෝෂාරෝපණයක හඬින් පැවසීය.

"සොරි මචං.... මම මේ දැනුයි ආවෙ.... එනකොට ගීතිකා මීට් වුණා... ඉතින් අපි මොනව හරි බොන්න කියල ආවා...." ගිම්හාන සංජීවගේ උරහිස මත සුරත තැබීය. එහෙත් ඇය හිස එසවූයේම නැත.

"මිස්ටර් අබේනායකත් කීප සැරයක්ම උඹව ඇහුවා... බැරිම තැන මං උඹගෙ ගෙදරට කෝල් එකකුත් දුම්මා....."

"මම බයික් එකට නගිනකොටම ෆෝන් එක රිං වෙනව ඇහුණා... ආපහු දෙර අරින්න කම්මැලිකමට මම එහෙම්ම ආවා...."

"පත්තරකාරයො කියන උන් ඔච්චර කම්මැලි වෙලා බෑ....." සංජීව සේවකයා ගෙනා බීම බෝතලයේ බටය මුවට ළං කර ගත්තේය. "ඉතින් ඉතින් ගීතිකා... කෝ පත්තරේ කවරයක් දල දුන්නට අපිට ලැබුණෙ නෑනෙ කිසිම සපෝර්ට් එකක්......"

ගීතිකා එවර හිස ඔසවා සංජීව දෙස බැලුවාය. ඇගේ දෙනෙතේ කෝපයක සේයාව සටහන් වෙනු ගිම්හාන පැහැදිලිවම දිටිය.

"ඔව් සපෝර්ට් එකක් දෙන්න තමයි ගීතිකා හිතාගෙන ඉඳල තියෙන්නෙ...." ඇය කෝපයට පත් වී කුමක් කියාවිදැයි සිතාගත නොහැකි වූ නිසා ගිම්හාන පැවසීය.

www.sinhalalibrary.com
Uploaded By Crzzzy

"එහෙම නම් මචං මෙතන හරියන්නෙ නෑ... යමං හොඳට කන්න බොන්න පුළුවන් හොටෙල් එකකට...." සංජීව ඉඟි මැරීය. ගීතිකා නොපහන් දෑසින් ඔහු දෙස බලා සිටියාය.

"උඹට හොඳ හොටෙල් එකකින් කන්න වෙච්ච ලඟදීම කෙල්ලන්ට නොකියා උන්ගෙ පින්තූර පත්තරවල දන්න ගියාම....." ගිම්හාන මුවගට සිනාවක් නඟා ගත්තේය. ගීතිකා නැවතත් දෙනෙත් බිමට යොමු කර ගත්තාය. සංජීව කුතුහලයෙන් ඔවුන් දෙදෙනා දෙස බැලීය.

"පින්තූරයක් දන්න කියල කන් කෙඳිරි ගගා පිටිපස්සෙ එන කෙල්ලන්ගෙ වගේ නෙමෙයි ඔය වගේ හොරෙන් පින්තූරයක් අරන් දම්මම තමයි ත්‍රිල් එක තියෙන්නෙ.. අනින් එක නියම පින්තූර ගන්න පුළුවන් එතකොට...... බලපන් ගීතිකාගෙ පින්තූරෙ කොච්චර ලස්සන ද...? මිස්ටර් අබේනායක මට කිව්වා මං මේ අවුරුද්දෙ ගත්ත හොඳම පින්තූරෙ කියල...." සංජීව කියාගෙන ගියේ සිනාසෙමිනි.

ඒ පින්තූරය පිළිබඳව ප්‍රධාන කතෘතුමා ප්‍රශංසාත්මක මුවින් කතා කළ බව ගිම්හාන ද දැන සිටියේය. සැබැවින්ම ඔහුගෙන් එවන් ප්‍රශංසාවක් ලද හැක්කේ ඉතාම උසස් ගණයේ නිර්මාණයකට බව පුවත්පත් කාර්යාලයේ සියළු දෙනාම අත් දුටු සත්‍යයක් විය.

"ෂා නියම පින්තූරෙ..... මේ වගේ ලස්සන කෙල්ලක් හරියන්නෙ වෙළඳ කලාපෙට නෙමෙයි. ෆිල්ම් එකක මේන් කැරැක්ටර් එකට...." උපැස් යුවල දබරැඟිල්ලෙන් සකස් කරමින් ප්‍රධාන කතු තුමා කී අයුරු ගිම්හාන නැවත වරක් සිහිපත් කළේය.

"අපි වගේ අයට ලස්සන කියන එක ආභරණයක් නෙමෙයි ගිම්හාන....."

ගීතිකාගේ මුවින් එදා නිකුත් වූ වදන් මතකයේ තිබූ බැවින් ගිම්හාන කවරයේ පින්තූරය ගැන කිසිම විටෙක ඇය අබියස සඳහන් නොකළේය. එහෙත් සංජීව වළකාලන්නටද හැකියාවක් ඔහුට නොතිබිණි.

"ඇයි ගීතිකා කතා නොකරන්නෙ...." සංජීව ඕනෑකමින් ඇය දෙස බැලීය. ගීතිකා හිස ඔසවා සංජීව දෙස බැලුවේ පුදුමයක් ද හෙළමිනි.

www.sinhalalibrary.com

"මොනවා කතා කරන්න ද අයියෙ.....?"

"ඇත්තටම කියන්න... ඒ පින්තූරෙ ලස්සනයි කියල පිළි ගන්නෙ නැද්ද ඔයා....?"

ගීතිකා කතා නොකළාය. එහෙත් ඇගේ සිත බෙහෙවින් ඥදමළ වී තිබිණි. ඒ පින්තූරය සැබැවින්ම කලාත්මක ගුණයෙන් ඉහළ එකක් බව ඇය පිළිගත්තාය. එහෙත් එය නිසා ඇසූ ඇනුම් පද..... විඳි සිත් තැවුල් සිහිපත් වෙද්දී ඇගේ සිත ශෝකයෙන් බර විය. ඇය වෙළඳ කලාපයේ සේවය කරන යුවතියක නොවී වෙනත් උසස් යයි සම්මත රැකියාවක නිරතව සිටියේ නම් ඒ පින්තූරය වෙසෙස් ඇගයීමකට ලක් වෙන්නට ඉඩ තිබිණි.

ගිම්හානත් ඇයත් මෙතරම් සමීප වූයේ ද ඒ පින්තූරය නිසාමය. එහෙත් ඒ ඇසුරේ කෙළවර ද වේදනාවක් පමණක් වන බව ඇගේ සිත මුමුණා කියන්නට විය. ගීතිකා දෙනෙතට නැගී කඳුළු වසන් කරලන්නට වෙනතක බැලුවාය.

"ඇයි ගීතිකා...." සංජීව විමසුවේ ඇගේ වෙනස වැටහුණු නිසාය. ඇය නැවත වරක් හඬා වැටෙතැයි ගිම්හානට බිය සිතිණි.

"අපි ඔය කතාව දැන් නවත්තමු මචං..."

ගිම්හාන පහත් හඬින් සංජීවට පැවසීය. සංජීවගේ දෙනෙත විස්මයෙන් සහ කුතුහලයෙන් විවර විය.

"ඇයි ගීතිකා... ඒ පින්තූරෙ හින්ද ඔයාට මොකක් හරි ප්‍රශ්නයක් වුණාද.....?"

සංජීව විමසුවේ සිත නැගි කුතුහලය නිසාමය. ගීතිකාගේ සිතට නැවතත් කෝපයක් දැනිණි. එහෙත් ඔවුන්ගේ දයාබර බව හමුවේ ඒ කෝපය වදන් වලට පෙරළා ගැනීමට තරම් දිරියක් ඇයට නොමැති විය.

"මං ගිම්හාන අයියට සේරම විස්තරේ කිව්වා අයියෙ..... මං ආස නෑ අයෙ ආයෙමත් ඒව කියන්න..... ඔයා එයාගෙන් අහගන්න...." ගීතිකා පහත් හඬින් පැවසුවාය.

# 8

ඈත ක්ෂිතිජය රන් පැහැයෙන් බැබළෙමින් තිබිණි. රන් පැහැති බෝලයක් බඳු හිරු තව මොහොතකින් අතුරුදන්ව යනු ඇත. ඉන් පසු මුළු ලොවම ගනඳුරින් පිරී යනු නොඅනුමානය. ඒ ගනඳුර දුරු කරලන්නට දල්වන විදුලි පහන් එළි මායාවක් පමණක් නොවේදැයි ගිම්හාන කල්පනා කළේය. ඔහු දිගු සුසුමක් හෙළා තවත් බියර් විදුරුවක් පුරවා ගත්තේය. සංජීව ඔහු දෙස බලා සිටියේ කුතුහලයෙනි.

"මොකද උඹ තවමත් මූඩ් ගහගෙන.....?" සංජීව විමසුව ද ගිම්හානට එය නෑසිණි. ඔහු විනෝදකාමීන්ගේ පාරාදීසයක් බඳු වූ ගාලු මුවදොර පිටිය පුරා දෑස දිවෙව්වේය. විනෝද කාමීන් පමණක් නොව වේදනාබර සිතුවිලි දරා ගත්තවුන් මොන තරමක් නම් මේ ඉමේ ගැවසෙනු ඇද්දැයි ගිම්හාන කල්පනා කළේය. ඔහු ද ඔවුනතරින් එක් අයෙකු නොවන්නේද?

"උඹ දැන් මට කිව්වා ගෝල්ෆේස් යමු හුඟක් දේවල් කියන්න තියෙනවා කියල... දැන් උඹ මොකාද වාගෙ උඩ බලාගෙන ඉන්නවා.. කතා කරපන්කො ගිම්හාන... මොකද උඹට වෙලා තියෙන්නෙ.....?" සංජීව එවර ගිම්හානගේ උරහිසට අත තැබුවේ නොඉවසුම් සහගතවය.

ගිම්හාන පෙණ ඉතිරෙන බියර් වීදුරුව දෙතොලට ළං කර ගත්තේය. එහි පුංචි පුංචි වායු බුබුළු බිඳී විසිරෙන ලෙස සිතේ සතුට ද බිඳෙන් බිඳ වියැකී යන බව ඔහුට දැනෙමින් තිබිණි.

"මන්ද මට කිසිම දෙයක් හිතා ගන්න බෑ මචං....." ගිම්හාන වීදුරුව පසෙකින් තබා දණහිස් වටා දෑත බැඳ ගත්තේය. සංජීව ඔහු දෙසම බලා සිටියා විනා කිසිවක් කීවේ නැත

"ඉර බැහැල ගියාම ලෝකෙම අඳුරු වෙලා යනව නේද.....?" මඳ වේලාවකට පසු ගිම්හාන විමසුවේ සංජීව සිනා ගන්වමිනි.

"උඹට ඩෝප් ද.... එහෙම නැත්තම් පිස්සු හැදිගෙන එනව ද.....?" සංජීව විමසුවේ ඒ සිනාවෙන්ම යුතුවය.

"ඒ මොකුත් නෙමෙයි බං...."

"එහෙනම් උඹ කියන්නෙ අර කෙල්ල ඇවිත් ගියාට පස්සෙ උඹෙ ලෝකෙ අඳුරු වුණා කියල එහෙමද.....?"

"ඒකත් නෙමෙයි...."

"එහෙනම් කියන අට මගලයක් සිංහලෙන් කියපන් ඩෝ....."

සංජීව අතේ වූ බියර් බෝතලය බිම තැබුවේ කෝපයෙනි. එහෙත් ගිම්හාන ඒ කෝපය ගණනකටවත් ගත්තේ නැත. මුහුද පිසගෙන ආ ලවණ මිශ්‍රිත සුළඟින් එහා මෙහා යන අකීකරු කෙස් කළඹ අතින් හීලෑ කර ගනිමින් ඔහු ඉවසිල්ලෙන් කතා කළේය.

"මේ ලයිව් ඔක්කොම නිවල දම්මොත් අපිට තේරේවි අපි වැටිල තියෙන්නෙ මුලාවක කියල...."

"මල්ලි..... ඔය දර්ශනේ හරියන්නෙ නෑ මට..... උඹට කියන්න තියෙන දේ කොටින් කියපන්. මම අහගෙන ඉන්නම් එළි වෙනකම් වුණත්...."

ගිම්හාන නැවතත් ක්ෂිතිජය වෙත නෙත් රඳවිය. එවර මුළු අහසම සැරසී තිබුණේ වෛවර්ණ පැහැයෙනි. එක් ලා රෝස පැහැති වලා කැරැල්ලක් දුටු ගිම්හානට ගීතිකා හැඳ සිටි රෝස පැහැති ගවුම

සිහිපත් විය. නැවත ද ඔහුගේ සිත රිදෙන්නට විය. උදෑසන ගීතිකා ඔහුගෙන් වෙන් වී ගියේ එතරම් කැමැත්තකින් නොවන බැව් ඔහු සිහිපත් කළේය. අවන්හලේ සිටියදී ඔවුන් දෙදෙනා අතරට සංජීව පැමිණියෙන් ඇය පැමිණි හේතුවවත් ඔහුට විමසා දැනගත නොහැකි විය. එය නොඅනුමානවම සමාව අයැදීමට පැමිණි ගමනක් විය යුතුයයි ඔහුට සිතිණි. පුවත්පතට හදිසි ලිපියක් ලිවීමට තිබූ බැවින් ගිම්හාන අකමැත්තෙන් වුව ද ඇයට සමු දුන්නේය.

"මම ඔයාට ලියුමක් එවන්නම්කෝ......" ඇය දුක්බර මදහසකින් සුහුව ඔහුගෙන වෙන් වී ගියාය. ඇය සෙනඟ අතරින් නොපෙනී යන තුරුම ඔහු හිස් දෑසින් එදෙස බලා සිටියේය.

"මස්සිනා...... මොකද උඹ තවම බලාගෙන ඉන්නෙ.....? කෙල්ල හිතත් ඩැහැගෙන ගියාද.....?" සංජීව ඇසක් වසා ඉඟි කළේය.

"මට ඒ කෙල්ල ගැන පුදුම විදියෙ හැඟීමක් දැනෙනවා මචං...." ගිම්හාන පැවසුවේ පහත් හඬිනි.

"ඒ ආදරේ වෙන්න ඇති....." සංජීවගේ කටහඬේ කැටි වී තිබුණේ උපහාසයකි. "ඒත් මචං උන් අහිංසක කෙල්ලො.... නිකම් අපරාදෙ බලාපොරොත්තු දෙන්න එපා......"

සංජීවගේ ගැඹුරු හඬට සවන් යොමන්නට තරම් චිත්ත ඒකාග්‍රතාවයක් ගිම්හානට තිබුණේ නැත. ගීතිකා සිය සිත ද පැහැරගෙන ගිය බව නම් සැබෑවකැයි ඔහුට සිතෙන්නට විය.

"සංජීව හවසට යමු ද ගෝල්ෆේස්.....?" හිටි ගමන්ම ගිම්හාන යෝජනා කළේය.

"ඕකත් අහන්න දෙයක් ද.....? යමන් යමන්.... මම එවර් රෙඩි.... දන්නවනෙ...."

සැබැවින්ම සියල්ල කිසිවෙකුට කියා සිත සැහැල්ලු කර ගැනීමේ දැඩි වුවමනාවක් ගිම්හාන තුළ ඇතිවෙමින් තිබිණි. ඔහු සංජීව ද කැටුව ගාලු මුවදොර පිටියට පැමිණියේ එහෙයිනි. එහෙත් බීර බෝතල් දෙකක් හිස් වනතුරුම කතාව පටන් ගත යුත්තේ කොතනින්දැයි ගිම්හානට සිතා ගත නොහැකි විය. සංජීව නොඉවසුම් සහගතව සිටියේ එහෙයිනි.

"දැන්නම් ඉතින් මට තද වෙනව මචං......" සංජීව ගිම්හාන දෙස බැලුවේ නොරිස්සුම් සහගතවය.

"උඹට කියන්න බැරි නම් යමන් යන්න...... නිකම් මෙතෙන්ට වෙලා පෙට්රල් පුච්චන්නෙ නැතුව......"

"මට ගීතිකා ගැන හරි දුකයි මචං...." ගිම්හාන සිගරැට්ටුවක් පත්තු කරගෙන දෙතොලතර රඳවා ගත්තේය.

"ඔය ටික කියන්න ද උඹ මච්චර තෙපර බෑවෙ.....? ඉතින් මොකද උඹ ඔය කෙල්ලෙක් ගැන දුක් වෙන්නෙ....? ඒකි ගැන මොකක් හරි අදහසක් තියෙනව නම් කෙළින්ම කියපන්.... එච්චරනෙ....." සංජීව පැවසුවේ සැහැල්ලුවෙනි. "මට හිතෙන්නෙ ඒ කෙල්ලත් උඹ ගැන බලාපොරොත්තුවක් තියෙනව වගේ......"

"එච්චර ලේසියෙන් ඒක කරන්න පුළුවන් නම් මම මෙච්චර කල්පනා කරන්නෙ නෑ මචං....." ගිම්හාන දිගු සුසුමක් හෙලා සිගරැට්ටුව කිහිප වරක් තදින් ඉරුවේය.

"ඇයි මොකක්ද ප්‍රශ්නෙ...... ඒකිට වෙන කොල්ලෙක් ඉන්නවද.....?"

"නෑ....."

"එහෙනම්.....?"

"මම බැඳලනෙ මචං......" ඔහු සංජීව දෙස බැලුවේ හිස් බැල්මකිනි. සංජීවගේ දෙනෙත කුතුහලයෙන් විකසිත විය.

"මොනව......? උඹ බැඳල.....?"

"ඔව් මචං....."

ගිම්හාන කීවේ බිඳුණු හඬිනි. ඇදහිය නොහැකි යමක් කියැවුණ කලෙක මෙන් සංජීව බලාසිටියේය. ගිම්හාන සියල්ල පවසා අවසන් වන තුරුම ඔහු එකම වදනකින්වත් බාධාවක් නොකොට සිගරැට්ටුව ඉරුවේය. සැබැවින්ම ගිම්හානට අවශ්‍ය වූයේ සියල්ල කාට හෝ පවසා සිත නිදහස් කරගැනීමට පමණකි. තවමත් ඔහුට බරපතල ප්‍රශ්නයක් පැන නැගී තිබුණේ නැත. අනෙත් අතට ප්‍රශ්නයක් පැන නැගුණ ද එහි විසඳුම තිබුණේ ඔහු වෙතමය.

www.sinhalalibrary.com
Uploaded By Crzzzy

"දූන් උඹ ඔය ටිකම ගීතිකාටත් කියන්න ද හිතාගෙන ඉන්නෙ.....?"

ගිම්හානගේ කතාව අවසන් වූ ඉනික්බිති මුහුද දෙස බලාගෙන මඳ වේලාවක් කල්පනා කරමින් සිටි සංජීව විමසීය.

"ඔව් මචං.... එතකොට මගෙ හිතට බරක් නෑ.... වංචා කාරයෙක් කියන චෝදනාව අහන්න මම කැමති නෑ....."

ඔහු කීවේ සුසුමක් හෙළමිනි.

"ඔව් කියපන්..... එතකොට ඒකි කැමති තීරණයක් ගනීනෙ....."

සංජීව උපදෙස් දුන්නේය.

ඔවුන් ගාලු මුවදොර පිටියෙන් නික්ම ආවේ බොහෝ රෑ බෝ වූවාට පසුවය. සියල්ල සංජීවට පැවසීමෙන් අනතුරුව සිතේ සැහැල්ලු බවක් ශේෂ වූ බව සැබෑවකි. එහෙත් නිවසට පැමිණි පසුව නැවතත් සිතේ ලැගුම් ගත්තේ බරකි.

මුහුණ දෙවා පිජාමා ඇඳුමකින් සැරසුණ ඔහු ඇඳේ දිගෑදුණේය. වේලාව රෑ මැදියම ද ඉක්මවමින් තිබිණි. එහෙත් ඔහුට නිදිමතක් දැනුණේ නැත. කිසියම් පාළු හුදෙකලා බවක් ආත්මය පුරාවටම ඉතිරී පැතිරී යන සෙයක් ඔහුට දැනිණි. තනි යහනේ පාළුව මෙතරම් තදින් දැනුණු වෙනත් දවසක් ඔහුට මතක නැති තරමය. බියර් මත සමග නැගී එන කිසියම් අනුරාගී සිතුවිල්ලකින් ඔහු නොඉවසිලිමත් විය. ඔහුට පියුමි සිහිපත් විය. ගීතිකා සිහිපත් විය. එංගලන්තයේ සිටියදී හුදු විනෝදයම පතා ඇසුරු කළ යෙහෙළියන් සිහිපත් විය. එහෙත් ඔවුන් එකෙකුවත් අත දිග මානයේ නොවිණි. ගිම්හාන සිත සන්සුන් කර ගන්නට වෑයම් කරමින් කැසට් යන්ත්‍රය ක්‍රියාත්මක කළේය.

"දවසක් පැල නැති හේනේ
අකාල මහ වැසි වැස්සා
තුරුලේ හංගාගෙන මා
ඔබ තෙමුණා අම්මේ...
පායන තුරු සිටි පියවර
සිටියා ඔබ අම්මේ.....

www.sinhalalibrary.com

ඉණිදස කපුගේ ගේ හැඟුම්බර කටහඬ දෝංකාර නංවමින් කාමරය පුරා පැතිරී ගියේය. ගිම්හානගේ සසල සිත එක් සැණෙකින් සන්සුන් වූයේය. ඔහු දැහැනකට සම වැදුණාක් බඳුව ඒ ගී රාවයට සවන්පත් විවර කළේය.

නුවර වීදි යට කරගෙන
නින්ද වැඟි වැගිරුණු ද
කිරිදකගේ සෙනෙහේ ගියා
යෝධ ඇළේ නැම්මේ....
ඔබෙ සෙනෙහස සුවඳ දිදී
දැනුණා මට අම්මේ..."

ගිම්හාන නොදැනුවත්වම දෙනෙත බොඳ කළ සිහින් කඳුළු පටලය තුළින් ඔහුට අම්මාගේ මුහුණ සතර අතින්ම මැවී පෙනිණි.

"අම්මා.... අම්මා....." ඔහු තනිවම මුමුණා ගත්තේය. ඇගේ සෙනෙහසේ සුවඳ ඔහුට දැනෙන්නාක් බඳු විය.

"පුතා, කොහොමද අපි කවුරුවත් නැතිව ලංකාවට වෙලා ඉන්නෙ.....?" ඔහු ලංකාවට ඒමට ගත් තීරණය ගැන ඇසූ විට අම්මා කම්පිත හඬින් ඇසූ අයුරු ගිම්හාන සිහිපත් කළේය.

"අම්මා තවමත් හිතාගෙන ඉන්නෙ අයියා පොඩි එකෙක් කියල..." නංගී සිනාසුණාය.

"කොයි අම්මටත් තමන්ගේ දරුවො හැමදාටම පුංචියි තමයි දරුවනේ...." අම්මා ඔසරි පොටින් දෑස පිසදා ගත්තාය.

එංගලන්තයේ දශක දෙකකටත් වැඩි කාලයක් ගත කළ ද අම්මා ඇගේ සිංහලකම අමතක කළ තැනැත්තියක නොවේ. ඇය ඇන්දේ පැළැන්දේ සිංහල ක්‍රමයටය. ඔසරිය ඇඳ ගෙඩි මාල, වළලු පැළඳගෙන යම් තැනකට ගිය විට ඇය වෙත බොහෝ දෙනෙකුගේ අවධානය යොමු වූ බව ගිම්හාන අත් දුටු සත්‍යයක් විය.

"දැන් ලංකාවෙ ඉන්න ගෑනු අඳින්නෙත් එංගලන්තෙ විදියට.... මෙයා එංගලන්තෙ ඉඳගෙනත් අඳින්නෙ ඔසරිය...." තාත්තා ඇතැම් විටෙක අම්මාට සරදම් කළේය. එහෙත් අම්මා ඔසරිය අඳිනවාට ඔහු කැමති වූයේය.

"නුපුරුදු දීගෙට වැඩිය පුරුදු කනවැන්දුම හොඳයි කියල කතාවක් තියෙනවනෙ.... ඒ හින්ද මටත් හොඳයි පුරුදු ඔසරිය...." අම්මා සිනාසුණාය.

අම්මා ලංකාවේ සිටියදී ගුරුවරියක වූවාය. එබැවින්ම ගිම්හානටත් නැගණියටත් ඉතා හොඳ සිංහල දැනුමක් ලබා දීමට ඇයට හැකි විය. ගිම්හාන ලිවීමට පුරුදු වූයේ ද අම්මාගේ ආශාව නිසාය.

අවුරුදු විසි එක සම්පූර්ණ වූ පසු කැදැල්ල හැර යන කුරුල්ලන් පරිද්දෙන් දෙමව්පියන්ගේ සෙවණින් මිදී වෙනම පදිංචියට යාම එංගලන්තයේ තරුණ තරුණියන්ගේ පුරුද්දකි. එහි වෙසෙන ලාංකික තරුණ තරුණියෝද ඒ පිළිවෙතම අනුගමනය කරන්නට පෙළඹී සිටියහ. එහෙත් ගිම්හානටත් නැගණියටත් දෙමව්පියන්ගේ සෙවණින් මිදී යාමට අවශ්‍ය නොවිය.

"බැන්දට පස්සෙත් ඔය ගෙදරම ඉන්න කියල ද ඔයා මට කියන්නෙ.....?" පියුමි දිනක් අමනාපයෙන් විමසුවාය.

"ඇයි මොකද වෙන්නෙ.....?" ඔහු පෙරළා ප්‍රශ්න කළේය.

"අනේ මට නම් බෑ ගිම්හාන..... බැන්දම වෙනම ඉන්නයි මං ආසා....."

"අපේ අම්මයි තාත්තයි ඉන්න ගෙදර හිටිය කියල අපිට බලපෑමක් වෙන්නෙ නෑ පියුමි...."

"ඒ වුණාට අපිට කියල නිදහසක් තියෙන්න ඕනනෙ බබී..... ඒ හින්ද අපි වෙනම පදිංචි වෙමු හොඳේ....." පියුමි ඔහුගේ ඇගේ එතෙමින් තොඳොල් ලෙස තෙපළාය.

"අම්මලට තාත්තලට දරුවොත් එක්ක එකම ගෙදර ජීවත් වෙනවා තරම් සම්පතක් තවත් නෑ පුතේ.... ඒත් ඔයාලා වෙනම ජීවත් වෙනවට

මම කැමතියි.... " මේ කතාව මතු වී ආ විටෙක අම්මා පැවසුවේ ගිම්හානගේ හිස ද පිරිමදිමිනි. ගිම්හාන ඇය දෙස බැලුවේ අදහාගත නොහැකි යමක් කියවුන කලෙක මෙනි.

"ඔව් පුතේ.... එහෙම ඉන්නකොට තමයි ඔයාලට ජීවිතේට මූණ දෙන්න ශක්තිය ඇති වෙන්නෙ...." අම්මා පැහැදිලි කළාය.

ලන්ඩන් නගරයේ තට්ටු නිවාස සංකීර්ණයකින් පියුමිටත් ගිම්හානටත් නිවසක් සොයා ගත හැකි විය. එම නිවසේ ජීවත් වූ ගිම්හානගේ මිතුරෙකු නිවස ගිම්හානට පවරා ස්කොට්ලන්තයට ගියේය. පියුමි සිය යෙහෙළියක හා හවුලේ විසූ තට්ටු නිවාසය අත හැර දමා එහි පදිංචියට ගියේ විවාහ වෙන්නටත් පෙර සිටමය.

"පියුමි තනියම ඉඳල පුරුද්දක් තියෙන කෙනෙක් නෙමෙයි.... දැනටම තවත් කවුරු හරි ෆ්ලැට් එකේ පදිංචි කරවා ගෙනද දන්නෙ නෑ....." කැසට් පටිය අනෙක් පසට හරවා යන්ත්‍රයට ඇතුළු කරමින් ගිම්හාන කල්පනා කළේය. ඔහු සමග දුරකථනයෙන් කතා කරමින් සිටියදී හදිසියේම සංවාදය නවතා දමා ඇය කලබලයෙන් ගිය අයුරු ඔහු නොපහන් සිතින් යුතුව වුව ද යළි සිහිපත් කළේය.

"පුතේ ලංකාවට යන්න ඉස්සර තව සැරයක් කල්පනා කළා නම් තමයි හොඳ...." තාත්තා තැන්පත් හඬින් කීවේ පියුමි ලංකාවට නොයන බව දැනගත් පසුවය.

"ඇයි තාත්තෙ එහෙම කීවෙ.....?" ගිම්හාන තාත්තා දෙස බැලීය. තාත්තා ගිනි උදුන දෙස බලාගෙන පයිප්පය කටේ රුවා ගත්තේය.

"ඔය තීරණය නිසා සමහර විට කීප දෙනෙක්ම පසුතැවිලි වෙන්න ඉඩ තියෙනවා...."

"ඉතින් තාත්තෙ, පියුමි එන්න බෑ කියනවනෙ...."

"කැමති කරවා ගන්න කොහොම හරි...."

"පුළුවන් තරම් ට්‍රයි කළා තාත්තෙ. එයාට බැරි නම් මොනව කරන්නද..? මම තනියම යනවා.." ඔහු පැවසුවේ ස්ථිර හඬිනි.

"අනේ මන්ද.... පුතාගෙ කැමැත්තක් එහෙනම්..... තාත්තා සුසුමක් හෙළුවේය.

"ඔබට යන්නම ඕනෑනම්
ඔබ යන්න ඉතින් නික්ම්
මේ කාමරයෙ පුරා රැඳුණ
සුවඳත් අරගෙන
ඒ සුවඳ ඇවිත් මගෙ හිත පාරයි...."

ගුණදස කපුගේගේ තවත් හැඟුම්බර ගීතයක් ගුවනට මුසු විය. ගිම්හාන අතීත ස්මරණයෙන් මිදී ගීතයට සවන් පෑවේය. කෙමෙන් ඔහුගේ දෑස නිදිබර වෙත හෙර්රාවේ දුරකථනය මහ හඬින් නද දෙන්නට විය.

නොනවත්වාම නද දෙන දුරකථනය දෙස ගිම්හාන බැලුවේ හිස් දෑසිනි. ගුණදස කපුගේ ගේ ගීත රාවය තුළ දැහැන්ගතව සිටි ඔහුට දුරකථනයේ හඬ කරදරයක් විය. එහෙත් රාත්‍රියේ මෙවන් වේලාවක දුරකථනය හැඬවෙන්නේ හදිසි පණිවිඩයක් නිසා බව ගිම්හාන අත්දැකීමෙන්ම දැන සිටියේය. ඔහු කැසට් යන්ත්‍රය නවතා දමා රිසීවරය ගත්තේ එහෙයිනි.

"හලෝ...."

"හලෝ ගිම්හාන..... උඹ නිදාගෙන ද මචං හිටියේ.....?" එහා පසින් ඇසුණේ සංජීවගේ කට හඬය.

"නිදාගන්න ට්‍රයි කර කර හිටියෙ... උඹ මොකද මේ වෙලාවෙ.....?"

"මට හිතුණා උඹ තවම නිදි නැතුව ඇති කියලා. ඒක නෙමෙයි මම උඹට කතා කළේ හදිසි පණිවිඩේකට...."

"ඒ මොකක්ද.....?" ගිම්හාන විමසුවේ කලබලයෙනි.

"නෑ කලබල වෙන්න තරම් දෙයක් නෙමෙයි. උඹට හොඳ ආර්ටිකල් එකක් ලියන්න ප්ලොට් එකක් තියෙනවා. ඒක කියන්න කතා කළේ...."

"උඹට ඕක හෙට උදේ කියන්න තිබුණෙ නැද්ද....? මම මේ ලස්සන සිංදුවක් අහ අහ හිටියේ....." ගිම්හාන උදාසීන හඬකින් කියමින් ඈනුමක් ඇරියේය. "එහෙම නැත්නම් ගෝල්පේස් එකේදී කියන්න තිබුණනෙ....."

"යකෝ ඔය මළ ඉලව් සින්දුව වගේ නෙමෙයි මේක..." සංජීව පැවසුවේ තරමක අමනාපයෙන් යයි ගිම්හානට සිතිණි.

"ඉතින් කියපන් අගේ නොකර...."

"කටුනායක වෙළඳ කලාපෙ වැඩ කරන කෙල්ලක් කෝච්චියට පැනලලු...."

"ආ මොනවා.....?" මෙතෙක් ඇඳේ වැතිරීගෙන කතා කරමින් සිටි ගිම්හාන වහා ඇඳ මත වාඩි ගත්තේය. ඔහු අතින් ගිලිහෙන්නට නොදී රිසිවරය අල්ලා ගත්තේ අසීරුවෙනි. ඔහුට ගීතිකාගේ මුහුණ සතර අතින්ම මැවී පෙනෙන්නට පටන් ගත්තේය. විදුලි පංකාව ක්‍රියාත්මකව තිබුණත් ගිම්හානට දහඩිය දමන්නට විය. ඔහුගේ සිත බියකින් හා දැවීමකින් පිරී ගියේය.

"හලෝ මචං ගිම්හාන....." ගිම්හානට අනෙක් පසින් සංජීවගේ නොඉවසිලිමත් හඬ ඇසෙන්නට විය.

"හලෝ....." ගිම්හාන දුර්වල හඬින් කොඳුළේය.

"මම දැනගත්තා ඔය ආරංචිය ඇහුව ගමන් උඹ කලබල වෙන බව ගීතිකා ඒ වාගෙ මෝඩ කෙල්ලක් නෙමෙයි බං....." සංජීව පැවසුවේ සැහැල්ලුවෙනි.

"මට මොකක්දෝ බයක් දැනෙනවා සංජීව.... කව්ද උඹට ඕක කිව්වෙ.....?"

"උඹට මතකද අර අපි කටුනායක ගිය දවසේ මීට වුණ අයි. පී.....? කටුනායක පොලිසියේ..."

"ආ.... ප්‍රදීප් ද කව්ද නේද.....?"

"ඔව් ප්‍රදීප් තමයි මට ඇවිල්ල කියල ගියේ.... තවස මුතුකුමාරි කෝච්චියට පැනල තියෙන්නෙ. බොඩි එක පොලිස් මෝචරියෙලු. හෙට උදේ පෝස්ට් මෝටම් එක තියෙන්නෙ". සංජීව එක හුස්මට කියාගෙන ගියේය.

"කොහෙ කෙල්ලක්ද දන්නෙ නෑ....නේද?" ගිම්හාන විමසුවේ දෙගිඩියාවෙනි.

www.sinhalaelibrary.com

"අනුරාධපුරේ පැත්තේ හද්ද පිටිසර ගමක කෙල්ලක්ලු. හරි පව් මචං... ඒ මරණේ පිටි පස්සේ ලොකු කතාවක් ඇති කියලා ප්‍රදීප් කිව්වා.... අපි උදෙන්ම යමු...."

ගිම්හානගේ සිතට යම් සහනශීලී හැඟීමක් දැනෙන්නට පටන් ගත්තේ ඉන් අනතුරුවය. ගීතිකාගේ ගම නුවර පළාතේ බව ඔහු දැන සිටියේය.

"ඒ වුණත් කවුරු හරි කෙල්ලක්නෙ... පව්...." ගිම්හාන තමාටම මුමුණා ගත්තේය.

"මොකක්ද උඹ කිව්වෙ...." ඔහුගේ මිමිණීම සවන් වැකුණු සංජීව විචාළේය.

"මොකුත් කිව්වෙ නෑ මචං......"

"උඹ උදෙන්ම මගේ බෝඩිමට ඇවිදින් මාව පිකප් කරපන්." සංජීව යෝජනා කළේය.

"බයික් එකේ යමු කියල ද උඹ කියන්නේ.....?"

"ඔව් ඔෆිස් එකට ගිහින් වාහනයක් දගෙන යනකොට පෙරහැර ගිහින් හිටීවි......."

"හරි මම එන්නම්.... හතට.....?

එච්චර ලේට් වෙන්න එපා... හයට වරෙන්....."

"උඹ එද එහෙනම් කිව්වෙ ආයෙ මගෙ බයික් එකේ කොහේවත් යන්නෙ නෑ කියලා......." ගිම්හාන පැවසුවේ හා හාපුරා කටුනායක ගිය දිනයේදි මුහුණ දුන් සිදුවීම මෙනෙහි කරමිනි.

"උඹට විහිළුවක් තේරෙන්නෙ නැද්ද මචං.....?" ඔහුට සංජීව සිනාසෙන හඩ ඇසිණි. "ඒක නෙමෙයි මම දැන් කියන්නම්. ජේෆෝන් බොක්ස් එකෙන් මේ කතා කරන්නේ. මේක බෝඩිමට කිට්ටුව තියෙන එක හොඳට ගියා.

"නිශාන්තිලාගෙ ගෙදරට ටෙලිෆෝන් තිබුණ නම් එහෙම උන්ගෙ ගෙදර අය කම්ප්ලේන් කරයි ජේෆෝන් බොක්ස් එක සංජීවගේ බෝඩිම

ළඟින් අයින් කරන්න කියලා....." සංජීවට විහිළුවක් ද කරමින් ගිම්හාන පිළිවරය තැබීය.

එහෙත් ඔහුගේ සිත කුමක්දෝ බරකින් පීඩා විඳින බව ඔහුට දැනිණි. ඔහු ඇඳෙන් නැගිට කාමරය පුරා ඒ මේ අත සක්මන් කරන්නට විය. මේසය මත වූ හදවතක හැඩය ගත් ඔරලෝසුවේ අළුයම දෙක සටහන් වී තිබිණි.

"ගීතිකා මේ වෙලාවේ මොනව කරනව ඇද්ද.....? කෙල්ල හිතත් රිද්දගෙනයි ගියෙ...." ඔහු ඔරලෝසුව දෙස බලාගෙන කල්පනා කළේය. එහෙත් ඔරලෝසුව තුළින් ඔහුට මැවී පෙනුණේ පියුමිගේ මුහුණමය. මේ ඔරලෝසුව ඔවුන් දැන හැඳිනගත් අලුත පියුමිගෙන් ලද තිළිණයකි. ඔහු එය ආදරයෙන් සුරැකියේය. ඔහු ඇයට තිළිණ කළ අත් ඔරලෝසුව ඒ දිනවලම ඇය නැති කරගත්තාය.

"ඒ කාලෙදිවත් පියුමි මං ගැන එච්චර සැළකිල්ලකින් ඉඳල නෑ......" ඔහු අමනාපයෙන් යුතුව තමාටම කියා ගත්තේය.

www.sinhalaelibrary.com Uploaded By Crzzzy

# 9

ගීතිකා ගේ සිත පුරා ඇති වී තිබුණේ කලකිරීමක් හා පරාජිත බවකි. ගිම්හාන හමු වීමට ගිය එක මෝඩකමකැයි ඇය නවාතැන කරා එද්දී කිහිප වරක්ම සිතුවාය.

"කොහොමත් වෙළඳ කලාපේ කෙල්ලො ගැන කොල්ලන්ගේ හිත්වල තියෙන්නෙ හොඳ ආකල්පයක් නෙමෙයිනෙ. අපි වැරැද්දක් කරල ඒකට සමාව ගන්න ගියත් උන් හිතනව ඇති පස්සෙන් එනව කියල....." ඇය තමාටම මුමුණා ගත්තාය.

යාබද අසුනේ සිටි මගියා ඇය තනිව මුමුණන අයුරු ඇසීමෙන්දෝ විමසිල්ලෙන් ඇය දෙස බැලීය. ඇය වහා කවුළුවෙන් පිටත බලා ගත්තාය.

"අනේ කෙල්ලෙ තරහ වෙන්න එපා... මට හදිස්සි වැඩක් තියෙනවා. ඒකයි ඔයාව තනියම යවන්නෙ. මම ඉක්මනටම එන්නම්කො ඔයාව බලන්න....."

ඇය බස්රියට නංවන්නට පැමිණි ගිම්හාන මිමිණූ අයුරු ගීතිකා සිහිපත් කළාය. ඒ මොහොතේ ඔහුගේ වතෙහි වූයේ සැබෑම වේදනාවකි. බසය වංගුවෙන් හැරෙද්දී ඇය ආපසු හැරී බැලුවාය. ඒ වන විටත් ගිම්හාන බස්රිය දෙසම බලාගෙන සිටියේය. සංජීව



www.sinhalalibrary.com

අමනාපයෙන් මෙන් ඔහුට යමක් පවසන අයුරු ද ඇය දුටුවාය.

"මම ගියෙ ගිම්හානගෙන් සමාව ගන්න... ඒත් දෙවියනේ.... එයා ළඟදි දන්නෙමත් නැතිව මම ගොළු වුණා....." ඇය සිතුවාය.

ගීතිකා ස්වභාවයෙන් දෙඩමළු තැනැත්තියක නොවූව ද පිරිමින් හමුවේදී කිසි විටෙකත් ගොළු වූයේ ද නැත. ගිම්හාන හමුවේදී පමණක් එසේ වන්නට හේතුවක් ඇයට සිතා ගත නොහැකි විය.

අවේලාවේ බැවින් පාර පුරාම වූයේ හුදෙකලා බවකි. ගීතිකාගේ විඩාබර සිතට ඒ හුදෙකලා බව වේදනාවක් ද එක් කළේය. ඇය නවාතැන් කාමරයට පිවිසෙන විට වේලාව සවස තුනද පසුවෙමින් තිබිණි. මෙතෙක් නොදැනුණු කුස ගින්නක් ද යන්නමින් දැනෙන්නට විය. ගීතිකා මුහුණ දොවා ඇඳුම් මාරු කොට ගෙන අත් බෑගයේ තිබූ බත් පාර්සලය කුඩා මේසය මතට ගත්තාය.

"ගීතිකා මොකද අද වේලාසනින්......?" නවාතැන හිමිකාරිය වන රෝසක්කා කාමරයට එබී බැලුවේ ඒ මොහොතේය. ගීතිකා බත් කෑම නවතා හැරී බැලුවාය. ඇගේ නම රොසලින් වුවද සියලු දෙනා අතරම ඇය ප්‍රචලිතව සිටියේ රෝසක්කා වශයෙනි. උස මහත හැඩි දැඩි පෙනුමැති කාන්තාවක් වුව ද ඇගේ හදවත බෙහෙවින් මුදු මොළොක් බව ගීතිකා දැන සිටියාය. එහෙත් මේ මොහොතේ ඇගේ මුහුණේ වූයේ කිසියම් ගැටළු සහගත පෙනුමකි.

"ෆැක්ටරි එකේදි මට ඉස්සරදේ හැදුණා රෝසක්කෙ. පස්සෙ මිස් කිව්ව ගෙදර යන්න කියල...." ගීතිකා හැකිතාක් සාමාන්‍ය ස්වරයෙන් පැවසුවාය. "එන්න රෝසක්කෙ ඇතුළට...."

"ඔය ළමයා කෑම කාල මෙහාට එන්නකෝ. මට ඔය ළමයත් එක්ක වැදගත් දෙයක් කතා කරන්න තියෙනවා...." රෝසක්කා එතැනින් ඉවත්ව ගියාය.

ගීතිකාගේ හදවත ගිනි ගැනිණි. ඇයට කෑම ද එපා විය. කිසිවෙකු විසින් ගිම්හාන පිළිබඳ පුවත ඇයට පවසා ඇතැයි ගීතිකා සිතුවාය. වෙනත් නවාතැන් හිමිකාරියන් මෙන් නොව රෝසක්කා දැඩි නීති

අනුගමනය කරන්නියක් බව ගීතිකා දැන සිටියාය. තරුණයෙකු නවාතැනට ගෙන්නා ගැනීමට ඇය කිසිසේත්ම ඉඩ දුන්නේ නැත. පෙම් සබඳතාවකට පවා ඇයගෙන් සහයෝගයක් ලැබුණේ එය වැඩිහිටියන් විසින් අනුමත කරන ලද්දක් බව හැඟුණු විටය.

"ගිම්හාන ගැන ඇහුවොත් මොකක්ද මම කියන්නෙ.....? ඇත්තටම ගිම්හාන මගේ කව්ද.....?" සිතමින් ගීතිකා කටක් දෙකටක් පමණක් කෑ බත් පාර්සලය අකුළා ජනේලයෙන් එහා තිබූ කෙසෙල් පඳුර අසළට විසි කළාය. ඇය වතුර කෝප්ප දෙකක්ම පානය කළේ තිබහට නොව සිත නොසන්සුන් වූ නිසාය.

ගීතිකා සෙමින් සාලයට යද්දී රෝසක්කා සාලයේ පුටුවක වාඩි වී ඈත බලාගෙන සිටියාය.

"වාඩි වෙන්නකො ගීතිකා මෙහෙන්...." රෝසක්කා පැවසුවේ ඇය දෙස නොබලාය. ගීතිකා යන්ත්‍රානුසාරයෙන් මෙන් පුටුවකට බර දුන්නාය.

"ඇයි රෝසක්කෙ මොකක් හරි ප්‍රශ්නයක් ද......?" ගීතිකා තැතිගැනුණු හඬින් විචාළාය.

"ප්‍රශ්නයක් තමයි. ඒත් ඔයාල නොදන්න එකක් නෙමෙයි මගෙ හිතේ...." රෝසක්කා තියුණු දෑසින් ගීතිකා දෙස බැලුවාය. ඒ බැල්මට හසු වීමට බිය වූ ගීතිකා වහා බිම බලා ගත්තාය.

"ගීතිකා දන්නවනෙ මම ඔය ආවට ගියාට කෙල්ලො මෙහෙ නතර කර ගන්නෙ නෑ කියල. දුප්පත් වුණත් හොඳ වැදගත් ළමයින්ට විතරයි මම නවාතැන් දුන්නෙ. ඔයාලත් වැදගත් ළමයි කියල හිතපු හින්දයි ඔයාල හතර දෙනාට නවාතැන් දුන්නෙ......" රෝසක්කා කියාගෙන යද්දී බිම බලාගෙන සිටි ගීතිකා හිස ඔසවා ඇය දෙස බැලුවාය.

"ඇයි රෝසක්කෙ අපෙන් මොකුත් වරදක් වෙලා තියෙනව ද......?" ඇය කටහඬ අවදි කර ගත්තේ අසීරුවෙනි.

"මට නම් වරදක් වෙලා නෑ. ඒත් ඔයාල වැරදි කරන කොට ඒවා මටත් බලපානවා....."

"මට තේරෙන්නෙ නෑ රෝසක්කා කියන්නෙ මොනවද කියල....."

"නිර්මලාට බබෙක් හම්බ වෙන්න ඉන්නව කියල ඔයාල දන්නෙම නැද්ද.....?" රෝසක්කා ගේ වදන් වලින් ගීතිකාට දැනුණේ දෙපා ළඟ හෙණයක් පිපිරූ කලෙක මෙන් කම්පනයකි. ඇයට නොදැනුවත්වම පුනස්සෙන් නැගිටිණි.

"මොනව රෝසක්කෙ......?" ඇය විදහා ගත් දෙනෙතින් යුතුව රෝසක්කා දෙස බැලුවාය.

"ඒක කාමරේ ඉඳලත් ඔය ළමයි නොදන්න දේවල් මං දන්නවා... මං අද උදේ නිර්මලාට කිව්ව වෙන කාමරයක් හොයා ගන්න කියල. ඔය වගේ නැගැද්දිච්ච ළමයි මගේ වහල යට තියා ගන්න මම කැමති නෑ......" රෝසක්කා වේගයෙන් පැවසුවේ සියලු දෙනාටම අනතුරු අඟවන හඬකිනැයි ගීතිකා සිතුවාය. කාමරයට එද්දී ඇයට දැනුණේ ඕය හිස බමන්නාක් බඳුවය. ඇය ඇඳේ වැතිරුණාය.

නිර්මලා පසු ගිය දින කිහිපයේම සිටියේ අසනීප ගතියකින් බව ගීතිකා දැන සිටියාය. එහෙත් එයට බල පෑවේ මෙවන් ප්‍රබල හේතුවක් බව ඇයට සිහිනයකින්වත් සිතුණේ නැත.

"ගීතිකා....."

සේනානි හතිදාගෙන කාමරයට ඇතුළු වූයේ ගීතිකා නිමක් නැති කල්පනාවලියක ගැලී සිටියදීය. සේනානි බෙහෙවින් කලබලයට පත්ව සිටින බව ගීතිකාට වැටහිණි. ඇය වහා ඇඳෙන් නැගී සිටියාය.

"ගීති මාර වැඩක් වෙලානෙ.... කෙල්ලක් කෝච්චියට පැනලලු......" සේනානි පැවසුවේ කලබලයෙනි. හිම්හාන පිළිබඳ දුක්බර සිතුවිලිවලින් හා රෝසක්කා පැවසූ නිර්මලා පිළිබඳ පුවතින් සසල වී කල්පනාවේ ගැලී සිටි ගීතිකා තිගැස්සී ඇය දෙස බැලුවාය.

"කෙල්ලක්.....? කවද....? අඳුනන කෙනෙක්ද...?" ඇය විමසුවේ දෙනෙත මහත් කොටගෙනය. සේනානි සුසුමක් හෙළා ඇඳ මත වාඩි ගත්තාය. ගීතිකාගේ සිත අවිනිශ්චිත බියකින් සැලී ගියේය.

www.sinhalalibrary.com

"උඹට දැන් සනීප ද......?" සේනානි කතාව වෙනතකට හැරවූවාය.

"ඔව්... ඉතින් කියපන්කො කව්ද කෝච්චියට පැනල තියෙන්නෙ......?"

"අපේ ෆැක්ටරියෙ කෙල්ලක් කියල ආරංචිය. කව්ද කියල දන්නෙ නෑ හරියට....." සේනානි කියද්දී ගීතිකාගේ සිරුර සීතල වී ගියේය. ඇය සේනානි අබියසින්ම වාඩි ගත්තාය.

"මට මොකක්දෝ බයක් දැනෙනවා සේනානි....."

"ඒ මොකටද උඹ බය වෙන්නෙ......?"

ගීතිකා රෝසක්කාගෙන් දැන ගත් තොරතුරු සේනානි හමුවෙ තැබූවාය. එහෙත් සේනානි ඒවා අසා සිටියේ කිසිදු උනන්දුවකින් නොවේ.

"නිම්මිට බබෙක් ලැබෙන්න ඉන්නව කියල මම දැනගෙන හිටියෙ ගීති......" ඇය පැවසුවේ සිහින් සුසුමක් පිට කරමිනි.

"මොනව...? උඹ දැනගෙන හිටියා.....? උඹ නිකමටවත් අපිත්තෙක්ක කිව්වෙ නෑනෙ....."

"කිව්ව කියල ඒකිගෙ ප්‍රශ්නවලට විසඳුමක් උඹල ළඟ නෑ බං...."

"උඹ ළඟ තියෙනව ද......?" ගීතිකා විමසුවේ සරෝස් හඬිනි.

"අපේ ප්‍රශ්නවලට කව්රුවත් ළඟ විසඳුම් නෑ.... ඒත් මම ඒකිගෙ කතාව අහගෙන හිටිය....." සේනානි පැවසුවේ සන්සුන් හඬකිනි.

"උඹ දන්නවනෙ නිම්මි අපිටත් වඩා දුප්පත්... පුංචි කටුමැටි ගේක ඉන්නෙ. වෙළඳ කලාපෙ හැම කෙල්ලක්ම වගේ ඒකිත් හීන මැව්වෙ කොහොම හරි මග් ටිකක් හදාගෙන නංගිල මල්ලිලට උගන්නගෙන රත්තරන් බඩුවක් හදගෙන ඔළුව ඩිංගක් උස්සල ජීවත් වෙන්න. ඒ වගේ හීන හැබෑ කරගන්න ගියාම රුවටිලි කාරයින්ට අහුවෙනවා අනන්තවත්. නිර්මලාට වුණෙත් අන්න ඒ වගේ..... ඒ මිනිහා ඒකිගෙ ජීවිතේ බිලි අරගෙන ඒකිට සල්ලි දුන්නා...."

සේනානි කතා කළේ ගැඹුරු තැන්පත් හඬිනි. ගීතිකා ද එවදන් ඔස්සේ කල්පනාකාරී වූවාය. ගිම්හාන පසුපස යාමෙන් තමාට ද එවැනි ඉරණමක් අත් වේයැයි ගීතිකාට සැණෙකින් සිතිණි.

ඇයට දැනුණේ බියකි. එහෙත් ඒ ඔස්සේ දිගින් දිගටම සිතන්නට අවස්ථාවක් නොවිණි. ප්‍රියන්ති හඬාගෙන කාමරයට ඇතුළු වූවාය. ගීතිකාත් සේනාණිත් නිරායාසයෙන්ම නැඟිට ගත්හ. ගීතිකාගේ සිරුර හිරි වැටී ගියේය. කුමක්දෝ අසුබ සිදුවීමක පෙර නිමිති ඇය ප්‍රියන්ති තුළින් දුටුවාය.

"ප්‍රියන්ති මොකද......?"

"නිර්මලා කෝච්චියට පැනල...." ප්‍රියන්ති දැතින් හිසකෙස් ඇද ගනිමින් ඇඳ මත වාඩි වූවාය. ගීතිකාට ඉහළට ගත් හුස්ම පහළට හෙලන්නට අමතක විය. ඔවුහු කුමක් කළ යුතුදැයි නිනව්වක් නැතිව මෙන් උනුනුන්ගේ මුහුණු දෙස මොහොතක් බලා සිටියහ. ගීතිකාගේ හිස බමන්නට විය.

"දෙවියනේ.... මම හිතුවා ඔය වගේ දෙයක් වෙලා ඇති කියල.." කොඳුරා කියූ ගීතිකා ඇඳ මත වාඩි ගත්තාය. ඇගේ දෑසින් කඳුළැලි කඩා හැලෙන්නට විය. නිර්මලාගේ අහිංසක රැඹර මුහුණ ගීතිකාගේ දෙනෙත් හමුවේ ඇඳී මැකී ගියේය.

"ඔයා දන්නෙ කොහොමද ප්‍රියන්ති......?" සේනාණි සෙමින් විමසුවාය. ගීතිකාට එවැන්නක් විමසීමටවත් ශක්තියක් නොවිණි.

"මං ගියා බලන්න......" ප්‍රියන්ති හඬමින්ම පිළිතුරු දුන්නාය. දැඩි සොවින් මුසපත් වුව ද සේනාණි මොහොතකටවත් හඬා වැළපුණේ නැත.

"ඇඬුවයි කියල දැන් මොනව කරන්න ද......?" සේනාණි සිහින් හඬින් පැවසුවාය. එහෙත් ඇය කතා කරන්නේ කඳුළු සඟවාගෙන බව ඇගේ ස්වරයෙන්ම පැහැදිලි විණි.

"අපි රෝසක්කටත් කතා කරල බලමු. ඉස්සරහට කරන්න පුළුවන් දෙයක්...."

සේනාණි කාමරයෙන් පිට වී ගියාය. කෙළිලොල්ව හැසිරුණ ද මෙවන් මොහොතක කල්පනාකාරීව කටයුතු කිරීමට ඇයට හැකියාව ඇති බව ගීතිකාත් ප්‍රියන්තිත් දැන සිටියහ. ඔවුන් දෙදෙනාට කළ හැකිව තිබුණේ අසරණව හඬා වැළපීම පමණකි.

"අපි දැන් මොකද කරන්නෙ රෝසක්කෙ......?" සේනානි රෝසක්කා ද කැටුව කාමරයට පිවිසියේ එසේ අසාගෙනය.

"මටත් හිතා ගන්න බෑ ළමයිනේ...." රෝසක්කා පැවසුවේ බියපත් හඬකිනි. ඇය බෙහෙවින් කැළඹී සිටින බව ඔවුනට දකගත හැකි විය. ඇගේ දෝෂාරෝපණය නිසා නිර්මලා සියදිවි නසා ගත් බව ඇය සිතනු ඇතැයි ගීතිකාට තේරුම් ගියේය.

ඔවුන් සිවු දෙනාම අසරණව අවිනිශ්චිතව එකිනෙකා දෙස බලා සිටියදී අඳුර දසතින්ම කාමරයට එක් රොක් විය. මූසල, වේදනාබර සිතුවිලිවලින් සිත් පුරවාගෙන සිටි ඔවුනට නැගිට විදුලි පහනක් දැල්වීමට තරම්වත් ශක්තියක් නොවිය. ගීතිකාගේත් ප්‍රියන්තිගේත් ඉකි බිඳුම් හඬ හැරුණු විට මුළු නිවස පුරාම තිබුණේ නිහඬතාවයකි. ඒ නිහඬතාවය පළුදු කරමින් දොර සීනුව නාද වෙන හඬ නැගී ආවේය. සිව්දෙනාම තිගැස්සී නැගී සිටියහ රෝසක්කා විදුලි පහන දල්වා දොර විවර කළොය. දොරකඩ සිටගෙන සිටියේ පොලිස් භටයෙකි. ගීතිකාගේ සිත් කොනකින් ඇවිලගත් ගින්නක් මුළු සිරුර වසා පැතිර ගියේය.

"මේ මිසිස් රොසලින් පෙරේරගෙ ගේ වෙන්න ඇති......?" පොලිස් භටයා ආරූඪ කරගත් ගාම්භීර ස්වරයකින් කතා කළේය.

"ඔව් රාළහාමි....." රෝසක්කා සිහින් හඬින් තෙපළාය.

"අද නවස මුතු කුමාරි කෝච්චියට ගැණු ළමයෙක් පැනල තියෙනවා. මේ ගෙදර හිටිය ළමයෙක් කියලයි සැක කරන්නෙ...... මිනිය පොලිස් මෝචරියෙ තියෙනවා. හෙට උදේට ඇවිත් මිනිය අඳුන ගන්න...."

ඔහු කියාගෙන යද්දී ප්‍රියන්තිගේත් ගීතිකාගේත් හැඬුම් හඬ උස්ව නැගී ආවේය. මෙතෙක් හැඟීම් සිරකොටගෙන සිටි සේනානිගේ දෙනෙතින් ද කඳුළු බිඳු කඩා හැලෙන්නට විය.

හැඳින ගැනීමට පවා නොහැකි තරම් විකෘති වූ නිර්මලාගේ පණ නුන් සිරුර දෙස ගීතිකා නෙත් හෙළුවේ එකමෙක වතාවක් පමණකි මෘත ශරීරාගාරය කේන්ද්‍ර කොටගෙන මුළු ලොවම තමා වටා බමන බව ඇයට දැනිණි. පය ගසාගෙන සිටි පොළොව ගිලිහෙන්නට හසු වූ වෙඩරු

පිඩක් මෙන් දියව වැගිරෙන්නට විය. මුවින් අව්‍යක්ත රාවයක් නගාගෙන ගීතිකා සිහිසුන්ව ඇද වැටුණාය. අසළ සිටි පොලිස් භටයෙක් වහා ඉදිරියට පැන ඇය වත්නම් කර ගත්තේය.

බොහෝ වේලාවකට පසු ඇය දෙනෙත් විවර කළේ අපැහැදිලි රූ සහිත ලොවකටය. ඇය කිහිප වරක් තදින් නෙතු පියා ගසා ඒ රූ මොනවාදැයි පැහැදිලි කර ගන්නට උත්සාහ කළාය.

"ගීති....." කිසිවෙකු සිය හිස පිරිමදින ලෙසක් ඇයට දැනිණි. ඇගේ මුහුණ දියෙන් තෙත්ව තිබිණි. ඇඟ වියළී ගිය දිවගින් තොලේ රැඳුණ දිය බිඳුවක් මුව තුළට ගත්තාය. සිදු වූ කිසිවක් පිළිබඳ පැහැදිලි මතකයක් ඇය තුළ නොවීය.

"ගීති....." නැවතත් අර කටහඬ නැගී ආවේය.

එවර ගීතිකාට කටහඬ හිමි තැනැත්තිය හැඳින ගත හැකි විය. සේනානි, ප්‍රියන්ති, රෝසක්කා ඇය තමා වටා රැස්ව සිටියවුන්ගේ මුහුණු දෙස පිළිවෙලින් බැලුවාය. තවත් හන්නාඳුනන මුහුණු කිහිපයක්ම එහි විය. ඒ අතර ගිම්හානගේ මුහුණ දුටු ඇය තිගැස්සී ගියාය. දකින්නේ සිහිනයක් දැයි ඇය කල්පනා කලා ය.

"ගිම්හාන....." මුමුණමින් ඇය නැගී සිටින්නට තැත් කළාය.

"ඔයාට සනීප ද ගීති.......?" වහා ඇයට නැගී සිටින්නට රුකුල් දුන් ගිම්හාන විමසීය. ඔහුගේ ගතට හිස හේත්තු කරගත් වනම ඇය තත්පර කිහිපයක් නිසලව සිටියාය.

"මට අසනීපයක් තිබුණේ නැහැ...." ඉනික්බිතිව හිස එසවූ ඇය තමා වටා කුතුහලයෙන් නෙත් දල්වාගෙන සිටින පිරිස දෙස බැලුවාය.

"මේ කෝපි එක බොන්න...." කෝපි කෝප්පයක් සහිත සුරතක් පිරිස අතරින් දිගු විණි. ගිම්හාන එය රැගෙන ඇගේ දෙතොලට ළං කළේය. ඇය ගිම්හානගේ දෙනෙත දෙස බලාගත්වනම ඉන් ස්වල්පයක් තොල ගෑවාය. ඔහුගේ දෙනෙත් වල අනුකම්පාවක සේයාවක් රැඳී තිබිණි. දිගු සුසුමක රාවය පිරිස අතරින් නැගී ආවේය. ගීතිකාට සියල්ල වැටහුණේ ඒ මොහොතේය. නිර්මලාගේ පණ සුත්

www.sinhalelibrary.com
Uploaded By Crazzy

විකෘති සිරුර ඇගේ දෙනෙත් ඉදිරියේ මැවී පෙනිණි. ඇය බියපත් දෑසින් අවට බැලුවාය. තමා සිටින්නේ පොලිසියේ බංකුවක් මත බව ඇයට වැටහිණි.

"ගීති මොකද ඔයාට......?" සේනානි ඇය අබියසින් වාඩි ගත්තාය.

"අනේ නිමමි....." ඇය සේනානිගේ උරහිසට වාරු වී හඬන්නට පටන් ගත්තාය. දුක සැප සමව බෙදාගෙන එක පවුලේ සොයුරියන් සේ එකට ජීවත් වූ යෙහෙළියගේ වියෝවෙන් තැවෙන ඔවුන් දෙස ගිම්හාන බලා සිටියේ දැඩි කම්පාවෙනි. සංජීව සුපුරුදු පරිදිම අකම්පිතව කැමරාව ඔවුන් දෙසට එල්ල කළේය.

"හා... දැන් ඉතින් එයාට පොඩ්ඩක් ඔහොම රෙස්ට් කරන්න ඇරල අනිත් අය මෙහාට එන්න....." පොලිස් නිලධරයෙක් පැවසීය. "අපිට ඔයාලගෙ සාක්කි සටහන් කරගන්න තියෙනවා...."

"ගීති.... ඔයා ඔහොමම හාන්සි වෙලා ඉන්න පොඩ්ඩක්...." සේනානි ගීතිකාගේ හිස සිය උරහිසින් මෑත් කළාය. ගිම්හානත් ගීතිකාත් පමණක් එතැන තනිකොට එකිනෙකා ඉවත්ව ගියහ. ඔහු ඇයට සමීපව බංකුව මත වාඩි ගත්තේය.

"ගෑනු ළමයි වුණාම ඔච්චරම දුර්වල වෙන්න හොඳ නෑ ගීති..... හැමදේම විඳ දරා ගන්න ශක්තිය තියෙන්න ඕන...." ගිම්හාන ඇගේ සවනතට කෙඳිරීය. ඇය කඳුළුබර දෙනෙත විදහා ඔහු දෙස බැලුවාය.

"අපිට හැම දේම දරාගෙන ඉන්න පුළුවන් කියල හිතල තමයි පිරිමි අපිට රිදවන්නෙ...." ඇගේ කටහඬේ වූයේ අමනාපයකි.

"මම ඔයාට රිදෙව්වෙ නැහැනෙ ගීති...."

"ඒත් ඔයත් පිරිමියෙක්..... ඔයාලා අපිට ලස්සන ලස්සන ලෝක මවල පෙන්නනවා... ඔයාලට ආදරේ ජීවිතේ එක මොහොතක් විතරක් වුණාට අපිට මුළු ජීවිතේමයි... ඉතින් අපිත් අපේ පැත්තෙන් විතරක් හිතල ඒ ලස්සන ලෝකවලට ඇතුල් වෙනවා.... අන්තිමට ඔක්කොම මායාවක් විතරයි කියල තේරෙනකොට අපි ආපහු හැරෙන්න බැරි තරමට දුරක් ගිහින් ඉවරයි. නිර්මලාට වුණෙත් ඒ ටික...." ගීතිකා වියරුවෙන් මෙන් කියාගෙන ගියාය.

විස්මයෙන් ගීතිකාගේ මුහුණ දෙස නෙත් හෙළා සිටිය ද ඇගේ මුවින් පිට වූ හැම වදනක්ම ඔහුගේ සිතේ තදින් තැන්පත් විය. සැබැවින්ම ඇගේ අදහස් අලුතෙන් සිතන්නට ඔහු පොළඹවන සුළු විය. සෙනෙළියගේ මරණය තුළින් උපන් වේදනාව ඇය බෙහෙවින් දෙඩමළු කර තිබිණි. ඇගේ ස්වරයෙන් වදන්වලත් වූයේ පිරිමි සංහතිය කෙරෙහිම පළ වූ වෛරයකි. එහෙත් ඒ දෙනෙතේ වූයේ දැවිම දැවි වේදනාවක් පමණක් බවක් ගිම්හාන හැඳින ගත්තේය.

"මේ ටික බීල ඉන්න...." ඔහු මුදු ස්වරයෙන් පවසමින් නවමත් අත රැඳුණු කෝපි කෝප්පය ඇය වෙතට දිගු කළේය. ඔහුගේ ස්වරය ඇගේ සිත සසල කරන්නට සමත් විය.

"ඔයා මොකද මෙහෙ......?" ඇය ප්‍රථම වරට සාමාන්‍ය ස්වරයෙන් කතා කළාය.

"මේක බීල ඉන්නකෝ....."

ඇය කෝපි කෝප්පය සියතට ගත්තාය. ඔහුට තදින් කතා කිරීම ගැන ඇගේ සිත තැවුල්පත්ව තිබිණි. මුහුණේ වරදට නාසය කපාගෙන පලක් ඇද්දැයි ඇය කෝපි පානය කරමින් සිතුවාය. ඔහු හිස් කෝප්පය ඇයගෙන් රැගෙන බංකුව පාමුල තබමින් තැබීය.

"දැන් හරි..." කෝපි කෝප්පය පානය කිරීමෙන් අනතුරුව මඳ ප්‍රාණවත් බවක් දැනුණ බැවින් ගීතිකා ගිම්හාන දෙස බලා පැවසුවාය.

"ඒ කියන්නෙ ආයෙ මට බනින්නෙ නෑ එහෙම්නෙ......?" ඔහු ඇය වෙතට නැඹුරු වී මඳ සිනාවක් මුවගට නඟා ගනිමින් විමසීය.

"අනේ මාව වරදවල හිතන්න එපා ගිම්හාන.... මම ඔයාට දෙස් කිව්වා නෙමෙයි... මගෙ හිතේ වේදනාවට මොනවා කියවුණාද මන්ද...." ගීතිකා දෝතින් මුහුණ වසා ගත්තාය.

"ආයෙමත් අඬන්න එපා ගීති....." ඔහු සිය අතැඟිලි ඇගේ හිස කෙස් අතරින් යැවිය.

www.sinhalaelibrary.com

"මං හිතන්නෙ නෑ මට අඬන්නෙ නැතිව ඉන්න පුළුවන් වෙයි කියල.... කලාපෙට ආව ද ඉඳලම සේනානියි ප්‍රියන්තියි, නිර්මලයි, මමයි හිටියෙ එකටමයි. අතේ සල්ලි නැති වුණාම වඩේ දෙක කෑලකින් වේල පිරිමහගෙන අපි හිටියෙ.... අපි හතර දෙනා ගැන හැම දෙයක්ම අපි දැනගෙන හිටියා. ඒත් මොකක්දෝ අහේතුවකට ඔය රහස විතරක් නිර්මලා අපිට කිව්වෙ නෑ....." ගීතිකා කියාගෙන කියාගෙන ගියාය. ගිම්හාන කල්පනාවෙන් බරව ඇය දෙස බලා සිටියේය. ඇගේ දෙනෙතින් ගලා හැලෙන කඳුළැලි ඔහු අතැඟිලි තුඩකින් පිස දැමීය.

"ඔයා ඇහුව නේද මම මෙහෙ ආවෙ මොකටද කියල......?" ගිම්හාන කතාව වෙනතකට හරවන්නට තැත් දැරීය. ඇය කඳුළු පටලය විනිවිදගෙන ඔහුගේ මුහුණ මත නෙතු රැඳවූවාය.

"මමයි සංජීවයි ඊයෙ ගෝල්පේස් ගිහින් හුඟාක් රෑ වෙලා ගෙදර ගියේ. ගිහින් ටිකක් වෙලා ගියාට පස්සෙ සංජීව කතා කරල මේ ආරංචිය දුන්නෙ.... අපි දෙන්න පාන්දරම මෙහෙ ආවා....."

"පත්තරේට ආර්ටිකල් එකක් දුන්න......?" ඇය උපහාසය මුසු හඬකින් විමසුවාය.

"ඔව්......."

"ඔයාල ඔය වගේ දේවල් පත්තරේ දල ඔයාලගෙ පත්තරේ විකුණ ගනීවි. ඒකෙන් අපිට වෙන හානිය ගැන හිතන්නෙ නෑ...."

"අපි ඔයාලට හානියක් වෙන විදියට මොකුත් ලියන්නෙ නෑ ගීති...."

"ඔයාල හිතන්නෙ එහෙම තමයි....."

තවත් කිවයුතු දේවල් රැසක් මුවට නැඟුණද බලවත් ලෙස විඩාබර වී සිටි ගීතිකා එතැන් සිට ඔවුන් වෙන් වී යන තුරුම මුණිවත පිරුවාය. ගිම්හාන අමනාප වෙන්නට ඇතැයි ඇයට සිතිණ

• • • •

කාමරය පුරා පැතිර තිබුණේ ගුප්තමය නිහඬ බවකි. එහෙත් ඒ නිහඬ බව තුළ ගුලි වූ වේදනාව කොපමණදැයි ගීතිකා සිතුවාය. සියල්ල මතකයෙන් ඈතට පලවා හරින්නට මෙන් ඇය තදින් දෙනෙත

පියා ගත්තාය. එහෙත් නිර්මලාගේ තැලුණු පොඩි වූ මළ සිරුර දෙනෙත් පියැවී ගිය කල වඩාත් හොඳින් මනසට දර්ශනය විය. එහි දෙනෙත විවරව තිබිණි. මුළු ලොවම කෙරෙහි පල වූ වෛරයක් ඒදෙනෙතෙහි විය. මෙලොව දකින්නට වරම් අහිමි වූ කිරි කැටියාගේ පිඟිනි සිරුර ද ඇය පසෙකින් විය. ඒ සිරුර එකමෙන් විසල් වෙන අඳුරු ගීතිකා මනසින් දුටුවාය. තවත් මොහොතකින් ඔහු ගීතිකා වෙත කඩා පැන්නේය. ඇය මර හඬ දී කෑ ගැසුවාය.

නිමේෂයකින් කාමරයේ විදුලි බුබුල දැල්විණි. සේනානිත්, ප්‍රියන්තිත් වහා ගීතිකා කරා ආහ. ගීතිකාගේ මුළු සිරුරම දහදියෙන් තෙත්ව තිබිණි.

"ගීති..... ඇයි ඔයා හීනෙන් බය වුණා ද......?" සේනානි ඇගේ හිස පිරි මැද්දය. සැබැවින්ම තමාට නින්ද නොගිය බව ගීතිකා දැන සිටියාය. නිර්මලා ගේ මරණය පිළිබඳ ආරංචිය සවන් වැකි වෙලේ සිටම ඇගේ සිත කම්පනයකට හසු වී තිබිණි.

"ආ.... මේ වතුර එක බොන්න ගීති....." ප්‍රියන්ති වතුර කෝප්පයක් පෑවාය. එහෙත් එය අතට ගන්නට නොහැකි තරමට ගීතිකාගේ දෑත වෙව්ලමින් තිබිණි. ප්‍රියන්ති වතුර කෝප්පය ඇගේ මුවට ළං කළාය. එහෙත් දිය පානය කිරීමට තරම් වුවමනාවක් ගීතිකාට නොවීය.

"මට එපා...." ඇය සෙමින් කොඳුළාය.

"ළමයිනේ.... ළමයිනේ....." රෝසක්කා පිටතින් දොරට ගසන හඬ ඇසෙන්නට විය. "මොකද කලබලේ......?"

"මොකුත් නෑ රෝසක්කෙ.... ගීති හීනෙන් බය වෙලා...." ප්‍රියන්ති තරමක උස් හඬින් පැවසුවාය.

යමක් මුමුණමින් රෝසක්කා ඉවත්ව යන හඬ ඇසිණි. ඉනික්බිතිව ඔවුනතර නැවතත් පැතිරී ගියේ නිහඬතාවයකි. ඒ නිහඬතාව බිඳී ගියේ ගීතිකා ගෙලූ සුසුමක හඬිනි.

"ගීති... නිදි ගනින්......" සේනානි සෙමින් ඇගේ හිස පිරිමැද්දය. ඇය බිය වූයේ මන්දැයි ඔවුන් දෙදෙනාම විමසුවේ නැත.

"අනේ මට හරිම තනිකමක් දැනෙනවා සේනානි...."

". අපි ඇඳන් තව ටිකක් ළං කර ගනිමු" ප්‍රියන්ති යෝජනා කළා ය.

එහෙත් නිර්මලාගේ හිස් වූ ඇඳ දකිද්දී කුමක්දෝ බියක් බඳු හැඟීමකින් ඔවුන් තිදෙනාගේම සිරුරු හිරි වැටී ගියේය. එහෙත් ඒ හැඟීම වදන්වලට පෙරළන්නට ඔවුනට හැකියාවක් නොවිණි. ඔවුන් තිදෙනා ඔවුනොවුනට වෙන් වූ ලෝකවල හුදෙකලා වූහ. සිතට ඇතුළු වූ බිය හා සාංකාව මුසු සිතුවිලි පලවා හරින්නට ගීතිකා ගිම්හාන පිළිබඳව සිතන්නට වෑයම් කළාය. ඔහු කෝපි කෝප්පය සිය මුවට ළං කළ දයාබර විලාශය ඇයට එක් වරම සිහිපත් විය.

"අපි දෙන්න අන්තිමට හමු වුණේ ඊයේ..... ඒත් මට දැනෙන්නෙ කල්ප කාලාන්තරේකට ඉස්සර හමු වුණා වගේ......." ගීතිකා තමාටම මුමුණා ගත්තාය. එහෙත් ගිම්හාන පිළිබඳව වුවද ඕනෑවට වඩා බලාපොරොත්තු තබා ගැනීම පලක් නැති දෙයක් වශයෙන් ගීතිකා සිතුවාය. නිර්මලාගේ මරණය විසින් බොහෝ දේවල් සිතන්නට ඇය පෙළඹවන ලද්දේය.

ඒ නිදි නැති රැය නවත් දවසකට පරිවර්තනය වෙන්නට හෝරා දෙක තුනක් තිබියදී දැඩි ශීතලක් සිය ගත වෙලා ගන්නා බව ගීතිකාට දැනිණි. ඇය හිස සිට දෙපතුල දක්වා පොරෝනයකින් වසා ගත්තාය. එහෙත් සීතල කෙමෙන් උත්සන්න වෙන්නට විය. දත් ඇදි කිටි කිටියේ එකට වැදිණි.

"සේනානි...." බැරිම තැන ගීතිකා කෙඳිරි ගෑවාය. නින්දත් නොනින්දත් අතරේ සිටි සේනානි වහා ඇඳ මත වාඩි ගත්තාය.

"ගීති...... ඇයි.........?"

"මට හරි සීතලයි......"

සේනානි කලබල වූවා ය. වහා ප්‍රියන්තිට කතා කළ ඇය ගීතිකාට සාන්තු කරන්නට පටන් ගත්තාය.

# 10

අනන්ත අපරිමාණ දුක් සමුදයක් කැටි වූ කැටයමක් බඳු ගීතිකාගේ සුදුමැලි පැහැගත් වත දෙස ගිම්හාන බලා සිටියේ දුක්බර දෑසිනි. ඔහුගේ සිතේ සුවහසක් හැඟුම් වැල් කෙරපෙමින් තිබිණි. ඇඳ පසෙක එල්ලා තිබූ බෝතලයෙන් සේලයින් බින්දුව බින්දුව ඇගේ සිරුර තුළට කාන්දු විය.

"මම දන්නෙ නෑ අයියෙ... මම කරපු වැඩේ හරි ද කියල.... ඒත් ගීතිට අමාරු වුණාම මට හොඳටම බය හිතුණා.... ඒකයි මම අයියට කෝල් එකක් දැම්මෙ...." අසල සිටි ෂේනානි බිම බලාගෙන කෙඳිරුවාය. ඇගේ මුහුණින් සුපුරුදු කෙළි ලොල් විනෝදකාමී පෙනුම අතුරුදන්ව පැවතිණි. ගීතිකාගේ වතින් දෑස් මෑත් කරගත් ගිම්හාන ෂේනානි දෙස බැලීය.

"ගීතිට හුඟක් අමාරු වුණා ද ෂේනානි......?"

"ඔව් අයියෙ. රෑ මැද්දෙ එක පාරටම කෑ ගහගෙන ඇහැරුණා බය වෙලා. ඊට ටික වෙලාවකට පස්සෙ සීතලයි කියල වෙව්ලන්න ගත්තා. උදේ වෙන කොට හොඳටම උණ. උණ විකාරෙන් දෙඩවන්නත් පටන්

ගත්තා... ළඟ ඩිස්පෙන්සරියෙන් බෙහෙත් අරගෙන දුන්නා..... ඒත් අඩු වුණේ නැති හින්ද තමයි හොස්පිට්ල් එකට ඇඩ්මිට් කළේ....." සේනානි බිඳුණු හඬින් කියාගෙන කියාගෙන ගියාය.

දිවයිනේ නොයෙකුත් පළාත්වලින් පැමිණ එකට දුක සැප බෙදාගෙන කල් ගෙවන මේ යුවතියන්ගේ සුහදත්වය ගැන ගිම්හානට දැනුණේ මවිතයකි. පෙරදා රෑයේ පටන්ම ගීතිකා අසල ගත කළ සේනානිගේ දෑසේ විඩාබර බවක් ඇඳී තිබිණි. ගිම්හානගේ සිත තුළට අනුකම්පා සහගත සිතුවිලි රැසක් ඇදී ආවේය.

"ඔයා තවම දවල්ට කාලත් නැතිව ඇති නේද සේනානි......?" ගිම්හාන ඒ හැඟීම පෙරදැරි කොටගෙන විමසුවේය.

"මට කැමක් ගැන හිතන්නවත් බෑ අයියෙ... අනිත් අයගෙ හිත් පාරවන්න බැරි හින්ද මම මගෙ දුක හංගගෙන ඉන්නෙ.... ඒත් ගෑනු අපි පුරුදු වෙලා තියෙන්නෙ අඬල වැලපිල හිතේ දුක අඩු කරගන්න..... එහෙම බැරි වුණාම ඒක හිතට ලොකු බරක්......."

සේනානි සුරතේ ඇඟිලි තුඩුවලින් දෙබැම පොඩි කර ගත්තාය. කිව යුතු යමක් එක්වරම සිහියට නොආවෙන් ගිම්හාන හිස් බැල්මෙන් ඇය දෙස බලා සිටියේය. එහෙත් ඔහුගේ සිත බෙහෙවින් දෙඩමළුව පැවතිණි. උපන්ද සිට එංගලන්තයේ හැදී වැඩුණ ද වසරකට ආසන්න කාලයක් පුවත්පත් ආයතනයක සේවය කළ ද තමා දැන සිටින්නේ මොනවාදැයි ඔහුට සිතිණි. මේ යුවතියන්ගේ ජීවිතාවබෝධය පිළිබඳව සිතන විට ඔහුට ඔහු ගැනම ලැජ්ජාවක් දැනිණි.

ගීතිකාගේ මුවින් සිහින් කෙඳිරියක් නික්මිණි. සේනානි මෙන්ම ගිම්හාන ද වහා ඇයට සමීප වූහ. කුමක්දෝ කියන්නට මෙන් ඇගේ සුදුමැලි දෙතොල් පොපියන්නට විය. ඔවුනට උපදෙස් ලැබී තිබුණේ රෝගියා හා නොදොඩන ලෙසය. එහෙත් ඒ උපදෙස් ගිම්හානට සිහිපත් වූයේවත් නැත.

"ගීති...."

ගිම්හාන සෙමින් ඇගේ අවුල් හිසකෙස් පිරිමැද්දේය. ඔහුගේ ඇමතුමට පිළිතුරු වශයෙන් තවත් සිහින් කෙඳිරියක් ඇගේ මුවින් නික්මිණි. ඇය අපහසුවෙන් දෙනෙත් විවර කොට ඔවුන් දෙස හිස් බැල්මකි බලා සිටියාය.

"ගීති...." ඔහු එවර ඇගේ මුහුණට නැඹුරු වී වඩාත් මුදු ලෙස ඇය ඇමතීය. ඇය මොහොතක් බලා සිට නැවතත් නෙත් පියා ගත්තාය. ගිම්හානගේ සිතට සිහින් රිදුමක් දැනිණි.

"දැන් තමයි මගෙ ඇඟට ලේ පොඩ්ඩක් ඉනුවෙ..... ඊයෙ ඉඳන්ම ඇස් දෙකවත් ඇරියෙ නැතුව හිටියෙ......" සේනානි සහනශීලී හඬකින් පැවසුවාය. ගිම්හාන ගීතිකාගේ මුහුණ දෙසම බලාගෙන සිටියේය. ඒ සුදුමැලි දෙතොල සිය දෙතොලින් උණුසුම් කිරීමේ වුවමනාවක් ඔහුට දැනිණි. රෝහල් වාට්ටුවක බැවින් සිය හැඟීම මැඩ ගත් ඔහු දිගු සුසුමක් හෙළමින් සේනානි දෙස බැලීය.

"ඔයාල නිර්මලාගෙ ෆියුනරල් එකට යන්නෙ නැද්ද සේනානි.......?" ඔහු විමසුවේ සිහින් හඬිනි. සැබැවින්ම ඒ මාතෘකාව පිළිබඳ කතා කරන්නට ඔහු තුළ වූයේ මැලිකමකි.

"නෑ අයියෙ...." සේනානි දිගු සුසුමක් හෙළමින් දුර ඈතක නෙතු රඳවා ගත්තාය.

"මම කොහොමද අයියෙ ඒ කෙල්ලගෙ තැලිච්ච පොඩිවෙච්ච මූණ දිහාවෙ ආයෙමත් බලන්නෙ.....? ඊද මගෙ උකුලෙ මූණ තියාගෙන ඇඬුවා එයාට වුණ දේ ගැන කිය කියා....... නිර්මලාගෙ තාත්ත පහුගිය කාලෙ අතුරුදන් වුණා...... අම්මා අතන මෙතන කුලී වැඩ කරල නිර්මලයි මල්ලියි නංගියි බලා ගත්තෙ.... බැරිම තැන තමයි නිර්මලා වෙළඳ කලාපෙට ආවෙ..... මෙච්චර දුක් මහන්සි වෙලා මේ ගන්න සොච්චම් පඩියෙන් මොනවද අයියෙ කරන්න පුළුවන්.......?"

"ඒ කියන්නෙ නිර්මලා ඕනකමින්මයි ඔය වගේ දෙයක් කරගත්තෙ කියල ද ඔයා කියන්නෙ......?" නිහඬව ඇගේ කතාවට සවන් දී සිටි ගිම්හාන විමසීය.

www.sinhalalibrary.com
Uploaded By Crazzy

"මම එහෙම කියන්නෙ නෑ අයියෙ. ඒත් යමක් කර කියා ගන්න බැරි තරමට ගෑනු අසරණ වෙන වෙලාවල් තියෙනවා... ඒ වෙලාවට ඕනෙ කෙනෙකුට පුළුවන් එයාලව රවට්ට ගන්න... නිර්මලාට වුණේ ඒ ටික......"

සේනානිගේ වදන්වැල්වලට යටින් කුමක්දෝ සැඟවුණ අරුතක් ඇති බව ගිම්හානට වැටහිණි. එහෙත් ඒ පිළිබඳව හාරා අවුස්සන්නට ඔහු මැළි විය. ඔහුගේ සිත හැඟුම්වලියකින් සසලව තිබිණි.

• • • •

මල් කැකුළු ඇස් අරින මැදියම් රැය වන තුරුම ගිම්හානගේ සිතුවිලි ද අවදි වෙමින් තිබිණි. මුළු කුටිය පුරාම ඉතිරී පැතිරී තිබුණේ කැටි කොට දෝතට ගත හැකි තරමේ පාළුවකි. කිකිණි සිනාවක රාවයක්, සුරතල් ආදර වදනක් අසන්නට ඔහුගේ දෙසවන් පාරමී පිරුවේය. එහෙත් ජීවිතයේ පැතූ සියල්ල වේදනාවක් පමණක් ශේෂ කොට තබා මැකී යනු ඇද්දැයි ඔහුට සිතිණි.

ගිලන් යහනක අසරණ ලෙස සැතපී සිටින ගීතිකාගේ රුව මනසින් පලවා හරින්නට ඔහුට ඇවැසි විය. සිනාසිසී ඔහු අබියස හිඳගෙන දඟකාර වදන් තෙපලන ගීතිකාවක් මනසේ ඇඳ ගන්නට ඔහු නිරර්ථක වෑයමක යෙදුණේය. පාට බොඳ වූ සිතුවමක් මෙන් ඔහුගේ සිතුවිලි නොපැහැදිලි විය. ඔහුට සිහින් හිස රිදුමක් ද දැනෙන්නට විය.

යහනින් නැගිට ගත් ගිම්හාන හදවතක හැඩැති මේස ඔරලෝසුව වෙත දෙනෙත රැඳවීය. වේලාව පාන්දර දෙකට ද ළං වෙමින් තිබිණි.

"ගීතිකාට දැන් කොහොමද දන්නෙ නෑ...." ඔහුට සිතිණි. හදිසි ලිපි කිහිපයක් සැකසීමට තිබූ බැවින් ඔහුට ගීතිකා දකින්නට යාමට කාල වේලාවක් නොවීය. අනෙක් අතට තමා ඒ අවස්ථාව වුවමනාවෙන්ම මග හැරියේයැයි ඔහු පසුතැවිල්ලෙන් යුතුව සිතුවේය.

www.sinhalaelibrary.com

"ඔයා ගීතිකා ගැන මොන විදිහටද හිතාගෙන ඉන්නෙ අයියෙ......?" සිය මුහුණ දෙස තියුණු බැල්මෙන් බලා සේනානි විමසූ අයුරු ගිම්හාන අකමැත්තෙන් වුව ද නැවතත් සිහිපත් කළේය. සැබැවින්ම දිය යුතු පිළිතුර කුමක්දැයි ඔහුට සිතා ගන්නට නොහැකි විය. ගීතිකා පිළිබඳව සෙනෙහසක් ලෙන්ගතු බවක් ඔහුගේ සිත පුරාම පැතිරී තිබූ බව සැබැවකි. එහෙත් ඒ බව වදන්වලට කැටි කරන්නට තරම් ශක්තියක් ඔහුට නොවිය.

"අයියා දන්නවද. ගීතිකා වෙළඳ කලාපෙට එනව කියල ඒයාගෙ බෝයි ෆ්‍රෙන්ඩ් තරහ වුණා ඒයන්මෙතක්න....." ගිම්හාන නිහඬව සිටි බැවින් සේනානි නැවතත් කටහඬ අවදි කළාය.

ඔවුන් දෙදෙනා කතා කළේ ගීතිකා රඳවා සිටි වාට්ටුවේ කොරිඩෝරයේ සිටගෙනය. ඒ වන විට ගීතිකාට තදින් නින්ද ගොස් තිබිණි. එහෙත් සේනානි වරින් වර කෙටි බිත්තියෙන් ඉස්සී ගීතිකාගේ ඇඳ දෙස බැලුවාය. ඇය ගීතිකාට මොන තරම් දයාබර බවක් දක්වන්නේදැයි ගිම්හාන පහන් සිතින් යුතුව සිතුවේය.

"වෙළඳ කලාපෙ කෙල්ලො කියන්නෙ ඕන ඕන විදිහට නටවන්න පුළුවන් සෙල්ලම් බඩු කියල හුඟාක් දෙනෙක් හිතාගෙන ඉන්නෙ...... ඒත් අපිත් ලෙයින් මසින් හැදිච්ච කෙල්ලො අයියෙ....." සේනානි කතා කළේ දැඩි ආවේගාත්මක ස්වරයෙනි. පෙරද ගීතිකා ද මෙබඳුම ස්වරයකින් කතා කළා ඔහුට සිහිපත් විය.

"මාව වරදවල හිතන්න එපා සේනානි මං කවදාවත් කෙල්ලෙකුගෙ හිත රිදවලා සතුටු වෙන කෙනෙක් නෙමෙයි...." ගිම්හාන පැවසුවේ තව දුරටත් ඒ චෝදනා වලට සවන් දීමට අයිතියක් ඔහුට නැතැයි අඟවන හඬකිනි.

"මම දන්නෙ නෑ ඔයයි ගීතියි අතර මොන විදියෙ සම්මුතියක් තියෙනවද කියල... නිලන්තගෙන් පස්සෙ ගීති පිරිමි ගැන හුඟක් කළකිරීමෙන් හිටියෙ... ඒත් ඔයා ගැන හුඟක් පැහැදිලා වගේ මගෙත්තෙක්ක කතා කළේ... මට ඔයාගෙන් ඉල්ලන්න තියෙන්නෙ එකම දෙයයි අයියෙ..... ඒ කෙල්ලගෙ හිත හුඟාක් සංවේදීයි. නිර්මලාට වගේ තමයි

සුළු දෙයක් වුණත් දරා ගන්න බෑ....." සේනානිගේ කට හඬ බිඳිණ. ඇය කියන්නට ආ දෙය නොකියා ගිල ගත්තාය. ඇගේ දෑසේ කඳුළු බොඳ වී තිබෙනු ඔහු දිටිය. ඇය නොකියා ගිල ගත්තේ ගීතිකාගේ සිත නොරිදවන්නැයි යන්න බව ගිම්හාන වටහා ගත්තේය.

"පසුතැවිලි වෙන විදියෙ තීරණ මම ගන්නෙ නෑ සේනානි....." ඔහු එමොහොතේ සේනානිට පැවසුව ද ඔහුගේ සිත බෙහෙවින් කැලඹී තිබිණ. දැනටමත් තමා පසුතැවිලි වෙමින් සිටිනවා නොවේදැයි ඔහු සිහිපත් කළේය.

මේසය මත වූ ඔරලෝසුව ඔහුට සිහිපත් කළේ පියුමිය. ඔහු ඒ අසලින්ම වූ කුඩා සිප්පි කටුව අතට ගත්තේය. එද ගීතිකාත් සමග මුහුදු වෙරළේ ගත කළ සුන්දර හෝරාව ඔහුගේ මනසේ ඇඳිණ. ඇය එදින දඟකාර ලෙස ඔහුගේ සාක්කුවට වීසි කළ ඒ සිප්පි කටුව ඔහු සිහිවටනයක් ලෙස ප්‍රවේශම් කළේය.

"ඔය සිප්පි කටුව දැක්කොත් විතර ද ඔයාට මාව මතක් වෙන්නෙ......?" ඇය නෝක්කාඩු ස්වරයෙන් ඇසූ අයුරු ඔහුට සිහිපත් විය. සැබැවින්ම ඇය පිළිබඳ මතකය අමතක කරන්නට නොහැකි තරම් තදින් මනසේ ඇඳී තිබිණ. ජීවිතයට අතිශයින් සමීප වූ පියුමි හැර දමා සැතපුම් දහස් ගණනාවක් දුර ඒමට ඔහුට හිත හදා ගත හැකි විය. එහෙත් හෝරාවක් වැනි සුළු වේලාවකින් ළඟා විය හැකි තරම් දුරින් සිටින ගීතිකා පිළිබඳ මතකය ඔහුගේ සිතට වද දුන්නේය.

නොසන්සුන් සිතිවිලි වලින් හෙම්බත් වූ මනසින් යුතු ගිම්හාන ඇඳෙන් නැගී කවුළු පියන්පත් විවර කළේය. උඳුවප් මසේ සීතල සුළං රැල්ලක් ඔහුගේ ගත කිළි පොළමින් කුටියට ඇතුළු වූයේය.

"දැන් වින්ටර් සීසන් එක පටන් ගත්තනෙ..... හරි විනෝදයි....." පියුමිගේ දුරකථන ඇමතුමකින් කියැවුණ එවදන් ඔහුගේ සිතට පාළුවක් බඳු හැඟීමක් එක් කළේය. හිම මත ලිස්සන සපත්තු පැළඳගෙන ක්‍රීඩා කරමින් විනෝද වූ අතීතය තිළිණ කළේ වේදනාවක් පමණක්දැයි ඔහුට සිතිණ. පියුමිත් ඔහුත් හමු වූ ඒ අසාමාන්‍ය දිනයේ මතක තුළ ඔහු අතරමං විය.

එදින ගිම්හාන හිම ක්‍රීඩා කිරීම සඳහා ගියේ තනිවමය. කාඩිල් හිල්හි බෑවුමක් දිගේ පහළට ලිස්සාගෙන එද්දී කොළ හැළී ඉපල්වූ ගසක් අසළ රැඳුණු පොදියක් වැනි යමක් ඔහුගේ නෙත ගැටිණි. ඔහු වහා එදෙසට ලිස්සා ගියේය.

බෑවුම කෙළවර ගසක් මුල සිහිසුන්ව වැතිර හුන් යුවතිය අසළ ගිම්හාන නැවතුණේ කුහුල් සිතින් යුතුවය. බෑවුම දිගේ පහළට ලිස්සා එද්දී වේගය පාලනය කර ගත නොහැකිව ඇය ගසේ හැපෙන්නට ඇතැයි ඔහුට සිතිණි. සිය හිම සපත්තු මුදා හැර යුවතිය ළග දණ ගසාගත් ඔහු වහා ඇයට ප්‍රථමාධාර දෙන්නට විය. දැඩි සීතල නිසා අඳුරු පැහැ ගැන්වුණු ඇගේ මුහුණෙහි කුමක්දෝ හුරු පුරුදු බවක් රැඳී ඇතැයි ඔහුට සිතිණි. ඔහුගේ ප්‍රථමාධාර නිසා සිහි ගැන්වුණු යුවතිය වේගයෙන් ඇසිපිය ගසමින් අවට පරිසරය හැඳින ගැනීමේ වෑයමක යෙදුණාය. ගිම්හානගේ සිතට සහනශීලී හැඟීමක් දැනිණි.

"හලෝ..... කොහොමද දැන් ඔයාට.......?" ගිම්හාන මිත්‍රශීලී හඬින් විමසීය.

"අම්මේ....." යුවතිය හිස අල්ලා ගෙන මුමුණද්දී ගිම්හාන පුදුමයටත් කුහුලටත් පත් විය. ඇය ලාංකික යුවතියක් විය යුතුයයි ඔහුට සිතිණි.

"ඔයා ලංකාවෙද.......?" ගිම්හාන එවර විමසුවේ සිංහලෙනි. යුවතිය වේදනාව ද අමතක කළ නියායෙන් නෙතු දල්වා ඔහු දෙස බැලුවාය. ඒ දෙනෙතේ රැඳී තිබූ විස්මය ඔහු පැහැදිලිවම හැඳින ගත්තේය. ඇය නැගී සිටින්නට තැත් දැරුවාය. ගිම්හාන වහා ඇයට උදව් දුන්නේය.

"මොකද වුණේ.......?" ඇය ගසට හේත්තු වී පහසුවෙන් වාඩි ගන්නා තුරු බිම බලා සිටි ගිම්හාන විමසීය. ඇගේ ඇඳුම් පුරා හිම තැවරී තිබිණි. ටිකින් ටික සීතල ද වැඩි වෙමින් පැවතිණි.

"ස්පීඩ් එක වැඩි වුණා....." යුවතිය හිස් වැස්ම ගලවා හිස අත ගා බැලුවාය....." ඔළුව රිදෙනවා හරියට....."

"තුවාල වෙලා නෑනෙ....." ගිම්හාන ලංව පිරික්සා බැලීය. ඇගේ කළු පැහැති කෙස් කළඹට රිදියෙන් වැඩ දැමුවාක් බඳුව එමත හිම කැට පතිත විය. ඔහු වහා හිස් වැස්ම ඇගේ හිස පැළඳවීය.

"අද කුණාටුවක් එයි වගේ මට හිතෙන්නෙ.... ඉක්මනට යා ගත්තොත් හොඳයි... කොහෙද ඔයා ඉන්නෙ.......?"

"මම ලන්ඩන්වල ෆ්ලැට් එකක ඉන්නෙ.... මෙහෙ කාඩිෆ් හිල්වල යාළුවෙකුගෙ කැබින් එකක් තියෙනවා... ගිය සතියෙ මම එහෙ ආවා...."

"ඔයා විතර ද කැබින් එකේ ඉන්නෙ......?" ඔහු කල්පනාකාරී ස්වරයෙන් විචාළේය.

"ඔව්..... මගේ යාළුවා පැරිස් ගිහින්.... එයා එනකම් මම ඉන්නවා...."

"යමු මම ඔයාව ඇරලවන්නම්...." ඔහු නැගී සිටින්නට ඇයට ආධාර කළේය. "හොඳ වෙලාවට මම මෙතෙන්ට ආවෙ.... තව ටික වෙලාවක් හිටිය නම් එහෙම ඔයාව හිමෙන් වැහිල යනවා....."

"මොකක්ද ඔයාගෙ නම.......?" යුවතිය විමසුවාය.

"ගිම්හාන.... ඔයා.......?"

"පියුමි....."

"ෂා...... හරි ලස්සනයි..... ගිම්හානෙ පිපුණු නෙළුම් මලක්....." ගිම්හාන කෙළිලොල් හඬින් පවසද්දි යුවතිය තරමක් හඬ නගා සිනාසුණාය.

"ලංකාවෙ කෙනෙක් හදිස්සියෙ හරි හමු වුණාම හිතට දැනෙන්නෙ පුදුම විදියෙ හැඟීමක්...ඒක වචනවලින් විස්තර කරන්න අමාරුයි..." ආපසු ගමනට නික්මෙමින් පියුමි පැවසුවේ හැඟුම්බර හඬිනි

"ඒ වුණාට හුගාක් අය මෙහෙ ජීවත් වෙන්නෙ සිංහලකම අමතක කරලා...." ගිම්හානගේ කටහඬට කලකිරීමක් මුසු වී තිබිණි.

"එහෙම නැතිවත් බැහැ... වවුලගෙ ගෙදරට ගියාම එල්ලිලා ඉන්න කියල කතාවක් තියෙනවනෙ....."

සිහින් කුඩු වශයෙන් ඇරඹුණු හිම වැස්ස කෙමෙන් කෙමෙන් කැට බවට පත් වෙමින් පතනය වෙන්නට විය. පියුමි වෙහෙසින් මෙන්ම වේදනාවෙන් ද හෙම්බත්ව සිටිනු ගිම්හාන දිටිය.

"ඉක්මන් කරන්න පියුමි......" ඔහු දැඩි නොඉවසිල්ලෙන් පැවසීය.

"අනේ මට තවත් නම් අඩියක් වත් උස්ස ගන්න බෑ ගිම්හාන...." ඇය දෙනෙත පියා ගනිමින් ඔහුගේ සිරුරට බර වූවාය.

දැඩි ලෙස විඩාබරව සිටි පියුමි ද කැටුව හිම මත ලිස්සා ඒම ඔහුට ලෙහෙසි පහසු කාර්යයක් නොවීය. හිම වැස්ස ද ක්‍රමයෙන් දැඩි වෙමින් පැවතිණි.

"පියුමි කොහොම හරි යා ගන්න බලමු. නැත්නම් අනතුරකට මුහුණ දෙන්නයි අපිට වෙන්නෙ. මට දැනටමත් සීතලයි..." ඔහු පියුමි දිරි ගැන්වීය. එහෙත් ඇය ලිස්සා ආවේ ඉතා සෙමිනි. ඒ අසීරු ගමන කෙළවර පියුමිගේ කැබිනයට එද්දී ඇය සිටියේ ඇඳ වැටෙන්නට ඔන්න මෙන්න තත්වයේය.

ඔහු ඇය අසුනක වාඩි ගන්වා ඇගේ හිම සපත්තු උනා දැමීය. ඇය බෙහෙවින්ම මලානිකව සිටියාය. ඔහු ඇගේ උඩ කබාය ද ගලවා දැමීය.

"ඔයා දැන් හොට් බාත් එකක් ගන්න පියුමි. එතකොට ඇඟට ටිකක් පහසුවක් දැනේවි.... කෝ කොහෙද බාත්රූම් එක..... මම ඔයාට ටබ් එක පිල් කරල දෙන්නම්...."

"ඔයා මං හින්ද කරදර වෙනව ගිම්හාන....." ඇය අසුනේ ඇන්දට හිස හේත්තු කොටගෙන කෙඳිරි ගෑවාය.

"ඒකට කමක් නෑ...... කරදරයක් වුණ වෙලාවට උදව් නොකරනවානම් වෙන කොයි වෙලාවටද උදව් කරන්නෙ.......?"

ඔහු උණුසුම් වතුරින් නාන ඔරුව පුරවා ඇය නාගන්නා තුරු උණුසුම් කොකෝවා කෝප්පයක් ද සකස් කළේය. නැමෙන් අනතුරුව වෙනත් ඇඳුමකින් සැරසුණු පියුමි කෙරෙන් දිස් වූයේ ප්‍රබෝධමත් බවකි.

"දැන් ඔයාගෙ ඔළුව රිදෙනවා අඩු ද.......?" ඔහු කොකෝවා කෝප්පය ඇය අතට දුන්නේය.

පියුමි කොකෝවා කෝප්පය අතට ගත්තේ කෘතඥතා පූර්වක බැල්මක් මුහුණේ රඳවාගෙනය.

"ඔයා හරියට මේ ගෙදරට පුරුදු කාරයෙක් වගේනෙ..... ඒ විකට කොකෝවාත් හදල...."

"ඔය වගේ දේවල් අමුතුවෙන් පුරුදු වෙන්න දෙයක් නෑනෙ..... කුස්සියට ගියා.... වතුර උණු කළා.... හැඳුවා එච්චරයි...." ඔහු සිනාසුණේය.

"ඔයා ලංකාවෙදිත් ඔව කරල තියෙනව ද.......?" ඇය කොකෝවා කෝප්පය තොල ගාමින් නෙත් කොණින් ඔහු දෙස බැලුවාය.

"ඉදල හිටල නිවාඩුවකට ලංකාවට යනව මිසක් මම එහෙ පදිංචි වෙලා ඉදල නෑ....."

"ඒ කියන්නෙ ඔයා පදිංචි වෙලා ඉන්නෙ මෙහෙද.......?" පියුමි දෙනෙත් මහත් කොට ඔහු දෙස බැලුවාය.

"ඔව් කාඩිෆ් ප්ලේස්වල......" ඔහු හිම කබාය ළනා දමා අසුනකට බර වූන්නේය. "ඔයා ළඟදි ද මෙහාට ආවෙ.......?"

"මම ඇවිත් අවුරුදු තුනක් විතර වෙනවා...."

"ආවට පස්සෙ ලංකාවට ගියෙ නැද්ද.......?"

ඔහු ඇසූ ප්‍රශ්නයෙන් ඇය කැළඹුණු බව ඔහුට පැහැදිලිවම පෙනිණි. ඇය පානය කරමින් සිටි කොකෝවා කෝප්පය පසෙක තබා ඔහු කෙරෙන් මුහුණ සඟවා ගත්තාය.

"සමා වෙන්න පියුමි.... මම අනවශ්‍ය ප්‍රශ්නයක් ඇහුව නම්...." ඔහු පැවසුවේ ආචාරශීලී ලෙසය.

"නෑ ගිම්හාන... මම ලංකාවෙන් ආවේ ලංකාව ගැන අන්තයටම කළකිරිල... ආයෙ ලංකාවට කවදවත් මං යන්නෙ නෑ...."

"ලංකාවට මම නම් හරි ආසයි.... මං හිතාගෙන ඉන්නෙ කවද හරි දවසක ගිහින් ලංකාවෙ පදිංචි වෙන්න....."

ඇය උපහාසය මුසු මඳ සිනාවක් පෑවාය. "මෙ වගේ රටක් දාල ලංකාවට යන්නෙ මොන මෝඩයෙ ද......?" වැන්නක් ඒ සිනාවේ සැඟවී ඇතැයි ඔහුට සිතිණි. ඔහු ඇය සමඟ ඒ පිළිබඳව වාද කරන්නට ගියේ නැත.

හිම වැස්ස නොනවත්වා ඇද හැලෙමින් තිබිණි. යන්ත්‍රානුසාරයෙන් උණුසුම් කොට නොතිබුණා නම් ගේ ඇතුළේ සිටිය ද ඔවුනට සීතල දරා ගන්නට නොහැකි වනු ඇත. ඔහු වීදුරු කවුළුවක් අසලට ගොස් පිටත බැලුවේය. අවට පරිසරයම සුදු පැහැති රෙද්දක් ඇතිරුවාක් මෙන් හිමෙන් වැසී තිබිණි. ඔහු බලාපොරොත්තු කඩ වූ ලෙසින් ආපසු හැරුණේය.

"එළියට බහිනව තියා හිතන්නවත් බැහැ පියුමි....."

"දැන් ඔයාට මෙහෙ නවතින්න තමයි වෙන්නෙ....."

"නවතින එකනම් ප්‍රශ්නයක් නෙමෙයි. කොහොමටත් මම ගෙදරට කියල ආවෙ. යාළුවෙකුගෙ ගෙදරත් යනව කියල....."

"එහෙමනම් මොකක්ද ඔයාට තියෙන ප්‍රශ්නෙ.......?" ඇය ඕනෑකමින් ඔහු දෙස බැලුවාය.

"ලස්සන කෙල්ලක් තනියම ඉන්න ගෙදරක නවතින එක හොඳද කියල මං කල්පනා කළේ...." ඔහු ඇසක් වසා ඉඟි කළේය.

"අපෝ ඒකට මක් වෙනව ද මේ ලංකාව නෙමෙයි, එංගලන්තෙනෙ...."

"ඒ වුණාට අපි ලංකාවෙ මිනිස්සුනෙ...."

"ඉපදුණ දා ඉඳල එංගලන්තෙ ඉන්න ඔයා ඔය විදියට හිතන එක මට හරි පුදුමයි ගිම්හාන....."

"පුදුම වෙන්න දෙයක් නෑ ඒකෙ... ලංකාවෙ පදිංචි වෙලා හොඳිපියට ලංකාව ගැන දැන ගන්න ඕන හැම දේම මම දන්නවා...." ඔහු පැවසුවේ ආඩම්බරය මුසු ස්වරයෙනි.

"ඔයාගෙ සිංහල උච්චාරණය හුඟාක් වෙනස්... මං හිතුවෙ ඒ විදියට කතා කරන්නෙ ඕන කමින් කියලයි...." පියුමි සිනාසුණේය.

දින තුනක් තිස්සේ එක දිගටම හිම වැස්ස පැවතිණි. පුරකටන පවා ක්‍රියා විරහිතව පැවති ඒ දින තුනේ ගිම්හානත් පියුමිත් මුළු ලොවින්ම වෙන් වූවාක් බඳු විය. බැලූ බැලූ අත දිස් වූයේ සුදෝ සුදු හිම පලස පමණකි. හිම වැස්ස නවතින තුරු එළි පහළියට බැසීම ඉතා අන්තරාදායක ක්‍රියාවක් විය.

"ඔයා නොහිටිය නම් එහෙම මම පාළුවෙ මැරේවි මේ ගේ ඇතුළෙ....." ගිනි උදුන ඉදිරිපිට අසුනකට බරදී කෝපි පානය කරමින් සිටි ගිම්හාන පියුමිට පැවසීය. පියුමි දඟකාර එහෙත් ලඟන්නා සුළු මඳහසකින් මුව සරසා ගත්තාය.

"මම නොහිටිය නම් ඔයා මෙහෙ එන්නෙත් නෑනෙ....."

"ඒකත් ඇත්ත....." ඔහු ගිනි උදුනේ රත් පැහැ අඟුරු දෙස හිස් දෑසින් බලා සිටියේය.

සිය අසුනින් නැගී සිටි පියුමි ගිම්හානගේ අසුන ඉදිරිපිට දණ ගසා ගත්තාය. ඉනික්බිති ඔහුගේ අතේ වූ හිස් කෝපි කෝප්පය රැගෙන සීරුවෙන් පසෙක තැබුවාය. ගිම්හාන කුතුහලය රැඳි දෑසින් ඇය දෙස බැලීය.

"ගිම්හාන....." ඇය ඔහුගේ දෑත සිය දෑතට මැදි කර ගත්තාය.

ගිම්හාන මොහොතක් නිසලව ඇය දෙස බලා සිටියේය. ඇගේ සසල දෙනෙතේ කාන්තිය ඔහු වශී කරවන සුළු විය. සැබැවින්ම ගිම්හාන ඇසුරු කළ පළමු යුවතිය පියුමි නොවේ. ඔහුගේ දෑතින් අල්ලාගත් පළමු යුවතිය ද පියුමි නොවේ. එහෙත් මෙතෙක් කිසිදු යුවතියක තුළ නොදුටු කුමක්දෝ අපූර්වත්වයක් ඔහු පියුමි තුළින් දිටිය. ඒ හැඟීමට නිසි අරුතක් දීමට ඔහුට හැකි වූයේ නැත. ඔහු ඇගේ දෑතින් මුදා ගත් සිය දෑතින් ඇය තම උණුසුමට ළං කර ගත්තේය.

"ගිම්හාන මට ළං වුණ හැම කෙනෙක්ම මගෙ හිත රිද්දල ඇත් වෙලා ගියා.... ඔයත් එහෙම වේවිද.......?" ඇමෙඬන්නට ආසන්න ස්වරයකින් විමසූ පියුමි හිස ඔසවා ගිම්හානගේ මුහුණ දෙස බැලුවාය. ඔහු නැඹුරු වී ඇගේ දෙඅදර සිප ගත්තේය.

"නෑ පියුමි..... එහෙම තාවකාලිකව ළං වෙන්න ඕන වුණා නම් හිත නොරිදවාම මගෙ හිතත් නොරිද්දගෙනම ඇත් වෙන්න පුළුවන් විදියෙ සිය ගණනකට ළං වෙන්න මට ඉඩ තිබුණා.... ඒත් මං එහෙම කළේ නෑ.... ඉස්සරහට කරන්නෙත් නෑ ඒ වගේ දෙයක්...." ඔහුගේ කටහඬේ වූ ස්ථිරසාර බව පියුමි තුළ තිගැස්මක් ඇති කරලූ බව ඔහුට පසක් විය.

"මම ඔයාව අප්සෙට් කරවන්න නෙමෙයි ඒ විදියට කිව්වෙ...." ඇය බැගෑපත් ලෙස ඔහුගේ මුහුණ දෙස බැලූවාය.

"නෑ අප්සෙට් වුණේ නෑ මම...." ඔහු සිනාසුණේය. ඇය වඩාත් ඔහුට ළං වූවාය. හිම වැස්ස නවතින විට ඔවුන් දෙදෙනා ළං විය යුතු අන්තයටම ළං වී සිටියහ.

කොතරම් යුවතියන් ඇසුරු කළ ද ගිම්හාන ඔවුන් සමග සිප ගැනුමකින් එහාට ගොස් නොතිබිණ. ලංකාවේ සංස්කෘතික රටාව පිළිබඳ මනා අවබෝධයකින් සිටි ඔහු යුරෝපීය තරුණයන් මෙන් විවාහ නොවී එක නිවසක විසීමේ චාරිත්‍රය අනුමත කළේ නැත. පියුමි සමග කායිකව බැඳුණ ද ඔහුට ඒ පිළිබඳව පසුතැවිල්ලක් දැනිණි.

"මොනවද ගිම්හාන ඔයා ඔච්චරම කල්පනා කරන්නෙ......?" ජනේලයෙන් පිටත බලාගෙන නිමක් නැති කල්පනාවක ගැලී සිටි ගිම්හාන අසලට ආ පියුමි විමසුවාය.

"දැන් හිම වැස්ස නැවතිලා.... මම යන්න ඕන..... අම්මලා මෙලහකටත් කලබල වෙලා ඇති....." ඔහු ඇය දෙස නොබලාම පිළිතුරු දුන්නේය. පියුමි ඔහුගේ සිරුරට බර වී උරහිස මත මුහුණ හොවා ගත්තාය.

"මම ජීවිතේ හුඟාක් සතුටින් හිටිය දවස් තුන මේ ගෙවිල ගියේ.... අපි ආයෙ හමු වෙන එකක් නැද්ද ගිම්හාන.......?" ඇය විමසුවේ සුසුමක් හෙළමිනි. ගිම්හාන ඇය තමා දෙසට හරවා ගත්තේය.

"නෑ පියුමි.... මීට පස්සෙ අපි හැමදාම හමු වෙනවා...."

"ඔය ඇත්තම ද ගිම්හාන......?" විමසද්දී ඇගේ දෙනෙත සතුටින් දිදුලනු ඔහු දිටීය.

"ඔව පියුමි අපි දෙන්න බඳිමු....."

ඒ යෝජනාව කරද්දී ඇය කුඩා දැරියක මෙන් උඩ පැන නටනු ඇතැයි ඔහු සිතිය. එහෙත් මෙතෙක් සතුටින් දිදිලූ ඇගේ දෑසට අඳුරක් එක් විය. ඇය සුසුමක් හෙළා ඔහුගෙන් ඈත් වී අසුනකට බර වූන්නාය. ඔහු ඇය දෙස බැලුවේ කුතුහලයෙනි.

"ඇයි පියුමි ඔයා කැමති නැද්ද මාව බඳින්න.......?"

"අපි තවම හරියට අඳුන ගත්තෙවත් නෑ ගිම්හාන......" ඇය පවසද්දී ඔහුගේ සිතට දැනුණේ කෝපයකි. ඔහු සමග යහන්ගත වෙද්දී ඒ සිතුවිල්ල සිතට නොනැඟුණේදැයි අසන්නට ඔහුට සිත්විය. එහෙත් ඔහු ආයාසයෙන් ඒ අවිනීත වදන් ගිල ගත්තේය.

"පියුමි ඔයා දන්නවද මම ඉපදුණේ එංගලන්තෙ.... හැදුණෙ වැඩුණෙ එංගලන්තෙ.... ඒත් මං හිතන්නෙ පතන්නෙ ලංකාවෙ විදියට..... ඒකයි මං ඔයාට බඳිමු කියල යෝජනා කෙරුවෙ.... කෙල්ලක් එකක් නිදාගෙන ඊ දැකපු හීනයක් වගේ ඒ හැම දේම අමතක කරල දාන එක එංගලන්තෙ කොල්ලන්ට පුළු දෙයක්.... ඒත් මං ඒ වගේ නෑ....." ඔහු කියාගෙන කියාගෙන ගියේ ඒ කෝපය නිසාමය. පියුමි අයාගත් දෙනෙතින් ඔහු දෙස බලා සිටියාය.

## 11

නිදිබර ලොව කෙමෙන් අවදිවන ලකුණු දසතින් දිස්වෙමින් තිබිණි. තමා කොතෙක් වේලා නිදි වරමින් සිටියාදැයි ගිම්හානට පසක් වූයේ එමොහොතේය. අතීතයත් වත්මනත් එකිනෙකට යාකරන සිතුවිලිවලියක පැටලී සිටි ඔහුට රැය ගෙවී යන බව දැනුණේ නැත. උගුරක් දෙකක් පමණක් පානය කළ කෝපි කෝප්පය සීතල වී තිබිණි. ඔහු ඉතිරි කෝපි ටික බීගෙන බීගෙන ගියේය.

"දැන්වත් පොඩ්ඩක් නිදා ගන්න බලන්න ඕන.... නැත්තම් හෙට ඔෆිස් එකට ගිහින් නිදා වැටෙන්න වේවි....." තමාටම කියා ගනිමින් නැගී සිටි ගිම්හාන අත් දෙක විදා ඇඟ මැලි කැඩුවේය. එහෙත් යහනට වැටුණු සැණින් නැවතත් ඔහුගේ සිතුවිලි අයාලේ සැරිසරන්නට විය.

"ගීතිකාට සනීප ද දන්නෙ නෑ දැන්... පව් අහිංසක කෙල්ල....." ඔහු දුක්බර සිතින් යුතුව කල්පනා කළේය. පියුමි වෙනුවට ගීතිකා හමුවූයේ නම් මේ වන විට තම දිවිය වෙනස්ම මඟකට යොමු වී තිබෙනු ඇතැයි ගිම්හාන සිතීය. පියුමිත් ඔහුත් අතර ඇති වූයේ හුදු කායික ආකර්ෂණීය බැඳීමක් පමණක් බව පසක් වෙද්දී ඔවුන් විවාපත්ව මාස ගණනාවක් ඉකුත් වී පැවතිණි.

"මම නම් ඒ ගෑණු ළමයට එච්චර කැමති නෑ පුතේ....." පියුමි පිළිබඳ යෝජනාව ඉදිරිපත් කළ විට අම්මා පැවසුවේ ගිම්හානගේ සිත නොරිදෙන පරිදිය. එහෙත් නංගී නම් කෙළින්ම විරුද්ධ වූවාය. ඔහුගේ පැත්තට කතා කළේ තාත්තා පමණකි.

"පුතාගෙ කැමැත්ත ඒක නම් අපි විරුද්ධ වෙලා වැඩක් නැහැනෙ... අපි නෙමෙයිනෙ එකට ජීවත් වෙන්නෙ ඒ දෙන්නනෙ......" තාත්තා සුපුරුදු නැන්පත් බවින් යුතුවම පැවසීය. කවුරු විරුද්ධ වුවද පියුමි සමග විවාහ වීමට තරම් ඒ වන විට ඔහුගේ සිත ඇය කෙරෙහි බැඳී තිබිණි. විවාහය පිළිබඳව පියුමි දැක්වූ ඇල්මැරුණු ප්‍රතිපත්තිය තේරුම් ගැනීමට නොහැකි තරමට ඒ බැඳීම බලවත් විය.

"දැන් ඉතින් පහු ගිය දේවල් ගැන කතා කරල වැඩක් නෑ.... ඉස්සරහට වෙන්න තියෙන දේවල් ගැන හිතනවා මිසක....." ගිම්හාන යහනෙහි මුණින් අතට හැරී කොට්ටය බදා ගත්තේ එසේ මුමුණා ගනිමිනි.

ඔහු අවදි වෙද්දී වේලාව උදේ දහය ද පසුවී තිබිණි. මුළු රාත්‍රිය පුරාවටම නොලද නින්ද රාත්‍රිය ගෙවී ගිය පසුව ලැබීම ගැන ඔහුට දැනුණේ විමතියකි. ඔහු ගතට දැනුණු කෙඩෙත්තු ගතිය පහවී යන තුරුම නාන කාමරයේ දිය මල යටට වී සිටියේය. එදිනට දියයුතු හදිසි ලිපි කිහිපයක්ම පෙරදා සකස් කොට දුන් බැවින් හදිස ියේ කාර්යාලයට යෑමේ වුවමනාවක් ඔහුට නොවීය. ඔහු ගීතිකා බැලීමට රෝහලට යාමට සූදානම් වූයේ එබැවිනි.

රෝහල අබියසට යද්දී ගීතිකා බැලීමට ඔහුගේ සිතේ වූ වුවමනාව දැඩි ආශාවක් බවට වර්ධනය වී තිබිණි. සීනුව නාද වන විටම ඔහු ඉක්මන් ගමනින් ඇතුළට පිවිසියේය. හදිසිය වැඩි නිසාම ඔහු කිහිප දෙනෙකුගේම ඇඟේ හැපිණි.

"කොහේ යනවද මන්දා හරක් වගේ උඩ බලාගෙන...." එක් අයෙක් ගිම්හානට දොස් පවරමින් ඔහු දෙස රවා බැලුවේය. එහෙත් ගිම්හානට තරහක් දැනුණේ නැත. ඔහු පසු නොබලාම ගොස් ගීතිකා සිටි

වාට්ටුවට ඇතුළු විය. කියා ගත නොහැකි කුමක්දෝ හැඟීමක් ළය තුළ පිරී ඇති බව ඔහුට දැනිණි. ඔහු ගීතිකාගේ ඇඳ අසලට පියවර මැන්නේ ඒ හැඟීමෙන් සසල සිතින් යුතුවය.

නින්ද ගිය අයුරින් ඇගේ දෑස් පියවී තිබිණි. ඔහු මුලින්ම දවසේ වාට්ටුවට එද්දී දකින්නට තිබූ තරම් සුදුමැලි පැහැයක් ඇගේ වතේ නොවීය. සේලයින්ද ගලවා තිබිණි.

"ගීති......" ඔහු ඇගේ නළලතට අත තබා සිහින් සරින් ඇමතීය. ඈය වහා දෙනෙත් විවර කළාය. ඔහු හැඳින ගන්නට මෙන් මොහොතක් බලා සිටි ඇගේ දෙනෙත කඳුලින් පිරී යනු ඔහු දුටුවේය. ඇගේ ඇසි පිල්ලමක රැඳුණු සිහින් කඳුළු බිඳ ඔහු දබරැඟිල්ලෙන් පිස දැමීය.

"ගිම්හාන ..." ඈය සුදුමැලි දෙතොලතරින් අපහසුවෙන් ඔහුගේ නම පිට කර ගත්තාය.

"ඔයාට දැන් සනීපද ගීති...?"

ඔහු වඩාත් ඈය වෙතට නැඹුරු විය.

"ඔව්.."ඈය හිස සැලුවාය.

"සේනානි ගෙදර ගියාද..?"

"ඊයෙ උදේ සේලයින් ගැලෙව්වා... ඊට පස්සෙ කාටවත් ළඟ ඉන්න දෙන්නෙ නෑ....." ගීතිකා නැඟී සිටින්නට වෑයම් කළාය. ගිම්හාන කොට්ටය ඇඳ විට්ටමට හේත්තු කොට ඈය හාන්සි කළේය. ඈය කෘතඥතා පූර්වක මඳ සිනාවක් පෑවාය. කඳුළත් සිනාවත් එකට එක්වූ කල මැවෙන්නේ අපූර්ව චමත්කාරයකැයි ඇයගේ මුහුණ දෙස බලා සිටියදී ඔහුට සිතිණි.

"ඔයාට ඩොක්ටර් මොකද කිව්වෙ ගීති......?"

"රෙස්ට් කරන්න කිව්වා සතියක් දෙකක්.... ඒ වුණාට මට දැන් අමාරුවක් නෑ....." ඈය සිනාසෙන්නට වෑයම් කළාය.

"අමාරුවක් නැති බව පේනවා මූණ දිහා බැලුවාම....." ඔහු ඇගේ දෙකොපුල දෑතින් උණුසුම් කළේය. ඈය ඇසි පිය නොහෙළා ඔහු දෙස බලා සිටියාය.

www.sinhalalibrary.com Uploaded by Crazy

"ඔයාට මං වදයක් වුණා නේද ගිම්හාන......?"

"නිකමටවත් එහෙම හිතන්න එපා කෙල්ලෙ.... ඔයා මට කවදාවත් වදයක් වෙන එකක් නෑ...." ඔහු සෙමින් ඇගේ අවුල් හිසකෙස් පිරිමැද්දේ නළලත සිප ගැනීමට ඇතිවූ ආශාව මැඩ ගනිමිනි.

රෝගීන් බැලීමට නියමිත වූ හෝරාව බැවින් රෝහල් වාට්ටුව පුරා වූයේ විසිරුණ කඩ් ගුලක ඇති කඩිසර බව හා කලබලකාරී බවය. එහෙත් එකිනෙකාගේ නෙත්වලට එබීගෙන සිටි ගීතිකාටත් ගිම්හානටත් ඒ කලබලකාරී බව දැනුණේ නැත. ගිම්හානගේ බැල්මට පැරදුණු කලෙක මෙන් මඳ වේලාවකට පසු ගීතිකා ඉවත බලා ගත්තාය. ඔහුගේ මුවගට සිහින් සිනාවක් නැගිණි.

"ඇත්තටම දැන් ඔයාට සනීප ද ගීති......?" ගිම්හාන මුදුව ඇගේ හිස පිරිමැද්දේය.

"ඔයා ආවට පස්සෙ සනීපයි වගේ දැනෙනවා....." ඇය සිනාසෙන්නට තැත් දැරුවාය.

"එහෙම නම් හැමදාම මගෙ ළඟ හිටියොත් ඔයාට කවදාවත් අසනීපයක් හැදෙන එකක් නෑ....." ගිම්හාන එසේ කියද්දී ගීතිකා දෑඩිව යටි තොල සපා ගත්තාය. ඇය එසේ කළේ කුමන අරුතකින්දැයි දැන ගැනීමේ උවමනාවක් ඔහු තුළ ඇති විය. තමා වරදක් කරන්නේය හැඟීම ඔහුට වද දුන්නේය.

"මම නොපෙනෙන අනාගතයක් ගැන සුබ හීන මවන්න කැමති නෑ ගිම්හාන...." ඇය පැවසුවේ ඉවත බලාගෙනය. ඔහුගේ සිත සසල විය.

"ඇයි ඒ......?" ඔහු ඒ සසල බව සඟවා විමසුවේය.

"මට බයයි.... මම මැව්ව හීන හැම එකකින්ම මට ඉතිරි වුණේ දුකක් විතරයි...." ගීතිකා දිගු සුසුමක් හෙළුවාය.

"මම කෙල්ලෙකුගෙ හිත රිදවලා සතුටු වෙන විදියෙ පහත් කෙනෙක් කියල හිතන්න එපා ගීති......"

"නෑ දෙවියනේ නෑ...." ඇය ඇඳ විට්ටම මත වූ ඔහුගේ පුරන තද කොට අල්ලා ගත්තාය. "මාව වරදවල හිතන්න එපා.... ඒත් නිර්මලාගෙ සිද්ධිය මතක් වෙන කොට මට මොකක් දෝ බයක් දැනෙනවා...."

"ඔයාට මාව වදයක් නම් මං ඔයාගෙ හිත රිදවයි කියල හිතෙනව නම් මම මීට පස්සෙ ඔයා බලන්න නැවිත් ඉන්නම් ගීති...." ඔහු පහත් හඬින් පැවසීය. එහෙත් ඒ කටහඬේ වූ දුක්බර බව ඇගේ දෑසට කඳුළු නැංවීය.

"එපා අඬන්න. ඔයාට අඬන්න හොඳ නෑ....." ඔහු ඇය අස්වැසුවේය. "ඒක නෙමෙයි ගීති..... ඔයාට කන්න මොනවද ගෙනත් දෙන්නෙ.......?"

"කට දනා ලුණු මිරිසකුත් එක්ක බත් ගේන්න කියල මම සේනානිට කිව්වා....." ඇය සිනාමෙසන්නට තැත් දැරුවාය. ගිම්හාන ගේ පපුව දැවී ගියේය.

"සේනානිටත් හරි කරදරේ මං හින්දා. නිවාඩු ගන්නත් බෑ එක දිගට. හෙට ඉඳන් ආපහු වැඩට යන්න වෙවි....."

"මම හෙට ඉඳන් ඔයාට බත් ගේන්නම්...." ගිම්හාන කියද්දී ගීතිකා ඔහු දෙස බැලුවේ දෙනෙත් විදහාගෙනය.

"ඔයා.......?"

"ඔව් මං තමයි... හැබැයි මම ලුණු මිරිස් හදන්න දන්නෙ නෑ. දන්න දේවල් එක්ක උයාගෙන එන්නම්...."

"ඔයා රසට උයන්න දන්නව ද.......?"

"අපෝ ඔව්.... ඔයාලට වැඩිය රසට උයන්න පුළුවන්...." ඔහු ඇසක් ඉගි මැරීය.

"ඔයා මං උයන දේවල් කෑව නම් ඔහොම කියන්නෙ නෑ....."

"ඉතින් ඇවිත් මට උයල දෙන්නකො...." ඔහු විහිළුවක ස්වරයෙන් පැවසීය. එහෙත් ඇගේ මුහුණ සැණෙකින් වෙනස් වනු ඔහුට පෙනිණි. නොපෙනෙන අනාගතයක් පිළිබඳ සිහින නොමවන බව ඇය පැවසුවේ මොහොතකට පෙරය. අසනීපයෙන් පීඩාවට පත්ව සිටින ඇය තව දුරටත් වෙහෙසට පත් නොකළ යුතුයයි ඔහුට සිතිණි. අනෙක් අතට අනාගතය මොන ආකාරයේ එකක් දැයි ඔහුට ද සිතා ගත නොහැකිය. කුමක්දෝ අපූර්ව ආකර්ෂණයකින් ඔහුගේ සිත ගීතිකා කෙරෙහි බැඳාණි. එය පියුමිට බැඳුණාක් මෙන් හුදු කායික

www.sinhalaelibrary.com
Scanned By Crizzy

ආකර්ෂණයක් නොවන බවද සහතිකය. එහෙත් ඔහු තවමත් විවාහකයෙකි. ගීතිකාට නිදහසේ ආදරය ප්‍රකාශ කිරීමට හැකියාවක් ඔහුට නැත. ඇය පිටු දැකීමට හැකියාවක්ද නැත. ඔහු දිගු සුසුමක් හෙළීය.

"ඇයි ගිම්හාන......?" ගීතිකා කුතුහලයෙන් ඔහු දෙස බැලුවාය.

"මොකුත් නෑ ගීති...... ඒක නෙමෙයි ඔයාට සනීප නෑ කියල ගෙදරට දැන්නුවෙ නැද්ද......?" ඔහු කතාව වෙනතකට හැරවීය.

"ගෙදරට දැන්නුවයි කියල වැඩක් නෑ... මාව බලන්න මෙච්චර දුර එන්න අම්මලාට බෑ. එයාල නිකම් කලබල වෙනව විතරයි...."

දෙමව්පියන්ට එන්නට නොහැක්කේ මන්දැයි ගිම්හාන විමසූවේ නැත. වෙළඳ කලාපය පිළිබඳ ලිපිය සකස් කරන්නට ගියදා එහි යුවතියන්ගේ ජීවිතවල ඇතුළ පැත්ත ගැන බොහෝ දේවල් ඔහු දැන ගත්තේය.

"ඉතින් දැන් හෙට නැත්තම් අනිද්දා ඔයාව ඩිස්චාර්ජ් කරාවි. එතකොට බෝඩිමට ගිහින්ද ඔයා රෙස්ට් කරන්නෙ......?"

"රෙස්ට් කරන්න තියා ආපහු සැරයක් ඒ බෝඩිමට යන්නවත් මට හිතෙන්නෙ නෑ ගිම්හාන......" ගීතිකා ඉවත බලාගෙන දිගු සුසුමක් හෙලුවාය. නිර්මලාගේ සුපුරුදු සිනාමුසු මුහුණ ගීතිකාගේ මනස හමුවේ ඇඳී මැකී ගියේය. ඇගේ මළ සිරුර පිළිබඳ මතකය සිතින් ඉවත් කරලීමට ගීතිකා වෙහෙස ගත්තාය. එය යන්තමින් සිහිපත් වෙද්දී පවා ගීතිකාගේ සිරුර කිළිපොලා ගියේය.

"ඔයා වරදවල හිතන්නෙ නැත්තම් මම යෝජනාවක් කරන්නම්...."

"ඒ මොකක්ද......?"

"ඔයා මගේ ගෙදරට එන්න....."

"ඔයාගෙ ගෙදර......?" ගීතිකා දෙනෙත් විසල් කොටගෙන ඔහු දෙස බැලුවාය.

# 12

දින කිහිපයක් තිස්සේ වාට්ටුව තුළම සිටි බැවින් ගීතිකාගේ දෙනෙතට හිරු එළිය පීඩාකාරී විය. ඇගේ දැස අඳුරු වීගෙන ගියේය. ඇය ගිම්හානගේ සුරතේ එල්ලුණාය. ගිම්හාන වහා ඇය දෙස බැලුවේය. ඇය සිටියේ දැස් පියාගෙනය.

"ඇයි ගීති...... මොකද ඔයාට........?" ඔහු විමසුවේ කලබලයෙනි. ඇගේ බෑගය ද කොට්ටය ද ඇතේ දරාගෙන සිටි බැවින් ඔහුට ඇය වාරු කොටගත නොහැකි විය.

"මට ඇස් දෙක පෙනෙන්නේ නැතිව ගියා...."

"ඒ එක පාරටම අව්ව දිහා බැලුව හින්ද. ඔයා හෙමින් හෙමින් එන්න මගෙ අත අල්ලගෙන. අපි ටැක්සියක් කතා කර ගනිමු...."

"ඔයා බයික් එකේ නෙමෙයි ද ආවෙ........?"

"බයික් එකේ තමයි.... ඒත් දැන් සංජීවට කෝල් එකක් දාල කියනව ඇවිත් බයික් එක ගෙනියන්න කියල....."

"ඔයා මං හින්ද කරදර වෙනව ගිම්හාන...." ඇය කෙපලුවේ සංවේගයෙනි. ගිම්හාන සෙමින් සිනාසුණාය.

සැබැවින්ම අරුතක් නැතිව ගෙවූ සිය දිවියට අරුතක් එක් කළේ ගීතිකා නොවේදැයි ඔහු සිහිපත් කළේය. මෙතෙක් ඔහු කළේ කාර්යාලයට යාමත් ආපසු ඒමත් මිතුරෙකු සමග විනෝද ගමනක් යාමත් පමණකි. ගීතිකා වැනි අහිංසක යුවතියක වෙනුවෙන් වෙහෙසෙන්නට ලැබීම ඔහුට සතුටක් දැනවීය. පියුමි වෙනුවෙන් ද ඔහු කොතෙකුත් දුක් උසුලා තිබිණි. සිය දෑතින්ම රස මසවුළු පිළියෙල කොට දී තිබිණි. එහෙත් ගීතිකා වෙනුවෙන් බත් පාර්සලයක් සාදද්දී දැනුණු හැඟීම ඒ කිසිදු විටෙක නොදැනුණ බව ඔහු සිහිපත් කළේය. ඔහුට ඉබේටම දිගු සුසුමක් හෙළිණි.

"ගිම්හාන.........?" ඔහුගෙ වෙනස වැටහුණු බැවින්දෝ ගීතිකා දෙනෙත විවර කොට ඔහු දෙස බැලුවාය.

"ඔයා ඔහොම කල්පනා කරන කොට මට බය හිතෙනවා....." ඈය පැවසුවේ සිහින් හඬිනි.

"ඇයි ගීති ඒ.........?" ඔහු සිටි වනම නැවතී ඈය දෙස බැලුවේය. සිය බෑගය උරහිසේ එල්ලාගෙන කොට්ටය කිහිලි ගන්වාගෙන සිටින මේ යෞවනයා සංසාරේ ඈත එපිට සිටම තමාට හමුවන්නට ඇතැයි ඇයට සිතිණි. වදනින් විස්තර කළ නොහෙන දයාබර හැඟුමකින් ඇගේ දෙනෙතට කඳුළු පිරිණි.

"මං කාටවත් කරදරයක් වෙන්න කැමති නෑ...... ඒත් මේ වෙලාවෙ මං හුඟාක් අසරණයි....." පවසමින් ඈය බිම බලා ගත්තාය.

"කොයිම වෙලාවකවත් ආත්මානුකම්පාවට යට වෙන්න එපා ගීති..... එතකොට අපිට හිත හදා ගන්න අමාරුයි...." ඔහු මඳ ලෙස සිනාසුණේය. "ඒක නෙමෙයි ඔයා ඔය බංකුවෙ වාඩි වෙලා ඉන්නකො. මම සංජීවට කෝල් එකක් දානකම්......"

"කොහෙද යකෝ උඹ යන්නෙ. හිටිය ගමන්.........? දැන් ටිකකට ඉස්සර වෙලත් බොස් උඹව ඇහුවා...." දුරකථන ඇමතුම ගත් විගසම සංජීව කඩාපැන්නාය. ඔහුගේ ස්වරයේ වූ අමනාපය ගිම්හානට වහා වටහා ගත හැකි විය.

"ඒක නෙමෙයි මචං මාර වැඩක් වුනානෙ. ගිම්හාන හැකි තරම් කෙටියෙන් සංජීවට සිද්ධිය විස්තර කලේය.

"ඉතින් දැන් උඹ මොනවද කරන්න යන්නෙ........?" සංජීව විමසීය.

"ගීතිකාව මගදාල එන්න පුළුවන් කමක් නැනෙ මචං. උඹට බැරිද ඇවිත් මගෙ මෝටර් බයික් එක අරන් යන්න........?"

"මං හිතුව ඇවිත් ඒකිව අරන් යන්න කියනවා කියල......"

"උඹෙ හැටි දැන දැනත් මං කියනවද එහෙම.........?"

"කොහොමටත් ඉතින් අන්තිමට ඔච්චට කර ගහන්න වෙන්නෙ මෙ අහක ඉන්න අපිට තමයි.... දැන්නම් කියනව මග දාල එන්න බෑ කියල. අන්තිමට උන්ට මං සලකුණුවත් ඉතුරු කරන්නෙ නැතිව උඹල කැපිල යන්නෙ......" සංජීවගේ කට හඬේ වූයේ කෝපයට මුසුවූ කලකිරීමකි. ගිම්හානගේ සිත රිදිණි. ඔහු මොහොතක් දෙකක් නිහඬව සිටියේය.

"හලෝ... හලෝ... ගිම්හාන..... මොකද උඹ සයිලන්ස් වුනේ.........?" සංජීව කෑ ගසනු ගිම්හානට ඇසිනි.

"උඹ මං ගැන නොදන්න කෙනෙක් වගේ ඔහොම කතා කරන එක වැරදියි මචං....." ගිම්හාන පහත් හඬින් පැවසීය.

"දැන් ඔව ගැන කතා කර කර ඉන්න වෙලාවක් නෑ..... මං පස්සෙ වෙලාවක විස්තර ඇතුව කියන්නම්කො... දැන් කියපන් මං කොහාටද එන්න ඔන කියල......"

ගිම්හාන ඔහුට ආසන්න ස්ථානය පැවසීය. එහෙත් සංජීවගේ චෝදනාව ලෙහෙසියෙන් බැහැර කළ හැක්කක් නොවන බව ගිම්හානට පසක් වූයේ නැවත වරක් ගීතිකා වෙත යද්දීය. ඇය දෑස් දල්වා ගෙන ඔහු දෙස බලා සිටියාය. ආදරය හා විශ්වාසනීයත්වය එතුළ දිදුලමින් තිබිණි. ඇය තමාගෙන්ද අපේක්ෂා කරනු ඇත්තේ ඒවාමය.

කුලී රිය ගිනි ගත් නගරය මැද්දෙන් වේගයෙන් පෙරට ඇදෙන්නට විය. තාර පාරේ වැදී රිය වීදුරුවෙන් ඇතුළට පරාවර්තනය වන හිරු රැස්වල කාන්තිය දරා ගත නොහුණු ගීතිකා දෙනෙත පියා ගත්තාය.

ඇයටත් නොදැනුවත්වම ඇගේ හිස ගිම්හානගේ උරහිසට බර විණි. ඔහු අපමණ දයාවකින් යුතුව ඇගේ දෙඋරහිස් වටා අතක් යැවිය. ගීතිකාට දැනුණේ ආරක්ෂාවරණය පිළිබඳ අපූර්ව හැඟීමකි. සැබැවින්ම වෙනත් කිසිවකු සමීපයේදී නොදැනෙන ගිම්හාන සමීපයේදී දැනෙන මේ හැඟීමෙහි අරුත කිමෙක්දැයි ඇය කල්පනා කළාය. කෙමෙන් කෙමෙන් ඇය නිදිබර වන්නට වූවාය. ගිම්හාන ඇගේ නින්දට කිසිදු බාධාවක් කළේ නැත.

"ගීති......" මුදු හඬින් ඇගේ සවනට කොඳුරළේ කුලී රිය ඔහුගේ නවාතැනේ දොරකඩ නැවැත්වූවාටත් පසුවය. ගීතිකා කලබලයෙන් දෙනෙත් විවර කළාය. ඇයට එක්වරම කිසිවක් තේරුම් ගැනීමට අපහසු විය.

"ගීති බහින්න....." ගිම්හාන පැවසුවේ සිනාසෙමිනි. ඇය කිසිදු පැනයක් නොනගා රියෙන් බැස්සාය. ඒ ගිම්හානගේ නවාතැන බව හැඳින ගත් වහාම ගීතිකාට දැනුණේ බියකි. ඇගේ දෙපා පණ නැති වී ගෙන ගියේය. එහෙත් ගිම්හානගෙන් කිසිවක් විමසීමට තරම් දිරියක් ඇයට තිබුණේ නැත. ඔහු කුලී රියට මුදල් ගෙවා ගීතිකාගේ කොට්ටයත් බෑගයත් රැගෙන ඇය අබියසට ආවේය. ඇය කිසිවක් නොදොඩාම පිටත්ව යන කුලී රිය දෙස බලා සිටියාය.

"ගීති එන්න ඇතුළට....." ගිම්හාන දොර විවර කළේය. ගීතිකා පැකිළෙමින් බලා සිටියාය.

"එන්න ළමයෝ ඇතුළට...... මේ ඔයාට නුපුරුදු තැනක් නෙමෙයිනෙ...." ගිම්හාන බඩු බාහිරාදිය ගෙතුළින් තබා විත් ඇගේ සුරතින් අල්ලා ගත්තේය. ඇය ඉබේටම ඔහු පසුපස ඇදුණාය.

"ඇයි ගීති ඔයා තරහින් වගේ ඉන්නෙ.........?"

"තරහක් නෑ ගිම්හාන... එත් මට බයයි......" ඇය මිමිණුවාය. නැවතත් නිර්මලාගේ පුවත ඇගේ සිතට නැගී ආවේය.

"මං කිව්වනෙ... ඔයාට.. මගෙන් ඔයාට අබමල් රේණුවක තරම්වත් වරදක් වෙන්නෙ නෑ කියල. මං ඔයාව මෙහාට එක්කන් ආවෙ සතියක්

විතර නිවාඩු පාඩුවෙ ඉන්න අරින්න. අර බෝඩිමට වෙලා ඉන්නකොට ඔයා ආයෙමත් ලෙඩ වේවි....." ගිම්හාන පැවසුවේ තරමක අමනාපයක් ද මුසු වූ හඬිනි.

"මට ඔයාව විශ්වාසයි ගිම්හාන ඒත්......"ගීතිකා තැතනුවාය.

"මාව නෙමෙයි ගීති..... ඉස්සර වෙලා ඔයාව විශ්වාස කරන්න. තමන්ට තමන් විශ්වාස නැති කල් කාගෙන්වත් කරදරයක් වෙන්නෙ නෑ...."

ගීතිකා දෙනෙත් විදහාගෙන ගිම්හාන දෙස බැලුවාය. "මගෙ අම්මේ ඔයා දන්න දේවල්....." වැන්නක් ඒ බැල්මේ ලියැවී ඇතැයි ඔහුට සිතිණි. ඔහු සිනාසුණේය. "ඔයාට තරහ ගියාද....." මඳ වේලාවකට පසු ගීතිකා අසීරුවෙන් කටහඬ අවදි කර ගත්තාය.

"තරහ ගියෙ නම් නෑ ඒත් මං ආස නෑ කව්රු හරි කෙනෙක් ඕනවට වඩා මාව සැක කරනවට......."

"මං කිව්වනෙ ඔයාට මං ඔයාව සැක කරන්නෙ නෑ. ඒත් ඔයාව සැක නොකරන්න තරම් හේතු මට නෑ........." ගීතිකා කියද්දී ගිම්හාන ඇය දෙස බලා ගත් වනම සිටියේය. සැබැවින්ම ඇයට තමා සැක නොකිරීමට තරම් සහතිකයක් ඇද්දැයි ඔහු මොහොතක් කල්පනා කළේය. ඔවුන් දෙදෙනා හැඳිනගෙන තවම මසක්වත් ගත වී නොතිබිණි. යුග ගණනාවක් දන්න හඳුනන අය වලුත් සේ ඔවුන් සමීප වූ බව සැබෑවකි. එහෙත් ඒ සමීපත්වය ඇයට සිය නිවස සුරක්ෂිත තැනක් බව ඒත්තු ගන්වන්නට තරම් ප්‍රබල නොවේ යයි ඔහු සිහිපත් කළේය. ඔහුට තමා කෙරෙහිම සියුම් ලැජ්ජාවක් දැනිණි.

"මට සමාවෙන්න ගීති. මම එච්චර දුර දිග හිතන්නෙ නැතුව ඔයාව එක්කන් ආවෙ. යමු මම ගිහින් ඇරලන්නම්. ඔයාව ආපහු......" ඔහු ඇගේ දෙඋරහිසට දෑත් තබා පැවසුවේ සැබෑම පසුතැවිල්ලකින් යුතුවය. ඔහුගේ බිඳුණු කටහඬ ඇගේ සිත තුළ ශෝකයක් ජනිත කළේය. ඇගේ දෙනෙත්වලට කඳුළු පිරී ආවේය. ඇය යමක් කියන්නට මුව විවර කළාය. එහෙත් දොරකඩ නැවතුණු මෝටර් සයිකලයේ හඬ එවදන් මුව තුළම ගොළු කරවන්නට සමත් විය. ගීතිකාගේ දෙඋරහිසින් දෑත් මුදා ගත් ගිම්හාන දොර විවර කළේය.

"ඔන්න මං ආවා..." සංජීව හිස පැළඳි හෙල්මටය ගලවා ගනිමින් ගෙට ඇතුළු විය. ඔහු තවමත් සිටගෙන සිටින ගීතිකා දෙස බලා පුංචි සිනාවක් පාමින් අසුනකට බර වූයේය. එහෙත් ගීතිකාට පිළිතුරු සිනාවක් පෑමටවත් සිහිපත් වූයේ නැත.

"හරි මහන්සියි මචං...... බොන්න මොකුත් ගනින්කො....." ඔහු සිටිවනම සිට අත දිගු කොට විදුලි පංකාව ක්‍රියාත්මක කළේය. සංජීවට මේ නිවස ඉතාමත්ම හුරු පුරුදු තැනක්යයි ගීතිකාට සිතිණි. ගිම්හාන ගෙතුළට යන්නට හැරුණේය. හදිසියේ යමක් මතක් වූවාක් මෙන් සංජීවද ඔහු පසුපස කුස්සියට ගියේය. ගීතිකා කැරකෙන විදුලි පංකාව දෙස බලාගෙනම අසුනකට බර වූන්නාය.

"මට තේරෙන්නෙ නෑ ගිම්හාන උඹ මේ නටන්න හදන නාඩගම මොකක්ද කියල....." කුස්සියට ගිය සංජීව ගිම්හානට පැවසුවේ චෝදනාත්මක හඬිනි. ගිම්හාන ශීතකරණයෙන් ගත් සිසිල් බීම බෝතලයකින් වීදුරු තුනක් පිරවීය.

"කිසිම නාඩගමක් නටන්නෙ නෑ මට ඒ කෙල්ල ගැන දුක හිතුණා....." ඔහු පැවසුවේ වීදුරු වලින් දෙනෙක් ඉවතට නොගෙනමය.

"ඒත් අමතක කරන්න එපා අනුකම්පාවෙ කෙළවර තියෙන්නෙ භූමිකම්පාවක් කියල....." සංජීව අනතුරු ඇඟවීය. ගිම්හාන දෑත් එකිනෙක පිරිමදිමින් මොහොතක් ඔහු දෙස බලාගෙන සිටියේය.

"කෙල්ල කැමති වුණාද ඉතින් මෙහෙ ඉන්න.........?" ගිම්හාන ගේ නිහඬ බව දුටු සංජීව තවත් පැනයක් නැඟීය.

"ඒකි කියන්නෙ මහ අපභ්‍රංස කතාවක්. මාව සැක නැතිලු. ඒත් සැක නොකරන්න තරම් ගේත්තු නැතිලු." ගිම්හාන කියද්දී සංජීවගේ මුවගට සිනාවක් නැගිණි.

"අපභ්‍රංශ නෙමෙයි මචං. ඒක තමයි යථාර්ථය ගින්දරයි පුළුනුයි ළඟ තිබ්බහම ගිනි ගන්නවා කියන එක උඹ නොදන්නවාට මම දන්නවා. උපන්දා ඉඳල එංගලන්තෙ හිටිය උඹට නම් කොල්ලෙකුයි කෙල්ලෙකුයි නොබැඳ එක ගෙදර ඉන්න එක සාමාන්‍ය දෙයක්. ඒත් මේ එංගලන්තෙ නෙමෙයි. ලංකාව. ඒක මතක තියා ගනිං....." සංජීව කියාගෙන ගියේය.

"මම ගීතිව ආපහු ඇරලනවා...." ගිම්හාන කීයේ තිර හඬිනි.

ගිම්හාන හමුවූදා සිට මේ වනතුරු මොන තරම් අනපේක්ෂිත සිදුවීම් රැසකට මුහුණ පාන්නට සිදු විණිදැයි ගීතිකා කල්පනා කළාය. සැබැවින්ම ඔහුගේ ඇසුරින් ඈත් විය යුතු යයි ඇය සනිටුහන් කර ගත්තේ ඔවුන් දෙවන වරට මුහුදු වෙරළේදී හමුවූ දිනයේදීය. ඔහුත් ඇයත් අතර ඇත්තේ අහසත් පොළවත් අතර ඇති දුරස්තර බවම බව ඇය එදා වටහා ගත්තාය. ගිම්හානගේ නවාතැන දෙස බලද්දී ඒ බව වඩාත් ප්‍රත්‍යක්ෂ විය. බැලූ බැලූ අත වූයේ ඇයට නුහුරු නුපුරුදු ගෘහ භාණ්ඩය. ඔහුගේ සමාජ තත්ත්වය කෙබඳුදැයි වටහා ගැනීමට ඒවාම ප්‍රමාණවත් යයි ඇයට හැඟුණි.

කුස්සියට ගිය ගිම්හානත් සංජීවත් ආපසු පැමිණියේ ඇය නිමක් නැති කල්පනාවලියක ගැලී සිටියදීය.

"මොකද ගීතිකා නිකම් කරකවල අතෑරියා වගේ......?" සංජීව සිනාසෙමින් ඇය ඉදිරිපිට වාඩි වූයේය. ගීතිකා සිනාසෙන්නට අසාර්ථක උත්සාහයක් ගත්තාය. ගිම්හාන ඔහුගේ අත වූ සිසිල් බීම වීදුරුව ඇය වෙත පෑවේය.

"බොන්න ගීති....."

ඔහුගේ කටහඬේ වූ දයාබර බව ඇගේ සිත සසල කළේය. ඇය හිස ඔසවා ඔහු දෙස බැලුවාය. ඔවුන්ගේ සිව් නෙත් හමුවිණි. ගෙවී ගිය නිමේෂයකට පසුව ගීතිකා බිම බලා ගත්තාය. සංජීවගේ සරදම් මුසුවූ බැල්ම තමා වෙතට යොමුව තිබෙනු ගිම්හාන දුටුවේය.

"මං යනව මචං...... මිස්ටර් අබේනායකට බෝලයක් බස්සලයි ඔෆිස් එකෙන් පැන ගත්තෙ...." සංජීව අවසන් සිසිල් බීම උගුරද පානය කොට හිස් වීදුරුව ස්ටූලය මත තැබීය.

"මිස්ටර් අබේනායකට කියපන් මම ආර්ටිකල් එකක් ලියන්න කරුණු හොයන්න ගිහින් කියල...." ගිම්හාන පැවසුවේ ගීතිකා දෙසද හොරැහින් බලමිනි. සංජීව උපහාසාත්මක සිනාවක් පෑවේය.

"ඔව්..... මට හිතෙනවා ලඟදීම හොඳ ආර්ටිකල් එකක් ලියයි කියල....." සංජීව ඇසක් ඉගි කළේය. ගීතිකා ලැජ්ජාවෙන් බිමට නැඹුරු වූවාය.

"ඒක නෙමෙයි උඹ දැන් කොහොමද යන්නෙ.....?" ගිම්හාන කතාව වෙනතකට හැරවිය.

"සුපුරුදු බස් එකේ තමයි...."

"බයික් එක අරන් පලයන්......" ගිම්හාන කියද්දී සංජීව ඔහු දෙස බැලුවේ යටැසිනි.

"දැන් උඹ ගීතිකාව ගිහින් ඇරලන්න යනවා කිව්වනේ......"

"එයාට බයික් එකේ යන්න බැ රිවෙවි. මම ටැක්සියක් අරගෙන යන්නම්...." ගිම්හාන සිය අමනක විම වසා ගැනීම පිණිස කීවේය.

"කමක් නෑ. බයික් එක තිබුණාටෙ..... මට හවස ආපහු ගෙනත් දෙන්න වෙයිද කියල දන්නෙත් නැතෙ....." සංජීව නැගී සිටියේය. "කොහොමටත් ඕක ඓතිහාසික වටිනාකමක් තියෙන බයික් එකක් නැද්ද නංගී.....?"

ගීතිකා සිනාසෙන්නට තැත් දැරුවා විනා යමක් කීවේ නැත.

සැබැවින්ම ඇගේ සිත බෙහෙවින් දොඩමළුව තිබිණ. එහෙත් මුවින් වදනකුදු පිට කරන්නට තරම් දිරියක් ඇයට නොවිණි.

"එහෙනම් මචං.. ඔන්න අපි කැපුණා. චෙරියෝ නංගි..."

"චෙරියෝ..." ගීතිකා යාන්තමට අතක් ඔසවා ඔහුට සමු දුන්නාය.

සංජීව පිටත්ව ගිය පසු ගිම්හාන දොර වසා දමා ගීතිකා දෙසට හැරුණේය. නිවසෙහි වූ පාළුබව ගීතිකාගේ සිතට වඩාත් දැනෙන්නට වූයේ එමොහොතේය. ඇගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. ඒ අනුව අත ද සැලෙන්නට විය. ඇය අතවූ බිඳකුඩු තොල නොගෑ බීම වීදුරුව ස්ටූලය මත තැබුවාය.

"ගීති..." ගිම්හාන කලිසම් සාක්කු දෙකේ දැත් ඔබාගෙන ඇය ඉදිරිපිට සිට ගත්තේය. ඔහු යෝධයෙකු ලෙසද තමා කුරුමිට්ටෙකු ලෙසද ඇයට දැනෙන්නට විය. ඇය සෙමින් හිස ඔසවා ඔහු දෙස බැලුවාය.

www.sinhalalibrary.com

"ගීති.... දැන් ඔයාට මහන්සිනෙ.... ඔයා ඇඳුම මාරු කරල කෑම ටිකක් කාල චුට්ටක් රෙස්ට් කරන්නකො... මම ඔයාව හවසට ගිහින් ඇරලවන්නම්....."

"කොහෙද.....?" ගීතිකා එක්වරම ඇසුවාය. ගිම්හානගේ සිතට දැනුණේ මවිතයකි.

"ඔයා බයයිනෙ මගෙ ගෙදර ඉන්න. මං ඔයාව බෝඩිමට ගිහින් ඇරලන්නම්...."

"එපා ගිම්හාන....." ඇය පහත් හඬින් පවසමින් බැගෑපත් දෑසින් ගිම්හාන දෙස බැලුවාය. ඔහු ඇය වාඩිවී සිටි පුටුවේ ඇන්ද මත වාඩිවී ඇඟිලි තුඩින් ඇගේ නිකට අල්ලා එසවීය. ඇය ඇසිපිය නොසලා ඔහු දෙස බලා සිටියාය.

"එහෙනම් ඔයා කැමතිද මෙහෙ ඉන්න.....?" ඔහු විමසුවේය. ඇය පිළිතුරක් නුදුන්නාය. එහෙත් ඒ දෑසෙහි පිළිතුර සැඟවී තිබෙන බව ගිම්හානට පෙනිණි. ඔහු සැනසුම් සුසුමක් හෙළීය.

"ඔයාගෙ ඇඳුම් ඔක්කොම කිළුටුයි නේද ගීති.....? ඉන්න මං බලන්නම් ඔයාට අඳින්න දෙයක් තියෙනවද කියල......" ගිම්හාන නැගිට සිය නිදන කාමරය දෙසට ගමන් කළේය. ඔහු පමණක් සිටින මෙහි ගැහැණු ඇඳුම් තිබෙන්නේ කෙසේදැයි ගීතිකා පිටුපස යන ඔහු දෙස බලාගෙන සිතුවාය. ඇගේ මුවගට සිහින් හසරැල්ලක් නැගිණි.

ගිම්හානගේ සිත තුළ කුමක්දෝ නුහුරු නුපුරුදු චංචල බවක් රජයමින් තිබිණි. නිදන කාමරයට පිවිසුණ ඔහු අල්මාරිය විවර කළේය. ඔහු ගේ ඇඳුම් පැළඳුම් අතර එක මෙක රෝස පැහැති ඇඟළුමක් විය. එය පියුමිගේ නයිටියක් සහ හවුස් කෝට් එකකි. ඔහු ලන්ඩනයෙන් සමුගත් දා නිවසට එක්වූ මිතුරන් ඒ ඇඳුම ඔහුගේ බෑගයට ඔබා තිබිණි. ලංකාවට පැමිණ බෑගය අස් කරද්දී එය දුටු ගිම්හානට නැගුණේ ශෝකී මඳහසකි. ඔහු එවෙලේම පියුමිට දුරකථන ඇමතුමක් දුන්නේය.

"පියුමි...."

"ගිම්හාන... ඔයා මොකද මේ හදිස්සියේ.....?" ඇය විමසුවේ කලබලයෙනි.

"හදිස්සියක් නෑ කෙල්ලෙ.... මට හරි පාළුයි. ඔයාගෙ නයිටියකුයි හවුස්කෝට් එකකුයි මගේ බෑග් එකට දාල තිබුණා කව්දෝ..... ඒක දැක්කම මට දුක හිතුණා...." ඔහු කියද්දී පියුමි සිනාසෙන හඬ ඇසිණි. ගිම්හානගේ සිතට සිහින් රිදුමක් දැනිණි.

"ඔය පාළුව වැඩි දවසක් තියෙන එකක් නෑ ගිම්හාන......" ඇය පැවසුවාය.

ඔහු එදා බලාපොරොත්තු වූයේ "අනේ මටත් පාළුයි ගිම්හාන ඔයා නැතුව......." වැන්නක් ඇගේ මුවින් නික්මෙනු ඇසීමටය. ඔහුගේ සිත රිදුණේ ඇය එය නොපැවසීම නිසාය. එහෙත් එදා පියුමි විසින් පවසන ලද්දේ අනාවැකියක් යයි දැන් ගිම්හානට සිතේ. සැබැවින්ම ඔහු ගීතිකාට ළං වූයේ සිය හුදෙකලා බව මකා ගන්නට පමණක්දැයි ඔහු තමාගෙන්ම විමසා ගත්තේය. එසැණින්ම ගීතිකාගේ අහිංසක දෑස ඔහු ඉදිරියේ මැවී පෙනිණි. පියුමි කෙරෙහි වූයේ හුදු කායික ආකර්ෂණයක් පමණක් යයි ඔහුට සිතුණේ එමොහොතේය.

"ඕව දිගින් දිගටම කල්පනා කරන්න ගියාම ඔළුව අවුල් වෙනවා....." තමාටම මුමුණා ගත් ගිම්හාන නයිටියත් හවුස් කෝටයත් රැගෙන යහන මත දැමීය.

"ගීති එන්න....." ගිම්හානගේ ඇමතුම් හඬින් ගීතිකා තිගැස්සුණාය.

"ඔයා හැම වෙලාවෙම ඉන්නෙ බය වෙලා වගේ..... මං කතා කරනකොට ගැස්සෙනවා........" ගිම්හාන පැවසුවේ දෝෂාරෝපණයක ස්වරයෙනි. ගීතිකා බිම බලා ගෙන සිනාසුණාය.

"එන්න.... මේ රූම් එකට ඇවිත් ඇඳුම මාරු කර ගන්න..."

ගීතිකා ගිම්හානගේ නිදන කාමරය වෙතට පිය නැගුවේ ගැහෙන හදවතින් යුතුවය. සැබැවින්ම බිය වීමට කිසිදු හේතුවක් තිබුණේ නැත. එහෙත් අහේතුක බියක් ඇගේ සිත පුරා හොල්මන් කළේය. ඇය දොරකඩ නතර වී කාමරය සිසාරා බැල්මක් හෙලුවාය. එවන් සුඛෝපභෝගී නිදන කාමරයක් ඇය දැක තිබුණේ ටෙලිනාට්‍යයක හෝ චිත්‍රපටයක පමණි. ඇයගේ පපුව ඩිග් ඩිග් අනුකරණයෙන් ගැහෙන්නට විය.

www.sinhalalibrary.com Scanned by Crzzzy

"ගීති.... දැනට නම් ඔයාට අඳින්න දෙන්න තියෙන්නෙ මෙච්චරයි...." ගිම්හාන ඇඳ මත වූ ඇඳුම් කට්ටලය පෑවේය. "මෙන්න බාත් රූම් එක උණු වතුරත් තියෙනවා. ඔයා වොෂ් එකක් දාගෙන ඇඳුම් මාරු කරගන්න. අපි ඔයාගෙ ඇඳුම් ටික පස්සෙ සෝදා ගනිමුකො...."

එක හුස්මට කියාගෙන ගිය ගිම්හාන දොර වසාගෙන කාමරයෙන් එළියට ගියේය. කාමරය මැද තනිවූ ගීතිකා කතරක් තුළ තනි වූවෙකුගේ අසරණ බවින් යුතුව මොහොතක් එලෙසම සිටියාය. ඇයට දිරාපත් වූ සිය නිවස සිහිපත් විණි. කුඩු වී ගෙවන නවාතැන් කාමරය සිහිපත් විණි. තමා මේ දකින්නේ සිහිනයක් දැයි ඇය මොහොතක් සිතුවාය. සිහිනයක් වුවද සැබෑවක් වුවද අවසානයේදී ශේෂවන්නේ පසුතැවිල්ලක් හා වේදනාවක් පමණක්ම බව ඇයට පසක් විණි. ඇය දිගු සුසුමක් හෙලා යහන මත වූ නයිට්ය අතට ගත්තාය. එයින් වහනය වූයේ ගිම්හාන ළඟින් නිරතුරු වහනය වන විලවුන් සුවඳ බව ඇයට වැටහිණි.

"මේ වගේ නයිට්යකුයි හවුස් කෝට් එකකුයි මහ ගන්න මගෙ මුළු මාසෙම පඩිය තිබ්බත් මදි වේවි....." වට්නා සිහිඳු රෙද්දෙන් නිම කරන ලද ඇඳුම් දිග හැර බලමින් ගීතිකා තමාටම කියා ගත්තාය. මේ ඇඳුම් කාට අයිති එකක් විය යුතුදැයි ඇය කල්පනා කළාය. ඇඳ පසෙකින් කැබිනෙට්ටුව මත වූ සුන්දර යුවතියකගේ සේයාරුව ඇය දෙස සරදමට බලන සෙයක් ගීතිකාට සිතිණි. ඇය වඩාත් ළංවී සේයාරුව පිරික්සා බැලුවාය. ඇගේ සිතට වේදනාවක් බඳු හැඟීමක් දැනිණි.

"කැමති දෙයක් නොලැබෙනවාට වඩා එය වෙන කෙනෙකුට අයිති බව දැන ගැනීමට ලැබීම වේදනාවකි....." පාසලෙන් ඉවත් වූ දිනයේ කිසිවෙකු විසින් සිය සමරු පොතේ තබන ලද සටහනක් ගීතිකා ගේ සිතට පිවිසිණි. ඇය දිගු සුසුමක් හෙලුවාය.

"ගිම්හාන කවදාවත් මගේ නොවෙන බව මම දන්නවා. ඒත් එයා වෙන කාට හරි අයිතිනම්....."

ඒ සිතුවිල්ලත් සමගම සිය සිරුර පණ නැතිවී ගිය සෙයක් ඇයට දැනිණි. ඇය නයිට්යද අතැතිව යහන මත වාඩි ගත්තාය. සැබැවින්ම බෙහෙවින් දුර්වලව සිටි ඇයට සුළු කම්පනයක් පවා දරා ගන්නට නොහැකි තරම් විය. ඇය සසල වූයේ එහෙයිනි.

"ගීති....." පිටතින් දොරට ගසමින් කතා කරන ගිම්හානගේ හඬින් ඇය පියවි ලොවට පිවිසියාය.

"ගීති......." ඔහුගේ නොඉවසිලිමත් කටහඬ නැවතත් ඇයට ඇසිණි. සෙමින් යහනින් නැගී සිටි ඇය දොර අඩක් විවර කොට එබී බැලුවාය.

"කිසිම සද්දයක් නැති හින්දා කතා කරල බැලුවෙ. ඇයි ඔයාගෙ මූණත් එක්ක පුදුමැලි වෙලා.....? බය වෙලා වගේ.....?" ඔහු බියෙන් මෙන් ඇය දෙස බැලීය.

"නෑ මොකුත් නෑ....." ඇය සිනාසෙන්නට තැත් දැරුවාය.

"එහෙනම් ඉක්මනට ඇඳුම් මාරු කරගෙන එන්න. මම ඔයාට උදව් කරන්නද.....?" ගිම්හාන විමසුවේ සරදමට නොවේ. ගීතිකා ගේ දෙනෙත් කුතුහලයෙන් විවර විය. ඇය වහා දොර වසා ගත්තාය.

www.sinhalaelibrary.com
Uploaded By Crzzzy

## 13

SL-UNLIMITED
www.sinhalaelibrary.com

හදිසියේම ඇසුණු කෑ ගැසීමක් නිසා නින්දත් අව නින්දත් අතරේ සැරි සරමින් සිටි ගිම්හාන විගා නැගී සිටියේය. අවට පරිසරය පුරාම අඳුර පැතිරී තිබිණි. ඔහු ඇඳ අසළ විදුලි පහන දැල්වීමට අත දිගු කළේය. තමා සිටින්නේ සුපුරුදු යහන මත නොව සාලයේ සෙටිය මත බව ඔහුට වැටහුණේ එවිටය. ඔහු සිහිය නිවැරදිව රඳවා ගන්නට මෙන් තත්පර කිහිපයක් සිටි ඉරියව්වෙන්ම සිටියේය.

කෑ ගැසීම ඇසුණේ ඔහුගේ නිදන කාමරය දෙසිනි. ගීතිකා තනිව එහි නිදන බව සිහිපත් වීමෙන් ඔහුගේ සිතෙහි සීහින් තැති ගැන්මක් ඇති විණි. සාලයේ විදුලි පහන දැල්වූ ඔහු සුහුඹ නිදන කාමරය වෙතට ගියේය.

"ඔයා ඇතුලෙන් දොර ලොක් කරගෙන නිදාගන්න...." නිදා ගැනීමට සැරසුන ඇය තැති ගැන්මකින් සිටිනු දුටු බැවින් ගිම්හාන සරදමට මෙන් පැවසීය. එහෙත් ඇය දොර අගුළු දා නොතිබිණි. ගිම්හාන දොර බෝලය කරකැවූ සැණින් එය විවර විය. ගිම්හාන කුතුහලයෙන් කාමරය දෙසට නෙත් හෙළීය. ඇඳ අසල මේස ලාම්පුව දැල්වෙමින් තිබිණි. ගීතිකා ඇඳ මත වාඩිවී දෙදණ මත මුහුණ හොවාගෙන සිටියාය. ගිම්හාන ගල් ගැසුණාක් මෙන් මොහොතක් ඇය දෙස බලා සිටියේය. ඇය හුන් ඉරියව්ව එතරමම ප්‍රියංකර විය. එහෙත් ඒ

නිමේෂයකට පමණි. හදිසියේම නැවතත් ඇය අසනීප වී ඇද්දැයි ඔහුට සිතිණි. ඔහු අඩියට දෙකට යහන අසලට ගොස් ඇය අසලින් වාඩි ගත්තේය.

"ගීතී......" ඔහු ඇය ඇමතුවේ මුදු හඬිනි. ඇය වහා හිස එසවූවාය. ඇගේ දෙකොපුල් කඳුලින් තෙමී තිබෙනු ඔහු දිටිය.

"ඇයි ගීතී ඔයා කැගැහුවෙ.....?" ඔහු විමසුවේ ඇගේ අවුල් කෙස් රොදවල් අතරින් ඇඟිලිතුඩු යවමිනි. ගීතිකා වහා ඔහුගේ ගෙල බදාගෙන ඔහුව තුරුළු වූවාය. රෝස පැහැති පුහුළු නයිටියකින් පමණක් සැරසුණු ඇගේ පහස ඔහුගේ සිතේ අනුරාගී හැඟුම් පුබුදු කරවන්නට සමත් විය.

"අනේ මට බයයි ගිම්හාන....." ගීතිකා නුහුරු දසුනකට බියපත් වූ කුඩා දැරියක මෙන් මිමිණුවාය.

"මොනවටද ඔයා බය වෙන්නෙ.....? මං ඉන්නවනෙ ඔයා ළඟ......" ඔහු තව තවත් ඇය සිය සිරුරට සමීප කොට ගත්තේය.

"මට නිර්මලාව මතක් වෙනව හැම වෙලාවෙම....."

"ඔව හිතන්න ගිහින් තමයි ඔයා ලෙඩ වුණෙත්. දැන් ඕව අමතක කරල දාල ටිකක් නිදා ගන්න හොඳ කෙල්ල වගේ...." ගිම්හාන සිය සිරුර දවාගෙන නැගී එන අනුරාගී හැඟුම් මැඩලන්නට වෑයම් කරමින් පැවසීය. එහෙත් ගීතිකා ඔහු තුරුලෙන් මෑත් නුවූවාය. ඇය බෙහෙවින්ම බියපත්ව සිටින බව ඔහුට වැටහිණි.

"අනේ ගිම්හාන්......" ඇය බැගෑබර දෙනෙතින් ඔහු දෙස බැලුවාය. ගිම්හාන ඇගේ සොපියන දෙතොලට සිය දෙතොල ළං කළේය. නිමේෂයක් ගෙවෙන්නටත් පෙරම ගීතිකා ඔහුට අවනත වූවාය. ඔහු දෙතොලට තෙරපුණු ඇගේ දෙතොලින් ඇරඹුණු මිහිරියාවක් ගත සිත මත් කරමින් ගලාගෙන යන්නට විය. සැබැවින්ම මෙවන් අත්දැකීමකට ඇය ජීවිතයේදී කෙදිනකවත් මුහුණ දී නොතිබිණි.

පියුම්ගේ රෑ ඇඳුමින් සැරසී සිය යහන මත සිටින මේ යුවතිය තමා පිළිබඳව තැබූ විශ්වාසය බිඳකිනුදු පළුදු කළ යුතු නැතැයි එක්වරම ගිම්හානට සිතිණි. ඇගේ ඇඳුමේ උරහිස් පටි ලිහිල් කරලන්නට

නොඉවසිලිමත් වූ දෑත අසීරුවෙන් යටපත් කරගත් ගිම්හාන ඇගෙන් මෑතට විය. ගීතිකා අදහා ගන්නට නොහැකි යමක් සිදු වූ කලෙක මෙන් ඔහු දෙස බැලුවාය. ඔහු සීරුවෙන් ඇය කොට්ටය මත හාන්සි කළේය. සුර ලොවින් මිහිබට සුරඟනකගේ රුව ඇය තුළින් ඔහු දිටිය. රෝස පැහැ හුනුළු ඇඟළුම විනිවිද පෙනෙන ඇගේ මොළකැටි සිරුරේ පහස විඳ ගැනීමේ ආශාවක් නැවතත් ඔහු සිත තුළ උදා විය. ඔහු ඇගේ හිස රැඳුණු කොට්ටය දෙපස දෑත් තබා ඒ පියකරු මුහුණට නැඹුරු විය. ඔවුන් දෙදෙනා මොහොතක් නිසලව ඔවුනොවුන්ගේ දෑස් වලට එබීගෙන සිටියහ.

"ගිම්හාන....." ඇය සිය සුරත ඔහුගේ හිසකෙස් අතරින් යැව්වාය.

"ඔයාට තවත් බයද ගීති.....?" ගිම්හාන සිහින් හඬින් විමසීය.

"ඔයා ළඟ ඉන්නකොට මට බය හිතෙන්නෙ නෑ...." ඇය මදහසක් පෑවාය.

"ඇත්තටමද ඕය.....?"

"සත්තමයි......"

"ඔයාට මගෙන් කරදරයක් වේවි කියල හිතෙන්නෙ නැද්ද.....?"

නැති ගත් ලෙසින් මොහොතක් ඔහු දෙස බලා සිටි ගීතිකා කිහිප වරක් වේගයෙන් ඇසිපිය සැලුවාය. අනතුරුව ඔහු දෙස බලා පියකරු ලෙස සිනාසුණාය.

"මට ඔයා ගැන අහිතක් හිතන්න බෑ ගිම්හාන........"

"ඔයා කවදාවත් එහෙම හිතන්නෙනත් නැද්ද.....?"

"මගෙ හිතේ ඔයා ගැන තියෙන්න කියා ගන්න බැරි විදියෙ ලස්සන හැඟීමක්. ඒ හැඟීම සැකයකින් අවිශ්වාසයකින් කිළිටි කරගන්න මං කැමති නෑ....." ගීතිකා පවසද්දී ගිම්හාන විස්මයෙන් ඇය දෙස බලාගෙන සිටියේය. ඇය රූමත් තරමටම බුද්ධිමත් බව මුල සිටම ඔහු දැනගෙන සිටියේය. එහෙත් ඇය මෙතරම් ගැඹුරු වදන් වැලකින් සිය ආදරය ප්‍රකාශ කරනු ඇතැයි ඔහු සිතුවේ නැත. ඔහු හද පතුළින් නැඟ එන අපමණ සෙනෙහසින් යුතුව ඇගේ නළලත සිපගත්තේය.

"මං ඔයාට ආදරෙයි ගීති......"

ගීතිකා ගේ සිත තුමක්දෝ නැවුම් බවකින් ඔකඳ වෙමින් තිබිණි. ඇය හිස හරවා කුඩා දරුවෙකු සේ තමා සමීපයේ නිඳන ගිම්හාන දෙස බැලුවාය. ඒ පියවුණු නෙතු සඟල මත මුළු ලොවේම අහිංසකත්වය තැවිව ඇතැයි ඇයට සිතිණි. ඇයගේ සිත තුළ ඔහු වෙනුවෙන් දැඩි සෙනෙහසක් පමණක් නොව දැඩි භක්තියක් ද ජනිත වී තිබිණි. සැබැවින්ම වෙනත් තරුණයෙකු සමග කිසිවෙකුත් නැති මෙවන් නිවසක හුදෙකලා වී නම් තමාට මුහුණ පාන්නට සිදු වනු ඇත්තේ මොන තරම් වේදනීය ඉරණමකට දැයි ගීතිකා සිතුවාය. ඒ සිතුවිල්ලත් සමගම ඇගේ මුළු සිරුරම කිළිපොලා ගියේය. ඇයට නිර්මලා සිහිපත් විය. කඳුළින් තිම වූ යෙහෙළියන්ගේ පෙම් පුරාවත් සිහිපත් විය.

"මං ඒ අතින් මොන තරම් වාසනාවන්තද? පිරිමියෙක් එක්ක රැයක් ගත කළා කියලා කිවුවොත් හැමෝම මාව වරදවල හිතයි. ගිම්හාන වගේ රත්තරන් හිත් තියෙන පිරිමි ඉන්නව කියල කව්රුත් විශ්වාස කරන එකක් නෑ....." ගීතිකා තොල මතුරා ගත්තාය.

ඇය ඔහු අවදි නොවන තරමේ මුදු බවකින් යුතුව ඔහුගේ නළලත සිප ගත්තාය. ඔහු සිහිනයෙන් නොපැහැදිලි යමක් පැවසීය. සැබැවින්ම කිසිදු චකිතයකින් තොරව පිරිමියෙකුට මෙතරම් සමීපව සිටින්නට දිරි ලැබුණේ කෙසේදැයි ඇය මවිතයෙන් ගීතිකා සිතුවාය. පෙරදා රැයේ බියපත් වී කෑ ගැසීම පිළිබඳව ඇගේ සිත තුළ ඇති වූයේ ලැජ්ජාවකට ලං වූ හැඟීමකි. අවදි වූ විට ගිම්හානට මුහුණ දෙන්නේ කෙසේදැයි ඇය සිතුවාය.

"එයා හිතයි ද දන්නෙ නෑ බොරුවක් කරල එයාව ළඟට ගෙන්න ගත්ත කියලා....." ගීතිකා සිතුවේ චකිතයෙනි.

"නෑ ගිම්හාන එච්චර පටු විදියට හිතන කෙනෙක් වෙන්න බෑ...." ඇගේ සිතේ එක් පැත්තක් ඔහුට පක්ෂව කතා කළේය. ඇය නළලත දෙකොපුල දෙතොල ආදී ඔහුගේ දෙතොල් පහස ලැබුණු තැන් අතැඟිලි තුඩින් පිරිමැද්දාය. "මම ඔයාට ආදරෙයි ගීති........" ඇය ආස්වාදයකින් යුතුව ඔහුගේ වදන් නැවත නැවතත් සිහිපත් කළාය.

සැබැවින්ම නිලන්ත ගෙන් හිස් වූ අරාජික ප්‍රේම විජිනයේ කිරුළ පළඳවන්නට හැම අතින්ම සුදුසු කම් ලද ගිම්හාන වැන්නෙකු හමුවේයැයි ගීතිකා සිහිනෙකින්වත් සිතුවේ නැත. ඇගේ මුව මදහසකින් විවර විය.

"මොකද මේ තනියම හිනාවෙන්නෙ.....?" ගිම්හානගේ කටහඬ ඇගේ සවන්පත් අසලින්ම ඇසිණි. ගීතිකා වහා හිස හරවා ඔහු දෙස බැලුවාය. ඔහු සිනාසෙමින් සිටියේය. ගීතිකාගේ මුහුණ විළියෙන් රත් පැහැ ගැන්විණි. ගිම්හාන වැළමිටින් තමා ඔසවාගත් අතට හිසේ බරදී වඩාත් ඇය දෙසට හැරුණි. ඔහුගේ උණුසුම් සුසුම ඇගේ මුහුණ මත පතිත විය.

"දැන් ඔයාට සනීපයි නේද ගීති.....?"

"ඔව්......" ඇය මිමිණුවාය.

"එහෙනම් ඔයා හොඳට රෙස්ට් කරන්න. අද මම වැඩට යන්න ඕන..... සංජීවයා දැනටමත් මට බනිනවද දන්නෙ නෑ........" ඔහු ඇගේ අවුල් හිස කෙස් අතර ඇඟිලි තුඩු දිවවීය.

"අනේ......" ඇයට එක්වරම කියැවිණි.

"ඇයි.....?"

"මම තනියම කොහොමද මෙහෙ ඉන්නෙ.....?"

"මම ඉන්නකම් ඔයා තනි වෙන්නෙ නෑ ගීති...." ගිම්හාන පැවසුවේ හැඟුම්බර හඬිනි.

එහෙත් එක් සැණෙකින්ම හදිසි විදුලි සැරයක් බඳුව ඔහුගේ සිතට පියුමිගේ රුව පිවිසිණි. ගීතිකා හමුවෙහි මොන තරම් විශ්වාසී වෙන්නට තැත් දැරුවද තමා වංචනිකයෙකැයි හැඟීම පිටු දකින්නට ඔහු අපොහොසත් විය. ඇය ඔහුගේ නිවසෙහි රැය ගත කරන්නට කැමැත්ත පළ කළේ ඇයටත් වඩා ඔහු පිළිබඳව විශ්වාස කරගෙන විය යුතුය.

"අහිංසක කෙල්ලන්ට නිකම් බොරුවට බලාපොරොත්තු දෙන්න එපා බං......" ගිම්හානට සංජීවගේ වදන් සිහිපත් විණි. ඔහුගේ සිත තුළ කුමක්දෝ පාලනය කොට ගත නොහැකි ආවේගයක් නැඟී ආවේය.

www.sinhalalibrary.com
Uploaded By Crzzzy

"මං උඹව රවට්ටන්නෙ නෑ කෙල්ලෙ...." එකිනෙකට තදකොට ගත් දත් අතරින් ඔහු පිට කළ වචදන් ගීතිකාට ඇසුණේ යන්තමිනි. එවරම ඇය තමා සමීපයට ඇද ගත් ඔහු ඇගේ ගෙල මුල මුහුණ සඟවා ගෙන නිමේෂයක් ගත කළේය.

"ගිම්හාන......" ගීතිකා සැලෙන හඬින් ඔහු ඇමතුවාය. ඔහුගේ හදිසි වෙනස සැබැවින්ම ඇය බියපත් කොට තිබිණි. ඔහු හිස ඔසවා ඇගේ බයාදු මුහුණ දෙස බලා අසරණ සිනාවක් පෑවේය.

"ඇයි ගිම්හාන මොකද වුණේ ඔයාට.....?"

ඇය මෘදු ඔහුගේ හිස සිඹ මැද්දාය. ඔහු ඒ සුවයට අවනතව දෑස් තරහොට පියාගත්තේය. පෙර දිනක ඔවුන් මුහුදු වෙරළේ හමුවූ විටද ගිම්හාන මෙලෙසින්ම හිටි හැටියේම වෙනස් වූ බව ගීතිකාට මතකය. එහෙත් ඔහු නොකියන දෙයක් පිළිබඳව දිගින් දිගටම විමසීම නොමැනවැයි ඇය සිතුවාය.

"ගීති.... යමු අපි තේ ටිකක් බොන්න..." මද වේලාවකට පසු ගිම්හාන ඇඳෙන් නැගී සිටියේ දිගු සුසුමක් ද හෙළමිනි.

"ඔයා තව ටිකක් නිදා ගන්නකෝ. මම තේ හදාගෙන එන්නම්..."

"එපා..... ගීති...... ඔයාට සනීපත් නැනෙ..... මම තේ හදන්නම්....."

කුස්සියට පිවිසි ගිම්හාන විදුලි කේතලයට වතුර පුරවා ප්ලග් එක ගැසීය. ගීතිකා මවිතයෙන් වටපිට බැලුවාය. බැලූ බැලූ අත එහි වූයේ විදුලි භාණ්ඩය. ඒවා තුමට කෙලෙස භාවිතා කරනවාදැයි යන්නවත් ගීතිකා දැන සිටියේ නැත. ඇයට සිය නිවසේ කුඩා කුස්සිය සිහිපත් විය. දෑස් රතු වෙනතුරු ලිපට පිඹිමින් කඩයප්පන් සාදන අම්මා සිහිපත් විය. ගිම්හාන වැන්නෙකු බෑනා වශයෙන් ලැබුණොත් අම්මාට එය රටක් රාජ්‍යයක් අහල වුණා මදු බව ගීතිකා දනියි. එහෙත් දෙවියනි, ගිම්හානගේ ලෝකයත් සිය ලෝකයත් අතර ඇත්තේ මොන තරම් පරතරයක්දැයි ගීතිකා කම්පිත සිතින් යුතුව සිහිපත් කළාය.

"ගීති..... මොනවද ඔච්චරම කල්පනා කරන්නෙ.....?" ගිම්හාන ඇගේ උරහිස මත අත තැබීය.

ඒ සමගම දුරකථනය නාද වන හඬ ඇසිණි. ගිම්හාන ගීතිකා දෙසද උතුරන විදුලි කේතලය දෙස ද දෙවරකට බැලීය.

"මෙන්න ගීති සීනි....... තේ කොළ ඔයාට පුළුවන්නම් තේ හදන්නකො....." කියමින් ඔහු දුරකථනය වෙත දිව ගියේය.

"හායි ...... ගිම්හාන........" සත් සමුදුරෙන් එහා සිටින පියුමිගේ කටහඬ දුරකථන කම්බිය දිගේ විත් ගිම්හානගේ සවන් තුළට පිවිසුණේය. ඔහුගේ සිත තුළ කුමක්දෝ නුහුරු බවක් ජනිත විය.

"හායි පියුමි....." ඔහු පැවසුවේ එතරම් උනන්දුවකින් නොවේ. ගීතිකා පෙනෙන්නට සිටිද්දැයි ඔහු ඒ අතරම විමසිල්ලෙන් වටපිට බැලීය.

"ඉතින් කොහොමද කොල්ලො.....? ඔයා නිකමටවත් මට කතා කරන්නෙ නෑ මමම කතා කරනකම්ම....." පියුමිගේ ගීතවත් ස්වරය නෝක්කාඩුවෙන් පිරී තිබුණි. සැබැවින්ම ඇයට වූයේ මියුරු කටහඬකි. ගී ගැයීමට ද මනා හැකියාවක් ඇය සතු විය. එහෙත් මේ මොහොතේ පියුමිගේ කටහඬින් ඔහු තුළ කිසිදු ප්‍රබෝධයක් හට ගත්තේ නැත.

"මට හරියට වැඩ පියුමි.. ඔයා දන්නවනෙ පත්තරකාරයෙක් වුණාම රැයක් දවාලක් කියල නෑ...."

"මම පත්තරකාරයො ගැන දන්නෙ නෑ. මම පත්තරකාරයින්ට කැමතිත් නෑ....." පියුමිගේ කටහඬ සරදමින් පිරී තිබිණි.

"ඒක හින්ද වෙන්නැති ඔයාට මාව එපා වුණේ....." ගිම්හාන තරමක තරහින් පැවසීය.

"මට ඔයාව එපාවුණේ නෑ ගිම්හාන..... ඔයානෙ මාව දාල ලංකාවට ආවෙ...."

"මං ඔයාට කොච්චර කතා කළාද ඔයාට ඇත්තටම මාව ඕන නම් ඔයා එන්න තිබුණ මගෙත් එක්ක...." ගිම්හාන පැවසුවේ තරහිනි. ඔවුන් දෙදෙනා අතර සුළු මොහොතක නිහැඬියාවක් පැතිර ගියේය.

"මන්දා ගිම්හාන මට කිසිම දෙයක් හිතා ගන්න බෑ......" ඇය පැවසුවේ කනස්සල්ලෙන් මෙනි. ඔහු පිළිතුරු වශයෙන් යමක් කීමට

පෙර "පියුමි" යනුවෙන් ගෙතුලින් කෙරෙන ඇමතුමක් දුරකථනය තුළින් නැගී ආවේය. එය නුහුරු පිරිමි ඇමතුමක් විය. ගිම්හානගේ සිතට විදුලි සැරයක් වැදුණු කලෙක මෙන් කම්පනයක් ඇති විය.

"කව්ද ඒ.....?" ඔහු තරමක දැඩි හඬින් ඇසීය.

"ඔයා මාව දාල ගියා කියල මටත් මෙහාට වෙලා තපස් රකින්න කියලද කියන්නෙ.....?" ඇගේ කට හඬේ ඔහුගේ පැනයට පිළිතුරු පමණක් නොව ඇනුම් පදයක්ද සැඟවී තිබිණි.

"ඔයයි මායි බඳින්න ඉස්සර ඉඳලත් ඔයා තපස් රැක්කෙ නෑ කියල මම දන්නවා....." ඔහු පැවසුවේ තරමක් උස් හඬිනි. ගීතිකා නිවසේ සිටින බවද ඒ මොහොතෙහි ඔහුට අමතක වී තිබිණි.

"මං ඔයාට කවදාවත් මාව බඳින්න කිව්වෙ නැහැ ගිම්හාන... ඔයාගෙ කැමැත්තට මං අකමැති වුණේ නෑ එච්චරයි....." පියුමි කියද්දී ඔහුගේ සිත තුළ නැගී ආවේ පාලනය කරගත නොහැකි තරමේ කෝපයකි. අත දිගු මානයෙක සිටියේ නම් පියුමි ඔහුගෙන් පහර කනු නොඅනුමානය.

"දැන් එතකොට ඒකද වරද.... මං ඔයාට අයාලේ යන්න නොදී ඔයා බැඳපු එකද මං කරපු වරද.....?" ඔහු රිසීවරයට කෑ ගැසීය.

"ප්ලීස් ගිම්හාන... මං කියන දේ අහන්න. අපි දෙන්න රණ්ඩු නොවී කතා කරමු...." පියුමිගේ ආයාචනාත්මක හඬට සවන් නුදුන් ඔහු වේගයෙන් රිසීවරය තැබීය.

ඒ සමගම යමක් බිම අත හැරී කැබලිවලට බිඳී යන හඬ කාමරයේ දොරකඩින් ඇසිණි. තිගැස්සුණු ගිම්හාන හිස හරවා බැලීය. ගීතිකා දෝතින් මුහුණ වසාගෙන දොරට හේත්තු වී සිටියාය. ඇගේ පාමුල බිඳී විසිරුණු තේ කෝප්පයක කැබලි තිබිණි.

"දෙවියනේ...." ගිම්හාන තමාටම කොඳුරා ගත්තේය. ගීතිකාට පියුමි හා තමා කළ සංවාදයෙහි කොපමණ ඇසෙන්නට ඇද්දැයි ඔහු කැළඹුණු සිතින් යුතුව කල්පනා කළේය. ඔහු වරදක් කළ තැනැත්තෙකු

මෙන් දුබල පියවරින් ගීතිකා අසලට ගියේය. ඇය ඉකිබිඳ හඬමින් සිටියාය. ඔහු මුහුණ වැසී තිබූ ඇගේ දෝත ඉවත් කරලන්නට උත්සාහ දැරීය.

"ගීති පොඩ්ඩක් මෙහෙට වෙන්න. ඔය වීදුරු කටුවලට ඔයාගෙ කකුල කැපෙයි......" ඔහු දැඩි ආයාසයෙන් ඇය යහන අක්වා වත්තම් කරගෙන ආවේය.

"කකුල තුවාල වුණොත් ඒක සනීප වෙයි ගිම්හාන...." ඇය බිඳුණු හඬින් පැවසුවාය. ගිම්හාන දිගු සුසුමක් හෙළීය. ඇය අදහස් කළේ ඇගේ සිත පැලුණු බව නොවේදැයි ඔහු වේදනාවෙන් සිතීය.

"මං ඔයාට තේ එකක් හදාගෙන ආවා.... ඒත්.... ඒත්...." ඉතිරිය කියා ගත නොහැකිවූ ගීතිකා දෙදණෙහි මුහුණ හොවාගෙන හඬා වැටෙන්නට වූවාය.

"ගීති..... අඬන්න එපා....... " ඔහු ඇගේ හිස මුදුව පිරිමැද්දේය. ඔහුගේ අත ගසා දැමීමට ඇයට ඇවැසි විය. එහෙත් ඒ සඳහා දිරි උපදවා ගත නොහී ඇය දිගටම ඉකි බින්දාය.

"ගීති........." ඔහු ඇය සමීපකොට ගන්නට වෑයම් කළේය.

"එපා......." කඳුළු බර දෙනෙතින් ඔහු දෙස දැඩි බැල්මක් හෙලූ ඇය යහනේ කෙළවරටම ගොස් වාඩි වූවාය.

"ගිම්හාන කරුණාකරල මාව බෝඩිමට ගිහින් ඇරලවන්න......"

"කලබල වෙන්නෙ නැතිව ඉන්න ගීති පොඩ්ඩක්......." ඔහු පැවසුවේ ඉල්ලීමක ස්වරයෙනි.

"ඔයා මාව මෙහෙ එක්ක ආවෙ රෙස්ට් කරන්න කියල. මං ඔයා එක්ක ආවෙ අබමල් රේණුවක් තරම්වත් ඔයාව අවිශ්වාස කරල නෙමෙයි ගිම්හාන.... ඇයි.... ඇයි..... දෙවියනේ ඔයා මාව රැවැට්ටුවෙ.....?" ඇය මිටි මොලවා ගත් දෙඅත්ලෙන් යහනට ගැසුවාය. ඔහු ඇය අබියසට ඇදී ඇගේ දෑතින් අල්ලා ගත්තාය. ඇය එවර ඔහුගෙන් මිදෙන්නට තැත් කළේ නැත.

"මං ඒ විශ්වාසෙ කඩ කළේ නෑ ගීති........"

"බැඳපු මිනිහෙක් බැඳපු බව හංගන එක තරම් ජරා වැඩක් තවත් තියෙනව ද ගිම්හාන......? ඒ ජරා වැඩේ කළාට පස්සෙ මං කොහොමද තවත් ඔයාව විශ්වාස කරන්නෙ.....?" ඇගේ කටහඬ [illegible] වේදනාවෙන් ද පිරී තිබිණි. ඔහුගේ සිත දැඩිසේ පෑරිණි. [illegible] දෙඅතින් මුහුණ වසා ගත්තේය.

සමනල තටුවක් මෙන් මුදු වූ සිය යොවුන් සිත [illegible] ප්‍රේමය නිසා බිඳීගිය හැටි ඇය සංවේගයෙන් යුතුව සිහිපත් කළාය. අරාජික ප්‍රේම විජිතයේ ගිම්හාන අනවසරයෙන් ඇතුළු වූයේය. ඔහු හිමි කර ගන්නට නොහැකි අයෙකු වන බව ඇය දැන සිටියාය. එහෙත් ඔහු අන් සතු අයෙකු යයි ඇය සිහිනෙන්වත් සිතුවේ නැත. ඇගේ දෑසින් උල්පතක් මෙන් කඳුළු කඩා හැලෙන්නට විය. ඇය ගිම්හාන ගේ යහනෙන් ඔහුගේ කොට්ටයට හිස තබාගෙන ඉකි බිඳිමින් හැඬුවාය.

"ගීති.... ඔය වගේ අපිට කිට්ටු වෙන්න බැරි තරම් ඉහළක ඉන්න අය ගැන ඕනවට වැඩිය බලාපොරොත්තු තියා ගන්න එපා. අන්තිමට පසුතැවිලි වෙන්න සිද්ධ වෙන්නෙ අපිටමයි....." ජේනානි අවවාද කලයුරු ගීතිකා සිහිපත් කළාය. එහෙත් ඇය මොහොතකටවත් ගිම්හාන අවිශ්වාස කළේ නැත.

"ගීති... අඬන්න එපා කෙල්ලේ...." ගිම්හාන ඇය සනසන්නට වෑයම් කළේය. එහෙත් ඇය නෙත් කොනකින්වත් ඔහු දෙස බැලුවේ නැත.

ගිම්හාන වහාම කාර්යාලයට යා යුතුව තිබිණි. පෙරදාද වැඩ කළේ වරුවක් පමණක් බැවින් කළ යුතු වැඩ රැසක්ම ගොඩගැසී තිබිණි. එහෙත් ඔහු ගේ සිතේ කිසිදු එකලස් බවක් නොවීය.

"ගීති පොඩ්ඩක් මට ඇහුම් කන් දෙන්න..." ගිම්හාන කිසිදා කිසිවෙකු ඉදිරියේ බැගෑපත් නොවූ තරමට ගීතිකා අබියස බැගෑපත් වූයේය.

"එපා.... එපා... මට කිසිම දෙයක් කියන්න එපා.... කරුණාකරල මාව බෝඩිමට ගිහින් ඇරලවන්න... මට ඒ ඇති...."

ගිම්හාන තව දුරටත් ඇය වෙහෙස කිරීමට නොසිතුවේය. ඔහු යහනින් නැගිට නාන කාමරයට වැදුණේ දිගු සුසුමක් හෙළමිනි.

ගීතිකාගේ සිතට සහනයක් ලබා දෙන්නට ඇය සිය නිවසට කැටුව ආවද තිබුණාටත් වඩා ඇගේ සිත කලඹා ලන්නට සිදුවීම ඔහු දැඩි ලෙස කම්පනයට පත් කොට තිබිණි.

"මට ජීවිතේ හැම තැනම වැරදුණා....." ගිම්හාන සුසුමක් හෙලමින් තමාටම කියා ගත්තේය. ඔහු මුහුණ සෝදාගෙන ආපසු කාමරයට එද්දී ගීතිකා කාමරයේ සිටියේ නැත. ඇය හැඳගෙන සිටි රෝස පැහැ රෑ ඇඳුම අපිළිවෙලකට යහන මතු දමා තිබිණි. ගිම්හාන කලබලයෙන් සාලයට පිවිසියේය. රෝහලින් පිට වී එද්දී හැඳ සිටි ඇඳුමින්ම සැරසුණ ඇය පුටුවක වාඩි වී නිමක් නැති කල්පනාවක ගැලී සිටියාය. ඇගේ බෑගය ඇය අසල විය. ඇයට කතා නොකරම ආපසු කාමරයට ගිය ගිම්හාන ඇඳුම මාරු කර ගත්තේය. පියුමිගේ සේප්පුව සරදමට මෙන් තමා සමග සිනාසෙනු ඔහු දිටිය.

"ජීවිතේ හැම තීරණයක්ම ගන්න මම ඉක්මන් වුණා වැඩියි... ඒත් දෙවියනේ මම ඇත්තටම ගීතිට ආදරෙයි...." ඔහු වේදනාවෙන් දෙනෙත් පියාගෙන මොහොතක් ගත කළේය.

"මගෙ හිතේ ඔයා ගැන තියෙන්නෙ කියා ගන්න බැරි විදියෙ පිවිතුරු හැඟීමක්. ඒක අවිශ්වාසයකින් කිළුටු කරගන්න මම කැමති නෑ....." පෙරදා අතිශය හැඟුම්බර හඬින් පැවසූ ඇගේ ස්වරය ඔහුගේ සිත තුළ දුක්බර හැඟුම් මෝදු කරලමින් නැවතත් සවන් පතුලේ දෝංකාර දුන්නේය. සියල්ල සිදු වූයේ කොතරම් අනපේක්ෂිත අන්දමකටද.....? ගීතිකා රැවටීමට ඔහු කිසිදු විටෙක සිතුවේ නැත. ඇයට සත්‍යය හෙළි කරලීමට සුදුසු අවස්ථාවක් එන තුරු ඉවසිල්ලෙන් සිටීමට ඔහු අදහස් කොට ගෙන සිටියේය. එහෙත් එම අවස්ථාව එළඹුණේ ඇගේ සිත වෙහෙවින් කලඹාලමිනි. ඔහු කුහකයකු, වංචාකාරයකු බව ඇය සිතනු නොඅනුමානය.

"ගීති..... මොනවා හරි කාල ඉන්න...." ගීතිකා අබියසට ගිය ගිම්හාන පහත් හඬින් පැවසුවේය. ගීතිකා ඉදිමී රතුවූ මුහුණ ඔහු වෙතට හැරවූවාය. පරවී ගිලිහී ගිය මලක් බඳුවූ ඇගේ මුහුණ ඔහුගේ සිත වෙහෙවින් රිදවීය.

www.sinhalalibrary.com

"මට බඩගිනි නෑ.... ඇයගේ ස්වරය හැඳිනගත නොහැකි තරමට බිඳී තිබිණි. ඇය සමීපයට ගිය ගිම්හාන දෙඋර හිසින් අල්ලා ඇය නැගිට විය. එක්වරම ඔහුගේ ළමැදෙහි හිස හොවාගත් ගීතිකා ඉකි බිඳිමින් හඬන්නට වූවාය. ගිම්හාන ඇගේ හිස කෙස් මත මුහුණ සඟවාගෙන ඉකි බිඳින සිත වාරු කර ගන්නට නැත් දැරීය.

"ගිම්හාන ඇයි ඔයා මට මෙච්චර බලාපොරොත්තු දුන්නේ.....? ඔයා ගැන මගේ හිතේ තියෙන ආදරේ කොච්චර ද කියලා ඔයා දන්නෙ නැහැ දෙයියනේ...." ඇය රිදෙන නොරිදෙන අයුරින් ඔහුගේ උරහිස සපා ගනිමින් හැඬුවාය.

"ඔයාට හිතා ගන්න බැරි වුණාට මමත් ඔයාට ආදරෙයි ගීති..... මම දන්නව දැන් ඔයා ඒක විශ්වාස කරන්නෙ නෑ කියලා...." ඔහු සිය ළමැදේ රැඳී තිබූ ඇගේ හිස සෙමින් පිරිමැද්දේය.

"මං ඔයාව විශ්වාස කළා.... මටත් වැඩිය විශ්වාස කළා..... ඒත් ඔයා මට හැමදේම හැංගුවා. අපි දෙන්නා හමු වුණ හැම දවසකදීම මට තේරුණා ඔයා මොනව හරි දෙයක් වසංගනව කියලා... ඒත් ඒ දේ මෙච්චරම හිත පාරවන දෙයක් වේවි කියලා මං හිතුවේ නෑ....." ඇය අසීරුවෙන් වචන ගැට ගසා ගනිමින් කියාගෙන ගියේය. ගිම්හාන නිරුත්තරව බලාගෙන සිටියේය.

සෙනෙහෙ බර සිතුවිල්ලක චමත්කාරජනක බව සිතට තුරුළු වූ නිමේෂයේදීම එය සිතින් ගිලිහී යාම ගැන ගීතිකා බෙහෙවින්ම පසු තැවුණාය. සැබැවින්ම ගිම්හාන සිය දිවියට ගිම්හානයක්ම වනු ඇතැයි ඇය සිහිනෙනුදු සිතුවේ නැත. බලාපොරොත්තු පුන්ව හේබා ගිය සිය දිවියට මුතු වරුසාවක් වෙනු ඇතැයි සිතූ ඔහුගේ සෙනෙහසින් ද ඇයට ශේෂ වූයේ දරාගත නොහැකි තරමේ වේදනාවක් පමණකි. ගීතිකා ඇඩීව දෙබැම මිරිකා ගත්තේය.

"ඔයා මගෙන් කිසිම දෙයක් අහන්නෙ නැද්ද ගීති......?" ඔහු සිය දෙනෙතට එබීගෙන ඇසූ මොහොතේ සිත දැඩි කර ගන්නට ශක්තිය ලැබුණේ කෙසේදැයි ගීතිකාට සිතා ගැනීමට පවා නොහැකි විය.

"නැහැ මට කිසිම දෙයක් අහන්න ඕන කමක් නෑ... ඔයා මාව රවැට්ටුවා. හැම දේම හැංගුව මට....." ඇය පැවසුවේ කඳුළු සලමිනි.

"නෑ ගීති නෑ... දෙවියන්ගෙ නාමෙට මං කියන දේ අහන්න. ඔයාව රවට්ටන්න හිතකවත් තිබුණෙ නෑ ගීති. එහෙම වුණා නම් ඔයා අද මේ ගෙදරින් පිට වෙන්නෙ මෙහෙම නෙමෙයි. ඔයා පිළි [illegible] එක....? පිළි ගන්නවද.....?" ඔහු ඇයට රිදෙන තරම් [illegible] ඇගේ දෙඋරහිසින් අල්ලා සෙලවිය.

"ඌයි...." ඇයට කෑ ගැසිණි. ගිම්හාන එක්වරම ඔහුගේ දෑත ඉවතට ගෙන අසල තිබූ පුටුවකට බර විය. විනාඩි දෙක් තුනක් පමණ හිස දෑතේ රඳවාගෙන සිටි ඔහු නැගී සිටියේ තිර අදිටනකින් යුතුව මෙනි. ඔහු දුරකථනයේ අංක කිහිපයක් කරකවනු ඇය කුතුලින් යුතුව බලා සිටියාය. ඔහු ටැක්සියක් ඇණවුම් කරනු ඇයට ඇසිණි.

"මාව බස් එකකට ඇරලවන්න ගිම්හාන මම තනියම යන්නම්..." ගීතිකා පහත් හඬින් පැවසුවාය. ඔහු පිළිතුරක් දුන්නේ නැත.

"ගීති මං කියන්නෙ නෑ මේ අපේ අන්තිම හමුවීම කියල මං දන්නව මට ඔයා නැතුව ඉන්න බැරිවෙයි. ඉදල හිටල හරි ඔයාව බලන්න එන්න මට අවසර දෙනවද කියන්න...."

ඔහු විමසුවේ බිඳුණු හඬිනි. ඇය නිසලව මොහොතක් ඔහු දෙස බලා සිටියාය. ඒ දෙනෙත් බෙහෙවින්ම දුක්බර වී තිබිණි. ගීතිකාට ඒ වේලාවේ වේදනාවක් දැනුණේ ඔහු පිළිබඳවය. එහෙත් ඇය සිතැඟි සඟවා ගන්නට වෙර දැරුවාය. සැබැවින්ම තව දුරටත් මිරිඟුවක් පසු බැඳ යාමේ අරුතක් තිබේදැයි ඇය තමාගෙන්ම විමසා ගත්තාය.

"අපි හමු වෙන එකේ තේරුමක් තියෙනවද ගිම්හාන.....?" ඇය ඔහුගේ දයාබර දෑස මග හරිමින් විමසුවාය. "ඔයාට කොතැනක හරි ඉන්නවනෙ ආදරේ කරන්න කෙනෙක්. ඔයා වෙනුවෙන් බැඳුණු කෙනෙක්. එහෙම ඉඳිද්දිත් ඔයා මේ විදියට මට බලාපොරොත්තු දුන්න එක වැරදියි ගිම්හාන මාව විතරක් නෙමෙයි ඔයා එයාවත් රවැට්ටුවා...."

ඇගේ වේගවත් කටහඬ ගැන ඇයටම දැනුණේ මවිතයකි. තව දුරටත් ඇය හඬා වැටුණේ නැත. කිසිදාක නොදුටු ගිම්හානගේ බිරිඳ කෙරෙහි ඊර්ෂ්‍යාවක් බඳු හැඟීමක් ඇයට දැනිණි. ගිම්හානගේ කාමරය තුළ තිබෙන ඇගේ ඡායාරූපය දුටු සැණෙකින්ම සිය සිත තුළට කිසියම් අසුබ පෙරනිමිත්තක් දැනුණු බව ඇයට මතකය.

"ගීති.... මං කවදාවත් කාගෙවත් අනුකම්පාවක් බලාපොරොත්තු වුණ මිනිහෙක් නෙමෙයි. ඔයා පිළිගත්තත් නැතත් මං ඔයාට ආදරෙයි. ඒ ආදරේ වෙනුවෙන්වත් ඔයා ළඟ බැගෑපත් වෙන්න මම කැමති නෑ....."

ගිම්හාන කියාගෙන යද්දී ගීතිකා දෙනෙත් අයාගෙන ඔහු දෙස බලා සිටියාය.

"ගිම්හාන" ඇය යමක් කියන්නට තැතනුවාය. එහෙත් ඇයට දොඩමළු වන්නට ගිම්හාන ඉඩ දුන්නේ නැත.

"ගීති... මං හිතාගෙන හිටියෙ කවදා හරි දවසක මගෙ කතාව ඔයාට කියන්නම් කියල. ඒත් ඔයා දැනටමත් මාව වරදවල හිතාගෙන ඉවරයි...."

ගිම්හාන කියාගෙන යද්දීම මිදුලේ රියක් නතර කරන හඬ ඇසිණි. ගිම්හාන දොර විවර කළේය. කහ පැහැති රේඩියෝ කැබ් රියක් මිදුලේ නවතා තිබිණි.

"අන්න ටැක්සි එක ආවා. අපි යමු..." ගිම්හාන ඉතා මුදුව ඇගේ නළලත සිප ගත්තේය. ඇගේ දෙනෙතට නැවතත් කඳුළු පුරා ආවේය. ඔහු හා හා පුරා කියා දුම්රියේදී සිය නළලත සිප ගත් අයුරු ගීතිකාට සිහිපත් විය. එදා මෙදා තුර ගෙවී ගිය කාලය අතිශයින්ම කෙටි වුවද ඒ කෙටි කාලයේදී ජීවිතය මොන තරම් පෙරළියකට ලක් වූවාදැයි ඇය සිතුවාය.

"ඔයා මට වෛර කරන්නෙ නෑ කියන්න ගීති....." ඔහුගේ කටහඬ කෙඳිරියකට සම විය.

"නෑ දෙවියනේ නෑ. ඔයා මං වෙනුවෙන් කරපු හැම දේකටම මං ණයගැතියි ගිම්හාන....." ඇය ඔහුගේ දෙපා මුල ඇද වැටුණාය. ගිම්හාන වහා ඇය දෙඋරහිසින් අල්ලා එසවීය. ඔහුගේ දෙනෙතෙහි කඳුළු පිරී දිලිසෙනු ඇය දුටුවාය.

"අපි යමු ගීති....." ඇගේ බෑගය සුරතට ගත් ඔහු පෙරමුණ ගත්තේය. නෑ යසා හඬන්නට ඇයට ඇවැසි විය.

"ගිම්හාන මම තනියම යන්නම්....."

ඇය නැවත වරක් කෙඳිරුවාය. ඔහුගේ වේදනාබර මුහුණ දකිද්දී සිය සිත වෙනස් වේයැයි ඇයට බිය සිතුණි.

"කොහොමටත් එන්නෙ කොළඹට විතරයි.." ඔහු නොසැළකිල්ලෙන් මෙන් පැවසීය. ඇය යටි තොල විකා ගනිමින් රියට නැගුණාය.

රථය කොළඹ කොටුවට ළඟා වන තෙක්ම ඔවුනතර කිසිදු කතාබහක් නොවීය. ඉවසිය නොහෙන ඒ දුක්බර නිහැඬියාව බිඳුණේ ඇගේ සුසුම් හඬකින් පමණකි. කොටුවේ දුම්රිය ස්ථානය අසළදී ගිම්හාන රියෙන් බැස්සේය.

"ගීති ඔයා පරිස්සමට යන්න...." නිමේෂයක් ඇගේ අතැඟිලි සිය අතැඟිලිවලට සිර කොටගෙන සිටි ගිම්හාන එය මුදාලමින් දිගු සුසුමක් හෙළීය. ගීතිකාගේ ළය මඬල දැවී ගියේය. ඇය දෑසට නැගුණු කඳුළු වසන් කරන්නට අසාර්ථක උත්සාහයක යෙදුණාය.

කුලී රියේ රියැදුරාට යා යුතු තැන පිළිබඳ උපදෙස් ද ගීතිකා අතට මුදල් ද දුන් ගිම්හාන යළි වරක් පසු නොබලාම පාර පනිනු ඇය බලා සිටියේ කඳුළු අතරිනි. රිය නැවතත් පණ ගැන්විණි.

ඇය හිස ඔසවා වටපිට බලද්දී රිය මීගමු පාරේද සෑහෙන දුරක් පසුකොට තිබිණි.

"මිස් සීදුවට නේද යනව කිවෙ.....?" රියැදුරා විමසීය.

"ඔව්...." ගීතිකා ඇසෙන නෑසෙන හඬින් පිළිතුරු දුන්නාය.

"එහෙනම් මට හරියටම පාර කියන්න වේවි. මට මේ පාර එච්චර පුරුදු නෑ...." ඔහු කීවේය. ගීතිකා මුවඇලගුළු හැරියේ අකමැත්තෙනි.

තවා ඇතුළු මුළු ලොවම කුමක්දෝ වෙනසකට හසුවී තිබෙන සෙයක් ගීතිකාට දැනෙන්නට විය. ඇය බෝඩිම අබියස නතර කරන ලද කුලී රියේ හිඳගෙනම ඒ වෙනස කුමක්දැයි සිතට හසුකර ගන්නට වෙර දැරුවාය. රියේ හඬ ඇසීදෝ රෝසක්කා කඩිනම් ගමනින් ඉස්තෝප්පුවට පැමිණියාය. ඇගේ මුහුණේ පළමුව කුතුහලයකුත් දෙවනුව විස්මයකුත් ඇඳී ගියේය. ඇය වහා රිය අබියසට දිව විත් ගීතිකාට රියෙන් බසින්නට ආධාර කළාය.

"විකට් තැලුව ද ගීතිකා.....?" රෝසක්කා විමසද්දී ගීතිකාගේ දෙනෙත් සිහින් කඳුළු පටලයකින් ආවරණය විය. කුලී රථ රියැදුරාගේ විමසිලිමත් බැල්මෙන් මිදෙන්නට ගීතිකා වහා ඔහුගේ ගාස්තුව ගෙව්වාය. රිය පිටවී ගියේය.

"සේනානි හෙටවත් නිවාඩු දාල ඔයාව බලන්න යන්න ඕන කියල කිය කියා හිටියේ...." රෝසක්කා ගීතිකා කැටුව ගෙතුළට ගමන් කළාය.

"නිවාඩු කියලත් ඔය තරම් කොහෙ තියෙන ඒවද රෝසක්කෙ......?" නිහඬව සිටීම අනුචිත බැවින් ගීතිකා අමාරුවෙන් කියා ගත්තාය.

"ඒක තමයි...." රෝසක්කා ගීතිකාගේ බෑගය සාලයෙන් තැබුවාය. "සේනානිල කාමරේ වහල යතුර අරන් ගිහිල්ලනෙ...."

"කමක් නෑ රෝසක්කෙ. මම මෙහෙන් ඉන්නම් සේනානිල එනකම්...." ගීතිකා සාලයේ පුටුවකට බර දුන්නාය. ඇගේ හිස බෙහෙවින් ඇදුම් දෙමින් තිබිණි. තමා නැවතත් අසනීප වෙන්නට එන්නේදැයි ඇයට බිය සිතිණි. ඇය සිය නළල දැඩි ලෙස මිරිකා ගත්තාය.

"ගීතිකා ඇයි මොකද.....?" රෝසක්කා ඇය දෙස බැලුවේ බිය රැඳි දෙනෙතිනි.

"මගෙ ඔළුව තකියනව රෝසක්කෙ...." ගීතිකා කටට ආ දෙයක් කීවාය.

"මහන්සියට වෙන්න ඇති.... ඉන්නකො මං බොන්න මොකුත් හදාගෙන එන්නම්...."

රෝසක්කා සාලයෙන් පිටවී ගිය පසු තුමක්දෝ ගුප්ත ආවේගයක් වටපිටාව පුරාම පැතිරී ඇති සෙයක් ගීතිකාට දැනිණි. ඇය දෙනෙත පියාගෙන පුටු ඇන්ද මත හිස රඳවා ගත්තාය. ගිම්හානගේ සුවඳ ඔහුගේ පහස ඇත්ව නොයන තරම්ම සමීපව සිය ආත්මය සමග සබැඳී ඇති බව ඇය සිතුවාය.

"ඒත් දෙවියනේ එයා මට අයිති කෙනෙක් නෙමෙයි...." ගීතිකා තමාටම මුමුණා ගත්තාය. ගිම්හානගේ ඇඳ අසළ ඇති දගකාර පෙනුමකින් යුතු යුවතියගේ රුව ඇගේ දෑසේ ඇඳී මැකී ගියේය.

"එච්චර ලස්සන නෝන කෙනෙකුත් ඉඳිද්දි ඇයි ගිම්හාන ඔයා මට මෙච්චර බලාපොරොත්තු දුන්නෙ.....?" ඇය දෑසින් ගිලිහෙන්නට ආසන්න වූ කඳුළු රඳවා ගැනීමට තැත් දැරුවාය. එහෙත් ඒ අකීකරු කඳුළු ඇගේ රෝස පැහැති කොපුලත් ඔස්සේ ගලා බැස්සේය.

"මොනව වෙලාද මේ ළමයට.....? ගීතිකා.... ගීතිකා...." රෝසක්කා ගීතිකාගේ උරහිසින් අල්ලා සෙලවූවාය. ඇය කඳුළු පිරි දෙනෙත විවර කොට රෝසක්කා දෙස බැලුවේ මවිතයෙන් මෙනි. රෝසක්කා ගේ අතක දුම් දමන තේ කෝප්පයක් විය. මුහුණෙහි වූයේ බියපත් බවකි. රෝහලින් ආ විගසම ගීතිකා නැවතත් අසනීප වී ඇතැයි රෝසක්කා සිතුවාය. ඇය බියපත් වූයේ එබැවිනි.

"ඇඟට මොකුත් අමාරුවක් දැනෙනවද ගීතිකා.....?"

"නෑ රෝසක්කෙ... මට හරි මහන්සියක් දැනෙනවා....."

"දවස් කීයක් අසනීපෙන් හිටියද.....? ආ.... මේ තේ ටික බොන්නකෝ... මම ඔයාට ඇඳක් හදල දෙන්නම්... ටිකක් නිදා ගත්තම ඔය මහන්සි ගතිය ඇරල යාවි....."

• • • •

එහෙත් සිය සිතෙහි ඇතිවූ විඩාබර බව කෙදිනකවත් පහව් නොයන බව ගීතිකාට සිතිණි. ඇය දිගු සුසුමක් හෙළා තේ කෝප්පය දෙතොලතරට ළං කොට ගත්තාය. ඇයට ගිම්හානගේ සුරතින් පිළියෙල වූ තේ කෝප්පයක රසය සිහිපත් විය.

www.sinhalelibrary.com
Scanned By Crizzzy

"මට කවදාවත් හිනාව උරුම වෙන එකක් නෑ.... නිලන්තට මාව එපා වුණා... මං හිතුවා ගිම්හානත් මට දුකක් දෙන එකක් නෑ කියලා... ඒත් එයා මට දුන්නෙ උහුලගන්න බැරි තරමේ වේදනාවක්...." ඇය තේ කෝප්පය පශසක තබා නැවතත් දෙනෙත් පියා ගත්තාය.

හෝරා කිහිපයකට උඩදී සිදු වූ සියලුම සිදුවීම් ඇගේ මනසේ පෙළ ගැස්විණි. ඇය ගිම්හානට තේ කෝප්පයක් පිළියෙල කොටගෙන කාමරයට ගියේ අපමණ වූ දයාබර බවකින් යුතුවය. එහෙත් දුරකතන සංවාදය සවන් වැගෙද්දී ඇගේ දෙපා පණ නැතිවී ගියේය. සැබැවින්ම මෙවැන්නක් ඇසීමට තරම් සිය දෙසවන් පව් කොට තිබිණි දැයි ඇය තමාගෙන්ම විමසා ගත්තාය. තේ කෝප්පයද ඇය නොදැනුවත්වම බිම අත හැරිණි.

"ගිම්හාන මං ගැන මොනව හිතුවද දන්නෙ නෑ. ඒත් මං එයාට වරදක් කළේ නැහැනෙ......" ඇය කොඳුරා ගත්තාය.

ගීතිකා ඇඳුම් මාරුකොටගෙන රෝසක්කා විසින් පිළියෙල කොට දුන් යහනක මුණින්තලා වූවාය. එහෙත් ඇයට නිඳිමතක් නොවිය. ඇයට අවශ්‍ය වූයේ නිදහසේ ගිම්හාන ගැන සිතීමට පමණි. ඔහුගේ සිතේ තමාට කිවයුතු බොහෝ දේවල් ගොනු වී තිබෙන්නට ඇත. එහෙත් ඒ කිසිවකට සවන් යොමන්නට ගීතිකාගේ සිත නිරවුල් නොවිය. ඇයට වුවමනා වූයේ ගිම්හානගේ සෙවණින් පලා ඒමට පමණි.

"එයා කියන්න යන්නෙ මොනවද කියල අහගෙන ආව නම් හරි.... ඒත් මං මොකටද එයාට එච්චර අනුකම්පා කරන්නෙ........? එයා මගෙ ජීවිතෙත් එක්ක සෙල්ලම් කළා...."

ඇය නැවතත් එය ම සිතුවේ සිතට ඒත්තු ගන්වන්නට මෙනි.

www.sinhalalibrary.com

# 14

ගිම්හාන සිත එකලස් කරගැනීමට දැඩි උත්සාහයක් ගත්තේ ය. එහෙත් ගීතිකා පිළිබඳ මතකය මොහොතකටවත් අමතක කරන්නට ඔහුට හැකි වූයේ නැත. කාර්යාලයට පිවිසිය ද කිසිදු වැඩක නිරත වෙන්නට තරම් සන්සුන් සිතක් ඔහුට නොවීය. ඔහු අතින් ඇඳුණු බලි රූප සහිත කොල ගණනාවක් ම ගුලි වී කුණු කූඩයට වැටුණේ ය. සිගරට් එක පිට එක පිලිස්සිණි.

"අද නම් ගිම්හානට මොකක් හරි අප්සෙට් එකක්...." සහිනා ඔහු ඉදිරිපිට අසුනේ වාඩි වූයේ එසේ කියාගෙන ය. ගිම්හාන සිනාසෙන්නට තැත් දැරීය.

"අප්සෙට් යන්නෙ නැතිව තියේවිය, උදේ පාන්දර තමුසෙලගෙ මූණ දක්කම." අසල මේසයෙහි සිටි ධනුක නැගැසුවේ කිහිපදෙනෙකු ම හිනස්සමිනි. එහෙත් ගිම්හානගේ මුවට සිනාවක් නැඟුණේ නැත.

"අපෝ මෙයා හිතාගෙන ඉන්නෙ මෙයාගෙ මූණ හරි ලස්සණයි කියලා.... ජීවිතේ එක සැරයක්වත් කණ්ණාඩියකින් මූණ බලල නැතිව ඇති...."

"ඔයාගෙ මූණ දිහා බැලුවම මට ආයෙ කණ්ණාඩි ඕන නෑ...."

"අපේ නවත්න ගෙිල්ල උඹලගෙ කරච්චලේ...." ගිම්හාන දෑතින් දෙසවන් වසා ගන්නේය.

"හරි හරි ඔන්න අපි ගියා.... අර එන්නෙ අභිජාත මිත්‍රයා...."

කාර්යාලයට ඇතුළු වෙමින් සිටි සංජීව දක්වූ සරිතා එතැනින් ඉවත් වී ගියා ය. සංජීවගේ මුහුණ කුතුහලයෙන් පිරී තිබිණි. පෙරදා ගීතිකා නිවසේ නවත්වාගැනීම පිළිබඳ ව සියලු ම විස්තර දැනගැනීමේ ආශාව සංජීව තුළ ඇතැයි ගිම්හාන සිතීය. කැමරා ආම්පන්න සහිත බෑගය පරිස්සමින් පසෙක තැබූ සංජීව ගිම්හාන ඉදිරිපිට පුටුවෙහි වාඩි ගන්නේය.

"මොකද උඹෙ මූණ හරියට වැහි කෝඩෙකට අහු වුණා වගේ?" සංජීව ඔහැකමින් ගිම්හානගෙ මුහුණ දෙස බැලීය. ගිම්හාන තවත් සිගරට්ටුවක් පත්තු කර ගත්තේය. ගිම්හාන එක පිට එක දුම් වැටි උරන්නේ විසඳා ගත නොහැකි පැනයක් සිත තුළ කෙරපෙන විට බව සංජීව අත්දැකීමෙන් ම දැනගෙන සිටියේය. ඔහු වඩාත් කුතුහලයට පත්වූයේ එහෙයිනි.

"මට දිග කතාවක් තියෙනවා උඹට කියන්න....." ගිම්හාන සංජීව දෙස නොබලා ම සීලිම දෙසට දුම් වළලු පා කළේ ය. ඒ දුම් වළලු කෙමෙන් නොපෙනී යද්දී ඔහුගේ මුවින් සිහින් සුසුමක් ගිලිහිණි.

"මට හිතුණා ඒයෙම මට කියන්න උඹට දිග කතාවක් ඉතිරි වෙවි කියලා...." සංජීව පැවසුවේ ඇනුම් පදයක හඬිනි. "කෝ අර කෙල්ල....? මොකක්ද ඒකිට වුණේ....?"

"ඒකි බෝඩිමට ගියා....."

"ආව විදියටම....?" සංජීව ගිම්හාන දෙස බැලුවේ සරදම් සහගත බැල්මකි. ඒ බැල්මේ අරුත ගිම්හාන වහා හැඳින ගත්තේය.

"ආව විදියටම නැත්නම් වෙන විදියකට යන්නයැ....." ඔහු පැවසුවේ නොරිස්සුම් සහගත හඬිනි. සංජීව මහ හයියෙන් සිනාසුණේය.

"අපිට කෑගහන්න එපා කියලා මුන් දෙන්න ඔෆිස් එක දෙවනත් කරනවා....." ධනුක දෙස් පැවරී ය. සංජීවගේ සිනා හඬ කෙමෙන් වියැකී ගියේ ය.

"ඊයෙ ඊ ජ්කි උඹේ ගෙදර නැවතුණා නේද?....?"

"ඔව්....." ගිම්හාන මේසය මත වූ කොළයක දිගට හරහට ඉරි ඇන්දේ ය. ඒ ඉරි තුළින් පවා මතුව පෙනුණේ ගීතිකාගේ හැඩුම්බර මුහුණ ය. පෙරදා රෑයේ ඇය සිය තුරුලට වී ගත කළ ආනන්දජනක නිමේෂයේ මතකය ඔහුගේ සිත පාරවමින් මතකයට නැගී ආවේ ය.

"ඔයා ගැන මගෙ හිතේ තියෙන්නෙ පිවිතුරු හැඟීමක්. ඒක අවිශ්වාසයකින් කිලිටි කරගන්න මම කැමති නෑ....."

ගීතිකාගේ වදන් ඔහුගේ සවන් අබියසම නින්නාද විය. ඇය ඔහු කෙරෙහි තැබූ විශ්වාසය කොතරම් ද? ඒ විශ්වාසය දැන් ඉතින් කැබලිවලට කැඩී බිඳී අවසාන ය. එය යළිත් තිබූ දිනයෙක එක්තැන් කරන්නට හැකියාවක් නොලැබෙනු ඇත. ගිම්හාන දිගු සුසුමක් හෙළීය.

"දැන් ඉතින් වෙච්ච දේ වෙලා ඉවරනෙ.... ඕක ඔච්චර හූල්ල හූල්ලා කල්පනා කරන්න දෙයක්යැ....." සංජීවගේ සැහැල්ලු ස්වරය ගිම්හානගේ දැහැන් බිඳ දැමීය.

ගිම්හාන දෙබැම රැලිකොට ගෙන මොහොතක් සංජීව දෙස බලා සිටියේ ය. සැබැවින් ම ඔහු අදහස් කළේ කුමක්දැයි ගිම්හානට සිතා ගන්නට නොහැකි විය.

"මොනවා ගැනද උඹ ඔය කියන්නෙ?"

"ඊයෙ ගැන මතක් කරපු ගමන් උඹ කල්පනා කරන්න පටන් ගත්තෙ මොකක් හරි දෙයක් සිද්ධ වුණ හින්දනේ...."

"උඹ හිතන විදියේ දෙයක් වුණේ නෑ බං...." ගිම්හාන පැවසුවේ නොරිස්සුමෙනි.

"මං උඹට කලින්ම කිවුවනේ අර වගේ ලස්සණ කෙල්ලෙක් එක්ක තනි පංගලමේ ගේක තනි වුණාම...."

"සංජීව...." ගිම්හාන සංජීවගේ කතාවට බාධා කරමින් මේසයට මිටින් පහරක් ගැසීය. මේසය මත වූ සිගරැට් කොටවලින් පිරි අළු බඳුන කිහිපවරක් ඒ මේ අතට සෙලවිණි. කාර්යාලයේ බොහෝ දෙනෙකුගේ කුතුහලයෙන් පිරි නෙත් ඔවුන් වෙතට එල්ල විණි. ගිම්හාන සන්සුන් පෙනුමක් ආරූඪ කරගන්නට වෙර දැරිය.

www.sinhalalibrary.com
Decoded By Crzzzy

"සිද්ධ වුණේ මොකක්ද කියල හරියට දන්නෙ නැති ව තීරණ ගන්න එපා මචං"

ගිම්හාන සිගරැට්ටුවෙ දික්ව තිබූ අළු, බඳුනට ගැසී ය. සංජීව අතක් දවුණු ඒ සිගරැට්ටුව අනාරාධිතව ම රැගෙන සිය දෙතොලතර රඳවා ගත්තේය.

"හරි ඉතින් කියපන්.... මොකක්ද වුණේ....?"

ගිම්හාන සියල්ල නොසඟවා හෙළි කළේය. සාවධානව කතාවට සවන් දුන් සංජීව එවර සිය මිතුරා දෙස බැලුවේ අනුකම්පාවකින් මෙන් ම මවිතයකින් ද යුතුවය. දුහුල් රැ ඇඳුමකින් පමණක් සැරසුණු විට ගීතිකා වැනි සුරූපිනියක් හමුවේ දී තවුසෙකුගේ පවා දැහැන් බිඳෙනු නොඅනුමානය. හැඟීම් විජිහිත වූවෙකු සේ ඇය ඉදිරියේ නැසිරෙන්නට ගිම්හානට කොතරම් ආත්ම සංයමයක් තිබිය යුතු ද? සංජීවට එය දැනුණේ ආශ්චර්යයක් ලෙසිනි.

"ඇත්තමයි මචං.... අවංකවමයි මේ කියන්නේ.... උපන් ද ඉඳලා එංගලන්තෙ ජීවත් වෙලත් උඹට ඔච්චර හිත පාලනය කරගන්න පුළුවන් වුණා කියන්නෙ උඹ අදහන්න වටින මිනිහෙක් කියන එක...." සංජීව ලෙන්ගතුකම පුරවාගත් දෑසින් යුතුව ගිම්හානගේ උරහිස මත සුරත තැබීය. ගිම්හාන දෙතොලග මඳ සිනාවක් තවරා ගත්තේය.

"එයා මගෙ ළඟට ආවෙ මාව හුඟක් විශ්වාස කරලා...."

කියන්නට අදහස් කළ බොහෝ දේවල් ගිම්හානගේ මුව තුළම ගොළු වී ගියේය. කෙසේ වුව ද අවසානයේ දී සිදු වූයේ ගීතිකාගේ සිත තුළ තමා පිළිබඳව අවිශ්වාසයක් හටගැනීම පමණක් බව ඔහුට සිහිපත් විණි.

"ඒත් දැන් මං දන්නව ගීති ආයෙ මාව විශ්වාස කරන්නෙ නෑ කියලා...." ඔහු දැඩිව දෙඩැම මිරිකා ගත්තේය.

"ඇත්තනේ මචං.... උඹ නිකමටවත් අලෙවුවෙ නෑ ඒකිට උඹ බැඳලයි කියලා.... ඉතින් ඒකි අප්සෙට් යන එක අහන්න දෙයක්ද? සංජීව සිගරැට් කොටය අළු බඳුනට හෙලා දෑත් එකිනෙක පිරිමැද ගත්තේය. මිතුරා සිය පැනය සැහැල්ලුවට ගණන් ගත්තේ යැයි ගිම්හානට සිතිණි. ඔහුගේ සිත තුළ කහටක් බඳු හැඟීමක් හටගත්තේය.

"මම මුලදී ම උඹට කිවුවනෙ අහිංසක කෙල්ලන්ට බලාපොරොත්තු දෙන්න එපා කියලා...." සංජීවගේ වදන් ගිම්හානගේ සිත පාරවන සුලු විය.

"මගෙ ජීවිතේ ඇතුල් පැත්ත ගැන උඹල දන්නෙ නෑ මචං...." ගිම්හාන දිගු සුසුමක් හෙළී ය. පියුමිගේ අනුරාගී දෑසද ඔහුගේ දිවිය ඉමහත් පෙරළියකට ලක් කළ ඇගේ දඟකාරී හැසිරීම් ද ඔහුගේ දෑස් හමුවේ මැවී පෙනෙන්නට විය.

"මචං ගිම්හාන, ප්‍රශ්න තියෙන්නෙ උඹට විතරක් නෙමෙයි.... එක අතකින් බලනකොට උඹට ප්‍රශ්නයක් ඇත්තෙත් නැති තරම්.... ඒත් බලපන් ගීතිකා වගේ කෙල්ලන්ට හැමදාම ප්‍රශ්න.... හැම තැනම ප්‍රශ්න.... එදා වෙළඳ කලාපෙට ගිය වෙලාවෙ වුණත් උඹ දැක්කනෙ උන්ගෙ ජීවිතවල ඇතුල් පැත්ත කොහොම ද කියලා.... ඒ වගේ කෙල්ලන්ට ආදරෙන් ප්‍රශ්නයක් නරන එකට නම් උඹලට සමාව දෙන්න බෑ...."

සිත තුළින් නැඟී ආ දැඩි ආවේගයකින් මෙන් සංජීව කියාගෙන කියාගෙන ගියේය. ගිම්හාන නිහඬවම ඔහු දෙස බලාගෙන සිටියේය. ගීතිකාගේ දිවියට සවිමත් අත්වැලක් වෙන්නට පෙරුම් පිරුවා විනා ඇයට ගැටලුවක් වෙන්නට කිසිදු දිනෙක නොපැතූ බව සංජීව හමුවේ කියා පෑමෙන් පලක් නැතැයි ඔහුට සිතිණි.

"දැන් ඉතින් උඹ මොනවද කරන්න හිතුවේ...?" සංජීව පුටුවෙන් නැඟිට අඩමානයට මෙස ගැට්ට මත වාඩි වී ගිම්හාන වෙතට නැඹුරු විය.

"මම තවම කිසිම දෙයක් හිතුවෙ නෑ. මගෙ ඔළුව අවුල් වෙලා හොඳටම....." ගිම්හාන නළල මිරිකා ගනිමින් කෙඳිරීය.

"අපි යමුද ගීතිකාව මීට් වෙන්න...."

සංජීවගේ යෝජනාව ගිම්හානගේ ගිනිගත් සිතට සිසිල් පවනැල්ලක් බඳු විය. ඔහු වහා නැඟී සිටියේය.

"අනේ මචං යමන්.... දැනටමත් ඒ කෙල්ල මොන වගේ තත්ත්වෙක ඉන්නවද දන්නෙ නෑ.... කොහොමටත් අසනීපෙන්නේ හිටියෙත්...."

"දැන් නම් බෑ.... දැන් මට පින්තූර වගයක් ගන්න යන්න තියෙනවා..... අපි හවසට යමු....."

# 15

දවස් ගෙවී ගියේ පාළුවෙන් හා හුදෙකලාවෙනි. ගීතිකාට ඒ හුදෙකලා බව දරිය නොහැකි තරම් විය. අනෙක් අතට නවාතැනේ ජීවිතය ද ඈ ප්‍රිය නොකළා ය. දිගින් දිගට ම සිත තුළට පියා සලා එන නිර්මලා පිළිබඳ මතකය ඇගේ සිත බෙහෙවින් පීඩාවට පත් කළේ ය. ගිම්හාන පිළිබඳ ව සිතද්දී ඒ සිත් පීඩාව දෙගුණ තෙගුණ වෙමින් දැනිණි. ගීතිකා දිනෙන් දින ම වැහැරුණා ය. කෑම රුචිය ද ඈ කෙරෙන් පලා ගියේ ය. සේනානිත් ප්‍රියන්තිත් බෙහෙවින් බියපත් වූහ.

"ගීති..... උඹට මොකද වෙලා තියෙන්නෙ?" එක්තරා සවසක සේනානි දයාබර ව විමසුවා ය. ගීතිකා මලානික මඳ සිනාවක් පෑවා ය.

"මොකුත් නෑ...."

"එහෙනම් ඇයි කන්නෙ නැත්තෙ.....?"

මට බඩගින්නක් දැනෙන්නේ නෑ....?"

ගීතිකා හිස ඔසවා යෙහෙළිය දෙස බැලුවේ කඳුළු බර දෑසිනි. පෙර ජීවයෙන් පිරිතිරුණු ගීතිකාගේ දෙනෙත් යුග පත්ලේ වතුර ස්වල්පයක් රැඳුණු පොකුණු දෙකක් බඳුව යට ගිලී ගොස් තිබිණි. සේනානිගේ පපුව හෝස් ගා දැවී ගියේ ය.

"උඹට තන්න පුළුවන් කිසි ම දෙයක් නැද්ද?"

"ම්හු...."

සේනානි එසේ විමසුව ද ඇය අතේවත් ප්‍රියන්ති අතේවත් මුදල් තිබුණේ නැත. රෝහලේ සිටිය දී ශිම්භානගෙන් ලද මුදල් ස්වල්පයක් ගීතිකා අතේ ඉතිරි වී තිබිණි. ඔවුන් අමාරුවෙන් ජීවිතය ගෙන ගිය පැහැදම් කළේ ඒ මුදල් ය. ගීතිකා ද ඒ බව දැන සිටියා ය. උණුසුම් සුප් කෝප්පයක් බීමට සිතට නැඟුණු ආශාව ද අමාරුවෙන් මැඩ පවත්වා ගත්තේ එහෙයිනි.

"සේනානි මං ගෙදර යනවා...." හිටි හැටියේ ම ගීතිකා පැවසුවා ය. සේනානිත් ප්‍රියන්තිත් දෙදෙනා ම ඇය දෙස බැලුවේ මවිතයෙනි.

"ගිහිල්ල....?"

"එතන ඉඳන් අරගෙන හිතන්න ඕන. තාමත් එකක මෙච්චර කල් නිවාඩු දෙන්නෙ නෑ. එක දිගට ම. මෙලහකටත් මාව රස්සාවෙන් අස් කරල ද දන්නෙත් නෑ....."

ගීතිකා පැවසුවේ යෙහෙළියන්ගේ මුහුණු ඉක්මවා ඈත බලාගෙනය. සේනානිත් ප්‍රියන්තිත් මුහුණෙන් මුහුණ බලා ගත්හ. සැබැවින් ම සත්‍ය ද එය ම විය. එහෙත් ගීතිකා සේවයෙන් නෙරපූ බව ඇයට හොඳ හැටි සනීප වන තුරු නොකියන්නට පිළිනු කතා කරගෙන සිටියහ.

"ජීවිතේ දි මං ප්‍රාර්ථනා කරපු හුඟක් දේවල් අහිමි වෙලා ගියා. රස්සාවත් ඔහේ නැති වෙලා ගියාවෙ. ඒත් ශිම්භාන ගැන හිතන කොට මට හිත වාව ගන්න බෑ සේනානි."

ගීතිකා එක්වර ම දෙදණ මත මුහුණ හොවාගෙන හඬා වැටෙන්නට වූවා ය. පෙර තමන්ට ද උපදෙස් දෙන්නට තරම් බුද්ධිමත් වූ යෙහෙළිය ආදරය වෙනුවෙන් හඬා වැටෙතුරු ප්‍රියන්තිත් සේනානිත් බලා සිටියේ කම්පාවෙන් යුතුව ය.

"අඬන්න එපා ගීති....." ප්‍රියන්ති ඇගේ හිස සෙමින් පිරිමැද්ද ය.

"මං දන්නවා උඹේ හිතේ තියෙන වේදනාව. ඒත් ගීති බැඳපු මිනිහෙකුට අනුකම්පා කරන එක තරම් මෝඩ වැඩක් තවත් නෑ. ඒක හොඳට මතක තියා ගනින්." සේනානි පැවසුවේ තරමක් දැඩි හඬිනි.

"එයා බැඳලා හිටියට එයාගෙ විවාහ ජීවිතේ සාර්ථක නෑ කියල මට හිතෙන්නෙ. එද ටෙලිෆෝන් එකෙනුත් දෙන්නා රණ්ඩු වුණා මට ඇහුණා....." ගීතිකා හිස නොඔසවා ම කියාගෙන කියාගෙන ගියා ය.

"ඒක ඒ දෙන්නගෙ ප්‍රශ්නයක්. එයාගෙ විවාහ ජීවිතේ සාර්ථක නෑ කියල අහක ඉන්න කෙල්ලෙකුගේ ජීවිතේ අවුල් කරන්න එයාට කිසි ම අයිතියක් නෑ...." සේනානි පැවසුවේ කෝපයෙනි.

"අනේ ප්ලීස් සේනා ගිම්හානට බනින්න එපා...." ගීතිකා වහා හිස ඔසවා සේනානිගේ දෑතින් ම අල්ලා ගත්තා ය. ඇගේ වැහැරුණු මුහුණ දෙස බලා සිටිය දී සේනානිගේ දෙනෙත් තුළ වූ කෝපය පහව ගියේ ය.

"ගිම්හාන නරක කෙනෙක් නෙමෙයි."

"එයා නරකයි කියල මං කිවුවෙ නෑ. ඒත් උඹව රවටපු එකට සමාව දෙන්න පුළුවන් ද?" සේනානි ඒක එල්ලේ ම ගීතිකාගේ දෙනෙත් දෙස බැලුවා ය.

"එයා එහෙම කරන්න ඇත්තෙ මොකක් හරි හේතුවක් හින්ද....." ගීතිකා කතා කළේ පහත් හඬිනි.

"ඔව් ඉතින් හේතුවක් නැත්නම් එකක් හදාගන්න හරි බැරියැ. කිතුල් ගහට නැංග මිනිහටත් කියන්න දෙයක් තිබුනනෙ...." සේනානි පැවසුවේ අවඥාවෙනි.

"ගිම්හාන රැවටිලිකාරයෙක් වුණා නම් එයා මේ තරම් මං ගැන හොයන්නෙ බලන්නෙ නෑ සේනා. මම හොස්පිට්ල් එකේ ඉද්දි වුණත් කොච්චර මං වෙනුවෙන් මහන්සි වුණා ද?" ගීතිකා තව දුරටත් ගිම්හාන වෙනුවෙන් කතා කළා ය. "අනිත් එක එයයි මායි කොච්චර සමීප වෙලා හිටියත් එයා නරක විදියට හැසිරුණෙ නැනෙ...."

"ඒක නම් ඇත්ත තමයි....." සේනානි පැවසුවේ කල්පනාකාරී ලෙසට ය. ගීතිකා දැඩි ලෙස ඔහුට ආදරය කරන බව සේනානිට රහසක් නොවී ය. එහෙත් මේ අසම්මත බැඳීම කොතැනින් කෙළවර වෙනු ඇද්දැයි ඇයට සිතා ගන්නටවත් නොහැකි විය.

නවාතැන ඉදිරිපස මෝටර් සයිකලයක් නතර කරන හඬ ඇසිණි.

"ගිම්හානගෙ මෝටර් සයිකලේ සද්දෙමයි...." ගීතිකාට සිතිණි. එහෙත් යෙහෙළියන් බැන වදිතැයි බියෙන් ඇය සිතැඟි හෙළි නොකළා ය.

"ගීති....."

ඒ සමග ම ඇයට ප්‍රියන්තිගේ විස්මයෙන් පිරුණු කටහඬ ඇසිණි. ඇය වහා දොරකඩට පැමිණියා ය. විඩාබර මුහුණින් සහ පරාජිත බැල්මකින් යුතු ව දොරකඩ සිටගෙන සිටියේ ගිම්හාන ය. සංජීව මෝටර් සයිකලය මත හිඳ සිටියේ ය. දෙපා අප්‍රාණික වන සෙයක් ගීතිකාට දැනිනි. ඇය අසළ සිටි සේනානිගේ අත තරයේ අල්ලා ගත්තා ය.

"ගීති...." ඔහු ඉතා දුක්බර හඬින් ඇය ඇමතී ය. ගීතිකාගේ සිත හෝස් හා දැවී ගියේ ය. ඇගේ දෑසට කඳුළු පිරිණි.

"එන්න අයියෙ ඇතුළට....."

සේනානි සන්සුන් හඬින් ඇරයුම් කළා ය. ඔහුගේ ස්වභාවය ඇය තුළ ද දැඩි දුකක් ඇතිකොට තිබිණි.

"ගෙට එන්න බෑ සේනානි..... මම ආවෙ ගීතිත් එක්ක ටිකක් කතා කරන්න පුළුවන් ද බලන්න...."

"එන්න ගෙට....."

තව දුරටත් ඔහුගේ බැගෑපත් ස්වරය දරා සිටීමට නොහැකි වූ ගීතිකා සිහින් හඬින් ඇරයුම් කළා ය. ඔහු නෙත ගැටුණහොත් රෝසක්කා දහසකුත් එකක් ප්‍රශ්න අසන බව ඇය දැන සිටියා ය.

"ප්ලීස් ගීති. එක විනාඩි දහයක් මගෙත්තෙක්ක එළියට යන්න එන්න...."

ගිම්හාන යනු මෙසේ යුවතියක ඉදිරියේ බැගෑපත් විය යුතු අයෙකු නොවේ. ඇයට තව දුරටත් සිත පාලනය කරගැනීමට නොහැකි වූයේ ය. ඇයට සේනානි සහ ප්‍රියන්ති දෙස බැලිණි. ඔවුන් දෙදෙනාගේ ම මුහුණුවල වූයේ දුක්බර බවකි.

"ගිහින් වරෙන් ගීති....."

සේනානි කෙඳිරුවා ය.

"ඔයා ගිහින් හන්දියෙ ඉන්න.... මම එන්නම්....."

ගීතිකා ඇසෙන නෑසෙන හඬින් මිමිණුවා ය. ඔහුගේ දෙතොලේ මන්දස්මිතයක් ඇඳිණි.

"ඔයා එහෙනම් එනව නේද.....?"

ඔහු විමසද්දී ගීතිකාගේ සිතට හොරිස්සුම් සහගත බවක් දැනිණි.

"මං බොරු කියන්නෙ නෑ....."

ඇය ඇනුම් පදයක හඬින් කීවා ය. ගිම්හානගේ මුහුණ බොහෝ සෙයින් අඳුරු වූයේ ය. ඔහු දඩි ව යටි තොල සපාගෙන මෝටර් සයිකලය වෙත ගියේ බිම බලාගෙන ය. සංජීවගේ මුහුණේ ඇඳුණේ ද දුක්බර බවකි.

"පව් බං....."

පෙර ඔහුට දෙස් පැවරූ ඉක්තානි එසේ කියද්දී ගීතිකා දිගු සුසුමක් හෙළුවා ය.

ඔහු හමුවීමට මුල් වරට මිගමුවට පැමිණි ද හැඳි නිල් පැහැති ඇලි ගවුම ම හැඳගත් ගීතිකා හන්දියට යද්දී ගිම්හාන නොඉවසිල්ලෙන් මග බලා සිටියේ ය. සංජීව පෙනෙන්නට නොවී ය. ඇය වදනකුදු කතා නොකොට මෝටර් සයිකලයට නැඟුණා ය. එහෙත් හැකි තරම ඔහුගෙන් ඈත් වී වාඩි වෙන්නට උත්සාහ ගත්තා ය. ඔහු දිගු සුසුමක් හෙළනු ඇයට ඇසිණි.

"අපි බීච් එකට යමු ද ගීති.....?"

මඳක් දුර ගිය විට ඔහු විමසී ය. එහෙත් ගීතිකා කතා කළේ නැත. කොහේ ගිය ද මේ කතාවේ වෙනසක් ඇති නොවන බැව් ඇය දැන සිටියා ය.

ගිම්හාන වෙරළ අද්දර මෝටර් සයිකලය නැවැත්වී ය. එයින් බැස ගත් ඇය රළ බිඳෙන සීමාවට ගොස් නැවතුණා ය.

ඈත දියඹේ සිට මෑත වෙරළට ඇදී එන රළ පෙළෙහි දෑවටී ඇත්තේ දුක්බර අඳෝනාවක් යයි ගීතිකාට සිතිණි. සැබැවින් ම සිය සිත හඬා වැටෙන්නේත් මේ රිද්මයට ම නොවන්නේ දැයි ඇය කල්පනා කළා ය. සිය දෙපා මුල ම බිඳී ගිය රැල්ලක් දෙස ඇය බලා සිටියේ අරමුණකින් තොරව ය.

"ගීති....." ගිම්හාන සිහින් සරින් ඇය ඇමතී ය. ඇය හිස හරවා බලා දුක්බර සිනාවක් පෑවා ය.

"මොනව ද ඔයා ඔච්චර ම කල්පනා කරන්නේ.....?"

www.sinhalalibrary.com
SL UNLIMITED
Scanned By Ozzzy

"මම මොකුත් කල්පනා කළේ නෑ ගිම්හාන..... රළ බිඳෙන දිහාවේ බලාගෙන හිටියෙ...."

"අපේ බලාපොරොත්තු බිඳිල ගියෙත් හරියට මේ රළ බිඳෙනව වගේමයි නේද ගීති....?"

ගිම්හාන සිනාසෙන්නට තැත් කළේ ය.

"ඔයාගෙ නෙමෙයි මගේ....."

ඇය කඳුළු පිරෙන දෙනෙත ඔහුගෙන් වසන් කරලන්නට ඉවත බැලුවා ය. බැලූ බැලූ අත ඇයට දිස් වුණේ යෞවනයේ චමත්කාරය අත් විඳින පෙම්වතුන් ය. තමාට ඒ වරම අහිමි වූයේ කාගේ වරදකින් දැයි ගීතිකා සිතුවේ සොවින් බර සිතින් යුතුව ය.

"ඔයා හිතන්නෙ මං විනෝදෙට ඔයාට බලාපොරොත්තු දුන්න කියල ද....?" ඔහු විමසුවේ බෙහෙවින් රිදුණු හඬකිනි.

"ඔයාව බොරු කාරයෙක් වංචාකාරයෙක් කියල මම කවදවත් කියන්නෙ නෑ..... ඒත්..... ඒත්.... මට ඔයා ගැන.... ඔයා.... ගැන....."

ගීතිකාට එතැනින් එහාට කතා කර ගත නොහැකි විණි. ඇය ගිම්හානගේ උරහිසට වාරු වී ඉකි බිඳිමින් හැඬුවා ය. ගිම්හාන ඇය වඩාත් සිය සිරුරට සමීපකොට ගත්තේ ය.

"අඬන්නෙපා ගීති....." ඔහු දුක්බර හඬින් කොඳුලේ ය. එහෙත් ගීතිකාට එවදන් ඇසුණේ යන්තමිනි.

"මම හිනාවෙන්න ඉපදුණු කෙනෙක් නෙමෙයි ගිම්හාන..... මගේ මුළු ජීවිතේ ම කඳුළක්....."

"නෑ ගීති නෑ..... විශ්වාස කරන්න මාව..... මං ඔයාට අඬන්න ඉඩ දෙන්නෙ නෑ....." ඔහු දැඩි සේ ඇගේ දෑතින් අල්ලා ගත්තේ ය. දෙපා අබියස ම බිඳුණු රළ පහරකින් විසි වූ දිය බිඳු ඔවුන් දෙදෙනාගේ ම සිරුර පුරා විසිරී ගියේ ය. සිය දෙතොලට දැනුණේ ගීතිකාගේ කඳුළක ලවණ රසය දැයි කරදියේ රසය දැයි වෙන් කොට හැඳින ගන්නට ගිම්හානට නොහැකි විය.

"ඔයා මගෙ කඳුළු පිහදන්න හදන්නෙ තවත් කෙනෙකුගෙ ඇස්වලට කඳුළු පුරවලා.... මම කොහොම ද ඒකට කැමති වෙන්නෙ ගිම්හාන.....?"

"පියුමි ගැන හැම දේම මං ඔයාට කිව්වනෙ ගීති..... මං නැතුව කියලා කවදාවත් එයාට අඩුවක් දැනෙන එකක් නෑ..... කුරුළු කූඩුවක් කඩල ඉහිරුවා වෙන්නෙ නෑ ඒ හින්දා....."

"ඔයාට ඔයාගෙ පැත්තෙන් ඕන තරම් නිදහසට කරුණු කියන්න පුළුවන්. ඒත් ඔයා පියුමිගෙ පැත්තෙන් පොඩ්ඩක් හිතල බැලුව ද.....?" ගීතිකා හිස නගා ඔහුගේ මුහුණ දෙස බැලුවා ය. එවර ඇගේ දෑසේ කඳුළු පිරී තිබුණ ද ඇය හැඬුවේ නැත. සිය වේදනාව වසාගෙන වෙනකෙකු වේදනාවට පත් වීම වළක්වා ලන්නට තැත් දරන මේ අරුම පුදුම යුවතිය දෙස ගිම්හාන බලා සිටියේ මවිතයෙනි.

"පියුමි මට නොකියන හුගක් දේවල් හිතේ හංගගෙන ඉන්නව ගීති...." ගිම්හාන සිහින් සරින් පැවසී ය.

"ගැහැනුන්ට හිතේ තියෙන හැම දේම කෑ ගහල කියන්න බෑ ගිම්හාන...."

ගීතිකා ඔහුගෙන් මෑත් වී දෑත ළමැද පටලා ගත්තා ය. ඔහුගේ සිත බෙහෙවින් රිදිණි. ඇගේ ඒ සරල වදන් තුළ දිගු කතාවක් ගැබ්ව ඇති බව ඔහු පසක් කොට ගත්තේ ය.

"ඇයි එහෙම කියන්න බැරි.....?"

"කියන්න බැරි.....?" ඇය හිස ගස්සා තියුණු බැල්මකින් ඔහුගේ මුහුණ දෙස බැලුවා ය. හා හා පුරා කියා ඇය දුටු දිනයේ ඒ මුහුණ පුරා තිබූ කඩුපතක තියුණු බව ඔහු යළි වරක් දුටුවේ එමොහොතේ ය.

"මේ ලෝකෙ අසාධාරණකම් වෙන තරමක් වෙන්නෙ ගැහැනුන්ට..... මම වෙළඳ කලාපෙ රස්සාවට ආව කියලා තිලන්ත මගෙන්නෙක්ක තරහ වුණා..... කවුදෝ මිනිහෙක් ව විශ්වාස කරන්න ගිහින් නිර්මලාට ජීවිතෙන් වන්දි ගෙවන්න සිද්ධ වුණා.... හැමෝ ම හුගක් වෙලාවට ගෑනු හිත්වල පැත්තක් වහගෙන ඉන්නෙ. පියුමිත් ඒ වගේ වෙන්න ඇති....." ගීතිකා කියාගෙන කියාගෙන ගියා ය. ගිම්හාන නිරුත්තර ව බලා සිටියේ ය. සැබැවින් ම ඔහුට ඇයට පිළිතුරු වශයෙන් කියව හැකි යමක් සිහිපත් වූයේ නැත.

"ගීති.... ඔයා මොනව ද මට කරන්න කියන්නේ....?" අවසානයේ දී ඔහු අසරණ හඬින් විමසී ය. ඒ මොහොතේ ඔහුට සැබැවින් ම අසරණ බවක් තනි කමක් දැනෙමින් තිබිණි.

"මං වෙනුවෙන් ඔයාට කරන්න තියෙන්නෙ එක ම එක දෙයයි ගිම්හාන....." ඇය සෘජු බැල්මකින් මොහොතක් ඔහු දෙස බලා සිටියා ය. ඒ දෙනෙතේ වූයේ ඔහුට දරා ගත නොහැකි තරමේ කාන්තියකි.

"මොකක් ද ගීති කියන්න...... ඔයා වෙනුවෙන මං ඕන ම දෙයක් කරන්නම්....." ඔහු පැවසුවේ ඉමහත් උනන්දුවකිනි. ඇගේ මදනොලේ සරදමකට ලං වූ සිනා රැල්ලක් ඇති වී නැති වී යනු ඔහුට පෙනිණි.

"ඔයා මීට පස්සෙ කවදාවත් මාව හමුවෙන්න එන්න එපා...." ඇගේ හඬ ස්ථිර වුව ද එහි තිබූ ශෝකී බව ඔහු වහා හැඳින ගත්තේ ය.

"ගීති....." ඔහු තැ ගැසී ය. රළ පෙළ කැළඹෙන හඬ මැද ඔහුගේ කට හඬ සිඳී ගියේ ය.

"ගීති.... මං කොහොම ද ගීති ඔයා නොදැක ඉන්නෙ.....?"

"ඔයාට වැඩිය මට අමාරුයි ගිම හදාගන්න..... ඒත්.... ඒත්.... අපි කවද හරි වෙන් වෙන්න ම ඕන..... ඒ හින්ද...."

ගීතිකාට තව දුරටත් කතා කරගත නොහැකි විය. ඇය දඩි ව යටි තොල සපාගෙන හැඬුම මැඩ පවත්වා ගනු ඔහු දැඩි අනුකම්පාවෙන් යුතු ව බලාගෙන සිටියේ ය. ඔහු අබියසට ඇඳුණු ඇය සෙමින් ඔහුගේ නළලත සිප ගත්තා ය. සිය දෙනෙනට කඳුළු පිරී එනු ගිම්හානට දැනිණි. ඔහු ඇගේ දෑත අල්ලා ගන්නට තැත් දැරී ය. ඇය එය වළකාලමින් වහා ගල් තලාවෙන් බිමට බැස්සා ය.

දෙනෙතට ලේන්සුව තද කොට ගෙන වෙරළ දිගේ ඇය දිව යන සුරු ඔහු බලා සිටියේ හැඟීමක් දැනීමක් නැති අයෙකු මෙනි. ඇය පසුපස දිව යන්නට ඔහුට දෙපා නගා ගත නොහැකි විය.

"යමු....." සංජීව පැමිණ උරහිසට අත තබන තුරු ම ගිම්හානට කිසිවක් පිළිබඳ ව නිනවවක් නොවී ය. ඔහු සති ගණනාවක් නිරාහාර ව සිටි අයෙකුගේ දුබලකමින් යුතුව ගල් තලාවෙන් බැස්සේ ය.

"මොකද වුණේ.....?" සංජීව විමසුවේ ඉතා සෙමිනි.

"හැමදේම ඉවරයි...." ගිම්හාන ලොව ම දවා හළු කරලන්නට තරම් වූ දිගු සුසුමක් හෙළී ය. සංජීව ඊට වැඩි යමක් විමසුවේ නැත.

"මම පදින්නම්....." මෝටර් සයිකලය අභියසට පැමිණි විට සංජීව පැවසී ය. ගිම්හාන නිහඬව ම යතුර ඔහු වෙතට පෑවේ ය.

නුගේගොඩට එනතුරු ම ඔවුනතර වූයේ දැඩි නිහඬ බවකි. ගිම්හානගේ නිවසට පැමිණි පසු ව සංජීව සිය මිතුරා දෙස බැලුවේ අනුකම්පාව පුරවා ගත් දෑසිනි. ඔහුගේ මුහුණේ මෙතරම් දැඩි වේදනාවක් සටහන්ව තිබූ අන් අවස්ථාවක් සංජීවට මතකයට නංවා ගත නොහැකි විය.

"ගිම්හාන.....". සංජීව ගිම්හානගේ දෑතින් අල්ලා ගත්තේ ය. මගෙන් මොනව ද කෙරෙන්න ඕන කියලා කියපන් මචං....."

මිතුරාගේ ලෙන්ගතු ස්වරය දරාගත නොහැකි තරම් හැඟුම්බර ව ගිම්හානගේ සවන්පත් මත පතිත විය.

"මට ටිකක් තනියෙන් ඉන්න ඕන මචං....."

ඔහු නළල පිරිමැද ගනිමින් කෙඳිරී ය.

"රාජිව්.... මට පොඩි ගමනක් යන්න තියෙනව.... ගිහින් හරියට ම හයට ආපහු එනවා...."

"බයික් එක අරන් පලයන්....."

ගිම්හාන නොසන්සුන් සිය වරින් කාමරයේ ඒ මේ අත සක්මන් කළේ ය. එක පිට එක දුම් වැටි කීයක් පුළුස්සා දැමුවේ දැයි ඔහුට නිනව් නැත. ගීතිකා හමුවට යාමෙන් සිදු වූයේ සිත තව තවත් නොසන්සුන් වීම පමණකැයි ඔහුට සිතිණි. ඔහු සිගරැට්ටුව අළු බඳුන තුළට දමා යහනත දිගා විය. ගීතිකා විසින් අඳින ලද පියුමිගේ රූ ඇඳුම තවමත් ඇඳ විට්ටම මත විය. ඔහු එය රැගෙන ළමැදට තුරුළු කරගත්තේ ය. ඇගේ සුවඳ සිය නැහැපුඩු විනිවිද යනු ඔහුට දැනිණි.

"මම ජීවිතේ ගැන මොනතරම් බලාපොරොත්තු තියාගෙන ද හිටියෙ.....? ඒත් ඒ හැම එකක් ම මටවත් නොදැනී විනාශ වෙලා ගියා....." ඔහු දිගු සුසුමක් හෙළී ය.

ඔහුට අම්මාගේ ආදරණීය බව සිහිපත් විය. තාත්තාගේ කාරුණික බව සිහිපත් විය. නංගිගේ දඟකාර බව සිහිපත් විය.

ඔවුන් තුළ තමා වෙනුවෙන් ඇති සෙනෙහස මොන තරම් ද? හදිසියේ ම ඔහුට ඔවුන් කිසිවෙකු අසලක නැති පාළුව දැනෙන්නට විය. සැබැවින් ම ලංකාවට පැමිණියාට ම පසු ඔහුට මෙතරම් හුදෙකලා බවක් දැනුණු පළමු අවස්ථාව එය විය.

"කුරුළු කූඩුවක් කඩා ඉහිරවලා පව් කාරියක් වෙන්න මම කැමති නෑ ගිම්හාන... මගෙ වේදනාව මං තනිය ම විඳ ගන්නම්.... ඔයා ආපහු එංගලන්තෙට ගිහින් පියුමිත් එක්ක සන්තෝසෙන් ජීවත් වෙන්න...." ගීතිකාගේ හැඬුම්බර ස්වරය සවන් පතුලේ දෝංකාර දෙනු ගිම්හානට දැනිණි. සිය උරහිසට වාරු වීගෙන ඇය ඉකිබිඳ හැඬූ අයුරු ඔහු සිත දවෙන වේදනාවෙන් යුතු ව වුව ද යළිත් වරක් සිහිපත් කළේ ය. සංජීව මේ මොහොතේ සිටියා නම් මැනවැයි ගිම්හානට සිතිණි. ඔහු සිය දෝතට හිර වූ රෑ ඇඳුම දෙස නැවත වරක් නෙත් හෙළී ය. මේ ඇඟලුමින් යුතු ව තමාට සමීප ව සැතපී සිටි ගීතිකාගේ රුව ඔහුගේ සිත පුරා ම රැඳී තිබිණි.

"මම එංගලන්තෙ ඉඳල ලංකාවට ආවෙ ජීවිතේට වෙනසක් ඕන හින්ද.... ඒත් දැන් ලිහා ගන්න කෙළවරක් හොයන්න බැරිතරමට ජීවිතේ අවුල් වෙලා....." ඔහු තමාට ම මුමුණා ගත්තේ ය.

දැන් ලංකාවේ සිටියා ඇතැයි හදිසියේ ම ඔහුට සිතිණි.

"මම අම්මල ළඟට යනවා ආයෙමත්.... අම්මට කියනව හැම දේ ම.... එතකොට අම්ම කියල දේවි කරන්න ඕන හොඳ ම දේ මොකක් ද කියලා....." ඔහු කුඩා දරුවෙකු විලසින් සිනී ය.

• • • •

රැකියාව අහිමිවීමත් ගිම්හානගෙන් ඈත් වෙන්නට සිදුවීමත් ගීතිකාගේ සිත බෙහෙවින් සසල කළේ ය. ඇය ගතින් පමණක් නොව සිතින් ද බොහෝ සේ දුර්වල වූවා ය.

"මම ගෙදර යනවා සේනානි....." එක්තරා උදෑසනක ගීතිකා සේනානිට පැවසුවා ය. සේනානි මෙන් ම ප්‍රියන්ති ද ඇය දෙස බැලුවේ තිගැස්සීගෙන ය.



www.sinhalelibrary.com
Uploaded By Lizzy

"ගිහින්.....?"

"හෙට මොනවගේ වෙයි ද කියල කියන්න පුළුවන්කමක් නෑ මට.... එන විදියකට මූණ දෙනවා...." ගීතිකා දිගු සුසුමක් හෙළුවා ය.

ප්‍රියන්තිත් සේනානිත් මුහුණෙන් මුහුණ බලා ගත්හ. දුක සැප බෙදාගෙන එකට සිටි දයාබර මිතුරිය වෙනුවෙන් උපන් කඳුලක් ඔවුන්ගේ දෑස්වල ඉතිරී ව තිබිණි. පෙර ජීවයෙන් මිරිකිරුණු ගීතිකාගේ මුහුණ මලානික ව දෙනෙත් යට ගිලී තිබෙනු දකීම සැමැවින් ම ඔවුන්ට ඉවසුම් නොදෙන්නක් විය. ඇය ආපසු නිවසට යාම ඔවුන් අනුමත කළේ එහෙයිනි.

"හිමිහාන නිසා තමයි මේ සේරම වුණේ....." සේනානි ප්‍රියන්තිට පැවසුවේ ගීතිකා එහා මෙහා වූ අතරයි. ඇගේ කටහඬේ වූයේ කෝපයකි.

"මම නම් හිතන්නෙ මේ හැම දේම වුණේ හිමමිගෙ මරණෙන් පස්සෙ කියලයි..." ප්‍රියන්ති පැවසුවේ දිගු සුසුමක් හෙළමිනි.

"අනේ මන්ද බං..... අපි හතර දෙනා එක බඩවැල කඩාගෙන ආපු උන් වගේ හිටියෙ.... ඉස්සර වෙලා අපිට හිමමි නැති වුණා..... ගීති ගැනත් මගෙ හිතේ තියෙන්නෙ බයක්...."

"හිමමි වාගෙ මෝඩ වැඩක් කරගනී කියල දෑ...?" ප්‍රියන්ති විමසුවේ බියපත් හඬිනි.

"මං එහෙම ම කියන්නෙ නෑ.... ඒත් දැන් බලපන් ගීතිගෙ හැටි..... මෙහෙ හිටියොත් ආයෙමත් ඔය කෙල්ල අසනීප වෙනවා.... ඒ නිසා ගෙදර යන එක හොඳයි මං හිතන්නෙ......"

"මටත් දැන් මෙහෙ ඉඳල ඇති වෙලා තියෙන්නෙ බං..... අම්මා ලියුමකුත් එවල තිබුණා ගෙදර එන්න කියල..... ගිය මාසෙ අපේ ගමේත් ගාමන්ට් ෆැක්ටරි එකක් දැම්මනෙ...."

"අපිට ඉතින් වෙළඳ කලාපෙ ඇරෙන්න වෙන විකල්පයක් නැනෙ..... උඹල හැමෝ ම ගියාට පස්සෙ මමත් මෙහෙන් අස්වෙලා ගිහින් ගෙදර ඉඳගෙන මහන්න පටන් ගන්නවා....."

"ගීතියි ඔයයි දෙන්න එක ගමේ නිසා ඔයාල දෙන්නට ම එකතු වෙලා මහන්න පුළුවන්නෙ....."

ගීතිකා කාමරය තුළට පැමිණි බැවින් ඔවුන්ගේ කතා බහ විරාමයකින් තොරව ම නැවතිණි. සැබැවින් ම ඇය වසර ගණනාවකින් වියපත් ව ඇතැයි ඔවුන් දෙදෙනාට ම සිතිණි.

ගීතිකා නවාතැනින් සමුගන්නා ඒ දුක්බර දිනය එළැඹිණි. ප්‍රියන්තිත්, සේනානිත් නෙතු කඳුළින් පුරවාගෙන ඇය දෙස බලා උන්හ. ගීතිකා සූට්කේසයේ පියන වසා දමා ඔවුන් වෙතට පැමිණියා ය. තව දුරටත් හැඟීම් පාලනය කරගැනීමට ඔවුන් තිදෙනාට ම නොහැකි විය. ඔවුනු එක පොකුරට වැළඳගෙන ඉකිබිඳ හඬන්නට වූහ. රෝසක්කා ද දොරකඩට වී දුක්බර දෑසින් ඔවුන් දෙස බලා සිටියා ය.

සුළඟ නොවේ ඒ පාවී එන්නේ
කුටියක සිර වී හෙළන සුසුම්
අතු අග පරවී බිමට වැටෙන්නේ
සමනළ යුගයක පිපුණු කුසුම්.....

ඔවුන්ගේ දුක්බර ස්වරූපයට ම සරිලන ගීතයක් රෝසක්කාගේ නිවසේ ගුවන්විදුලි යන්ත්‍රයෙන් ප්‍රචාරය වනු ඇසිණි. යෙහෙළියන්ගෙන් මෑත් වූ ගීතිකා රෝසක්කාගේ දෙකොපුල් සිප ගත්තා ය.

"රෝසක්කා මට කරපු උදව් මං කවදාවත් අමතක කරන්නෙ නෑ....." ගීතිකා පැවසුවේ ඉකි බිඳිමිනි.

"ඔයාට මොන උදව්වක් ඕන වුණත් ඔයා මෙහාට එන්න ගීතිකා.... ඔයා ඇත්තට ම හුඟක් හොඳ ළමයෙක්...." රෝසක්කා පැවසුවේ බිඳුණු හඬිනි.

මිදුලෙන් බයිසිකල් සීනු හඬක් ඇසිණි.

"ලියුම් ඇවිල්ලා....."

කියාගෙන රෝසක්කා මිදුලට ගියා ය.

"ගීතිකාටත් ලියුමක් තියෙනවා......"

ගීතිකා අතට ගත් සූට්කේසය නැවතත් ඇඳ මත තබා ලිපිය අතට ගත්තා ය. ගිම්හානගේ අත් අකුරු හැඳිනගත් සැණින් ඇගේ දෑත සැලෙන්නට විය. ඇය යෙහෙළියන් දෙස බැලුවා ය.

www.sinhalaelibrary.com
Uploaded By Grzzzy

"නාගෙන් ද ගිම්හානගෙන් ද....?" සේනානි විමසුවේ ඒ වැල්ම හැඳිනගත් බව පළ කරමිනි.

"ඔව්...." ගීනිකා සැලෙන දෑතින් ලිපිය විවර කළා ය. ඇගේ දෑස නොඉවසිලිමත් ව එහි අකුරු පේළි දිගේ දුවන්නට විය.

සඳුදරණීය ගීනි,

ඔයාට මේ ලිපිය ලැබෙනකොට මම ලංකාවෙන් සමු අරගෙන ආයෙමත් එංගලන්තෙ හුදෙකලා වී හිඳිවි. ඔයාට මම මේ ලියන්නෙ සමුගන්න හෝරා දෙක තුනකට කලින්. ඔයාගෙ සුවඳ රැඳුණු මේ කුටියෙ ඉන්න කොට මට මොන තරම් වේදනාවක් දැනෙනව ද කියල ඔයාට ගන්ගෙරවන්නෙ නෑ කෙල්ලෙ. ඒක තේරුම් ගත්ත නම් ඔයා දැන ගනීවි මං ඔයාට මොන තරම් ආදරේ කරනව ද කියල.

මම ලංකාවට ආවෙ කිසි ම බලාපොරොත්තුවක් නැති හිස් මිනිහෙක් විදිහට. ඔයා හමු වුණාට පස්සෙ මට ජීවිතේ ගැන පුදුමාකාර ඇල්මක් දැනුණා. ඒත් අද රෑ දෙකට පිටත් වෙන කේ. එල්. එම්. ගුවන් යානයෙන් මම ආපහු එංගලන්තෙට යන්නෙ මම ආපහු එංගලන්තෙට හඩා වැටෙන ගින ධාරු කරගන්න උත්සාහ කරන හැබැ ම අභාග්‍ය සම්පන්න මිනිහෙක් විදියටයි.

මේ කිසි ම දේකට ඔයා වැරදිකාරියෙක් නෙමෙයි ගීනි.... ඔයයි මායි දෙරටක දෙතැනක තනිවෙලා සදාකාලිකව ම සුසුම් හෙළාවි. බිඳුණු ප්‍රේමයේ මතක සැමරුම් විතරක් අපේ තනියට තනි රකීවි හැමදාමත්.

සමහරවිට අපි ආයෙ හමුවේවි. සමහරවිට කිසි ම දවසක හමු නොවේවි. ඒත් මතක තියාගන්න රත්තරන් කෙල්ලෙ අදත් හෙටත් කවදාවත් මං ඔයාට ආදරෙයි. ඔයා මගෙ ළඟ නෑ කියල ඒ ආදරේ වෙනස් වෙන්නෙ නෑ කිසි ම දවසක.

රටකින් එහා ඉගිලී
තනිවෙන්න බෑ
සිතකින් නොවේ කිසිද
හැර යන්නෙ මා

අද මෙන් ළඳේ යළි නෑ
හමුවෙන්නෙ මා
ගෙන යමි ඔබේ ආදරේ.... ආදරේ
මම
සදදර,
ගිම්හාන

දෙනෙතින් ගලන කඳුළැලින් තෙත් වූ ලිපිය දෝතින් ම ළමැදට තුරුළු කරගත් ගීතිකා බලාගත්වන ම බලාගෙන මොහොතක් ගත කළා ය. ඊළඟ මොහොතේ එය දෑතින් ම ගිලිහී ඇගේ දෙපා මුල වැටිණි. ඇගේ දෑස නිලංකාර වී ගෙන ගියේ ය. තමා ඒකේන්ද්‍රකොට ගෙන මුළු ලොව ම භ්‍රමණය වන බව ඇයට දැනිණි. ඊළඟ මොහොතේ ඇය අව්‍යක්ත රාවයක් නගාගෙන සිහිසුන් ව ඇද වැටුණා ය. එහා දිව ආ යෙහෙළියෝ ඇය වත්කම් කර ගත්හ. ගිම්හාන විසින් එවන ලද ලිපිය ඔවුන්ගේ පාවලට පෑගී තැලී පොඩි වී ගියේ ය.

# 16

ගිම්හාන ආපසු එංගලන්තයට ගියේ ශීත සෘතුවේදීය. ඇට මිදුලු විනිවිද යන තරම් ශීතලට හමන සුළං රැළි සමග කැරකි කැරකී බිම පතිත වෙන හිම පියලි ගස් වැල් මතද, ගොඩනැගිලි මතද, පොළවේද රැඳී අපූරු සුන්දර දසුනක් මවා පෑවේය. එහෙත් මේ අපූරු දසුනේ සුන්දරත්වය තවත් දින කීපයකින්ම නිමාව දකින බව ගිම්හාන අත්දැකීමෙන්ම දැන සිටියේය. ඉනික්බිති දකින්නට ලැබෙන්නේ සුදෝ සුදු පැහැති හිම ගොඩවල් සහ හිසේ සිට දෙපතුල් දක්වාම වසා පොරවාගත් මිනිසුන් සහිත පරිසරයකි. වෛවර්ණය ප්‍රිය කරන මිනිසුන්ට එය සිත උමතු කරවන ඒකාකාරී දසුනක් බවට පත් වීම පුදුමයක් නොවේ. ශීත කාලය ළඟාවෙද්දී අතමිට සරු උදවිය උණුසුම් රටවල් කරා යන්නේ එහෙයිනි. එම නිසාම ගිම්හානගේ මේ හදිසි ආගමනය නිවසේ අයට පුදුමයක් වූයේය.

"වින්ටර් සීසන් එකට මෙහෙ අය වැඩිදෙනෙක් ලංකාවට යනවා...... මෙයා මෙහෙ ඇවිත්......" නංගී ඔහු පිළිගත්තේ එසේ කියමිනි. එහෙත් ඔහුගේ පැමිණීම තුළින් ඇය ලද සතුට ඇගේ මුහුණ පුරාම ගලා හැලුණේය.

"මම ගිම්හානනෙ.... ඒකයි ඒ ...... ඔහු සිනාසෙමින් කියද්දී නංගී පමණක් නොව අම්මා හා තාත්තාද සිනාසුණහ. දරුවන්ගේ සිත් සියුම්ව විනිවිද දැකීමේ ශක්තියක් ඇති අම්මා නම් ගිම්හාන කුමක්දෝ ගැටළුවකින් පීඩා විඳින බව වහා හැඳින ගත්තාය. එහෙත් එවැනි යමක් හාර හාරා ප්‍රශ්න කිරීමට වඩා ඔවුන් කැමැත්තෙන්ම කියනතුරු ඉවසා සිටීමේ ශක්තියක් ඇය තුළ තිබිණි.

"පුතාට ජොබ් එක එපා වෙලාද ආපහු ආවෙ....?"

තාත්තා පුරුදු බැරෑරුම් ස්වරයෙන් විමසීය. මුවෙහි වූ සිනාව නොනසා පවත්වා ගැනීමට ගිම්හාන අසාර්ථක උත්සාහයක් ගත්තේය.

"අපෝ නෑ තාත්තා.... මම ජොබ් එකට ආසයි...."

කියද්දී ගිම්හානගේ කට හඬ බිඳිණි. සැබවින්ම ඔහු රැකියාව කලේ බොහෝ ආශාවෙනි. පුවත්පත් කලාවේදියෙකු වශයෙන් ගත කරන ජීවිතය තුළ තිබුණේ විවිධත්වයකි. හැම දිනකම කුමක් හෝ නැවුම් අත්දැකීමකට මුහුණ දෙන්නට ඔවුනට සිදුවෙයි. ගීතිකා වෙතින් ප්‍රතික්ෂේප වීම එතරම් ආශාවෙන් කරන ලද රැකියාව පවා එපා වීමට තරම් ආත්ම පරාජයක් වෙතු ඇතැයි ඔහු සිතුවේ නැත. ඔහු දිගු සුසුමක් හෙළීය.

"එහෙනම් පුතාට පියුමි නැතුව තනියෙන් ඉන්න බෑ කියල හිතෙන්න ඇති....."

අම්මා කීවාය. ඔහුගේ ප්‍රශ්නය පියුමි නොවන බව ඇය වටහාගෙන තිබෙන්නේ යයි ඇගේ ස්වරයෙන්ම ගිම්හාන අනුමාන කලේය. නංගීගේ දෙතොලට සරදම් සිනාවක් නැගිණි.

"පියුමිට බැරි කරපු එක තමයි අයියා ජීවිතේදි කරපු ලොකුම මෝඩකම .... මම මුල ඉඳලම කියන්නෙ ඒකමනෙ...."

ඇය කියද්දී අම්මා තරවටුවෙන් ද, තාත්තා අවවාදාත්මකවද ඇය දෙස බැලූහ. එහෙත් තමාකියූ වදන් පිළිබඳව කිසිසේත්ම පසුතැවිලි නොවන බව ඇගේ මුරණ්ඩු බැල්ම කියාපෑවේය.

"ඒක මටත් හිතෙනවා නංගී..."

ගිම්හාන කල්පනාකාරී ස්වරයෙන් පැවසුවේ ගිනි උඳුනේ දිලිසෙන අඟුරු දෙස බලාගෙනය. ගිනි උඳුන ඉදිරිපිට වාඩිවී කොකෝ වැනි උණුසුම් යමක් පානය කරමින් සතුටු සාමීචියේ යෙදී සිටීම ශීත සෘතුවේදී ඔවුහු පුරුද්දක් වශයෙන් කළහ. ගිම්හාන සෘතුවේදී නම් ගෙවත්තට වී කතා බහ කළහ. එකිනෙකා අතර රහසක් නැතිව ඕනෑම දෙයක් විවෘතව සාකච්ඡා කිරීමට ඔවුන් හුරු පුරුදු වූයේ එලෙසිනි. අනෙක් අතට අම්මා ඔවුන් බටහිර පන්නයට ඇති කළේ නැත. මේ රටේ තරුණ තරුණියන් පමණක් නොව ලංකාවෙන් පැමිණ පදිංචිවී සිටින පවුල්වල තරුණ තරුණියන්ද අවුරුදු විසි එක සම්පූර්ණ වෙනවිටම පවුලෙන් වෙන්වී ස්වාධීන ජීවිත ගත කිරීම අරඹති. එහෙත් නිදහස උපරිමව භුක්ති විඳීමේ ප්‍රතිඵල ලෙස ජීවිත බොහෝ සෙයින් අවුල් කරගත් අයද නොඅඩුව සිටිති. අම්මාත්, තාත්තාත් හැර දමා ගොස් වෙනම නිවසක පදිංචිවීමේ වුවමනාවක් ගිම්හානට හෝ නැගණියට කිසිදිනෙක ඇති වූයේ නැත.

විවාහයෙන් අනතුරුව පියුමි සමඟ වෙනම නිවසක පදිංචි වුවද, ගිම්හාන නිතර නිතරම පවුලේ නිවසට පැමිණියේය. පියුමි හා ඔහු අතර ගැටුම් ඇති වීමට එයද හේතුවක් විණි. ඔවුන් දෙදෙනා නොගැලපෙන යුවලක් බව දැන සිටියද අම්මාත්, තාත්තාත් පියුමි හා විවාහයට ගිම්හානට අවසර දුන්නේ එය ඔහුගේ කැමැත්ත නිසාය. ගිම්හාන කුඩා කල සිටම වෙනස් සිතුම් පැතුම් ඇති අයෙකු විය. ඔහු යම් දෙයක් තදින්ම ඉල්ලන්නේ එය සැබැවටම අවශ්‍යනම් පමණක් බැව් අම්මාත් තාත්තාත් දැන සිටියහ.

"පියුමි වගේ කෙනෙක් අයියට ගැලපෙන්නේ නෑ.... බලන්නකෝ කවද හරි දවසක ඔය තීරණේ ගැන ඔයාට පසුතැවිලි වෙන්න සිද්ද වෙන්නෙ නැද්ද කියලා....".

නංගී නම් කෙලින්ම විරුද්ධත්වය ප්‍රකාශ කළාය.

"දෙන්නෙක් කවදාවත් එක වගේ වෙන්නෙ නැහැනෙ පුතේ..... නොගැලපීම තියනවා..... සමහර ඒවා හදාගන්න පුළුවන්. සමහර ඒවා කවදාවත් හදගන්න බෑ.... ඒ වගේ දේවල් ඉවසන්න පුරුදු වෙන්න ඕන..... අහල නැද්ද කතාවක් තියෙනවා විවාහ වෙන්න ඉස්සර වෙලා ඇස් දෙක හොඳට ඇරගෙන ඉන්න. විවාහ වුනාට පස්සෙ එක ඇහැක් වහ ගන්න කියලා.... ඒ කියන්නෙ සමහර දේවල් දැක්කත් නොදැක්කා වගේ ඉන්න පුරුදු වෙන්න ඕන......"

තාත්තා ගිම්හානටත් කුමාරිටත් දෙදෙනාටම දිග දේශනාවක් කළේය.

"අඩු පාඩු වැඩිපුර පේන්න ගන්නේ දෙන්නා එක ගෙදර ඉන්නකොට තමයි. ඒවා ඉතින් දෙන්නා කතා බහ කරල හදාගන්න ඕන....."

අම්මා තාත්තා ගේ කතාව ඌන පූරණය කළාය. එහෙත් ගිම්හානට ඔවුන්ගේ උපදෙස් අනුව පියුමි සමග ක්‍රියා කිරීමට කිසිදු අවස්ථාවක් නොවීය. ඇය සිය මතයම ක්‍රියාවට නංවන්නට උත්සාහ කරන බොහෝ හිතුවක්කාර එකියක බව ඔහු ඉක්මනින්ම වටහා ගත්තේය. දිනෙන් දින ළං වෙනවා වෙනුවට ඔවුහු එකිනෙකාගෙන් ඈත් වීමට පටන් ගත්හ. එසේ නොමැති නම් ඔහු ලංකාවට යා යුතුව තිබුණේ ඇයත් කැටුවමය.

අහසත් පොළවත් අතර ඇති ඕනෑම දෙයක් පිළිබඳව කතා බහ කළද මෙතරම් කලක් ඔවුනතර පියුමි සම්බන්ධයෙන් විවෘතව කතා බහක් කෙරී තිබුණේ නැත. අම්මාත් තාත්තාත් උපේක්ෂා සහගත වුවද නංගී නම් පියුමි සමග දැනැහැඳුනුම් කමකට වැඩි යමක් තිබුණේ නැති තරම්ය. පියුමි ගැන ඔහු නොදන්නා බොහෝ දේවල් නැගණිය දැන සිටින්නේයයි ගිම්හාන අනුමාන කළේය. කෙසේ වුවද මේ මොහොතේ නැගණිය විසින්ම පියුමි ගැන කතාව ඇරඹීම ගැන ඔහු සතුටු වූයේය. පියුමි හරහා ගීතිකා පිළිබඳව සාකච්ඡා කිරීමට ඔහු බලාපොරොත්තු වූයේය.

"පුතා ඇත්තටම පසුතැවිලි වෙනවද පියුමිව මැරි කරපු එක ගැන.....?"

www.sinhalaelibrary.com

තාත්තා බැරෑරුම් ස්වරයෙන් විචාළේය. අම්මාත් නංගීත් ඔහුගේ පිළිතුර අපේක්ෂාවෙන් බලා සිටියත් ගිම්හාන සුසුමක් හෙළා පානය කරමින් සිටි කෝපි කෝප්පය පුටුව අසලින් බිම තබා ගත්තේය. ඔහුට ගීතිකාගේ අහිංසක මුහුණ සිහිපත් විණි. ඔහුගේ නිවසේ රැයක් ගෙවන්නට තරමටම ඇය ඔහු විශ්වාස කළාය. එහෙත් ඔහු විවාහකයෙකු බව දැන ගැනීමත් සමගම ඒ විශ්වාසය සැණින් බිඳී ගියේය.

"බැඳපු මිනිහෙක් ඒ බව හංගන එක තරම් රැවටිල්ලක් තවත් තියෙනවද.....?"

කඳුළැලි කඩා හැළෙන නෙත් වලින් යුතුව ඇය විමසූ ආකාරය තවමත් සිත රිදවමින් ඔහුට සිහිපත් වූයේය. ඔහුට හැවතත් හිල්ලිණි.

"කසාද බැඳල ටික කාලෙකින් ඩිවෝස් වෙනවා කියන එක මේ රටවල් වල අයට අරුමයක් නෙමෙයි තමයි......... ඒත් පුතා ඒක ජීවිතේට හුගක් බලපාන මතයක් වෙන්න ඉඩ තියෙනවා....."

ගිම්හාන දික්කසාදයක් ගැන වදනක්වත් සඳහන් කොට නොතිබියදීත් අම්මා පැවසුවේ බොහෝ සන්සුන් ස්වරයෙනි. ඔහු මවිතයෙන් අම්මා දෙස බැලීය. වචනයකින් ප්‍රකාශ නොකරන අදහසක් බැල්මකින්, ඉරියව්වකින් හෝ හැසිරීමේ වෙනසකින් තේරුම් ගන්නට හැකියාව ඇත්තේ අම්මා කෙනෙකුට පමණක් වියයුතුයයි ඔහු කල්පනා කළේය.

"පුතා පියුමි එක්ක කතා කළාද....?" තාත්තා විමසීය.

"නෑ තාත්තේ......මම ආව බවක්වත් පියුමි දන්නෙ නෑ....."

තාත්තා කල්පනා කාරී ලෙස හෙමිහිට හිස සැලීය.

"මං හිතන්නෙ පුතා පියුමි එක්ක කතා කරල මොකක් හරි තීරණයක් ගත්තනම් හොඳයි...... එකට ඉන්න බැරිනම් ඩිවෝස් නොවී මොනව කරන්නද...?"

තාත්තා සිනාසෙන්නට තැත් දැරීය.

www.sinhalalibrary.com

ගීතිකා හමු නොවූයේ නම් පියුමි මොන වරදක් කළද ගිම්හාන ඇයට තව වරක් සමාව දීමට ඉඩ තිබිණි. එහෙත් මේ වන විට ඔහු පියුමි කෙරෙහි අතිශයින්ම කළකිරී සිටියේය. අඹු සැමියන් වූවද පියුමි ඇගේ හදවතේ එක් පැත්තක් ගිම්හාන වෙනුවෙන් විවර කළේ නැත.

"මම ලංකාවෙන් ආවෙ ආපහු යන්න බලාපොරොත්තුවෙන් නෙමෙයි....."

ඇය කිහිප විටක්ම පැවසූ බැවින් එවදන් තුළ කුමක් හෝ රහසක් ඇතැයි ඔහු අනුමාන කළේය. ආපසු එංගලන්තයට එන්නට සූදානම් වීමෙන් පසු ඔහු ගාල්ලට ගොස් පියුමි ගේ තොරතුරු සොයා බැලීය. ඇය වැදගත් පරපුරකට අයත් කාන්තාවක් බව ඔහු මුලසිටම දැන සිටියේය. එහෙත් ඇය ගත කොට තිබුණේ අතිශයින්ම සෙල්ලක්කාරී දිවියකි. පෙම්වතුන් කිහිප දෙනෙකුගේ අතින් අතට මාරු වූ ඇය අවසානයේදී ඇගේ අක්කාගේ සැමියා සමඟ සබඳතාවක් ඇති කොට ගෙන තිබිණි. එය බොහෝ දුර දිග ගියේය. එහෙත් අවසානයේදී මස්සිනා අක්කාගෙන් සමාව ඉල්ලා ගෙන ඇය ළඟම රැඳුණේය. සියලු දෙනාගෙන්ම කොන්වී අවමානයට පත් පියුමි යෙහෙළියකගේ මාර්ගයෙන් රැකියාවක් ලබාගෙන එංගලන්තයට පැමිණියාය. පියුමි ඔහුගෙන් වසන් කරන්නට තැත් කළේ මේ තොරතුරුය.

"මම ගාල්ලට ගිහින් පියුමි ගැන හොයල බැලුවා....."

ගිම්හාන නැවතත් කෝපි කෝප්පය අතට ගනිමින් පහත් හඬින් කියද්දී අම්මාත් තාත්තාත් මුහුණින් මුහුණ බලා ගත්හ. නංගීගේ කට කොනට සිනාවක් නැඟිණි.

"බඳින්න ඉස්සරෙන ඒ ටික කරන්න තිබුණෙ....."

තුෂාරි තවත් යමක් කියන්නට තැත් කළද අම්මා ගේ තරවටු බැල්ම හමුවේ පසු බෑවාය.

"මෙච්චර තාත්තා කෙනෙක් පුතෙකුට කියන්න ඕන දේවලුත් නෙමෙයි. ඒත් පියුමි ගැන හුඟක් දේවල් මම ගාල්ලෙ ඉඳල ආව කෙනෙකුගෙන් දැන ගත්තා..... පුතා ගියාට පස්සෙ පියුමි මෙහෙ ගත කරන්නෙත් එච්චර හොඳ ජීවිතයක් නෙමෙයි...."

www.sinhalaelibrary.com
Uploaded By Cizzzy

තාත්තා කියද්දී අම්මා තම්පිත දෙනෙතින් ගිම්හාන දෙස බලා සිටියාය. ගිම්හාන දැතින්ම කෝපි කෝප්පය අල්ලා ගෙන බිම බලා ගත්තේය. පියුමිගේත් ගිම්හානගේත් විවාහයට අකැමැත්ත නොපෑමෙන් ලොකු වරදක් කළ බව අම්මාත් තාත්තාත් සිතනවා විය යුතු යැයි ගිම්හාන සිතීය.

“මට ආයෙ හදාගන්න බැරි තරමටම ජීවිතේ වැරදුණා තාත්තෙ.....”

ගිම්හාන බිම බලාගෙනම කෙඳුළේ බිඳුණු හඬිනි. අම්මා ගේ දෙනෙතින් කඳුළු ගලා හැලිණි.

තුෂාරි වහා සිටි තැනින් නැඟිට විත් ගිම්හාන වාඩිවී සිටි පුටුවේ පත්ත මත වාඩිගෙන ඔහුගේ කරවටා අත යවා ගත්තාය.

“අනේ අයියෙ ඔය විදිහට හිතන්න එපා.....”

ඇය පැවසුවේ බැගෑපත් හඬිනි. තාත්තා සිය පුටුව ගිම්හාන ළඟට ඇද ගත්තේය.

“ජීවිතේ හදාගන්න බැරි තරමේ වැරැද්දක් වෙන්නෙ බොහොම කලාතුරකින් පුතා... එහෙම වැරැද්දක් ඔයාට වෙලා නෑ ... කිසිම දෙයක් අවසානයක් කියල හිතන්න එපා... අලුත් ආරම්භයක් කියල හිතන්න.

තාත්තා කීවේ පුතුගේ උරහිස මිරිකා ගනිමිනි. අම්මා අනෙක් පැත්තෙන් පැමිණ ගිම්හානගේ හිස සිප ගත්තාය. ඇගේ නෙතකින් ගිලිහුණු කඳුළක් උකුළ මත තිබූ ගිම්හානගේ අත මතට වැටිණි.

“කවුරු නැති වුණත් ඔයාට අපි ඉන්නවනෙ පුතේ.....”

ඇය කතා කළේ හැඬුම්බර ස්වරයෙනි. ඔවුන් තිදෙනාගේ සෙනෙහස දරා ගැනීමට නොහැකි බරක් ලෙසගිම්හානගේ සිතට දැනිණි. ඔහු තිදෙනාම වටා සිය දෑත යැව්වේය.

උපන්දා සිට ජීවත් වූ නිවසේ සුපුරුදු කාමරයේ වුවද ගිම්හානට දැනුණේ නුහුරු බවකි. උණුසුම් පොරෝනාවෙන් සිතට උණුසුමක් දැනෙන්නේනම් කොතරම් දෙයක්දැයි ඔහු කල්පනා කළේය.

ඔහුගේ සිත පුරාම අරක් ගෙන සිටියේ ගීතිකාය. සිය ලිපිය ලද විට ඇය කුමන මානසික තත්වයකට පත් වෙන්නට ඇද්දැයි ඔහු කල්පනා කළේය.

"එක අතකින් මං ලොකු මෝඩ වැඩක් කළේ... ගීති අසනීපෙනුත් හිටිය වෙලාවෙ මම මෙහෙම නැවිත් ඉන්න තිබුණෙ... මම එයාට කිසි දෙයක් පැහැදිලි කරල දෙන්නෙ නැතුව පැනල ආව කියලයි දැන් මට හිතෙන්නෙ...."

ඔහු පසුතැවිල්ලෙන් යුතුව කල්පනා කළේය. තමා හිටිහැටියේම එංගලන්තයට එන්නට තීරණය කළේ මන්දැයි ඔහු පැවසුවේ සංජීවට පමණකි. ඔහු ප්‍රධාන කර්තෘ ලවා මාසයකට නිවාඩු අනුමත කරවා ගත්තේ අම්මා අසනීපයෙන් සිටින බව කියමිනි.

"වින්ටර් සීසන් එක ගැන හොඳ ආර්ටිකල් එකකුත් ලියන්න...."

සිංහල පුවත්පතේ මෙන්ම ඉංග්‍රීසි පුවත්පතේ කතුවරයා ද පැවසීය. ගිම්හාන කැමැත්තෙන්ම එයට එකඟ වූයේය.

"කොහොම වුණත් ආව එක හොඳයි. කියලත් හිතෙනවා... පියුමිගෙන් ඩිවෝස්වෙලාම ආපහු යන්න පුළුවන් ..."

අනෙක් අතට ඔහු කල්පනා කළේය. එහෙත් ගීතිකා නැවත ඔහු පිළිගනු ඇද්දැයි සැකය සිත තුළ ඇනුණ කටුවක් මෙන් ඔහුට පීඩාවක් දුනිවිය.

"මම හෙට අම්මට ගීති ගැන ඔක්කොම කියනවා... එතකොට කරන්න ඕන දෙයක් අම්මා කියයි..."

තීරණයක් ගැනීමට නොහැකිව අසරණ වූ පාසල් දරුවෙකු මෙන් ගිම්හාන මුමුණා ගත්තේය.

www.sinhalalibrary.com Uploaded By Crazzy

17

ගිම්හානගෙන් තොර කාර්යාලය පුරා පැතිර ඇත්තේ මහා පාළුවක් යයි සංජීවට සිතිණි. ගිම්හාන මෙහි සේවයට පැමිණි දා සිටම ඔවුහු හොඳ මිතුරෝ වූහ. ඇතැම් විට කාර්යාලීය සගයන්ගේ සරදමට ඉලක්ක වෙන්නට පවා ඒ මිතුරුකම දැඩි වූයේය.

ගිම්හාන හොඳ මිතුරෙකු පමණක් නොව ඇසුරට සුදුසු බොහෝ නිහතමානි පුද්ගලයෙකු ද විය. සිංහලෙන්ද ඉංග්‍රීසියෙන්ද එකම දක්ෂතාවයෙන් යුතුව ලියන්නට දන්නා පුවත්පත් කලාවේදීන් සිටියේ අතලොස්සකි. ගිම්හාන ඒ අතරින් සුවිශේෂී වූයේ ඔහු ඉපදුණේත් හැදී වැඩුණේත් එංගලන්තයේ වීම නිසාය. ඔහුට එහි රැකියාවක් කිරීමට ඕනෑ තරම් අවකාශ තිබිණි. බොහෝ දෙනෙකු උත්සාහ කරන්නේ උපන් බිම හැර දමා ගොස් විදෙස් රටක රැකියාවක් ලබා ගැනීමටය. එහෙත් ගිම්හාන කළේ එහි අනෙක් පැත්තය. එම නිසාම ඔහු ආදර්ශමත් පුද්ගලයෙකු වශයෙන් කාර්යාලයේ ජනප්‍රිය වී සිටියේය. ඔහුට ඊර්ෂ්‍යා කළ අය කිහිප දෙනෙකු ද නොසිටියේ නොවේ. එහෙත් ගිම්හාන සියලු දෙනා සමගම සුහදශීලීව සිටින්නට වෑයම් කළේය.

ගිම්හාන නැතුව පාළුයි නේද මචං....?”

සංජීව තැමරා බෑගය ද කරේ එල්ලාගෙන කාර්යාලයට ඇතුළු වෙද්දී මහේෂ් විමසීය.

"ඔව් බං..."

සංජීව බෑගය ඔහුගේ මේසය මත තබා වීත් මහේෂ් ගේ මේසය ඉදිරිපිටින් වාඩි ගත්තේය.

"මන්න බලපන් පින් කළ ඇත්තෝ... උන් නිවාඩුවට යන්නෙත් එංගලන්තේ... අපිට කොළඹ වටේ රවුමක් යන්නවත් සල්ලි නෑ..."

මහේෂ් සිනාසෙමින් කීවත් ඒ සිනාවට යටින් වූ දුක් ගැනවිල්ල හැඳින ගන්නට සංජීවට අසීරුවක් නොවිණි. පුවත් පත් කලාවේදියෙකුට ලැබෙන වැටුප එතරම් විශාල නොවේ. යාන්තමින් මාසය ගෙවා ගන්නවා හැරෙන්නට ඉතිරි කිරීමක් ගැන හෝ අනවශ්‍ය වියදමක් ගැන සිතන්නට නොහැකිය.

"ගිම්හාන ඉතිං අපි වගේයැ බං... මේ ජොබ් එක කරන්නේ ජොලියටනෙ..."

"ඌ නම් අදහන්න වටින එකෙක් මචං... උපන් ද ඉඳල එංගලන්තෙ ඉඳලත් ඉන්නෙ ඉංග්‍රීසි වචනයක්වත් දන්නෙ නෑ වාගෙ... අවුරුදු දෙකක් මිඩ්ල් ඊස්ට්වල ඉඳල එනකොටත් අපේ හුඟක් උන්ට සිංහල අමතක වෙලා...ඒක නෙමෙයි ගිම්හාන පහු ගිය දවස් ටිකේ හිටියෙ අප්සෙට් මූඩ් එකේ... ගියෙ ආපහු නොඑන්න හිතාගෙනද දන්නෙ නෑ නේද..?"

මහේෂ් ඔනෑකමින් සංජීව දෙස බැලුවේ ගිම්හානගේ තොරතුරු හොඳින්ම දන්නේ ඔහු බව දැනසිටි නිසාය. එහෙත් ගිම්හාන සියලු තොරතුරු සංජීවට කීවේ ඔහු විශ්වාස කර ගෙනය. ඒවා තවත් කෙනෙකු ගේ කනට යවන්නට ඔහුට අවශ්‍ය නොවිණි.

"මාසෙකට විතරක් නිවාඩු දාලනෙ ගියෙ... අම්මා අසනීපෙන් කියල පණිවිඩයක් ආව හින්ද වෙන්නැති අප්සෙට් වෙලා හිටියෙ..."

සංජීව පැවසුවේ කතාව කෙටි කරන්නට සිතමිනි. ගිම්හාන නිවාඩු දැම්මේ අම්මා අසනීපයෙන් පසුවන බව කියමිනි. එහෙත් ඔහුට දරා

ගැනිමට නොහැකි වූයේ ගීතිකා අමනාප වීමය. ඇය අමනාප වීම රට හැර යන්නට හේතුවක් වීම තුළින්ම ගිම්හාන ඇයට කොපමණ ඇලුම් කරන්නට ඇද්දැයි සංජීවට සිතා ගන්නට හැකි විණි.

"මචං උඹ මගෙ බයික් එක තියා ගනිං.... ඉඳල හිටල ඇවිත් ගේත් බලල පලයන්... හිත හදා ගන්න පුළුවන් වුණ දවසක මම ආපහු එනවා..."

ගිම්හාන මෝටර් සයිකලයේ යතුර සංජීවට දෙමින් පැවසීය. සංවේගයෙන් බර වූ ඔහුගේ මුහුණ දෙස බලද්දී සංජීව ගේ සිතට ද දැනුණේ කණගාටුවකි.

"පිස්සු කෙලින්නෙ නැතුව මෙහෙ ඉඳගෙන හිත හද ගනින් ගිම්හාන... ඔයිට වැඩිය අවුරුදු ගණන් එකට හිටපු උන් ඩිවෝස් වෙන්නෙ... උඹට ගීතිකා මීට් වෙලා කොච්චර ටික කාලෙද....?"

සංජීව ඔහු අස්වසන්නට උත්සාහ කළේය.

"මට එහෙම හිතෙන්නෙ නෑ මචං.......මට දැනෙන්නෙ ගීතිකායි මායි ආත්ම ගණනාවක් තිස්සෙ එකට ආවා වගේ........."

ගිම්හානගේ හැඟුම්බර හඬ වෙනත් අවස්ථාවකදී නම් සංජීවගේ සරදමට ලක්වෙන්නට ඉඩ තිබිණි. එහෙත් ඔහු බලවත් වේදනාවෙන් පසු වන මොහොතේ විහිළුවකින් පවා සිත පෑරෙන්නට ඉඩ තිබූ බැවින් සංජීව නිහඬ වූයේය.

"උඹ ගීතිකාට කිව්වද ආපහු යන කතාව.....?"

මද වේලාවකට පසුව සංජීව විමසීය. ගිම්හාන හිස දෙපසට සැලීය.

"නෑ මං කිව්වෙ නෑ..... ලියුමක් ලියල යවනවා..."

"අමතක කරන්න එපා ඒකි මෙච්චර දවස් හිටියෙ අසනීපෙන් කියල......."

සංජීව අනතුරු ඇඟවීය. එහෙත් ගිම්හාන ඔහුගේ තීරණය වෙනස් කළේ නැත. ඔහු රට හැර යන්නට තීරණය කළේ යුවතියක නිසා බව දන්නේ නම් කාර්යාලීය සගයන් එය විහිළුවට ලක් කරනවා නොඅනුමානය.

ගිම්හාන විවාහකයෙකු වුව ද එම විවාහය බොහෝ කල කැළඹීම සහිත එකක් බව සංජීව දැන සිටියේය. ඔහු නැවත ලංකාවට යන්නට තීරණය කළේ එම නොගැලපෙන විවාහයෙන් මිදී යෑමේ අරමුණ ද සිත දරාගෙන විය යුතු යයි සංජීව කල්පනා කළේය. එහෙත් සිය විවාහක බව සැඟවූ ඔහුට ගීතිකාගෙන් ප්‍රේමය ලැබෙනු ඇද්දැයි සැක සහිතය.

"සංජීවට කෝල් එකක්...."

සරිතා කෑ ගැසුවාය. සංජීව නැගිට ඇගේ අතෙහි වූ

දුරකථනය වෙතට ගියේය.

"අයියෙ, මම සේනානි......"

දුරකථනයේ අනෙක් පසින් ඇසිණි.

"සේනානි.....?"

ඔහු මඳක් කල්පනා කළේය. ඔහුගේ ඡායාරූපවලට පෙනී සිටි යුවතියන්ගෙන් දුරකථන ඇමතුම් ලැබීම සාමාන්‍ය දෙයකි. එහෙත් ඒ අතර සේනානි නම් යුවතියක් සිටි බවක් ඔහුට සිහිපත් කිරීමට නොහැකි විය.

"මම ගීතිකාගෙ යාළුවා...."

ඇය කියද්දී ඔහුගේ මතකය පැහැදිලි වූයේය. ඒ සමගම සිත තුළ විදුලියක් කෙටුවාක් මෙන් තිගැස්මක් ඔහුට දැනිණි.

"ආ... නංගි, දැන් තමයි මට ඔයාව හරියටම මතක් වුණේ.... ඉතිං මොනවද තොරතුරු......?"

ඔහු උද්යෝගිමත්ව කතා කරන්නට වෑයම් කළේය. එහෙත් කුමක්දෝ අශුභ සිදුවීමක පෙරනිමිති ඔහුගේ සිතට දැනෙමින් තිබිණි.

"ඇත්තටම ගිම්හාන රට ගියා ද අයියෙ....?"

"ඔව් සේනානි. දැන් දවස් කීපයක් වෙනවා ගිහිල්ලා... ගීතිකාට ලියුමක් ලියලයි යන්නෙ කියලත් කිව්වා ..."

"ඒ ලියුම කියවල ගීති ආයෙමත් අසනීප වුණා අයියෙ. දැන් ඉන්නෙ ඉස්පිරිතාලෙ....."



www.sinhalaelibrary.com
SL UNLIMITED
Uploaded By Crzzzy

සේනානි පැවසුවේ බිඳුණු හඬිනි. තමාගේ අනුමානය මොන තරම් නිවැරදිදැයි සංජීව කල්පනා කළේය.

"හුගක් අමාරුද....?"

ඔහු කතා කළේ කලබලයෙනි.

" ඔව් අයියෙ ලියුම කියවන කොටම සිහිනැති වෙලා වැටුණා. අපි ඒ ගමන්ම ඉස්පිතාලෙට ගෙනිච්චා......"

"මයි ගෝඩ්..... ඉතින් .....?"

"තවමත් හරියට කල්පනාවක් නෑ.... හැම වෙලාවෙම ගිම්හාන ගැන කියවනවා..... මට කරන්නම දෙයක් නැති හින්ද අයියට මේ කෝල් එක දුන්නෙ..... ඩොක්ටර් කිව්වා ගීතිට තියෙන්නෙ කම්පනයක් කියලා. ගිම්හානව එක්කගෙන එන්න පුළුවන්නම් හොඳයි කිව්වා......"

සේනානි කතා කළේ අසරණ හඬිනි. මේ අහිංසක යුවතියට කරන්නට පුළුවන් උපරිම දේවල් ඔවුන් කර තිබේ. ඉතිරි කොටස ඔවුන්ට සිතා ගන්නට වත් නොහැකි තරමට දුෂ්කරය. සංජීව මොහොතක් කල්පනා කළේය.

"මම දවල්ට එන්නම් හොස්පිටල් එකට....."

අවසානයේදී ඔහු පැවසීය.

"අනේ ලොකු උදව්වක් අයියෙ..... මට මේ කර කියා ගන්න දෙයක් නැතුව ඉන්නෙ...."

"ගීතිකාගෙ ගෙදරට දැන්නුවෙ නැද්ද......?"

"දැන්නුවා කියලත් මොනව කරන්නද අයියෙ.....? එයාල නිකම් කලබල වෙනව විතරයි. ඒ හින්ද පුළුවන් විදියට මෙහෙ තියාගෙන ඉඳල සනීප වුණාට පස්සෙ ගෙදර ගිහින් ඇරලන්නයි මම හිතාගෙන ඉන්නෙ....."

"එතකොට ඔයාලගෙ ජොබ්ස්......?"

"පහු ගිය කාලෙ අසනීප වෙලා වැඩට ගියෙ නැති හින්ද ගීතිව ජොබ් එකෙන් අස් කළා..... එයා ගෙදර යන්න ලෑස්ති වෙනකොට තමයි

SL Unlimited www.sinhalaelibrary.com Uploaded By Crzzzy

ලිම්භාන ගෙ ලියුම හම්බ වුණේ...... මේ දවස් ටිකේ ගීතිට සාත්තු කරන්න මමත් නැවතුණානෙ..... දැන් මාවත් ජොබ් එකෙන් අස් කරල ඇති......."

සේනානි කතා කළේ රැකියාව ගැන කිසිදු තැකීමක් නැත්තියක මෙනි. ඔවුන් යන්තමින් දිවි ගැට ගසා ගත්තේ එම රැකියාවෙනි. එහෙත් එවන් වටිනාකමක් ඇති රැකියාවට වඩා ඔවුන් මිතුරුකම අගය කිරීම පිළිබඳව ඔහුට මවිත නොවී සිටිනු නොහැකි විය.

බොහෝ දෙනෙකු උත්සාහ කරන්නේ අනෙකා පාගා දමා හෝ තමාගේ තැන රැක ගැනීමටය. එවන් සමාජයක සේනානි වැනි පරිත්‍යාගශීලී යුවතියන්ගේ වටිනාකම මිළ කළ නොහැකිය. සංජීව රිසීවරය තැබුවේ සේනානි පිළිබඳ පහන් හැඟීමකින් මෙන්ම ගීතිකා පිළිබඳ බරකින් ද සිත පුරවා ගෙනය.

"මොකද සංජීව ප්‍රශ්නෙ.....?"

සරිතා විමසුවේ ඔහු කිසිවක් සිතා ගත නොහැකිව කල්පනා කරමින් සිටියදීය.

"යාළුවෙකුට සනීප නැතුව හොස්පිට්ල් එකේ..... මොකද කරන්නෙ කියල කල්පනා කළේ....."

සංජීව දෑත් එකිනෙක පිරිමැද ගනිමින් අහක බලාගෙන පැවසීය.

"ජෙනරල් හොස්පිට්ල් ද...?"

"ඔව්"

"මොනව කරන්න ද .....? ඩොක්ටර් කෙනෙක්ව අල්ලගෙන ගිහින් බලලා එන එකනෙ තියෙන්නෙ. පත්තරේ අයි. ඩී. එක පෙන්නල යන්න බැරියෑ....."

සරිතා යෝජනා කළාය. එම යෝජනාව සංජීව ඉහළින්ම පිළි ගත්තේය. ඇය හඳුනන වෛද්‍යවරයෙකු ගේ නමක්ද පැවසුවාය.

"තෑන්ක් යූ බං.... මට මේ උතුර දකුණ මාරු වෙලා තිබ්බෙ......"

සංජීව සිනාසුණේය.

"ගැළුන්ට තියෙන්නෙ හැඳි මිරෙ නුවණ කියල උඹල හිතා වෙනවා.... ඒ වුණාට මොනවා හරි වුණාම උතුර දකුණ මාරු වෙනවා..... ඊළඟට කරන්න ඕන දේ මොකක්ද කියල හිතන්නෙ ගෑනියෙක් තමයි....."

සරිතා සරදම් කළාය.

"අනේ නිකම් පලයන් යන්න...."

සංජීව ඇගේ හිසට පහරක් ගසා නැගී සිටියේය. එහෙත් ඇය පැවසුවේ සත්‍යයක්ම බව ඔහුට පසක් විණි. සිත විදුණු වහාම

ගිම්හාන කලේ රට හැර යාමය.ඔහු ගත් ඒ පියවර ගීතිකාට කෙසේ බලපානු ඇද්දැයි නිකමට වත් කල්පනා කළේ නැත.

සරිතා විසින් හඳුන්වා දෙන ලද වෛද්‍යවරයා ගේ ආධාරයෙන් රෝගීන් බලන්නට නියමිත වේලාවට පෙර රෝහලට ඇතුළු වෙන්නට සංජීවට හැකියාව ලැබිණි. වෛද්‍යවරයාද ඔහු සමඟම පැමිණියේය. ගීතිකාගේ ඇඳ අසල පුටුවක වාඩි වී සිටි සේනානි වහා නැගිට පසෙකට වූවාය. ඇය දෙස බලා මද සිනාවක් පෑ සංජීව ඇඳට ළං වී ගීතිකා දෙස බැලීය. දෙනෙත් විවර කොටගෙන සිටියත් ඒවායෙහි වූයේ සුදෝ සුදු කඩදාසියක බඳු හැඟීම් විරහිත බවකි. ඔහු මුලින්ම දුටු දිනයේ ජීවයෙන් පිරී තිබූ ඒ රූමත් මුහුණ මෙවෙලේ පැවතියේ මලානිකවය. පරවී ගෙන යන මලක් සංජීවට සිහිපත් විය.

"ගීතිකා....."

සංජීව ඇය වෙතට නැඹුරු වෙමින් ඇමතීය. ඇගේ දෑස් ඔහු දෙසට හැරිණි. එහෙත් ඔහු අඳුනා ගත් බවක් ඉන් පළ නොවිණි. ඇය ඔහේ බලා සිටියාය. ඇගේ පින්තූරයක් අනවසරයෙන් පුවත්පතේ පළ කිරීම සම්බන්ධයෙන් ඔහුට දෙස් පැවරීම සඳහා ඇය පුවත් කාර්යාලයට ආ දිනයේ මතක අතර සංජීව ගේ සිත අතරමං වූයේය.

"අපි වගේ දුප්පත් කෙල්ලන්ට රූපය ආභරණයක් නෙමෙයි අයියෙ....."

එදා ඇය පැවසුවේ කලකිරුණු ස්වරයෙනි. සැබවින්ම රුමත් කමේ තරමටම බුද්ධිමත් ද නොවූවා නම් වෙළඳ කලාපය වැනි සංකීර්ණ ස්ථානයක ඇය බොහෝ හිංසා පීඩා වලට ලක් වෙන්නට ඉඩ තිබිණි. සංජීව සේනානි දෙස බැලීය. ඇය කම්පිත දෑසින් යුතුව බලා සිටියේ ගීතිකාගේ ඇඟ ඉහපත කියවන වෛද්‍යවරයා දෙසය. සංජීව වෛද්‍යවරයා වෙත ළං

වූයේය.

"මොකක්ද ඩොක්ටර් මෙයාට වෙලා තියෙන්නෙ......"

ඔහු විමසද්දී වෛද්‍යවරයා මඳ සිනාවක් පෑවේය. එයින් සංජීවගේ සිතට සහනයක් දැණිනි.

"මෙයාට කම්පනයක් තියෙන්නෙ. ඒක හෙමින් හෙමින් ඇරිල යයි....... ඇත්තටම බෙහෙත් වලින් කරන්න පුළුවන් දේවල් තියෙන්නෙ ටිකයි.... මෙයාට දැන් ඕන විවේකයයි.... සාන්තුවයි....."

වෛද්‍යවරයා පැවසුවේ සේනානි දෙස ද බලමිනි.

"සනීප වෙන්න හුඟක් කල් යයිද ඩොක්ටර්...."

සේනානි විමසුවේ බැගෑපත් ස්වරයෙනි. සංජීවට ද එම ප්‍රශ්නය ඇසීමට ඕනෑකම තිබිණි.

"කොහොමත් හෙට අනිද්දා වෙනකොට ඩිස් චාර්ජ් කරයි... මං කිව්වනෙ බෙහෙත් වලින් කරන්න පුළුවන් දේවල් තියෙන්නෙ බොහොම ටිකයි තියලා....."

වෛද්‍යවරයා ගේ කට හඬ කාරුණික වුව ද එවදන් වලින් පහළ වූ අදහස මොන තරම් අමිහිරි දැයි සංජීව කල්පනා කළේය.

"ඩොක්ටර්... හදිස්සි ලෙඩෙක් ගෙනල්ලලු වෝර්ඩ් එකට....."

ඔවුන් වෙතට පැමිණි හෙදියක් දැනුම් දුන්නාය.

"රයිට් මම එන්නම්....." කියූ වෛද්‍යවරයා සංජීවගේ පිටට තට්ටු කළේය.

"ඔයා එහෙනම් ලෙඩා බලල එන්න.... ආයෙ මිට් වෙමු........"

"උදව් කළාට ස්තුතියි ඩොක්ටර්...."

සංජීව කෘතඥතා පූර්වකව පැවසීය.

"අපි දැන් මොනවද කරන්නෙ සේනානි....."

වෛද්‍යවරයා පිට වී ගිය පසුව සංජීව සේනානිගෙන් විමසීය. ගීතිකා ඔවුන්ගේ සෑම ඉරියව්වක් දෙසම ඕනෑකමින් බලා සිටින බවක් පෙනෙන්නට තිබුණත් ඇය සිටින්නේ පියවි ලෝකයේ නොවන බව සංජීවට වැටහී තිබිණි.

"මට කිසිම දෙයක් හිතා ගන්න බෑ අයියෙ...."

සේනානි කීවේ ශෝකී ස්වරයෙනි.

"ගීතිකාට දැන් සාත්තුවනෙ ඕන කරල තියෙන්නෙ.... මෙයා ගෙදර යැව්වොත් ගෙදර අය සාත්තු කරයිද.....?"

"ගීතිකා ගෙ අම්මලත් කුලී වැඩ කරල ජීවිතේ ගැට ගහ ගන්නෙ අයියෙ..... මේ කෙල්ල මේ විදියට ගෙදර ගිහින් දැම්මොත් ඒ මිනිස්සුන්ට අමතර බරක් වෙනවා විතරයි... ඒකයි මං හිතුවෙ සනීප වුණාටම පස්සෙ ගිහින් ඇරලන්න...."

සංජීව ඉහළට පහළට හිස සලමින් සවන් දී සිටියේය. පසු ගිය වර ගීතිකා අසනීප වූයේ ද කම්පනය නිසාය. එවර වෛද්‍යවරුන් පැවසුවේ වෙදකමට වඩා හෙදකම අවශ්‍ය බවය.

ගිම්හාන ඇය ඔහුගේ නිවසට රැගෙන ගියේ කුකුළු කූඩුවක් බඳු වූ ඇගේ නවාතැන් කාමරයේ විවේකයෙන් සිටීමට හැකියාවක් නොමැති නිසාය. එයින් සිදු වූයේ තත්වය තවත් බරපතල වීම පමණකි.

"සනීප වෙනකම් ගීතිකාව බෝඩිමට ගෙනියන්නද ඔයා කල්පනා කළේ.....?" සංජීව විමසීය. සේනානි සුසුමක් හෙලුවාය.

"ඒ බෝඩිමේ ඉන්නකොට සනීපෙන් ඉන්න අයත් අසනීප වෙනවා.... අනික් එක දැන් ජොබ් එකකුත් නැතුව බෝඩින් ෆීස් කොහොම ගෙවන්නද....."

සේනානි කිසිදු මවා පෑමකින් තොරව සත්‍යයම හෙළිදරව් කළාය.

"ගිම්හාන........"

ගීතිකා කොඳුරන හඬ ඇසුණු දෙදෙනාම හැරී බැලූහ. ඇගේ බැල්ම අහක කොහේදෝ රැඳී තිබුණත් දෙතොලේ වූයේ ප්‍රබෝධමත් සිනාවකි. ඇගේ සිත තුළ ගිම්හාන පිළිබඳ මොන තරම් පැතුම් ගොනුවී ඇද්දැයි සංජීව සංවේගයෙන් යුතුව කල්පනා කළේය.

"මං කියන්නද සේනානි..... මේ දවස්වල ගිම්හාන ගෙ ගෙදර කවුරුවත් නැහැනෙ.... ඒක නිකම්ම වහල අල තියෙන්නෙ... ඔයා ගීතිකාවත් අරගෙන එහාට යන්න....."

මොහොතක් ගීතිකා දෙස බලා සිටි ඔහු සේනානිට යෝජනා කළේය. සේනානි විස්මපත්ව ඔහු දෙස බැලුවාය.

"එහෙම යන එක හරිද.......? ගිම්හානත් නැතුව........."

ඇය කතා කළේ දෙගිඩියාවෙන් මෙනි. එහෙත් සිය යෝජනාවට ඇය තුළ අකැමැත්තක් නැති බව සංජීවට තේරුම් ගියේය.

"ගිම්හාන මට ගේ බලා ගන්න කියල ගියෙ..... මම එයාට කෝල් එකක් දාල විස්තරේ කියන්නම්කො......"

සංජීව කීවේය. සේනානි කල්පනාකාරීව බලා සිටියාය.

# 18

ගිම්හාන උදේ අවදි වී බලන විට ජනෙල් පියන්පත් මතද හිම තට්ටුවක් බැඳී තිබිණි. කුඩා කාලයේදී නංගීත් සමඟ එක්ව මේ හිම තට්ටු මත අලංකාර රූප ඇන්ද ආකාරය ඔහුට සිහිපත් විණි. දැඩිව හිම පතිත වෙන කාලයේදී ඔවුහු හිම මත ක්‍රීඩා කළහ. හිම ගුලි කොට රූප ඇඹූහ. හිම ක්‍රීඩාවලට ගිම්හාන දැක්වූයේ බලවත් ඇල්මකි. ඔහුට පියුමි හමුවූයේද එහි ප්‍රතිඵලයක් ලෙසිනි. ඇය හමුනොවූයේ නම් තම ජීවිතය මීට වඩා බොහෝ වෙනස් වෙන්නට ඉඩ තිබූ බව ගිම්හාන කල්පනා කළේය.

"ජීවිතේ හැම දෙයක්ම වෙන්නෙ සිද්ද වෙන්න තියෙන විදිහට මිසක් අපිට ඕන විදියට නෙමෙයි...."

කවුරුන් හෝ විසින් කොහේදීදෝ කියන ලද වදන් පෙළක් ඔහු ගේ මතකයට නැගිණි. එය පුවත්පත් කාර්යාලයේ කිසිවෙකු විසින් කියන ලද්දක් විය යුතුයයි ඔහුට සිතිණි. සැබවින්ම පුවත්පත් කාර්යාලයේ ගත කරන ජීවිතය විවිධත්වයෙන් හා රසවත් සිදුවීම් වලින් ගහණය. ඔහු එයට බෙහෙවින් ප්‍රිය කළේය. මෙහි හොඳ රැකියාවක් කිරීමට අවස්ථාව තිබියදී ලංකාව වැනි රටකට යාම මොන තරම් මෝඩ ක්‍රියාවක්දැයි බොහෝ දෙනෙක් තර්ක කළහ උපන්ද සිටම එංගලන්තයේ පදිංචිව නොසිටියේනම් ඔහු වුවද එසේ කල්පනා කරනු නියතය.

වර්ග වාදය හා වර්ණවාදය තුරන් කර ඇතැයි බොහෝ සෙයින් උදම් ඇනුවද ඇතැම් සුදු ජාතිකයන් තවමත් කළු ජාතිකයන් දෙස බැලුවේ උපහාසයෙන් හා පිළිකුලිනි. ගිම්හානලාටත් ඇතැම්විට එවන් අප්‍රසන්නජනක අවස්ථාවන්ට මුහුණ දෙන්නට සිදු විණි. එහෙත් ලංකාවේදී ඔහු ඉහළ පිළි ගැනීමකට ලක් විණි. තවමත් ලාංකිකයන් තුළින් යටත් විජිතවාදී මානසිකත්වය පහව ගොස් නැතැයි ගිම්හානට ඇතැම් විටෙක සිතිණි. ඔහු ලංකාවට යාමට තීරණය කළ විට අම්මලාගෙන් එයට කැමැත්ත ලැබුණේ ඒ පිළිගැනීම ගැන ඔවුන් දැන සිටි නිසා විය යුතුය. ඊටත් වඩා නිරන්තරයෙන්ම පියුමි සමඟ ගැටුම් ඇති කොටගෙන ඔහු තැවුල්පත් වීමද අම්මලා ඉවසුවේ නැත.

"කොහොම වුණත් ලංකාවට ගියායින් තවත් වේදනාවක් හිතට එකතු වුණ එකත විතරයි වුණේ......."

ගිම්හාන සුසුමක් හෙළීය. ඔහු තුළ ගීතිකා කෙරෙහි ඇති වූයේ පියුමි කෙරෙහි ඇති වූවාක් බඳු හැඟීමක් නොවේ. එය අනුරාගයෙන් තොර පිවිතුරු හැඟීමකි. ආදරය යනු එම හැඟීම විය යුතු යයි ඔහු අනුමාන කළේ කිසිදු දිනයෙක යුවතියක පිළිබඳව එවන් හැඟීමක් ඇති වී නොතිබුණ බැවිනි.

"පුතේ, ඔයා ඇහැරලාද ඉන්නෙ..........?"

දොරට තට්ටු කරමින් කතා කරන අම්මාගේ හඬ ඇසිණි. ගිම්හාන වහා ගොස් දොර විවර කළේය. ඔහුගේ මුහුණ දුටු විගසම අම්මාගේ සිනාව වියැකී ගියේය. ඇය ඕනෑකමින් ඔහු දෙස බැලුවාය.

"පුතාට සනීප නැද්ද............?"

"නෑ අම්මා අසනීපයක් නෑ........."

ඔහු සිනාසෙන්නට තැත් දැරීය. අම්මාගේ දෙනෙතට බොරු කළ නොහැකි බව ඔහුට සිහිපත් වූයේ පසුවය.

"කෑම කාල ඉන්නකො..........."

අම්මා පැවසුවේ පසුව විස්තර අසන බලාපොරොත්තුවෙන් විය යුතුය. ඔහු පැමිණි මොහොතේ සිටම අම්මාගේ බැල්ම විමසිලිමත්ව තමා වටා සැරි සරන බව ඔහුට මතකය.

"තාත්තයි නංගියි කෝවද...........?"

"ඒ දෙන්නා වැඩටත් ගියා....... ඔයාට නිදගන්න අරින්න කියල තාත්තා කිව්වා..........."

අම්මා ගිම්හාන කෑම මේසයට කැටුව ගියාය.

"ෂා"

ඔහුට කියැවුණේ රොටී සහ ලුණු මිරිස් තසිම දුටු විටය. අම්මාගේ දෙතොලින් වියැකී ගිය සිනාව නැවත එහි ලැගුම් ගත්තේය.

"පුතා ආස හින්ද මම රොටී හැදුවෙ...."

මම සමහර වෙලාවට ලංකාවෙදි රොටී හදනවා..... ඒත් මෙ රහට හදන්න බැනෙ....."

උම්බලකඩ යහමින් දමූ ලුණු මිරිස වැඩිපුර තවරාගෙන රොටී කමින් ගිම්හාන පැවසීය.

"පිටිත් එක්ක පොල් හොඳට එකතු වෙන්න අතල ටික වෙලාවක් තිබ්බම පදම එනවා........."

"මෙච්චර කල් එංගලන්තෙ ඉඳලත් අම්මට ලංකාවෙ කෑම බීම අමතක නොවුණ එකනෙ පුදුමෙ..."

ගිම්හාන සිනාසුණේය.

"ලෝකෙ කොහෙ හිටියත් අපි සිංහල කියල අමතක කරන්න හොඳ නෑ පුතා........."

"ඒකටත් එක්ක පියුමි........ එයා සුද්දන්ගෙත් සුද්දියෙක් වෙන්න හදන්නෙ......"

ගිම්හාන කියද්දී අම්මා ඔහු ඉදිරිපිට පුටුවේ වාඩි වූවාය. ඇගෙන් පළ වූයේ දිගු කතාවකට සූදානමකි. පියුමි සමගම ගීතිකාත් සිහිපත් වීම නිසා ගිම්හානගේ කෑම රුචිය හීන වී ගියේය.

"ඇයි පුතා........."

ඔහු අත සෝදා ගනු දුටු අම්මා මවිතයෙන් විමසුවාය.

"ඇති අම්මා... මට කෝපි එකක් හදල දෙන්නකො ......"

"පුතා දැන් මට කියන්නකො ලංකාවෙදි සිද්ද වුණ හැම දේම.........."

අම්මා කෝපි කෝප්පයක් සාදමින් සන්සුන් හඬින් පැවසුවාය. බරපතල යමක් සිදුවී ඇති බව ඇය අනුමාන කරන බව ඔහුට වැටහිණි. සැබවින්ම ඔහු ලංකාවෙන් පැමිණියේද අම්මාට හැම දේම පවසා උපදෙසක් පැතීමේ අරමුණ සිත දරාගෙනය.

"හුගාක් දේවල් වුණා අම්මා........."

දිගු සුසුමක් හෙලූ ගිම්හාන අම්මා දුන් කෝපි කෝප්පය අතට ගත්තේය. ඇය බොහෝ ඉවසිල්ලෙන් බලා සිටියාය.

"පුතා කැමති තරමක් කියන්නකො."

"කැමති තරමක් නෙමෙයි හැම දේම අම්මට කියල මොකද කරන්නෙ කියල අහගන්නයි මම හදිස්සියෙම ආවෙ අම්මෙ...."

අසරණ හඬින් එසේ ඇරඹූ ගිම්හාන ගීතිකා හමු වීමේ පටන් හැම දෙයක්ම සවිස්තරව අම්මාට පැවසීය. වදනකින් හෝ නොදොඩා අසා සිටියද ඇගේ මුහුණේ ඉරියව් වරින් වර වෙනස් වූයේය. අවසානයේදී ඉතිරි වූයේ බැරෑරුම් පෙනුමකි. ගිම්හාන අම්මා දෙසම බලා සිටියේ නිවැරදිම තීරණය ගත හැකි වන්නේ ඇයට පමණක් බව සිතමිනි.

"පුතා, මිනිසුන්ට කවදා හරි කොතැනදී හරි ජීවිතේ වරදින වෙලාවල් තියෙනවා........... පුතාටම තේරුණානෙ එක පැරයක් වැරදුණා කියලා.......... ඒ වැරදිම හදන්න ගිහින් තවත් අවුල් ඇති කර ගන්න එපා කීයලයි මම නම් කියන්නෙ..............."

අම්මා ඒ පෙනුමට සරිලන ස්වරයෙන් පැවසුවේ ඔහුට බොහෝ වේලාවක් මෙන් දැනුණු තත්පර ගණනාවක ඇවෑමෙනි. ගිම්හාන තිගැස්සී ගියේය. අම්මා එලෙස පවසනු ඇතැයි ඔහු කිසි සේත්ම බලාපොරොත්තු වූයේ නැත. ඔහු සිතට දිරියක් ලබා ගන්නාට මෙන් මේ වන විටත් සීතල වී තිබූ කෝපි කෝප්පය උගුරට දෙකට පානය කලේය.

"ඔයා කියන විදියට ඒ ගැණු ළමයා බොහොම දුප්පත්......... පවුලෙ අය යැපෙන්නේත් ඒ ළමයගෙන්, සමාජය ගැන අවබෝධයත් අඩුයි. ඔයා හිතනවද ඒ වගේ ළමයෙක් ඔයාට ගැලපෙයි කියලා.......?"

අම්මා සාපුවම ගිම්හානගේ මුහුණ දෙස බැලුවාය.

"ගීතිව දැකල කතා බහ කළා නම් අම්මා ඔහොම කියන්නෙ නෑ අම්මෙ..... එයා එංගලන්තෙ වගේ සමාජෙකට ගැලපෙන්නෙ නැති වෙයි........ ඒත් හැම දෙයක් ගැනම පුදුමාකාර දැනුමක් තියෙනවා.......... ඒ වගේ කෙනෙක් ඕනෑම තැනකට ගැලපෙන විදිහට හදගන්න ලේසියි......"

ගිම්හාන, ගීතිකා ගේ පැත්තට කතා කළේය. අම්මා හිස සැලුවාය.

"පුතා... පියුමි ගැනත් අපේ පැහැදීමක් තිබුණෙ නැහැ....... ඒත් අපි ඔයා ගෙ කැමැත්තට ඉඩ දුන්නා....... ජීවිතේ තවත් සැරයක් දන දන වරද්ද ගන්න එපා කියලයි මම කියන්නෙ.........."

අම්මා අවධාරණාත්මක හඬින් පැවසුවාය. ඇය මේ ආකාරයෙන් අවවාදයක් දෙන්නේ බොහෝ කලාතුරකිනි.

"මේ සැරේ වරදින්නෙ නෑ අම්මා......"

ගිම්හාන බිම බලාගෙන මිමිණීය. අම්මා සෙමින් සිනාසුණාය.

"ඔයා කොහොමද සහතික කරලම එහෙම කියන්නෙ......? ඔයා කසාද බැඳල කියල දන ගන්න ගමන් ගීතිකා ඔයාව දාල යන්න ගියා....... ඔයා මෙහෙ ආවා.... ඇත්ත තත්වය ගැන සාකච්ඡා කරන්න ඔයාල දෙන්නටම ඕන වුණේ නෑ......... දන් ඒ ළමයගෙ හිතේ ඔයා ගැන තියෙන්නෙ අවිශ්වාසයක්....... අවිශ්වාසයකුත් එක්ක පටන් ගන්න ජීවිතයක් සාර්ථක වෙයි කියල කියන්න මොකක්ද ඔයාට තියෙන සහතිකේ.............?"

අම්මා විමසුවේ අභියෝගයකට මෙනි. ගිම්හාන නිරුත්තරව බලා සිටියේය. එහෙත් ඔහුගේ සිත දෙගිඩියාව වෙමින් පැවතිණි. ගීතිකා යනු බොහෝ සංවේදී අහිංසක යුවතියක බැව් ඔහු දන සිටියේය. එවන් යුවතියකගේ සිත කලබල කොට තමා මේ පැමිණි ගමන නම් වැරදීමක් බැව් පිළි ගන්නට ඔහුට සිදු විණි. ඇය මේ මොහොතේ මොන තරමක් නම් වේදනාවට පත් වී ඇද්ද....? අම්මා කීවාක් මෙන් ඇය හා සාකච්ඡා කොට තීරණයකට ඒමට ඔහුට ඕන තරම් අවස්ථාව තිබිණි.

දුරකථනය නාද වන හඬ ඇසිණි. අම්මා නැගිට ගියාය. "පුතේ ඔයාට කෝල් එක......"

ගිම්හාන තිගැස්සිණි. මේ ඇමතුම නම් ලංකාවෙන්ම විය යුතු යයි ඔහුට සිතිණි. ඔහු ආපසු පැමිණි බව මෙහි කිසිවෙකු තවම දන්නේ නැත. ඔහු අනුමාන කළ ආකාරයටම කතා කළේ සංජීවය. දුරකථන අංකය තිබුණේ සංජීව ළඟ පමණෙකි.

"සංජීව, ඇයි මචං.........."

ඔහු විමසුවේ සසල හඬිනි.

"මං කතා කරන්නත් ඉස්සර උඹ කලබල වෙලානෙ......"

සංජීව පැවසුවේ සුපුරුදු සරදම් හඬිනි.

"හදිස්සියකට නෙමෙයි නම් උඹ කතා කරන්නෙ නෑ කියල මං දන්නවා........"

"හරි එහෙනම් කලබල නොවී අහගනින්....."

එලෙස ඇරඹූ සංජීව ගීතිකා ගේ තත්ත්වය ද ඇය ගිම්හාන ගේ නිවසේ නැවැත්වීමට ඔහු ගත් තීරණය ද පැහැදිලිවම විස්තර කළේය. ගිම්හානගේ සිත අවුල් විණි. හිටි හැටියේම රට හැර දමා පැමිණීමෙන් තමා ගත් අදූරදර්ශී පියවරේ බරපතලකම ඔහුට පසක් වෙමින් තිබිණි.

"දැන් මං මොකක්ද කරන්න ඕන මචං......"

ගිම්හාන විමසුවේ අසරණ හඬිනි.

"ඔහෙ ඉඳගෙන උඹට පුළුවන් කිසිම දෙයක් නැනෙ. මෙහෙ දේවල් අපි බලා ගන්නම.

උඹ නිවාඩුව ඉවර වෙලාම වරෙන්......"

සංජීව පැවසුවේ ඇනුම් පදයක් වශයෙන් යයි ගිම්හාන කල්පනා කළේය. ඔහු මේ ගමන පැමිණීමෙන් වළක්වන්නට උත්සාහ කළේය.

ටිසිවරය තැබූ ගිම්හාන නැවතත් මේසය අසල වාඩි වී දෝතින් හිස බදා ගත්තේය.

"ඒ සැරේ මොකද වෙලා තියෙන්නෙ.....?"

අම්මා විමසුවාය.

"මාර ප්‍රශ්නයක් අම්මා..... මං ආවට පස්සෙ ගීති අසනීප වෙලා......" ඔහු මිමිණුවේ වේදනාවෙනි.

"ඔය බලන්න.... දුර දිග බලන්නෙ නැතුව ගන්න හැම තීරණයකින්ම අන්තිමට ඉතුරු වෙන්නෙ පසු තැවිල්ලක් විතරයි කියල දැන් තේරෙනව නේද.....?"

අම්මා කියද්දී ගිම්හාන තවත් නොසන්සුන් වූයේය. පියුමි හමු වූ දා පටන්ම තමා ක්‍රියා කොට ඇත්තේ දුර දිග නොබලා බව ඔහුට පසක් වෙමින් පැවතිණි.

www.sinhalaelibrary.com
Scanned By Crzzzy

"දැන් මොකද අම්මා මම කරන්නෙ....?"

ඔහු විමසුවේ හිස බදා ගත් වනමය. මෙතරම් අසරණ බවක් ජීවිතයේ කෙදිනකවත් දැනී නැතැයි ඔහුට සිතිණි.

"ඉස්සර වෙලාම ඔයා පියුම් මීට් වෙලා මොනවා හරි තීරණයක් අරගෙන ඉන්න......"

අම්මා යෝජනා කළාය. ගිම්හාන එයට එකඟ විණි.

"ඉස්සර වෙලාම කෝල් එකක් දීල බලන්න ඔන ගෙදර ඉන්නවද කියලා......."

කියමින් ඔහු නැගී සිටියේය. ඔහුගේ නිවසට යාමට ඔහුට කලින් අවසර ගැනීමට අවශ්‍ය නොවිණි. එහෙත් නිවසේ පියුම් සිටිනු ඇත්තේ තනිව නොවේ යයි හැඟීම ඔහුට ප්‍රිය නොවීය.

"ඔයා ගියා කියල මට මෙහාට වෙලා තපස් රකින්න කියල ද කියන්නේ.......?"

ඇය කිසිදු විලිබියකින් තොරව එසේ විමසූ ආකාරය ඔහුට මතක තිබිණි. ඔහුගේම නිවස තුළ ඇය වෙනත් පිරිමියෙකු සමඟ සිටිනු දුටුවහොත් අමිහිරි ජවනිකාවක් ඇති වන්නට ඉඩකඩ තිබිණි. කලින්ම ඇයට දුරකථන ඇමතුමක් දීමට ඔහු තීරණය කළේ එහෙයිනි.

දුරකථන ඇමතුමට පිළිතුරු දුන්නේ විදේශික කාන්තාවකි. පියුම් සිය යෙහෙළියක නිවසේ නතර කරගෙන ඇතැයි ඔහුට සිතිණි.

"කෝ පියුම්.........?"

ගිම්හාන විමසීය. කාන්තාව දුන් පිළිතුරින් ඔහු කරකවා අත හැරියාක් මෙන් තත්ත්වයකට පත් වූයේය.

"පියුම් එයාගෙ බෝයි ෆ්‍රෙන්ඩ් එක්ක කැනඩා ගියා. මේ ගේ අපිට කුලියට දීල.

තව දුරටත් ඇයගෙන් විස්තර විමසීමේ තේරුමක් නොතිබූ නිසා ගිම්හාන ඇයට ස්තුති කොට රිසීවරය තැබීය. ඔහුට පියුම් කෙරෙහි ඇඩි කෝපයක් මෙන්ම පිළිකුලක් ද දැනිණි.

"මාර ගෑණියෙක්නෙ මේකි......"

ඔහු දත්මිටි කමින් කියා ගත්තේය.

# 19

SL-UNLIMITED
www.sinhalaelibrary.com
The Spirit of Sri Lankans community
Uploaded By Cizzzy

**සේ**නානිට ද රැකියාව අහිමි වී තිබිණි. ඇය ඒ පිළිබඳව මඳක්වත් කම්පා නොවුණත් ඇගේ සිතේ කම්හලේ පාලකයන් කෙරෙහි කලකිරීමක් හා ද්වේශයක් මෝදු වෙමින් පැවතිණි.

"කොච්චර නැහිගෙන මුන්ට කෙරුවත් කාටත් අන්තිමේ ඔය ටික තමයි......."

ඇය ප්‍රියන්ති සමඟ පැවසුවාය. ප්‍රියන්තිට ද මේ වන විට රැකියාව එපා වී තිබිණි.

"කලාපෙ රස්සාවට ආව දා ඉඳලම අපි හතර දෙනා හිටියෙ එකට.... ඔයාල තුන් දෙනාම නැතුව මට විතරක් මෙහෙ ඉන්න බෑ... මාත් ජොබ් එකෙන් අස් වෙලා ගෙදර යනවා...."

ප්‍රියන්ති පැවසුවේ දෑසට කඳුළු පුරවා ගනිමිනි. සේනානි එයට එරෙහිව කිසිවක් පැවසුවේ නැත. තමා වුව ද එම තීරණය ගැනීමට ඉඩ තිබූ බව සේනානි දැන සිටියාය.

ඔවුන්ගෙන් කිසිදු වරදක් සිදු නොවීත් ගීතිකා හා සේනානි රැකියාවලින් ඉවත් කිරීම ගැන කම්හලේ සේවක සේවිකාවෝ කුපිත වූහ. ඔවුන් වැඩ වර්ජනයකට අර අදින බැව් පාලක පක්ෂයට දැන

ගන්නට ලැබිණි. මාස තුනක වැටුප සහ ලැබිය යුතු අනෙකුත් දීමනා ගීතිකාට හා සේනානිට ලබා දීමෙන් සිය පවි සෝදා ගැනීමට ඔවුහු යත්න දැරූහ.

"අපි නිසා ඔයාලත් අවදානමක් ගන්න එපා.... අපි කොහොමටත් අස් වෙන්න හිතාගෙන හිටියෙ....."

සේනානි පැවසුවේ සහෝදර සේවක සේවිකාවන් ගැන ඇති වූ සැබෑම කැක්කුමකින් යුතුවය. ගීතිකා මේ කිසිවක් පිළිබඳව දැන සිටියේ නැත. ඇය ගිලන් යහනට වී බලා ගත් අත බලාගෙන සිටියාය.

"ගීතිකා අපි වගේ නෙමෙයි කොච්චර හයිය හිතක්ද තිබුණෙ...... එහෙම කෙල්ලෙකුට මෙහෙම අසනීපයක් හැදුණ කිච්චමත් පුදුමයි....."

ඇඟලුම් කම්හලේ බොහෝ දෙනෙක් ගීතිකා පිළිබඳව එසේ කතා කළහ. ගීතිකා බොහෝ සෙයින් පොත පත කියවන්නට පුරුදු වී සිටියාය. පොත පතින් ලැබූ දැනුමෙන් මෙන්ම සමාජය තුළින් ලද දැනීමෙන් ද පන්නරය ලබා සිටි ඇය මෙවන් විපතකට පත්වීම සැබැවින්ම පුදුම සහගතය.

සියල්ල ඇරඹුණේ නිර්මලාගේ මරණයත් සමඟමය.

"කොච්චර හයිය හිතකට වුණත් සමහර දේවල් දරා ගන්න බැරි වෙලාවක් එනවා.... එතකොට සිද්ධ වෙන්නෙ ඔහොම දේවල් තමයි...."

සමහරු කීහ. සේනානි දැරුවේ ද ඒ මතයමය. එහෙත් ගිම්හාන රට හැර ගියේ ප්‍රශ්නයෙන් පලා යාමේ මඟක් වශයෙන් යයි ඇයට නිරන්තරයෙන්ම සිතිණි.

"ගිම්හාන මහ වංචාකාරයෙක්....."

ඇය එසේ සිතුවා පමණක් නොව සංජීව සමඟ ද එසේ පැවසුවේ අප්‍රසාදයෙන් යුතුවය. ගීතිකා කැටුව ගිම්හාන ගේ නිවසට යාමට ඇය මුලින් අදි මදි කළේ ඔහු ගැන සිතේ වූ පැහැදීම වියැකී ගොස් තිබුණ නිසාය.

"ඔයා කොහොම හිතුවත් ගිම්හාන වංචාකාරයෙක්වත් අවස්ථාවාදියෙක්වත් නෙමෙයි නංගී....."

සංජීව කතා කළේ වේදනාවෙන් මෙනි. ඔහු සිය මිතුරා ආරක්ෂා කර ගැනීමට එසේ කියන්නේ යයි මුලින් සේනානි සිතුවාය. එහෙත් ඔහුගේ වදන්වල සත්‍යතාවය ඇයට පසක් වූයේ පසුව කල්පනා කරද්දීය. රාත්‍රියක් පුරා ගීතිකා ගිම්හාන ළඟ ගත කළාය. එහෙත් ඔහු ඇය මලක් මෙන් ආරක්ෂා කොට තිබිණි.

බටහිර සමාජයක දිගු කලක් ජීවත් වූ තරුණයෙකු තුළ එවන් සංයමයක් තිබීමම ඔහු අවස්ථාවාදියෙකු නොවන බවට සාක්ෂියක් නොවේ දැයි සේනානි කල්පනා කළාය. ගිම්හාන වංචාකාරයෙකු ලෙස හැඳින්වීම පිළිබඳව ඇයට පසුතැවිල්ලක් දැනිණි. ගීතිකා සමග ගිම්හානගේ නිවසට යාමට අවසානයේදී ඇය එකඟ වූවාය.

ඇනෙක්සියක් වුව ද ගිම්හාන ගේ නිවසේ වූයේ සේනානිට අදහා ගත නොහැකි තරම් සුඛෝපභෝගී බවකි.

ලෑලි ගසා සකස් කරන ලද අඩි අටේ දහයේ කාමර කැබැල්ලක කුඩු වී ඔවුන් දුක් විඳිද්දී සුඛෝපභෝගී ලෙසින් දිවි ගෙවන කණ්ඩායමක් ද මේ රටේම සිටිනු බව සේනානි දැන සිටියාය. එහෙත් මෙතරම් ප්‍රත්‍යක්ෂ ලෙසින් එය දැනුණ තවත් අවස්ථාවක් නොතිබිණි. මේ සුපිරි පරිසරය තමන්ට ඔරොත්තු නොදෙනු ඇතැයි බියක් හා සැකයක් විනා සැප විඳින්නවුන් කෙරෙහි අබ මල් රේණුවකුදු ඊර්ෂ්‍යාවක් ඇගේ සිතේ ඇති නොවීය.

"ඒක ඒ අයගෙ පින..... මේක අපේ ලැබීම....." ඇය සිතුවේ එලෙසිනි.

නිවසට පැමිණි සැණින් සේනානි අන්ද මන්දව වටපිට බැලූ ආකාරයෙන්ම ඇගේ සිතුවිලි සංජීවට ඉව වැටිණි. ඔහු ඇයට මදිකමක් නොවන පරිද්දෙන් නිවසේ තිබූ විදුලි උපකරණ ආදිය භාවිතා කරන අයුරු පහදා දුන්නේය.

ඔවුන් මෙහි පැමිණියේ සංජීව විසින් කුලියට ගන්නා ලද වෑන් රියකිනි. ඒ එනතුරුම ගීතිකා සේනානිගේ උර හිසේ හිස හොවාගෙන නිදා ගත්තාය. සෙටිය මත වාඩි කළ පසුවද ඇය සිටියේ නිදා වැටෙමිනි.

සේනානි තේ කෝප්පයක් සාදාගෙන එළියට පැමිණෙද්දී ගීතිකා සෙටියේ ඍජුව හිඳගෙන වටපිට බලමින් සිටියාය.

www.sinhalaelibrary.com
Uploaded By Crzzzy

මෙතෙක් දිනක් ඇගේ මුහුණේ වූයේ කඩදාසියක බඳු හිස් බවකි. මෙමොහොතේ ඒ හිස් බව මැකී ගොස් ප්‍රබෝධමත් පෙනුමක් එක් වී තිබෙන බව දුටු සේනානි ගේ සිතට දැනුණේ බලවත් සතුටකි.

"සේනා, මේ ගිම්හානගෙ ගෙදර නේද......?"

ගීතකා එක්වරම අසද්දී සේනානිට සතුටත් විමතියත් දරා ගන්නට නොහැකි වූයේය. තේ කෝප්පය පසෙකින් තැබූ ඇය වහා ගීතිකා වැළඳ ගත්තාය. සතුට වැඩි කමට ඇගේ දෙනෙතින් කඳුළු ගලා එමින් තිබිණි. අසනීප වූ දා සිට මේ වන තුරුම ගීතිකා ගේ මුවින් පිටවූ එකම වචනය වූයේ ගිම්හාන පමණකි.

"ගීති, ඔයාට දැන් සනීපයි නේද........?"

ඔවුන් දෙදෙනා ගේ දෙබස ඇසුණු සංජීව වහා සාලයට පැමිණ කුතුහලයෙන් ඔවුන් දෙස බැලීය.

"ගීති කතා කලා සංජීව අයියෙ... ගීති කතා කලා......"

ගීතිකා වැළඳගත්වනම සේනානි පැවසුවේ නොඉවසිලිමත් හඬිනි. සංජීවට ද සේනානිගේ සතුට දැනිණි. ඔහු ඔවුන් ඉදිරිපිට පුටුවේ වාඩි ගත්තේය. ගීතිකා මහත් වුවමනාවෙන් ඔහු දෙස බැලුවාය.

"සංජීව අයියා.... කෝ ගිම්හාන......"

ඇය විමසුවේ පැහැදිලි හඬිනි. සංජීවට මවිතයක් දැනිණි.

"ගිම්හාන ඔෆිස් ගියානෙ නංගී......"

ඔහු පැවසුවේ ගීතිකාගේ මේ හදිසි වෙනස අදහාගත නොහැකිවමය. ගීතිකා මුව පුරා සිනාසුණාය.

"එහෙම නම් මම ගිම්හාන එනකම් ටිකක් නිදා ගන්නම්....."

ඇය සේනානිගෙන් මිදී කාමරයට ගියාය. සංජීවත් සේනානිත් දෙදෙනාම එදෙස බලා සිටියේ නෙත් අයාගෙනය.

"මේක නම් හරිම පුදුමයක්. මෙච්චර දවස් ගිම්හාන කියල කිව්ව ඇරෙන්න වෙන වචනයක්වත් කතා කලේ නෑ......" සේනානි මිමිණුවාය.

"දැනුත් ඉතින් කතා කලේ ගිම්හාන ගැනමනෙ. මිනිහගෙ සුවඳ

දැනුණ ටිකට ඔච්චර සිහිය ආව නම් මිනිහට දැක්කොත් එහෙම කොහොම හිටීවි ද.....?"

සංජීව සිනාසෙන්නට තැත් දරමින් කිවත් ඔහුගේ කටහඬේ සරදමක් නොවිණි. එවර සේනානිගේ මුහුණෙහි වූ සතුට වියැකී බැරෑරුම් බවක් අරක් ගත්තේය.

"මට දැන් බයත් හිතෙනවා අයියෙ..... ගිම්හාන ඔන කියල කලබල කරන්න පටන් ගනීද දන්නෙ නෑ....."

"එහෙම වෙන එකක් නෑ... ඔය ඩොක්ටර් ගෙ බෙහෙත් වලින් ඔයිට වැඩිය හුඟක් අමාරු ලෙඩ්ඩුන්ට සනීප වෙලා තියෙනවා....."

සංජීව සඳහන් කළේ දැන් ගීතිකාට ප්‍රතිකාර කරන මානසික රෝග පිළිබඳ වෛද්‍ය විශේෂඥයා ගැනය. ගීතිකා ඔහු වෙතට යොමු කරන ලද්දේ සංජීව විසිනි. ඉතා කාර්ය බහුල වෛද්‍යවරයෙකු වූ ඔහුගෙන් ප්‍රතිකාර ගැනීම පහසු නොවිණි.

"මේ දවස්වල ලෙඩ්ඩු නම් වැඩියි.... ඒත් ඉතින් පත්තර කාරයෙකුගෙ ඉල්ලීම අහක දාන්න පුළුවන්කමක් නෑනෙ...."

වෛද්‍යවරයා ගීතිකාට ප්‍රතිකාර කිරීමට බාර ගත්තේ සංජීවට එසේ කියමිනි. සංජීව ඔහුට බෙහෙවින් ස්තූති වන්ත වූයේය. වෛද්‍යවරයාගේ ගාස්තුව පමණක් නොව බෙහෙත්වලටද වියදම් කරන ලද්දේ සංජීව විසිනි.

"අනේ අයියෙ අපි කොහොමද ඔය ණය ගෙවන්නෙ.....?"

සේනානි කම්පින හඬින් විමසුවාය.

ඒ වන විටත් ඔවුනට වැටුප් ලැබී නොතිබිණි.

"ආ..... ඔයා ඒව ගැන හිතන්න එපා... මං ගිම්හානගෙන් ඉල්ල ගන්නම්කො....."

ඔහු සිනාසී එම ප්‍රශ්නය මඟ හැරියේය. සැබැවින්ම මේ අවස්ථාවේදී සංජීව සිටියේ නොවූයේනම් ඔවුන් මොන තරම් අසරණ වෙන්නට ඉඩ තිබිණිදැයි සේනානි කල්පනා කළාය.

"ගිම්හාන ඉක්මනටම එයි කියල මට හිතෙනවා....."

සේනානි කල්පනා කරමින් සිටිනු දුටු සංජීව පැවසීය. ඇය සෙමින් නැඟිට ගොස් කාමරයට එබී බැලුවාය.

www.sinhalalibrary.com

ඇඳේ වැතිරුණු ගීතිකා කොට්ටයක් ද තුරුළු කරගෙන යමක් මුමුණමින් සිටියාය. ඇගේ මුහුණ පුරා පැතිරුණු සිනාවක් විය. ඈය සංජීවට අතින් සංඥා කොට එම දසුන දැක්වූවාය.

"ගිම්හාන ආවොත් හොඳයි අයියෙ..... එතකොටවත් මේ කෙල්ලගෙ හිත ටිකක් හැදෙන්නෙ නැතෑ....."

සේනානි පැවසුවේ සුසුමක්ද හෙළමිනි.

"ගිම්හාන එයාගෙ ඩිවෝස් එක ගැනත් කතා කර ගන්න එක්ක ගිහින් තියෙන්නෙ. ගීතිකාට සනීප නෑ කියල මම කිව්වට පස්සෙ ඒකත් කල් දාල එන විදියට තමයි කතා කළේ...."

"එයා ඩිවෝස් වුණත් ගීතිකා වාගෙ ගාමන්ට් කෙල්ලක්ව කසාද බඳිනවට ගිම්හානගෙ අම්මලා කැමති වෙයිද......?"

සේනානි පැවසුවේ සැකයෙනි. ඔහු සිනාසිණි.

"බටහිර සමාජේ ජීවත් වෙන අය ඒ වගේ පටු විදියට හිතන්නෙ නෑ... එහෙ හැම රස්සාවකටම එක වගේ වැදගත්කමක් තියෙනවා........."

සංජීව කියද්දී සිය නොදන්නාකම ගැන සේනානිට ලැජ්ජා සිතිණි. එහෙත් අර සැකය නම් සම්පූර්ණයෙන්ම සිතින් තුරන් වී ගියේ නැත. බටහිර සමාජයේ ජීවත් වුව ද ඔවුන් ලාංකිකයන් නොවන්නේදැයි ඈය තම සිතින්ම ප්‍රශ්න කර ගත්තාය.

"එහෙනම් සේනානි මම දැන් යනවා. ගීතිකාට හරියට වෙලාවට බෙහෙත් ටික දෙන්න. මොනවා හරි හදිස්සියක් වුණොත් රෑ කියල බලන්නෙ නැතුව මට කෝල් එකක් දෙන්න...."

බිම තබා තිබූ හෙල්මටය රැගෙන ගෙයින් පිටතට යමින් සංජීව පැවසීය. සේනානි ඔහු සමගම මිදුලට බැස්සාය. ප්‍රධාන නිවසේ පදිංචිකාරිය වූ මහාචෙන් මෙදෙස බලා සිටායාය. නිවස තාප්පයෙන් වට වී තිබුණ ද ප්‍රධාන නිවසේ පදිංචිකරුවන් කරුණාවන්ත බව පෙණුන ද සේනානිගේ සිතට හුදෙකලාවක් හා බියක් බඳු හැඟීමක් ඒ හැඟීම වඩාත් තදින් ඇතිණි. ඔහු නොපෙනී යන තුරුම බලාගෙන සිටි ඈය ගෙතුළට පිවිස දොර වසා දැමුවාය.

# 20

ගීතිකා කණ්ණාඩි මේසය ඉදිරිපිට වාඩි වී සිය පිළිබිඹුව දෙස බලා සිටියාය. ඇස් වටා කළු වී ජීව් බවින් හීන වූ ඒ මුහුණ අයිති තමාටදැයි ඇයට සිතා ගැනීමට පවා නොහැකි විණි. ආත්මානුකම්පාව නිසා ඇගේ දෙතොලට ශෝකී මදහසක් නැගිණි.

ගෙවී ගිය කාලය ඇගේ සිත තුළ සිත්තම් වී තිබුණේ නපුරු දීර්ඝ සිහිනයක් පරිද්දෙනි. දිගින් දිගටම බෙහෙත් පානය කළ අයුරුත්, එන්නත් නිසා දැනුණ වේදනාවත් ඇඳ ළඟ හිඳ ගත් සේනානි දුක්බර දෑසින් බලා සිටි අයුරුත් මීදුමක් අතරින් පෙනෙන්නාක් මෙන් ඇයට මතකය. බෙහෙත් එපා යයි කීමට සේනානි සමඟ කතා කිරීමට ඇයට අවශ්‍ය විය. එහෙත් එකම එක වදනක්වත් ඇගේ මුවින් පිට වූයේ නැත. ගිම්හාන දැවැන්ත සෙවනැල්ලක් මෙන් ඇගේ මුළු සිතම වසාගෙන සිටියේය. ඇය ඔහු සමග බොහෝ සෙයින් දොඩමළු වූවාය. ඔහු කිසිවක් නොකියා බලා සිටියා පමණකි. මේ සියල්ල සිදු වෙද්දී තමා සිටියේ සිහියත් අසිහියත් අතර කොහේදෝ තැනක බැව් දැන් ඇය දන්නීය.

බෙහෙත්වලටත් වඩා සේනානිගේ හෙදකමේ පිහිටෙන් දැන් ගීතිකා සුවපත් වෙමින් සිටින්නීය. ඇතැම් විටෙක සිතට දරා ගන්නට බැරි

තරමේ කාන්සියක්, නුදෙකලා බවක්, මඳු හැඟීමක් දැනෙයි. දැන් ඇය බෙහෙත් පෙත්තක් බොන්නේ පාලනය කර ගන්නට නොහැකි එවන් හැඟීමක් දැනෙන විටදී පමණකි.

දුප්පත්කමේ දුක උහුලා පුරුදු ආදරයේ වේදනාව උහුලා පුරුදු තමා මෙතරම් දුර්වල සිතැත්තියක් වූයේ මන්දැයි විටෙක ඇය කල්පනා කළාය. එහෙත් දිගින් දිගටම ඇයට කල්පනා කරන්නට සේනානි ඉඩ දෙන්නේ නැත.

ඇය කුමක් හෝ කතාවක් පටන් ගනියි. නැතහොත් චිත්‍ර පටයක් බලන්නට ඇය කැඳවයි. මුලු සිත් අග දක්වාම සිනාසිය හැකි ඒ විකට චිත්‍රපටි පවුනට ගෙනැවිත් දෙන ලද්දේ සංජීව විසිනි. ඇගේ සිතට කම්පනයක් ඇති වන කිසිවක් නොකරන ලෙස උපදෙස් දී ඇත්තේ වෛද්‍යවරයා බව ඇය දැන ගත්තේ පසුවය.

"මොනවද කණ්ණාඩිය දිහා බලාගෙන කල්පනා කරන්නෙ.....?" අසාගෙන කාමරයට පැමිණි සේනානි ඇඳ මත වාඩි ගත්තාය. ගීතිකා ඇය දෙස බැලුවේ කණ්ණාඩිය තුළින්මය.

"මේ කණ්ණාඩියෙ ඉන්නෙ මමමද කියල හිතුණා........"

ගීතිකා සිනාසෙන්නට තැත් දැරුවාය.

"තමන් තුළින් තමන්ම හොයනවා නම් හිත් වේදනා මොකුත් ඇති වෙන්නෙ නෑ කියල එදා හාමුදුරුවො බණට කිව්වා මතකද.......?"

"මතකයි...."

මිමිණූ ගීතිකා කණ්ණාඩිය අබියසින් නැගිට විත් ඇඳ මත වාඩි ගත්තාය. ඇය මුල්ම වතාවට ගිම්හානත් සමග මෙහි පැමිණි දිනයට වඩා කාමරයේ වෙනස් කමක් තිබුණා නම් ඒ ඇඳුම් රාක්කය මත තිබූ ඔහුගේ ඇඳුම් වෙනුවට ඇගේත් සේනානිගේත් ඇඳුම් තිබීම පමණකි. අබමල් රේණුවක්වත් අනුරාගී හැඟීමකින් තොරව ඔහු මේ යහන මත තමා තුරුළු කොටගෙන නිදා සිටි ඒ රාත්‍රියේ මතකය සුන්දර සිහිනයක් සේ තවමත් ඇයට සිහිපත් කළ හැකිය.

"බැඳපු මිනිහෙක් තමන් බැඳපු බව හංගන එක තරම් ජරා වැඩක් තවත් තියෙනවද.....?"

ඇය කටුක හඬින් එලෙස කතා කළේ තමාට අර තරම් ආදරය දැක්වූ මිනිසාටය. ඔහු විවාහකයෙකු බව කියන්නට තරම් සමීපව කතා බහ කරන්නට ඔවුනට අවස්ථාවක් ලැබුණේම නැත. ගිම්හානගේ ජීවිතයේ ඇති වූ ලොකුම වැරදීම ඒ විවාහය බවත් එයින් බොහෝ අමිහිරි අත්දැකීම්වලට මුහුණ දුන් බවත් ඇය දැන ගත්තේ සංජීවගෙනි.

"ගිම්හාන හුඟක් හොඳ කෙනෙක් නංගී...... එංගලන්තෙ වාගෙ රටවල ගෑණු, පිරිමි එක ගෙදරක ජීවත් වෙන්නෙ කසාද බැඳල නෙමෙයි. සමහර අය ළමයිනුත් ලැබුණට පස්සෙ කසාද බඳිනවා. සමහරු ළමයි ගැනවත් හිතන්නෙ නැතුව වෙන් වෙනවා. ඒවා ඒ රටවලට සාමාන්‍ය දේවල්. ඒත් ගිම්හාන ඒ සංස්කෘතියට කැමති නැති හින්දා තමයි පියුමිව කසාද බැඳල තියෙන්නේ.... එච්චර එපා.... උපන්දා ඉඳල එංගලන්තෙ හිටිය ගිම්හාන එහෙ ජොබ් එකෙන් අයින් වෙලා මේ වගේ දුප්පත් රටකට ආව එක ගැනම හිතන්න. මෙහෙ ඉන්න අය පාරවල් අතුගාන්න හරි ඒ රටකට යන්නයි ට්‍රයි කරන්නෙ......"

සංජීව කියාගෙන ගියේ බොහෝ පැහැදිලි හඬිනි. ගීතිකා ඉවසිල්ලෙන් අසා සිටියාය. ඇතැම් මොහොතක පැටලුණු නූල් බෝලයක් මෙන් මනකය අවුල් වූයේ වී නමුදු ගිම්හාන තමාට කිසිදු වරදක් නොකළ බව ඇය පසක් කොට ගත්තාය. සැබැවින්ම ඔහුට තමා වැනි ඇඟලුම් කම්හල් සේවිකාවක වෙනුවට උසස් රැකියාවක නියුතු ඉහළ සමාජය නියෝජනය කරන යුවතියක ජීවිතයට සම්බන්ධ කර ගැනීමට කිසිදු බාධාවක් නැත. එහෙත් ඔහුගේ සපුරුවේ ආදරය පිරුණේ ඇය වෙනුවෙනි. එසේ නොවන්නට ඇය ඔහුගෙන් ඈත් වීමට ගත් තීරණය ඇසූ සැණින් රට ද හැර දමා යාමට තරම් ඔහු සිත රිදවා ගන්නේ නැත.

සිය නළල දෙපසින් කැක්කුමක් මතු වී ගෙන එනු ගීතිකාට දැනිණි. ඇය ඇඟිලි තුඩුවලින් නළල දෙපස තෙරපා ගත්තාය. ඇගේ දෙනෙතට කඳුළු පිරිණි.

"ඇයි ගීති මොකද.........?"

ඇගේ වෙනස දැක කලබල වූ සේනානි විමසුවාය.

"මොකුත් නෑ.... ඔළුව ටිකක් රිදෙන්න ගත්තා...."

"බෙහෙත් පෙත්තක් දෙන්නද......?"

සේනානි ඇයට ළංව ගිය පිරිමැද්දාය.

"එපා.... බෙහෙත් මතක් වෙනකොටත් මට අප්පිරියයි......"

ගීතිකා මුහුණ ඇඹුල් කළාය.

"ඒක නමයි ඔහොම වැඩිය කල්පනා කරල ඔළුව අවුල් කරගන්න එපා කියන්නෙ.. එතකොට ආයෙ බෙහෙත් බොන්න ඕන වෙන්නෙ නෑනෙ...."

සේනානිගේ හඬේ වූයේ තෝත්කාඩුවකි.

"අපි දැන් මෙහෙ හිටිය ඇති නේද සේනා.....? අපි ගෙදර යමු.

හිටි හැටියේම ගීතිකා යෝජනා කළාය. ඇය එසේ යෝජනා කළේ අම්මාත්, තාත්තාත්, නංගිලා දෙදෙනාත්, මල්ලිලා දෙදෙනාත් බැලීමේ ආශාව මහ මෙරක් තරමට සිතට ඇතුණ නිසාම නොවේ. ගිම්හාන නුදුරු දිනකදීම එන බව සංජීවත් සේනානිත් කතා කරනු ඇයට ඇසී තිබිණි.

"ඔයාට හොඳටම සනීප වුණාට පස්සෙ යමු. එහෙ ගිහින් ආයෙමත් බෙහෙත් ගන්න මෙහෙ එන්න එපා වෙනවනෙ...... අනික් එක අසනීප තියාගෙන ගියාම අම්මලත් කලබල වෙයි......"

සේනානි පැවසුවේ කාරුණික හඬිනි. කඳුළු පිරුණු දෑසින් මොහොතක් බලා සිටි ගීතිකා සේනානි ගේ උරහිසට හිස බර කොට ගත්තාය.

"මං හින්දා ඔයාටත් ජොබ් එක නැතුව ගියා නේද සේනා.....?"

"ජොබ් නම් හොයා ගන්න බැරියැ බං...... අසනීපයක් වුණාම ඒක නොසලකා අරින්න පුළුවනෑ....."

ඇය කතා කළේ ගණනකට නැතිවය.

"ඒ වුණාට අපි අඩුම ගාණෙ ගෙවල්වලට බරක් නොවී ජීවත් වුණා.... දැන් ඒකත් නෑනෙ....."

ගීතිකා දුක්බර සුසුමක් හෙලුවාය.

"උඹ ඉක්මනට සනීප වෙයන්කො. සංජීව අයියා කිව්වා එයාලගෙ පත්තර කන්තෝරුවෙ ප්‍රවෘත්ති අංශයට පුහුණු කරන්න ගැණු ළමයි

ගන්නවලු...... උසස් පෙළ පාස් වෙලා තියෙන හින්දා ඔයාව එතෙන්ට දාන්න පුළුවන් කිව්වා...."

සේනානි එසේ කියද්දී ගීතිකා වහා හිස එසවූවාය. ඇගේ දෙනෙතේ බලාපොරොත්තුව දැල්වී තිබිණි.

"මොනව සේනා......? ඔය ඇත්තමද....?"

ගීතිකා සේනානිගේ දෑත අල්ලා ගත්තේ ප්‍රීතියෙන් සිනාසෙමිනි.

"ඇත්ත තමයි.... එතකොට උඹටයි, ගිම්හානටයි එකට වැඩ කරන්න බැරියැ....."

සේනානි පැවසුවේ උඟකාර ලෙස දෑස් නටවමිනි. එකෙණෙහිම ගීතිකාගේ දෙනෙතේ දැල්වුණු ප්‍රීතිය නිවී ගියාක් මෙන් විය. ඇය සුසුමක් හෙළා සේනානිගේ දෑත මුදා හැරියාය.

"ඔච්චා හීන විතරයි සේනා..... අනිත් එක මං හින්දා උඹට ජොබ් එක නැතුව ගියා.... ඉතින් මං විතරක් තනියම ජොබ් එකකට යන එක හරි දෙයක් ද......?"

"පිස්සු කතා කියන්න එපා ගීති... ඕ ලෙවල්වත් හරියට පාස් නැති මට පත්තර කන්තෝරුවල ලියන්න යන්න පුළුවන්ද......? මං ඉතුරු කර ගත්ත සල්ලි ටිකක් තියෙනවා.... ගෙදර ගිහින් පොඩි බිස්නස් එකක් පටන් ගන්න මං හිතාගෙන ඉන්නෙ......"

සේනානි කියද්දීම දොර සීනුව නාද විය. අවසානයකින් තොරවම කතාව නතර කළ සේනානි නැගී සිටියාය.

"සංජීව අයියා වෙන්න ඇති....."

ඇය පැවසුවේ ඔවුන් බලන්නට එන්නට වෙන අමුත්තෙකු නොසිටි බැවිනි.

එහෙත් දොර විවර කරද්දීම දුටු දසුනින් සේනානි සැලී ගියාය. ඇගේ දෙනෙත් විසල් විය. දෝතින් මුව වැසුණේ ඉබේටමය. ලොකු ගමන් බෑගයක් බිමත් බ්‍රීෆ් කේසයත් අතේත් ඇතිව සිනාමුසු මුහුණින් යුතුව දොරකඩ සිටගෙන සිටියේ ගිම්හානය.

"ගිම්හාන අයියා....."

ඇය මිමිණුවාය.

"කොහොමද සේනානි... කෝ ගීතිකා.......?"

"කාමරේ ඉන්නවා......."

ඇය ඔහු දෙස බලාගත්වනම පැවතුණේ සැබෑවටම ඔහු පැමිණ ඇතැයි අදහාගත නොහැකි වූ නිසාය.

"කවුද සේනා......?"

"අසාගෙන ගීතිකා එළියට පැමිණියාය. ගිම්හාන දුටු සැණින් ඇගේ දෙනෙත කැළඹෙනු දුටු සේනානි ඇය නැවතත් අසනීප වෙනු ඇතැයි බියපත් වූවාය.

"ගි..... ගි.... ගිම්හාන අයියෙ......."

ගීතිකා ගොත ගැසුවාය....... ගිම්හානත් ඇයත් නිමේෂයක් එකිනෙකා දෙස බලා සිටියහ. ඊළඟ මොහොතේ ඔහු ගේ අතේ වූ බ්‍රීෆ් කේසය බිමට අත හැරිණි.

"ගීති....... මගෙ ගීති........."

කෑ ගසාගෙන අඩියට දෙකට ගෙතුළට පිවිසි ගිම්හාන දැඩි ග්‍රහණයෙන් ඇය වැළඳ ගත්තේය. ගීතිකා මහ හඩින් හඬාගෙන ඔහුගේ ළමැදට බර වූවාය.

"මට සමාවෙන්න......"

"මට සමාවෙන්න......."

ඔවුහු එකිනෙකාට කියාගත්හ. සේනානි දෙනෙතට නැගුණු කඳුළු පිසලා ගනිමින් කුස්සිය දෙසට ගියාය.

"ගීති, ඔයා තරහද කෙල්ලෙ මගෙත්තෙක්ක......?"

බොහෝ වේලාවකට පසුව ඇගේ නිකටින් අල්ලා කඳුළු බර දෙනෙතට එබී බැලූ ගිම්හාන මුදු සරින් විමසීය. ගීතිකා හිස දෙපසට සැලුවාය.

"ජාති ජාතිවත් තරහ නෑ....."

"මං ඔයාට වංචාවක් කරන්නවත් ඔයාට මේ තරම් දුක් දෙන්නවත් කවදාවත් හිතුවෙ නෑ ගීති....."

www.sinhalalibrary.com
Scanned By Crzzzy

ඔහු කතා කළේ බිඳුණු හඬිනි. ගීතිකා නැවතත් ඔහුගේ ළමැදෙහි හිස හොවා ගත්තාය.

"මං දන්නවා ගිම්හාන අයියෙ...... ඔයා තරහද මම එදා ඔයාට එහෙම කතා කළාට.........?"

"ඔයාට එහෙම කතා කරන්න අයිතියක් තිබුණානෙ ගීති....."

ඔහු පැවසුවේ ඇගේ නළලත සිප ගනිමිනි.

මෙතෙක් වේලා වේදනා දෙමින් තිබූ හිස එකෙණෙහිම සුවපත් වූ සෙයක් ගීතිකාට දැනිණි. ඒ සෙනෙහසේ මහිමය නිසායයි ඇය කල්පනා කළාය.

"ඔයා අසනීප වෙයි කියල හිතුව නම් මම කියටවත් මේ ගමන යන්නෙ නෑ ගීති....."

ගිම්හාන කතා කළේ පසුතැවිල්ලෙනි. සැබැවින්ම ගීතිකාගේ අසනීපය ගැන සංජීව දැනුම් දුන් මොහොතේ සිටම ඔහුට ඒ පසුතැවිලි සහගත හැඟීම සමඟ එක්වූ වේදනාවක් දැනෙමින් තිබිණි. තමා ආපසු පැමිණෙනතුරු ගීතිකා රැක බලා ගන්නා ලෙස ඔහු සංජීවට ආයාචනා කළේය. මුදල් ද එවීය.

"සේනානියි, සංජීව අයියයි මාව හොඳට බලා ගත්තා.... මං හිතුවා සේනානිට ජොබ් එකක් නැතුව ගියා....."

ගීතිකා හිස නොඔසොවාම පැවසුවාය. එකම එක මොහොතකටවත් ඔහුගෙන් මෑත් වීමට නොහැකි තරමේ ලොබ් කමක් ඇයට දැනිණි.

"අපි ඒ දෙන්නට හොඳට සලකමු ගීති..... මීට පස්සෙ හැමදාටම මං ඉන්නවානෙ ඔයාව බලා ගන්න...."

ඔහු කියද්දී ගීතිකා වහා ඔහු දෙස බැලුවාය. ඇගේ දෙනෙතට විමතියක් එක් වී තිබිණි. ඔහු සිනාසුණේය.

"හැමදාටම......."

"ඔව් කෙල්ලෙ හැමදාටම........"

ඔහු කීවේ දැඩි සෙනෙහසනි.

"එතකොට පියුමි......?"

www.sinhalalibrary.com
Uploaded by Grzzzy

ඇය ඒ නම උච්චාරණය කලේ එතරම් කැමැත්තකින් නොවේ. ගිම්හාන තවත් කෙනෙකුට අයිති බව සිතන්නටවත් ඇය ප්‍රිය කලේ නැත. ගිම්හාන ඇගේ නලලත රැඳුණු කෙස් රොදක් පසුපසට කොට හිස පිරිමැද්දේය.

"මං යනකොට පියුමි එයාගෙ බෝයි ෆ්‍රෙන්ඩ් එක්ක කැනඩාවට ගිහින්.... මම එයාගෙන් ඩිවෝස් වෙන්න ඕන හැම දේම ලෑස්ති කරලයි ආවෙ..... ආයෙ මගෙ ජීවිතේට වෙන ගෑණියෙක් ඇතුල් වෙන්නෙ නෑ ගීති ඔයා ඇරෙන්න....."

ඔහු කතා කලේ ඉමහත් සහනයක් ලද කලෙක මෙනි.

"ඒත්.... ඒත්.... ඔයාලගෙ අම්මයි තාත්තයි කැමති වෙයිද අයියෙ. මං වගේ දුප්පත් කෙල්ලක් ඔයාගෙ ජීවිතේට ඇතුල් වෙනවට......?"

ගීතිකා විමසුවේ නැවත වරක් දෙනෙත කඳුළින් පුරවා ගනිමිනි. ගිම්හාන මඳ සිනාවක් පෑවේය.

"අම්මා මට කිව්වා ආයෙ සැරයක් ජීවිතේ වරද්ද ගන්නෙ නැතුව ඕන තීරණයක් ගන්න කියලා...... ඔයා ළඟ ඉන්න තාක් කල් මට වරදින්නෙ නෑ කියලා මං දන්නවා.

ඔහු හැඟුම්බරව පැවසීය.

"මාව එච්චරටම විශ්වාසද......?

ඇය පළමුවරට සිනාසෙමින් විමසුවාය. ඔහු පිළිතුරක් නොදී ඇගේ දෑසට එබීගෙන සිටියේය. විශ්වාසයත්, ආදරයත් ඔහුගේ දෑස තුළ දිදුලන අයුරු ගීතිකාට පෙනිණි. ඒ එළියෙන් සිය අඳුරු ලොව සදාකාලයටම ආලෝකමත් වනු ඇතැයි ඇයට සිතිණි.

**අවසානයි...**